කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
களனிப் பல்கலைக்கழகம் - இலங்கை
UNIVERSITY OF KELANIYA - SRI LANKA

# වාර්ෂික වාර්තාව සහ ගිණුම්
# 2024

## විශිෂ්ටත්වය ඔප් නැංවීම: උසස් අධ්‍යාපනයේ ගෝලීය තරඟකාරීත්වය අභිවර්ධනය කිරීම

මෙම වාර්තාව මගින් 2024 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලය පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කරන අතර, සංකලිත වාර්තාකරණ රාමුවක් භාවිතා කරයි. 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය ආවරණය කරමින් විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික දිශාව, පාලනය, කාර්යසාධනය සහ ඉදිරි කටයුතු මෙම වාර්තාව මගින් ඉදිරිපත් කර ඇත.

එමෙන්ම මෙම වාර්තාවේ සිසුන් ඇතුළත් කර ගැනීම සහ උපාධිධාරී නිමැවුම, මානව සම්පත්, පර්යේෂණ සංවර්ධනය, නවෝත්පාදන, සම්මාන සහ ජයග්‍රහණ පිළිබඳ සවිස්තර තොරතුරු ඇතුළත් වේ. තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ සමපාත වන ක්‍රීඩා ක්‍රියාකාරකම්, සුභසාධන පහසුකම්, යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සහ සමාරම්භක පිළිබඳ යාවත්කාලීන කිරීම් ද එහි අඩංගු වේ. මීට අමතරව, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ද මෙම වාර්තාවේ ඇතුළත් කර ඇත.

වාර්තාවේ දක්වා ඇති දත්ත කැලණිය විශ්වවිද්‍යාලයේ පරිපාලන අංශ සහ අධ්‍යයන අංශ, ඒකක සහ මධ්‍යස්ථානවලින් සම්පාදනය කර ඇත. ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව, උපාය මාර්ගික සැලසුම් සහ විශ්වවිද්‍යාල සංඛ්‍යාලේඛන මධ්‍යස්ථානය සහ කැලණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සහ ප්‍රකාශන අංශය විසින් මෙම වාර්තාව සම්පාදනය කරනු ලැබ ඇත.

# පටුන


පටුන ..... iii
වගු ලැයිස්තුව ..... vi
රූප සටහන් ලැයිස්තුව ..... vii
දැක්ම ..... ix
මෙහෙවර ..... ix
ඉලක්ක සහ අරමුණු ..... x
උපකුලපතිනියගේ පණිවුඩය ..... xiii
තොරතුරු සහ සංඛ්‍යා 2024 ..... xiv
විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය ..... xiv
විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන් ..... xvii
විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන සුදුසුකම් ..... xix
පර්යේෂණ ප්‍රදාන සහ පර්යේෂණ සඳහා සනාතන සභාවෙන් පිරිනමන ලද සම්මාන ..... xxi

**1. හැඳින්වීම ..... 1**
1.1. සමාලෝචිත වර්ෂය ..... 3
1.2. ඉදිරි දැක්ම ..... 6

**2. විශ්වවිද්‍යාලයේ පාලනය ..... 9**
2.1. විශ්වවිද්‍යාලයේ කුලපති, උපකුලපති, සහ නිලධාරීන් ..... 9
2.2. විශ්වවිද්‍යාල පාලක සභාව ..... 9
2.3. සනාතන සභාව ..... 11
2.4. පීඨ මණ්ඩල ..... 11
2.5. පාලන ලේඛන, උපායමාර්ගික සැලසුම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම ..... 11
2.6. ව්‍යවස්ථාපිත කමිටු ..... 13
2.7. සනාතන සභාවේ ස්ථාවර කමිටු ..... 15
2.8. පර්යේෂණ සඳහා ආචාර ධර්මානුකූල ප්‍රමිති ..... 16
2.9. සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම ..... 16
2.10. තත්ත්ව සහතික කිරීම ..... 17
2.11. විශ්වවිද්‍යාලය 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතට අනුකූල වීම ..... 19
2.12. අවදානම් කළමනාකරණය ..... 21
2.13. හරිත පරිචයන් ..... 23
2.14. බාහිර ආයතන සමඟ හවුල්කාරීත්වය ..... 29

**3. උප උපාධි මට්ටමේ පාඨමාලා පිළිබඳ තොරතුරු ..... 31**

**4. විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් ..... 33**
4.1. අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් ..... 33
4.2. බාහිර උපාධි අපේක්ෂකයින් ..... 35
4.3. පශ්චාද් උපාධි වැඩසටහන් හදාරන ශිෂ්‍යයන් ..... 35
4.4. විදේශීය ශිෂ්‍යයන් ..... 38

**5. උපාධිධාරී නිමැවුම සහ කාර්යසාධනය ........ 41**
5.1. උපාධිධාරී නිමැවුම - ප්‍රථම උපාධි අපේක්ෂක වැඩසටහන් ........ 41
5.2. උපාධිධාරී නිමැවුම - බාහිර උපාධි අපේක්ෂක වැඩසටහන් ........ 43
5.3. උපාධිධාරී නිමැවුම - පශ්චාද් උපාධි වැඩසටහන් ........ 43
5.4. 2024 වර්ෂයේ පවත්වන ලද උපාධි ප්‍රදානෝත්සව ........ 46

**6. විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය ........ 47**
6.1. අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය ........ 48
6.2. සේවක වර්ගීකරණය ........ 49
6.3. අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය (අධ්‍යයන කාරය මණ්ඩලය පමණි) ........ 49
6.4. විධායක කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ........ 52
6.5. අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ........ 52
6.6. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ........ 53
6.7. කාර්ය මණ්ඩලයේ ඉහළම අධ්‍යාපනික සුදුසුකම් ........ 53

**7. පර්යේෂණ සහ සංවර්ධනය ........ 55**
7.1. පර්යේෂණ සහ ප්‍රකාශන – 2024 ........ 55
7.2. පර්යේෂණ පරිසංවාද – 2024 ........ 55
7.3. අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන – 2024 ........ 56
7.4. පේටන්ට් බලපත්‍ර – 2024 ........ 57
7.5. විද්‍යා සහ තාක්ෂණ සංවර්ධන නිමැවුම– 2024 ........ 59

**8. ශිෂ්‍ය සුබසාධන පහසුකම් ........ 61**
8.1. ශිෂ්‍යත්ව ........ 61
8.2. නේවාසිකාගාර පහසුකම් ........ 63

**9. ක්‍රීඩා ක්‍රියාකාරකම් ........ 65**
9.1. ක්‍රීඩා කටයුතු සංවිධානය කිරීම සහ සහභාගීත්වය ........ 66
9.2. ක්‍රීඩා පුහුණු වැඩසටහන් සහ ක්‍රීඩා ඉසව් ........ 66
9.3. 2024 වර්ෂයේ ජාතික හා අන්තර් විශ්වවිද්‍යාලීය මට්ටමේ තරඟවලදී දැක් වූ කුසලතා ........ 67
9.4. 2024 වර්ෂයේ ජාත්‍යන්තර තරඟවලදී දැක් වූ කුසලතා ........ 68
9.5. 2024 වර්ෂයේ ජාතික ශූරතා තරඟවලදී දක්වන ලද කුසලතා ........ 69
9.6. 2024 වර්ෂයේ අනුබද්ධ ක්‍රීඩා පාලන ආයතන ........ 69
9.7. 2024 වර්ෂයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් දැරූ ක්‍රීඩා සම්බන්ධ වෙනත් තනතුරු ........ 70

**10. පීඨ, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, සහ පුස්තකාලය ........ 73**
10.1. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය ........ 73
10.2. පරිගණක හා තාක්ෂණ පීඨය ........ 77
10.3. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය ........ 80
10.4. මානවශාස්ත්‍ර පීඨය ........ 87
10.5. වෛද්‍ය පීඨය ........ 89
10.6. විද්‍යා පීඨය ........ 93
10.7. සමාජීය විද්‍යා පීඨය ........ 97
10.8. පුස්තකාලය ........ 100
10.9. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය ........ 104

**11. තිරසාර සංවර්ධනය ............................................................ 111**
11.1. ප්‍රතිපත්ති ප්‍රකාශනය ............................................................ 111
11.2. උපාය මාර්ග ............................................................ 111
11.3. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කවලට අදාළ ක්‍රියාකාරකම් සහ පර්යේෂණ .................... 112

**12. මූල්‍ය ප්‍රකාශන 2024 ............................................................ 119**
12.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ............................................................ 119
12.2. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ............................................................ 121
12.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ............................................................ 123
12.4. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය ............................................................ 124
12.5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් සහ අනෙකුත් පැහැදිලි කිරීම් ඇතුළත් සටහන්- 2024 .125

**13. විගණකාධිපති වාර්තාව ............................................................ 159**

**14. විගණකාධිපති වාර්තාව ආශ්‍රිතව විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නිරීක්ෂණ 167**

**15. විගණන කමිටු වාර්තාව 2024 ............................................................ 173**

# වගු ලැයිස්තුව

1 වගුව: විශ්වවිද්‍යාල පාලක සභාවේ සාමාජිකයෝ ..... 10
2 වගුව: 2024 වර්ෂය තුළ පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව ..... 14
3 වගුව: තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතට අනුව 2024 දී තොරතුරු නිකුත් කිරීම ..... 20
4 වගුව : විශ්වවිද්‍යාලයේ කොම්පෝස්ට් නිෂ්පාදනය ..... 28
5 වගුව: විශ්වවිද්‍යාලයේ කඩදාසි ප්‍රතිචක්‍රීකරණය ..... 28
6 වගුව: අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම් ..... 29
7 වගුව: උප උපාධි මට්ටමේ පාඨමාලා පිළිබඳ විස්තර ..... 31
8 වගුව: අභ්‍යන්තර උපාධි වැඩසටහන් සඳහා බඳවා ගත් මුළු සිසුන් සංඛ්‍යාව - දේශීය සිසුන් (2024 දෙසැම්බර් 31 දිනට) ..... 34
9 වගුව: මුළු ශිෂ්‍ය බඳවා ගැනීම- බාහිර උපාධි වැඩසටහන් ..... 35
10 වගුව: මුළු ශිෂ්‍ය බඳවා ගැනීම් - පශ්චාත් උපාධි වැඩසටහන් - දේශීය සිසුන් (2024 දෙසැම්බර් 31 දිනට) ..... 35
11 වගුව: විදේශීය සිසුන් - ප්‍රථම උපාධි වැඩසටහන් ..... 38
12 වගුව: විදේශීය සිසුන් - පශ්චාද් උපාධි වැඩසටහන් ..... 39
13 වගුව: ප්‍රථම උපාධිධාරීන් - අභ්‍යන්තර උපාධි වැඩසටහන් ..... 42
14 වගුව: උපාධිධාරීන් සංඛ්‍යාව- බාහිර උපාධි වැඩසටහන් ..... 43
15 වගුව: පශ්චාද් උපාධිධාරීන් පිළිබඳ සාරාංශය ..... 43
16 වගුව: පශ්චාද් උපාධිධාරී නිමැවුම ..... 44
17 වගුව: උපාධී ප්‍රදානෝත්සවය සහ උපාධිය පිරිනමන ලද සිසුන් සංඛ්‍යාව ..... 46
18 වගුව: විශ්වවිද්‍යාලයේ වර්තමාන කාර්ය මණ්ඩලය ..... 48
19 වගුව: ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවක වර්ගීකරණය ..... 49
20 වගුව: අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ..... 50
21 වගුව: පරිපාලන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ..... 52
22 වගුව: අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ..... 52
23 වගුව: අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ..... 53
24 වගුව: ස්ථිර කාර්ය මණ්ඩලයේ ඉහළම අධ්‍යාපන සුදුසුකම් ..... 53
25 වගුව: විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සහ ප්‍රකාශන නිමැවුම ..... 55
26 වගුව: පර්යේෂණ සභාව විසින් අරමුදල් සම්පාදනය කර 2024 වර්ෂයේ දී පවත්වන ලද පර්යේෂණ පරිසංවාද ..... 56
27 වගුව: 2024 අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන පිළිබඳ විස්තර ..... 57
28 වගුව: 2024 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයට ලැබුණු පේටන්ට් බලපත්‍ර ..... 57
29 වගුව: : 2024 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලය මගින් ගොනු කරන ලද පේටන්ට් බලපත්‍ර ..... 58
30 වගුව: 2024 වර්ෂයේ දී විද්‍යා සහ තාක්ෂණ සංවර්ධන නිමැවුම ..... 59
31 වගුව: මහපොළ සහ ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව ..... 61
32 වගුව: 2024 වර්ෂයේ දී නේවාසිකාගාර ලබා ගත් සිසුන් ..... 63
33 වගුව: ක්‍රීඩා පහසුකම් ..... 65
34 වගුව: කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ..... 65
35 වගුව: ක්‍රීඩා ඉසව් ..... 66
36 වගුව: 2024 වර්ෂයේ පැවැත් වූ ක්‍රීඩා ඉසවු සහ සහභාගීත්වය ..... 66
37 වගුව: 2024 අන්තර් විශ්ව විද්‍යාල මට්ටමේ තරඟවල දක්ෂතා ..... 67
38 වගුව: 2024 ජාතික මට්ටමේ තරඟවල දක්ෂතා ..... 68
39 වගුව: කාර්ය මණ්ඩලය විසින් දරන ලද වෙනත් තනතුරු ..... 70
40 වගුව : මානවශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන වැඩසටහන අනුව සිසුන් ..... 87
41 වගුව: පුස්තකාලය භාවිත කිරීම පිළිබඳ සංඛ්‍යාලේඛන ..... 100
42 වගුව: නව ලියාපදිංචිකිරීම් පිළිබඳ තොරතුරු ..... 105
43 වගුව: 1වන ශිෂ්‍ය හැඳින්වීමේ වැඩසටහන පිළිබඳ විස්තර ..... 105
44 වගුව: 2වන,3වන,4වන ශිෂ්‍ය හැඳින්වීමේ වැඩසටහන පිළිබඳ විස්තර ..... 105
45 වගුව: 2024 වසරේ පැවති විභාගය පිළිබඳ විස්තර ..... 106
46 වගුව: උපාධි ප්‍රදානෝත්සව පිළිබඳ විස්තර ..... 106
47 වගුව: මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ..... 119
48 වගුව: මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ..... 121
49 වගුව: මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ..... 123
50 වගුව: හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය ..... 124
51 වගුව: වත්කමක ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය ..... 129
52 වගුව: වත්කම් ප්‍රත්‍යාගණනය ..... 130
53 වගුව: විශ්‍රාම පාරිතෝෂිකය පිළිබඳ ආයුගණක තක්සේරුව ..... 133
54 වගුව: විභාගවෙමින් පවතින නඩු ..... 137
55 වගුව: මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් ..... 140
56 වගුව: ලෙජර් ශේෂ ..... 155
57 වගුව: අයවැයගත සහ සත්‍ය ප්‍රමාණ සංසන්දනය කිරීමේ ප්‍රකාශනය ..... 156

# රූපසටහන් ලැයිස්තුව


1 රූපසටහන: කාණ්ඩ අනුව කාර්ය මණ්ඩලය (අධ්‍යයන කාර්ය මණ්ඩලයට පුස්තකාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 11 දෙනෙකු ඇතුළත් වේ)...... xiv

2 රූපසටහන: ස්ත්‍රී-පුරුෂභාවය අනුව කාර්ය මණ්ඩලය ........ xiv

3 රූපසටහන: පුස්තකාල කාර්ය මණ්ඩලය හැර අධ්‍යයන කාර්ය මණ්ඩලය, තනතුර අනුව ........ xv

4 රූපසටහන: ස්ථිර කාර්ය මණ්ඩලයේ සුදුසුකම් - අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය, පරිපාලන මූල්‍ය සහ අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය. ........ xv

5 රූපසටහන: වර්ෂය තුළ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මුළු සංඛ්‍යාව (පුස්තකාල කාර්ය මණ්ඩලය හැර)........ xv

6 රූපසටහන: කාර්ය මණ්ඩලයේ ඉහළම සුදුසුකම් - ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩලය ........ xvi

7 රූපසටහන: ස්ත්‍රී පුරුෂ භාවය අනුව ස්ථිර කාර්ය මණ්ඩල කාණ්ඩවලට අයත් සියලුම සේවකයින්........ xvi

8 රූපසටහන: ආචාර්ය උපාධි ලබා ඇති ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය ........ xvi

9 රූපසටහන: 2024 දෙසැම්බර් 31 දිනට පීඨය අනුව ඇතුළත් කර ගත් මුළු උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව........ xvii

10 රූපසටහන: 2024 දෙසැම්බර් 31 දිනට වැඩසටහන් වර්ගය අනුව මුළු පශ්චාද් උපාධි ශිෂ්‍ය බඳවා ගැනීම්........ xvii

11 රූපසටහන: අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහන් සඳහා නවක බඳවා ගැනීම් (දේශීය) ........xviii

12 රූපසටහන: මුළු අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීමේ ප්‍රවණතාවය ........xviii

13 රූපසටහන: පීඨය අනුව උපාධිධාරීන් නිමැවුම........ xix

14 රූපසටහන: පශ්චාද් උපාධිධාරීන් නිමැවුම ........ xix

15 රූපසටහන: ජයග්‍රහණ මට්ටම අනුව උපාධිධාරීන් නිමැවුම ........ xx

16 රූපසටහන: පර්යේෂණ සභාවේ අරමුදල්වලින් ලබා දුන් සම්මාන සංඛ්‍යාව ........ xxi

17 රූපසටහන: ප්‍රකාශන සඳහා සනාතන සභාව මගින් ලබා දුන් සම්මාන........ xxi

18 රූපසටහන: 2024 වර්ෂයේදී පීඨය විසින් පර්යේෂණ ප්‍රදාන සඳහා දරන ලද වියදම් ප්‍රමාණය ........ xxii

19 රූපසටහන: සංවිධාන ව්‍යුහය........2

20 රූපසටහන: 2024 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්........33

21 රූපසටහන: 2024 දෙසැම්බර් 31 වන විට විශ්වවිද්‍යාලයේ උපාධි නිමැවුම........ 41

22 රූපසටහන: සේවක වර්ගීකරණය........47



# දැක්ම

තිරසාර සංවර්ධනය උදෙසා දැනුම නිර්මාණය කිරීමේ සහ ව්‍යාප්ත කිරීමේ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.

# මෙහෙවර

නිර්මාණශීලිත්වය හා නව්‍යකරණය තුළින් ජාතික සංවර්ධනයට උරදෙන බුද්ධිමත් පුරවැසියන් බිහි කිරීම.

# ඉලක්ක සහ අරමුණු

## ඉලක්කය 01: ඉහළ ගුණාත්මකභාවයකින් යුත් නම්‍යශීලී ශික්ෂණ හා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම.

### අරමුණු

- සිසුන්ට ඉහළ ගුණාත්මකභාවයකින් යුත් අධ්‍යාපනික වැඩසටහන් ලබාදීම.
- විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සහ වෙනත් රටවලින් විශ්වවිද්‍යාලයට ඇතුළු වන සිසුන් ඇතුළු විවිධ පරාසයකින් යුත් ශිෂ්‍ය ජනගහනයකට විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීමේ හැකියාව වැඩි දියුණු කිරීම.
- විශ්වවිද්‍යාලයෙන් පිටවන උපාධිධාරීන්ගේ සේවා නියුක්ති හැකියාව වැඩි කිරීම.
- උපාධිධාරීන්ට වාසිදායක සහ කාලෝචිත සේවා නියුක්තිය සඳහා උපකාර කිරීම පිණිස සේවා යෝජකයන් සමඟ සබඳතා වර්ධනය කිරීම.
- සියලුම අධ්‍යයන වැඩසටහන්වලදී ඉගැන්වීමේ විශිෂ්ටත්වයට අනුබල දෙන සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම.
- සිසුන්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.
- සිසුන්ගේ ඉගෙනීමේ කටයුතු සඳහා ජාත්‍යන්තර අවස්ථා වැඩි දියුණු කිරීම.
- යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

## ඉලක්කය 02: විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික ඉලක්ක සපුරාලනු වස් ඉහළම ගුණාත්මකභාවයකින් යුත් පීඨ සහ කාර්ය මණ්ඩලයක් ගොඩ නැගීම.

### අරමුණු

- විශ්වවිද්‍යාලය තුළ මානව සම්පත් සඳහා සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- ඉහළ ගුණාත්මකභාවයකින් යුත් අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීම.
- විශ්වවිද්‍යාලයේ සියලුම සේවකයින් සඳහා ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් නිර්මාණය කිරීම.
- ඉගෙනුම් අවස්ථා නිර්මාණය කිරීම සහ අදාළ වන පරිදි හා අවශ්‍යතාවය අනුව අධ්‍යයන හෝ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම සඳහා සියලුම කාණ්ඩවල කාර්ය මණ්ඩල සඳහා ලබා දෙන සහාය (මූල්‍ය) වැඩි කිරීම.

## ඉලක්කය 03: ගෝලීය පිළිගැනීමක් ඇති බහු-විෂය පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීම

### අරමුණු

- පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව වැඩි කිරීම මගින් විශ්වවිද්‍යාලය තුළ පර්යේෂණ සංස්කෘතියක් වර්ධනය කිරීම සහ විශ්වවිද්‍යාල ප්‍රාග්ධන අයවැයෙන් අවම වශයෙන් 10%ක් පර්යේෂණ ප්‍රදාන ලෙස වෙන් කිරීම.
- ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල විශ්වවිද්‍යාලයේ ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීම.
- දේශීය සහ ජාත්‍යන්තර තීරක / සුවිගත අධ්‍යයන සඟරාවල ප්‍රකාශන වැඩි කිරීම.
- අන්තර් ක්ෂේත්‍ර පර්යේෂණ වැඩි කිරීම.
- විශ්වවිද්‍යාල විද්‍යුත් පුස්තකාල පද්ධතිය ශක්තිමත් කිරීම.
- පර්යේෂණ සහ නව නිෂ්පාදන සංවර්ධනය සහ වාණිජකරණය තුළ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම.

## ඉලක්කය 04: ආර්ථික සහ සහභාගීත්ව පරාසයන් පුළුල් කිරීම මඟින් විශ්වවිද්‍යාලයේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම.

### අරමුණු

- විශ්වවිද්‍යාලය මගින් ප්‍රජාවට ලබාදෙන උපදේශන සේවා / ව්‍යාපෘති සංඛ්‍යාව වැඩි කිරීම.
- ජාතික සංවර්ධනය සඳහා උපකාරක සේවා සංඛ්‍යාව වැඩි කිරීම.
- වෘත්තීය ආයතන, කර්මාන්ත, සමාජ සංවිධාන සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධතා වැඩි කිරීම.
- සමාජ වගකීම් සම්බන්ධ ක්‍රියාකාරකම් වැඩි කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම.
- විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන් පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම.
- සමාජ හා අන්තර් සංස්කෘතික සමගිය වැඩි දියුණු කිරීම.
- හරිත විශ්වවිද්‍යාල සංකල්පය වැඩිදියුණු කිරීම.

## ඉලක්කය 05: කාර්යක්ෂම හා ඵලදායි පරිපාලනය හා මූල්‍ය කළමනාකරණය හරහා විශිෂ්ට පාලන ක්‍රමයක් ගොඩ නැංවීම.

### අරමුණු

- කාර්යක්ෂම පාලන පද්ධතියක් සංවර්ධනය කිරීම.
- පරිපාලනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නවීන තාක්ෂණය ඇතුළත් කිරීම.
- සම්පත් ප්‍රයෝජනයට ගැනීම ප්‍රශස්ත කිරීම සඳහා අඛණ්ඩතාව සහ වගවීම ප්‍රවර්ධනය කරන අතරම, කාලෝචිත, ප්‍රතිචාරාත්මක සහ නිරවද්‍ය මූල්‍ය පරිපාලන පද්ධතියක් සංවර්ධනය කිරීම.



# උපකුලපතිනියගේ පණිවුඩය



**"ජාත්‍යන්තර සහයෝගීතා පෝෂණය කිරීම, අපගේ ඩිජිටල් පරිවර්තන මුලපිරීම් වේගවත් කිරීම, ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සහ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තිරසාරභාවය සහතික කිරීම සම්බන්ධයෙන් ලබන වසරේ අවධානය යොමු කරනු ඇත."**

2024 වසර කැලණිය විශ්වවිද්‍යාලයට සැලකිය යුතු ප්‍රගතියක් අත්කර දුන් කාලපරිච්ඡේදයක් ලෙස සනිටුහන් වී තිබේ. පසුගිය වර්ෂය පිළිබඳව මෙනෙහි කරමින් ද, ඊළඟ වර්ෂය පිළිබඳව අවධානය යොමු කරමින් ද අප ලබා ගත් ජයග්‍රහණ සමරන අතරතුර අධ්‍යයන විශිෂ්ටත්වය, බලපෑම් සහිත පර්යේෂණ සහ තිරසාර සංවර්ධනය සඳහා අපගේ කැපවීම නැවත තහවුරු කරමු.

2024 වර්ෂයේ දී ලබා ගත් ප්‍රධාන ජයග්‍රහණයක් වූයේ ටයිම්ස් උසස් අධ්‍යාපන ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල (1501+ කාණ්ඩය) අපගේ ස්ථානය පවත්වා ගැනීම සහ THE බලපෑම් ශ්‍රේණිගත කිරීම්, QS ආසියානු ශ්‍රේණිගත කිරීම් සහ UI හරිත මෙට්‍රික් ශ්‍රේණිගත කිරීම්වල අපගේ ස්ථානය තහවුරු කර ගැනීමයි.

අධ්‍යයන අංශය පිළිබඳව සැලකීමේ දී, අපි අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් 3,094 ක්, බාහිර උපාධි අපේක්ෂකයින් 2,562 ක් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින් 1,363 ක් ඇතුළුව සිසුන් 7,000 කට අධික පිරිසකට උපාධි ප්‍රදානය කළෙමු. අපි උප උපාධි මට්ටමේ සුදුසුකම් 1,000 ක් ද ප්‍රදානය කළෙමු. නව උපාධි අපේක්ෂකයින් 4,054 ක්, බාහිර උපාධි අපේක්ෂකයින් 3,979 ක්, පශ්චාත් උපාධි අපේක්ෂකයින් 1,624 ක් සහ උප උපාධි මට්ටමේ සිසුන් 4,500 ක් සහිතව සිසුන් ඇතුළත් කර ගැනීම නව මානයකට ළඟා විය. Scopus-සුචිගත ප්‍රකාශන 313 ක් සමඟ අපගේ පර්යේෂණ පියසටහන සැලකිය යුතු ලෙස වර්ධනය වෙමින් පැවතුන අතර, 2023 වර්ෂයේ පැවති 6% ක්ව පැවති අනෙකුත් ප්‍රකාශනවලින් සැලකිය යුතු උපුටා දැක්වීම් සංඛ්‍යාවක් ලබා ඇති ශාස්ත්‍රීය කටයුතු 12% ක වර්ධනයක් සනිටුහන් කර ඇත.

යටිතල පහසුකම් සංවර්ධනය සම්බන්ධයෙන් සැලකීමේ දී, පෑලියගොඩ පිහිටි පරිගණක හා තාක්ෂණ පීඨය සඳහා නව ගොඩනැගිලි සංකීර්ණයක් විවෘත කිරීමට හැකි වීම වැදගත් අවස්ථාවක් සනිටුහන් කරන ලදී. මෙම ගොඩනැගිලි සංකීර්ණය ආසන 1,000 ක ධාරිතාවකින් යුත් ශ්‍රවණාගාරයකින් සමන්විත වන අතර සහ පීඨය විසින් පිරිනමනු ලබන වැඩසටහන් සඳහා අති නවීන රසායනාගාර පහසුකම්වලින් ද සමන්විත වේ.

රාගම වෛද්‍ය පීඨයේ අක්මා රෝග සඳහා වූ උතුරු කොළඹ මධ්‍යස්ථානයේ අක්මා බද්ධ කිරීමේ පහසුකමක් විවෘත කිරීම ද ප්‍රධාන සන්ධිස්ථානයක් විය. 2024 මැයි මාසයේ මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පසු රෝගීන් 800 කට ආසන්න සංඛ්‍යාවක් මධ්‍යස්ථානයට යොමු කර ඇති අතර, ශ්‍රී ලංකාවේ මෙතෙක් සිදු කර ඇති මාස 6 ක ලාබාලතම බිළිඳාගේ අක්මා බද්ධය ද ඇතුළුව අක්මා බද්ධ කිරීම් 13 ක් සිදු කර ඇත.

මෙම සියලුම සන්ධිස්ථාන අපගේ අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයේ කැපවීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ හැකි සාක්ෂි වේ. .

අනාගතය අවලෝකනය කිරීමේ දී, උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය අඛණ්ඩව උසස් තත්ත්වයේ පවතින බව ද සහතික කරමින් එය වැඩිදියුණු කිරීමට අපි කැපවී සිටිමු. අපගේ පර්යේෂණ හිමැවුම ශක්තිමත් කිරීම සහ තවත් ජාත්‍යන්තර සිසුන් ආකර්ෂණය කර ගැනීම සඳහා අපි අපගේ ජාත්‍යන්තර සහයෝගීතාවයන් පෝෂණය කරන්නෙමු. විද්‍යා පීඨයේ දේශන සංකීර්ණය සම්පූර්ණ කිරීමට සහ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය සඳහා මහල් 10 ක ගොඩනැගිල්ලක් ඉදි කිරීම ආරම්භ කිරීමට අපි අපේක්ෂා කරමු. අධ්‍යාපනික වැඩසටහන් වඩා හොඳින් ලබා දීම මෙන්ම පරිපාලන සහ කළමනාකරණ කාර්යක්ෂමතාවයේ ජයග්‍රහණ ලබා ගැනීම සඳහා ඩිජිටල් පරිවර්තනය අවධානය යොමු කළ යුතු වැදගත් ක්ෂේත්‍රයක් ලෙස පවතිනු ඇත.

අපගේ අධ්‍යයන, විධායක, අධ්‍යයන සහායක සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කැපවීම සහ උත්සාහයෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන් ඔවුන් වෙත මාගේ කෘතඥතාව දැක්වීමට කැමැත්තෙමි. ඔබගේ ප්‍රයත්නයන් අපගේ සාර්ථකත්වයේ මෙහෙයුම් බලවේගය වන අතර, වර්ධනයේ සහ නවෝත්පාදනයේ තවත් වසරක් සනිටුහන් කිරීමට මම අපේක්ෂා කරමි.



**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා**

උපකුලපතිනිය,

කැලණිය විශ්වවිද්‍යාලය

# වර්ෂයේ තොරතුරු සහ සංඛ්‍යා 2024

## විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය




රූප සටහන 1: කාණ්ඩය අනුව කාර්ය මණ්ඩලය (අධ්‍යයන කාර්ය මණ්ඩලයට පුස්තකාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 11 දෙනෙකු ඇතුළත් වේ)




රූපසටහන 2: ස්ත්‍රී පුරුෂ භාවය අනුව කාර්ය මණ්ඩලය




රූපසටහන 3: පුස්තකාල කාර්ය මණ්ඩලය හැර, අධ්‍යයන කාර්ය මණ්ඩලය තනතුර අනුව




රූපසටහන 4: ස්ථිර කාර්ය මණ්ඩලයේ සුදුසුකම් - අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය, පරිපාලන, මූල්‍ය සහ අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය




රූපසටහන 5: දක්වා ඇති වර්ෂ තුළ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මුළු සංඛ්‍යාව (පුස්තකාල කාර්ය මණ්ඩලය හැර)




රූපසටහන 6: කාර්ය මණ්ඩලයේ ඉහළම අධ්‍යයන සුදුසුකම් - ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩලය




රූපසටහන 7: ස්ත්‍රී පුරුෂ භාවය අනුව ස්ථිර කාර්ය මණ්ඩල කාණ්ඩවලට අයත් සියලුම සේවකයින්




රූපසටහන 8: ආචාර්ය උපාධි ලබා ඇති ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යා

## විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන්




රූපසටහන 9: 2024 දෙසැම්බර් 31 වන විට පීඨය අනුව ඇතුළත් කර ගත් මුළු උපාධි අපේක්ෂක සිසුන් සංඛ්‍යා




රූපසටහන 10: 2024 දෙසැම්බර් 31 වන විට වැඩසටහන් වර්ගය අනුව මුළු පශ්චාත් උපාධි ශිෂ්‍ය බඳවා ගැනීම්




රූපසටහන 11: අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහන් සඳහා නවක බඳවා ගැනීම් (දේශීය)




රූපසටහන 12: සමස්ත අභ්‍යන්තර උපාධි අපේක්ෂක සිසුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රවණතාවය

# විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන සුදුසුකම්




රූපසටහන 13: පීඨය අනුව උපාධිධාරීන් නිමැවුම




රූපසටහන 14: පශ්චාද් උපාධිධාරීන් නිමැවුම




රූපසටහන 15: ජයග්‍රහණ මට්ටම අනුව උපාධිධාරීන් නිමැවුම

## පර්යේෂණ ප්‍රදාන සහ පර්යේෂණ සඳහා සනාතන සභාවෙන් පිරිනමනු ලබන ලද සම්මාන




රූපසටහන 16: පර්යේෂණ සභාවේ අරමුදල්වලින් ලබා දුන් සම්මාන සංඛ්‍යාව




රූපසටහන 17: ප්‍රකාශන සඳහා සනාතන සභා සම්මාන




රූපසටහන 18: 2024 වර්ෂයේදී පීඨය විසින් පර්යේෂණ ප්‍රදාන සඳහා දරන ලද වියදම් ප්‍රමාණය

# හැඳින්වීම

කැලණිය විශ්වවිද්‍යාලය ආරම්භ වන්නේ 1875 දී රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමියන් විසින් බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපනික මධ්‍යස්ථානයක් ලෙස ආරම්භ කරන ලද ඓතිහාසික විද්‍යාලංකාර පිරිවෙනෙනි. 1940 සහ 1950 දශකවල ශ්‍රී ලංකාවේ නවීන විශ්වවිද්‍යාල පිහිටුවීමත් සමග විද්‍යාලංකාර පිරිවෙන 1959 දී විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය බවටත්, පසුව 1972 දී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපය බවටත්, අවසානයේ 1978 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලය බවටත් පත් විය.

මෙම විශ්වවිද්‍යාලය පීඨ හතකින්, අධ්‍යයන අංශ 58 කින් සහ වෙනත් අධ්‍යයන ඒකක හතරක් සහ පාලි හා බෞද්ධ අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය සහ පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය යන අනුබද්ධ ආයතන දෙකකින් සමන්විත වේ.

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන, පශ්චාත් උපාධි අධ්‍යයන, මානවශාස්ත්‍ර, විද්‍යා සහ සමාජීය විද්‍යා පීඨ දළුගම විශ්වවිද්‍යාලීය ප්‍රධාන පරිශ්‍රයේ ස්ථාපනය කර ඇති අතර වෛද්‍ය පීඨය රාගම පිහිටා ඇත. පරිගණක හා තාක්ෂණ පීඨය මේ වන විට කැලණිය බුළුගහ හන්දියේ නව ගොඩනැගිලි සංකීර්ණයකට රැගෙන ගොස් ඇත.

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය, වෛද්‍ය මධ්‍යස්ථානය, ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ප්‍රධාන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය සහ මධ්‍යම පරිපාලන අංශ ද වෙනත් පහසුකම් සපයනු ලබන අංශ වශයෙන් ප්‍රධාන මණ්ඩපයේ පිහිටා ඇත. තවද, භික්ෂු නේවාසිකාගාරය මෙන්ම කාන්තා නේවාසිකාගාර සංකීර්ණය දළුගම පරිශ්‍රය තුළ ද, අතිරේක පිරිමි සහ කාන්තා නේවාසිකාගාර ප්‍රධාන විශ්වවිද්‍යාල පරිශ්‍රය අවට ද ස්ථාපනය කර ඇත. වෛද්‍ය පීඨයේ පරිපාලන අංශ, නේවාසිකාගාර සංකීර්ණය, ක්‍රීඩා පහසුකම් සහ පීඨ පුස්තකාලය රාගම පරිශ්‍රයේ පිහිටා ඇත.

කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ පුරෝගාමියෙකු ලෙස කැපී පෙනෙයි. සිංහල භාෂාවෙන් විද්‍යා පාඨමාලා පිරිනැමූ පළමු ආයතනය එය වූ අතර විශේෂිත ක්ෂේත්‍රවල අධ්‍යයන දෙපාර්තමේන්තු පිහිටුවීමට ද මඟ පෙන්වා ඇත. නිදසුනක් වශයෙන්, විද්‍යා පීඨය යටතේ ස්ථාපනය කළ කාර්මික කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ ක්ෂුද්‍රජීව විද්‍යා දෙපාර්තමේන්තුව අප දිවයින තුළ එම ආකාරයේ අධ්‍යයන දෙපාර්තමේන්තු ස්ථාපනය කළ පළමු අවස්ථාව විය. ඒ හා සමානව, මානව ශාස්ත්‍ර පීඨය වාග් විද්‍යාව, ලලිත කලා, නූතන භාෂා සහ හින්දි වැනි විෂයයන් පිරිනැමූ පළමු ආයතනය වූ අතර, සමාජ විද්‍යා පීඨය ජන සන්නිවේදන දෙපාර්තමේන්තුව සහ පුස්තකාල හා විඥාපන විද්‍යා දෙපාර්තමේන්තුව හඳුන්වාදීමේ පුරෝගාමී විය.

විශේෂිත වූ විශ්වවිද්‍යාල මධ්‍යස්ථාන සහ ඒකක සමූහයක් මගින් කැලණිය විශ්වවිද්‍යාලය සිය සිසුන්ට අත්‍යවශ්‍ය සේවා රැසක් සපයයි. ශිෂ්‍ය උපදේශන කටයුතු අංශය, වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, පුද්ගලික උපදේශන ඒකකය (කලණ මිතුරු සෙවණ), වෛද්‍ය මධ්‍යස්ථානය, ශාරීරික අධ්‍යාපන මධ්‍යස්ථානය, සංස්කෘතික මධ්‍යස්ථානය, කලා මණ්ඩලය, පුස්තකාලය (පීඨ පුස්තකාල ද ඇතුළුව), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය, සහ ජාත්‍යන්තර ශිෂ්‍ය කටයුතු ඒකකය ඒ අතරින් ප්‍රධාන වේ. කැලණිය විශ්වවිද්‍යාලය මගින් විශේෂිත අරමුණු සඳහා විශේෂිත මධ්‍යස්ථාන සහ ඒකක ද ස්ථාපනය කර ඇත. තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA), උපාය මාර්ගික සැලසුම් සහ විශ්වවිද්‍යාල සංඛ්‍යාන සඳහා මධ්‍යස්ථානය (CSPS), කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, මාධ්‍ය ඒකකය, තාක්ෂණ හා නවෝත්පාදන ආධාරක මධ්‍යස්ථානය, තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය (CSS), ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය (CGS), දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය (CDCE), උපායමාර්ගික සන්නාම අනන්‍යතා සංවර්ධනය සඳහා වූ විශිෂ්ටතා මධ්‍යස්ථානය (CBID), මොඩියුල පද්ධතිය සම්බන්ධීකරණය කිරීමේ අන්තර් පීඨ මධ්‍යස්ථානය (ICCMS) සහ තාක්ෂණ හුවමාරු සහ කර්මාන්ත සම්බන්ධතා මධ්‍යස්ථානය (CTTIL) යනු මෙම විශේෂිත මධ්‍යස්ථාන සහ ඒකක වේ.

අධ්‍යයන කාර්ය මණ්ඩලය, පරිපාලන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය මගින් විශ්වවිද්‍යාලයේ මානව සම්පත් නියෝජනය කරනු ලබන අතර පහත සඳහන් රූපසටහන විශ්වවිද්‍යාලයේ සංවිධාන ව්‍යුහය නිරූපණය කරයි. (රූප සටහන 19)




රූපසටහන 19: සංවිධාන ව්‍යුහය

# 1.1. සමාලෝචිත වර්ෂය

## 1.1.1. හැඳින්වීම

2024 වර්ෂයේ දී, කැලණිය විශ්වවිද්‍යාලය එහි අධ්‍යයන වැඩසටහන්, පර්යේෂණ හැකියාවන් සහ ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් වැඩිදියුණු කිරීම මගින් අධ්‍යයන විශිෂ්ටත්වය සහ ගෝලීය සම්බන්ධතාවය සඳහා වූ විශ්වවිද්‍යාලයේ කැපවීම ශක්තිමත් කර ඇත. වේගයෙන් විකාශනය වන ගෝලීය අධ්‍යාපන භූ දර්ශනය හඳුනා ගැනීම තුළින් විශ්වවිද්‍යාලය තරඟකාරීත්වයෙන් යුක්තව කටයුතු කිරීම සඳහා උපායමාර්ගික මුලපිරීම් ක්‍රියාත්මක කර ඇත. භෞතික හා ඩිජිටල් ඉගෙනුම් පරිසර දෙකම ප්‍රශස්ත කිරීම මගින්, එය දක්ෂතා සහ නවෝත්පාදනයන් පෝෂණය කරන ගතික, ඉදිරිගාමී වාතාවරණයක් නිර්මාණය කර ඇත. කැලණිය විශ්වවිද්‍යාලය ගෝලීය අභියෝගවලට අනුවර්තනය වෙමින්, උසස් අධ්‍යාපනයේ ප්‍රමුඛයෙකු ලෙස ස්ථානගත වෙමින්, දැනුම ආර්ථිකය ඉදිරියට ගෙන යාමට සහ ගුණාත්මක අධ්‍යාපනය සහ සහයෝගීතාවය අවධාරණය කිරීම තුළින් ගෝලීය තරඟකාරිත්වයට දායක වීමට කැපවී සිටී.

කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමිය ලෙස ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආචාර්ය එන්.ආර්. ද සිල්වා මහත්මිය අඛණ්ඩව එළදායී මග පෙන්වීමක් ලබා දුන් අතර, අනෙකුත් ප්‍රධාන පරිපාලන තනතුරු සියල්ලම පාහේ නොවෙනස්ව පැවතුනි; එකම වෙනස වූයේ ඔක්තෝම්බර් මාසයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ධුරයට හිටපු පීඨාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඩී.කේ.පී.ජේ. සෙනෙවිරත්න මහතා පත් කිරීමෙන් පසුව, උපාධි අධ්‍යයන පීඨයේ වැඩබලන පීඨාධිපතිවරයා ලෙස ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි මහතා පත් කිරීමය. මහාචාර්ය ඩබ්ලිව්.එම්.සී.බී. වන්නිනායක මහතා වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ පීඨාධිපතිධුරය දරන ලද අතර, ආචාර්ය ආර්.එල්.සී.එස්. පුෂ්පකුමාර මහතා පරිගණක තාක්ෂණ පීඨයේ පීඨාධිපති ධුරය අඛණ්ඩව දරන ලදී. ඒ හා සමානව, ආචාර්ය යූ.එස්. සෙනරත් සහ මහාචාර්ය එම්.එන්. චන්ද්‍රතිලක මහතා අනුපිළිවෙලින් මානව ශාස්ත්‍ර පීඨයේ සහ වෛද්‍ය පීඨයේ පීඨාධිපතිවරුන් ලෙස ඔවුන්ගේ වගකීම් ඉටු කළහ. ඊට අමතරව, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි මහතා විද්‍යා පීඨයේ පීඨාධිපති ලෙසත්, මහාචාර්ය එම්.එම්. ගුණතිලක සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති ලෙසත් අඛණ්ඩව කටයුතු කළහ. මෙම පළපුරුදු නායකත්ව කණ්ඩායම සාමූහිකව පාලනයේ අඛණ්ඩතාව සහතික කළ අතර විශ්වවිද්‍යාලයේ තිරසාර අධ්‍යයන විශිෂ්ටත්වයට ද දායක වූහ.

විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ අධ්‍යයන විශේෂඥතාව ජාතික වශයෙන් පිළිගැනීමට ලක් වූ අතර, අනෙකුත් ආයතන සහ සංවිධානවල ඉහළ තනතුරු සඳහා සාමාජිකයින් කිහිප දෙනෙකු පත් කරන ලදී. විශේෂයෙන්, මහාචාර්ය එන්.ඩී.කේ.පී.ජේ. සෙනෙවිරත්න විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) සභාපති ලෙසත්, මහාචාර්ය චන්දිම බෝගහවත්ත ශ්‍රී ලංකා මධ්‍යම සංස්කෘතික අරමුදලේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ධුරයට පත් කරන ලද අතර, ආචාර්ය යූ.ජී. ගුණසේකර මහතා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති ලෙසත්, මහාචාර්ය එස්.ඩී.පී.එම්. මනුරත්න විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය/සාධාරණත්වය සඳහා වූ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා ලෙසත්, මහාචාර්ය පී. නාරංගොඩ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන ජාතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ලෙසත්, මහාචාර්ය පී.බී. ගල්හේන මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන විද්‍යාව, අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ ලෙසත්, ආචාර්ය රොමෝලා රසූල් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ ලෙසත් පත් කරන ලදී. මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අභයරත්න, මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන සහ අනුර කරුණාතිලක මහතා විශ්වවිද්‍යාලයේ සිය තනතුරුවලින් ඉවත් වී අලුතින් තේරී පත් වූ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමට එක්විය.

## 1.1.2. අධ්‍යයන ක්‍රියාකාරකම්, සිසුන් බඳවා ගැනීම සහ උපාධිය ලබා දීම

කැලණිය විශ්වවිද්‍යාලය 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා අධ්‍යයන කටයුතු 2024 පෙබරවාරි මාසයේදී ආරම්භ කළ අතර, සියලුම දේශන භෞතිකව පැවැත්වීම නැවත ආරම්භ කරන ලදී.

2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා නව අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් 4,088 දෙනෙකු ඇතුළත් කර ගත් අතර, එමගින් 2024 වර්ෂයේ දී ඇතුළත් කර ගත් සමස්ත අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව 15,747

දක්වා ඉහළ ගොස් තිබුණි. ඊට අමතරව, ප්‍රථම උපාධි පාඨමාලා සඳහා එම අධ්‍යයන වර්ෂයම සඳහා විදේශීය සිසුන් 34 දෙනෙකු අලුතින් ඇතුළත් කර ගන්නා ලදී. විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි වැඩසටහන් සඳහා සිසුන් 75,158 දෙනෙකු ඇතුළත් වූ අතර, පශ්චාත් උපාධි බඳවා ගැනීම් සංඛ්‍යාව 2,666 ක් විය.

2024 වර්ෂයේ දී, විශ්වවිද්‍යාලය අභ්‍යන්තර උපාධි වැඩසටහන්වලින් උපාධිධාරීන් 3,094 ක්, බාහිර උපාධි වැඩසටහන්වලින් 2,562 ක් සහ පශ්චාත් උපාධි වැඩසටහන්වලින් 1,363 ක් බිහි කරන ලදී. තවද, 2024 වර්ෂය තුළ උපාධි ප්‍රදානෝත්සව නවයක් පවත්වා ඇත.

## 1.1.3. කාර්ය මණ්ඩල පත් කිරීම්, සහ ඉල්ලා අස්වීම් හෝ විශ්‍රාම ගැනීම්

2024 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලය මගින් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 30 දෙනෙකු බඳවා ගත් අතර, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 37 දෙනෙකු ඉල්ලා අස්වී හෝ විශ්‍රාම ගොස් ඇත. ඊට අමතරව, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල සාමාජිකයෙකු පත් කරන ලද අතර, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල සාමාජිකයින් 3 දෙනෙක් ඔවුන්ගේ තනතුරුවලින් ඉල්ලා අස්වූහ. එපමණක් නොව, වසර තුළ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 6 දෙනෙකු බඳවා ගන්නා ලදී. තවද, අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 15 දෙනෙකු විශ්‍රාම ලැබූ අතර, 13 දෙනෙක් ඉල්ලා අස් වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විශ්වවිද්‍යාලය නව අධ්‍යයන කාර්ය මණ්ඩල පත් කිරීම් 37 ක් සිදු කළ අතර, කාර්ය මණ්ඩල සාමාජිකයින් 68 දෙනෙක් ඉල්ලා අස්වීම හෝ විශ්‍රාම යාම මගින් විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූහ.

## 1.1.4. පර්යේෂණ සහ සංවර්ධනය සහ සම්මාන

2024 වර්ෂයේ දී, කැලණිය විශ්වවිද්‍යාලය විවිධ කාණ්ඩවලට අයත් ප්‍රකාශන 1056 ක් ප්‍රකාශයට පත් කරන ලද අතර, ඒවාට SCOPUS-සුචිගත තීරක සඟරාවල සම්පූර්ණ පත්‍රිකා, සුචිගත නොවන තීරක සඟරාවල සම්පූර්ණ පත්‍රිකා, සාරාංශ සහ සම්මන්ත්‍රණ ක්‍රියාවලියේ සම්පූර්ණ පත්‍රිකා, පොත් පරිච්ඡේද සහ පෙළපොත් ඇතුළත් වේ. මේ අතරින් ප්‍රකාශන 307 ක් SCOPUS-සුචිගත කර ඇත.

විද්වත් ජයග්‍රහණ ඇගයීම සහ පර්යේෂණ කටයුතු සඳහා විද්වතුන් දිරි ගැන්වීම සඳහා, විද්‍යා උපුටා දැක්වීමේ දර්ශකයේ (SCI), සමාජ විද්‍යා උපුටා දැක්වීමේ දර්ශකයේ (SSCI) සහ කලා සහ මානව ශාස්ත්‍ර උපුටා දැක්වීමේ දර්ශකයේ (AHCI) හි සුචිගත කර ඇති සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද ආදර්ශමත් ලිපි සඳහා පුද්ගලයින් 122 දෙනෙකුට සනාතන සභාවේ ප්‍රශංසා සහ මුදල් ත්‍යාග පිරිනමන ලදී. තවද, වසර තුළ SCOPUS-සුචිගත සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද ලිපි පළ කළ විද්වතුන් සඳහා සනාතන සභාවේ ප්‍රශංසා සහ මුදල් සම්මාන 31 ක් ප්‍රදානය කරන ලදී. ඊට සමගාමීව, SCOPUS-සුචිගත කිරීම මගින් සම්මන්ත්‍රණ කටයුතුවලදී ප්‍රකාශයට පත් කරන ලද විස්තීර්ණ පත්‍රිකා සඳහා සනාතන සභාවේ ප්‍රශංසා සහ මුදල් සම්මාන 43 ක්, පේටන්ට් බලපත්‍රලාභීන් සඳහා සනාතන සභාවේ ප්‍රශංසා සහ මුදල් සම්මාන 14 ක් ද, විදේශ සංචාර ප්‍රදාන 6ක් ද පිරිනමන ලදී.

## 1.1.5. ශ්‍රේණිගත කිරීම්

2024 දී කැලණිය විශ්වවිද්‍යාලය ගෝලීය සහ කලාපීය ශ්‍රේණිගත කිරීම්වල දී කැපී පෙනෙන ජයග්‍රහණ ලබා ගැනීමට සමත් වූ අතර, ශ්‍රී ලංකාවේ සහ ඉන් පිටත ප්‍රමුඛ ආයතනයක් ලෙස එහි ස්ථානය තහවුරු කර ගන්නා ලදී. ටයිම්ස් උසස් අධ්‍යාපන (THE) බලපෑම් ශ්‍රේණිගත කිරීම් අනුව, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාවේ 5 වැනි ස්ථානයට පත් වූ අතර ගෝලීය වශයෙන් 601-800 කාණ්ඩයේ ශ්‍රේණිගත වී තිබුණි. විශේෂයෙන්, මෙම විශ්වවිද්‍යාලය ටයිම්ස් උසස් අධ්‍යාපන ලෝක විශ්ව විද්‍යාල ශ්‍රේණිගත කිරීම් (WUR) හි 1500+ යන ගෝලීය කාණ්ඩයේ ස්ථානගත කිරීම අත්පත් කර ගත් අතර, ජාත්‍යන්තර කීර්තියක් සහිත පර්යේෂණ-තීව්‍ර ආයතනයක් වශයෙන් එහි තත්ත්වය නැවත තහවුරු කර ගන්නා ලද අතර ශ්‍රී ලංකාවේ 3 වන ස්ථානය තහවුරු කර ගැනීමට සමත් විය. එපමණක් නොව, 2025 වර්ෂයේ දී, ටයිම්ස් උසස් අධ්‍යාපන ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල සායනික හා සෞඛ්‍ය විෂය ශ්‍රේණිගත කිරීම්වල දී කැලණිය විශ්වවිද්‍යාලය 801-1000 දක්වා පරාසයක ශ්‍රේණිගත වීමට සමත් විය.

2024 වර්ෂයේ UI GreenMetric ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වලදී ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල අතර 2 වන ස්ථානය ලබා ගනිමින් සහ ගෝලීය වශයෙන් 228 වන ස්ථානය තහවුරු කර ගනිමින්, කැලණිය විශ්වවිද්‍යාලය තිරසාරභාවය සම්බන්ධ සිය නායකත්වය අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. මෙම ජයග්‍රහණය මගින් තිරසාර විසඳුම් මධ්‍යස්ථානයේ (CSS) ක්‍රියාකාරී උත්සාහයන් සහ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සමඟ එහි පාරිසරික ප්‍රතිපත්ති සහ උපායමාර්ගික ඉලක්ක පෙළගස්වා ගැනීම සම්බන්ධ විශ්වවිද්‍යාලයේ කැපවීම පිළිබිඹු කරයි.

මීට අමතරව, 2025 වර්ෂයේ දී SCIMAGO සහ QS වැනි අනෙකුත් ශ්‍රේණිගත කිරීමේ ආයතනවල සැලකිය යුතු පිළිගැනීමක් අත්පත් කර ගත් විශ්වවිද්‍යාලයක් බවට ද කැලණිය විශ්වවිද්‍යාලය පත් වූ අතර, එමඟින් අධ්‍යාපනය, පර්යේෂණ සහ තිරසාරභාවය යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වය සඳහා එහි කැපවීම තවදුරටත් අවධාරණය කෙරිණි.

## 1.1.6. වෙනත් විශේෂ අවස්ථා

කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ විද්වතුන් සිව්දෙනෙකු, ඔවුන්ගේ උපුටා දැක්වීමේ බලපෑම සහ ඔවුන්ගේ ක්ෂේත්‍රවලට කළ දායකත්වය මත පදනම්ව, ඉහළම බලපෑමක් සිදු කළ හැකි පර්යේෂකයින් ඉස්මතු කරන වාර්ෂික ගෝලීය ශ්‍රේණිගත කිරීමක් වන 2024 වර්ෂයේ ලොව ප්‍රබලම විද්‍යාඥයින් අතරින් ද ඉහළම පිළිගැනීමට ලක් වී සිටින විද්‍යාඥයන්ගේ 2% ලැයිස්තුවට ඇතුළත් කර ඇත. ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලය සහ එල්සෙවියර් විසින් සම්පාදනය කරන ලද මෙම ලැයිස්තුව මගින් ගෝලීය පර්යේෂණ ප්‍රජාවට සැලකිය යුතු බලපෑමක් ඇති කළ විද්‍යාඥයින් හඳුනා ගත හැකිය. සම්මානිත මහාචාර්ය ජනක ද සිල්වා, විශ්වවිද්‍යාලයේ උපකුලපතිනි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා, මහාචාර්ය අනුරාධනී කස්තුරිරත්න සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අසිත ද සිල්වා 2024 වර්ෂය සඳහා මෙම ලැයිස්තුවට ඇතුළත් කර ඇත.

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ විශිෂ්ට පර්යේෂකයෝ පස් දෙනෙක් 2017 සිට 2020 දක්වා නව නිපැයුම් සඳහා වූ ජනාධිපති සම්මානයෙන් පිදුම් ලැබූහ. මහාචාර්ය සුදත් කාලිංගමුදලිගේ අධීක්ෂණය යටතේ ව්‍යවහාරික විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍රය සඳහා ලෝකඩ පදක්කමක් ආචාර්ය වෙත්තසිංහගේ සමීර කැලුම් පෙරේරා දිනා ගත්තේය. මහාචාර්ය ජනිතා අබේවික්‍රම ලියනගේගේ අධීක්ෂණය යටතේ සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව සඳහා ලෝකඩ පදක්කමක් ආචාර්ය හේමා පද්මිණී වක්කුඹුරට හිමි විය. මහාචාර්ය කපිල සෙනෙවිරත්න සහ මහාචාර්ය නිමන්ති ජයතිලකගේ අධීක්ෂණය යටතේ ආහාර කාණ්ඩයේ ලෝකඩ පදක්කමක් සහ කුසලතා සම්මානයක් ආචාර්ය චතුරි මහේෂිකා සේනානායකට හිමි විය.

2024 වර්ෂයේ දී, කැලණිය විශ්වවිද්‍යාලය තරඟවලදී සැලකිය යුතු ජයග්‍රහණ ලබා ගත් අතර, ජාත්‍යන්තර මානව හිමිකම් දිනයට සමගාමීව කැපිටල් මහරාජා සමූහය (CMG) විසින් සංවිධානය කරන ලද 2024 අන්තර් විශ්වවිද්‍යාල මානව හිමිකම් විවාද තරඟයේ ශූරතාවය විශ්වවිද්‍යාලයීය විවාද කණ්ඩායම දිනා ගන්නා ලදී. මෙමඟින් අඛණ්ඩව දෙවන වරටත් එම ජයග්‍රහණය සනිටුහන් කර ගනිමින්, විවාද ක්ෂේත්‍රයේ ඔවුන්ගේ ආධිපත්‍යය නැවත තහවුරු කිරීමට සමත් විය. එපමණක් නොව, පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගමයේ සාහිත්‍ය අනු කමිටුව විසින් සංවිධානය කරන ලද "ශාන්ත බණ්ඩාර අනුස්මරණ අන්තර් විශ්වවිද්‍යාල විවාද තරඟාවලියේ" සමස්ත ලංකා ශූරතාව දිනා ගැනීමට ද කැලණිය විශ්වවිද්‍යාල සිසුන් සමත් විය.

2024 වර්ෂයේ පැවති අන්තර් විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා උළෙලේදී කැලණිය විශ්වවිද්‍යාලය නියෝජනය කළ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සමස්ත අනුශූරතාව දිනා ගනිමින් වසර 40කට පසු ලැබූ ඉහළම ජයග්‍රහණය සනිටුහන් කළහ.

මෙම වසරේදී සැලකිය යුතු සංස්කෘතික හා ප්‍රජා සන්ධිස්ථාන ද සනිටුහන් කරන ලදී. විශ්වවිද්‍යාලයීය නිල සංගීත කණ්ඩායම වන "UoK Pulse" ආරම්භ කිරීම මගින් සිසුන්ගේ නිර්මාණශීලිත්වය සහ කුසලතා සැමරීම සඳහා සජීවී වේදිකාවක් සැපයීය. තවද, "හෙලබොජුන්" ආපන ශාලාව විවෘත කිරීමත් සමඟ සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික ආහාර හඳුන්වා දුන් අතර, එමඟින් සෞඛ්‍ය සම්පන්න ආහාර පුරුදු ප්‍රවර්ධනය කළ අතර සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට අද්විතීය සංස්කෘතික අත්දැකීමක් ද ලබා දීමට එමඟින් හැකි විය.

# 1.2. ඉදිරි දැක්ම

කැලණිය විශ්වවිද්‍යාලය වසර තුනක උපායමාර්ගික සැලසුම් චක්‍රයක් මත ක්‍රියාත්මක වන අතර වත්මන් චක්‍රය 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා විහිදේ. සෑම වසරකම, විශ්වවිද්‍යාලය තුළ ඇති සියලුම උපායමාර්ගික ඒකක, ආයතනයේ ප්‍රධාන ඉලක්ක පහේ ප්‍රගතිය සහතික කරමින්, සමස්ත උපායමාර්ගික සැලැස්මට අනුකූලව ඔවුන්ගේ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සංවර්ධනය කරයි. මෙම ඉලක්ක මගින් විශ්වවිද්‍යාලයේ මූලික උපායමාර්ගික ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කෙරේ:

- ඉලක්කය 1: ඉගැන්වීම සහ ඉගෙනීම: උසස් තත්ත්වයේ නම්‍යශීලී ඉගැන්වීම් සහ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම.
- ඉලක්කය 2: මානව සම්පත් සංවර්ධනය: විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ඉහළම ගුණාත්මක භාවයෙන් යුත් පීඨ සහ කාර්ය මණ්ඩලයක් සංවර්ධනය කිරීම.
- ඉලක්කය 3: පර්යේෂණ සහ නවෝත්පාදන: ගෝලීය වශයෙන් පිළි ගත් බහු-ක්ෂේත්‍ර පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීම.
- ඉලක්කය 4: ආර්ථික හා සමාජීය වගකීම: ආර්ථික හා සමාජීය සම්බන්ධතා පරාසය පුළුල් කිරීම මගින් විශ්වවිද්‍යාලයේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම.
- ඉලක්කය 5: පරිපාලනය සහ යහපාලනය: කාර්යක්ෂම හා ඵලදායී පරිපාලනය සහ මූල්‍ය කළමනාකරණය තුළින් විශිෂ්ට පාලන පද්ධතියක් සංවර්ධනය කිරීම.

මෑත අතීතයේ දී රට මුහුණ දුන් අභියෝග මධ්‍යයේ වුවද, කැලණිය විශ්වවිද්‍යාලය එහි උපායමාර්ගික ප්‍රමුඛතා හරහා කැපී පෙනෙන ඔරොත්තු දීමේ හැකියාවක් සහ ප්‍රගතියක් වාර්තා කර ඇත. 2024 මැද භාගය වන විට, විශ්වවිද්‍යාලය වසර සඳහා යෝජිත ක්‍රියාකාරකම් වලින් 64% ක් සාර්ථකව නිම කර ඇති අතර, එමඟින්, ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ දැඩි කැපවීම පිළිබිඹු කෙරේ.

ජාත්‍යන්තර වේදිකාවේ ද, විශ්වවිද්‍යාලය සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත:

- ගෝලීය ආයතන 1,400 කට අධික සංඛ්‍යාවක් අතර 228 වන ස්ථානය සහ තිරසාරභාවය වෙනුවෙන් එහි කැපවීම මැනවින් විදහා දක්වමින් හරිත ප්‍රමිතික ශ්‍රේණිගත කිරීම්වල ජාතික වශයෙන් 2 වන ස්ථානය ලබා ගන්නා ලදී.
- ශ්‍රී ලංකාවේ 3 වන ස්ථානය ලබා ගත් අතර තිරසාර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ දායකත්වය අවධාරණය කරමින් ටයිම්ස් උසස් අධ්‍යාපන බලපෑම් ශ්‍රේණිගත කිරීම්වල 601-800 ගෝලීය කාණ්ඩය තුළ විශ්වවිද්‍යාලය ශ්‍රේණිගත කර ඇත.

2030 වර්ෂයෙන් ඔබ්බට ද විහිදෙන දැක්මක් සහිතව, විශ්වවිද්‍යාලය එහි ගෝලීය තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා කැපවී සිටී. ඉදිරියේ දී, කැලණිය විශ්වවිද්‍යාලය ජාතික තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට දායකත්වය දැක්වීම, රැකියා ලබා ගැනීම සඳහා උපාධිධාරීන්ට ඇති හැකියාව වැඩි දියුණු කිරීම සඳහා මෙන්ම උසස් තත්ත්වයේ පර්යේෂණ සහ නවෝත්පාදන ඉදිරියට ගෙන යාම සඳහා ද ප්‍රමුඛත්වය දෙනු ඇත. කෙසේ වුවද, සීමිත යටිතල පහසුකම් වැනි අභියෝග කෙටිකාලීන අරමුණු සම්පූර්ණයෙන් සාක්ෂාත් කර ගැනීමට බාධා කරයි.

ඒ සඳහා දක්වන ප්‍රතිචාරයක් වශයෙන්, විශ්වවිද්‍යාලය පහත සඳහන් සමාරම්භක ක්‍රියාත්මක කර ඇත:

- ජාත්‍යන්තර සහ ජාතික සහයෝගීතා ශක්තිමත් කිරීම.
- දේශීය සහ ගෝලීය වෙළඳපොළවල් දෙකටම ගැළපෙන නව අධ්‍යයන වැඩසටහන් හඳුන්වා දීම.
- ඉගැන්වීම, ඉගෙනීම, පර්යේෂණ සහ තිරසාරත්වය පිළිබඳ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම.

මතු වන අභියෝග සහ අවස්ථා වඩා හොඳින් හැසිරවීම සඳහා, විශ්වවිද්‍යාලය එහි උපායමාර්ගික සැලැස්ම ක්‍රමානුකූලව සංශෝධනය කර ඇත. මෙම යාවත්කාලීන කරන ලද සැලැස්ම සුචලතාව සහ නවෝත්පාදනය සඳහා නව කැපවීමක් පිළිබිඹු කරන අතර, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ සාර්ථකත්වය සඳහා පැහැදිලි මාවතක් සකසයි. ඉදිරි වසරවලදී අපගේ සාමූහික උත්සාහයන්ට මඟ පෙන්වන මෙම වැඩිදියුණු කළ උපාය මාර්ගය එළිදැක්වීමට අපි ඉමහත් ආශාවෙන් අපේක්ෂා කරමු.



# විශ්වවිද්‍යාල පාලනය

කැලණිය විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ දක්වා ඇති සංවිධාන ව්‍යුහය සහ වගකීම්වලට ද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ මගින් කලින් කලට පනවනු ලබන රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට අනුකූලව ද කටයුතු කරයි.

විශ්වවිද්‍යාල පාලක සභාව, සනාතන සභාව සහ පීඨ මණ්ඩල යනු විවිධ ක්‍රියාකාරී මට්ටම්වලදී මාර්ගෝපදේශ සම්පාදනය කරන ව්‍යවස්ථාපිත ආයතන වේ. කැලණිය විශ්වවිද්‍යාලයේ සංවිධාන ව්‍යුහය සියළුම කාර්ය මණ්ඩලයේ තනතුරු සහ ඔවුන්ගේ රාජකාරි, වගකීම් සහ විධාන දාමය නිර්වචනය කරයි.

## 2.1. විශ්වවිද්‍යාලයේ කුලපති, උපකුලපති සහ නිලධාරීන්

කුලපතිවරයා උපාධි ප්‍රදානෝත්සවය මෙහෙයවනු ලබන විශ්වවිද්‍යාලයේ ප්‍රධානියා වන අතර උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අධ්‍යයන නිලධාරී සහ ගිණුම්කරණ නිලධාරියා ද වේ. උපකුලපතිවරයා විශ්වවිද්‍යාල පාලක සභාවේ සහ සනාතන සභාවේ නිල බලයෙන් සාමාජිකයෙකු ද, සභාපතිවරයා ද වන අතර විශ්වවිද්‍යාල පාලක සභාව සහ සනාතන සභාව විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම ද දරයි. පීඨාධිපතිවරයා සෑම පීඨයකම අධ්‍යයන හා පරිපාලන ප්‍රධානියා වන අතර එක් එක් පීඨ මණ්ඩලයේ නිල බලයෙන් සභාපතිවරයා ද වේ. ඔවුහු විශ්වවිද්‍යාල පාලක සභාවේ සහ සනාතන සභාවේ නිල බලයෙන් සාමාජිකයෝ වෙති. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා, සනාතන සභාවේ මඟපෙන්වීමට සහ පාලනයට යටත්ව, විශ්වවිද්‍යාලය තුළ සිදුකරන පශ්චාද් උපාධි අධ්‍යයන මෙන්ම සුවිශේෂී හෝ බහු ශික්ෂණ පර්යේෂණ සම්බන්ධීකරණය සහ නියාමනය කිරීමේ වගකීම දරයි. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විනය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ලේඛකාධිකාරිවරයා වගකිව යුතු වන අතර විශ්වවිද්‍යාලයේ වාර්තා සහ දේපළවල භාරකාරත්වය ද දරයි. ඔහු විශ්වවිද්‍යාල පාලක සභාවේ සහ සනාතන සභාවේ නිල බලයෙන් ලේකම්වරයා ද වේ. පුස්තකාලයාධිපතිවරයා විශ්වවිද්‍යාලීය පුස්තකාලයේ මෙහෙයුම් සම්බන්ධයෙන් වගකිව යුතු වන අතර සනාතන සභාවේ නිල බලයෙන් සාමාජිකයෙකු ද වේ. විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමනාකරණය සිදු කිරීම සහ එහි ගිණුම් පවත්වාගෙන යාමේ වගකීම මූල්‍යාධිකාරිවරයා සතු වේ.

## 2.2. විශ්වවිද්‍යාල පාලක සභාව

විශ්වවිද්‍යාල පාලක සභාව යනු විශ්වවිද්‍යාලයේ විධායක සහ පාලන අධිකාරියයි. උපකුලපතිවරයා, පීඨාධිපතිවරුන් සත් දෙනෙකු, සනාතන සභාව විසින් එහි සාමාජිකයින් අතරින් ඡන්දයෙන් තෝරා පත් කර ගත් සාමාජිකයන් දෙදෙනෙකු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත් කරන ලද සාමාජිකයින් එකොළොස් දෙනෙකුගෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව සමන්විත වේ. උපකුලපතිවරයා විශ්වවිද්‍යාල පාලක සභාවේ මුලසුන හොබවන අතර ලේඛකාධිකාරිවරයා පාලක සභාවේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි. අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ උසස් කිරීම සඳහා වන සියලුම තේරීම් කමිටුවල මෙන්ම පහත සඳහන් ව්‍යවස්ථාපිත කමිටුවල ද විශ්වවිද්‍යාල පාලක සභා සාමාජිකයෝ සේවය කරති:

- මූල්‍ය කමිටුව
- විගණන කමිටුව
- දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ කළමනාකරණ කමිටුව

උපකුලපතිවරයා මුලසුන හොබවන තත්ත්ව ආරක්ෂණ සනාතන සභා ස්ථාවර කමිටුවේ, ඉඩම් සහ ගොඩනැගිලි කළමනාකරණ සහ සංවර්ධන කමිටුවේ සහ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ද විශ්වවිද්‍යාල පාලක සභාවේ සාමාජිකයෝ සේවය කරති. මෙයට අමතරව, ඔවුහු ආචාර ධර්ම සමාලෝචන කමිටුව, කාර්ය මණ්ඩල සංවර්ධන කළමනාකරණ කමිටුව, පර්යේෂණ සභාව වැනි උප කමිටුවල ද සේවය කරති.

වගුව 1: විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ සාමාජිකයෝ

| නම | රැස්වීම්වලට සහභාගී වීම (2024.01.01 සිට 2024.12.31 දක්වා) |
|---|---|
| **උප කුලපති** | |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ආර්. ද සිල්වා මිය | 13 |
| **පීඨාධිපතිවරුන්** | |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඒ.කේ.පී.ජේ. සෙනෙවිරත්න[1] | 11 |
| මහාචාර්ය ඩබ්ලිව්.එම්.සී.බී. වන්නිනායක / වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය | 13 |
| ආචාර්ය ආර්.එල්.සී.එස්. පුෂ්පකුමාර / පරිගණක හා තාක්ෂණ පීඨය | 13 |
| ආචාර්ය යූ.එස්. සෙනරත්/ මානවශාස්ත්‍ර පීඨය | 13 |
| මහාචාර්ය එම්.එන්. චන්ද්‍රතිලක / වෛද්‍ය පීඨය | 13 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි/ විද්‍යා පීඨය / පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | 13 |
| මහාචාර්ය එම්.එම්. ගුණතිලක / සමාජීය විද්‍යා පීඨය | 13 |
| **සනාතන සභා නාමික** | |
| මහාචාර්ය ඩබ්ලිව්.එම්. සේමසිංහ | 12 |
| මහාචාර්ය එස්.එස්. වැලිගමගේ මිය | 13 |
| **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පත්වීම්ලාභීන්** | |
| මහාචාර්ය එච්. අබේගුණවර්ධන (2023.01.16 - 2026.01.15) | 9 |
| මහාචාර්ය රංජිත් අර්ථනායක (2023.01.16 - 2026.01.15) | 13 |
| එල්.ටී. සුසන්ත සිල්වා (2023.01.16 - 2026.01.15) | 12 |
| එස්.කේ. සිරිල් සුදුවැල්ල (2023.01.16 - 2026.01.15) | 10 |
| මේරි ටී ඩික්මන් මහත්මිය[2] | 4 |
| පූජ්‍ය වැලමිටියාවේ ඤාණරතන නායක හිමි (2023.01.16 - 2026.01.15) | 12 |
| මහාචාර්ය කල්‍යාණි පෙරේරා (2023.01.16 - 2026.01.15) | 12 |
| සිරි රණසිංහ මහතා[3] | 0 |
| උදය රංජිත් සෙනෙවිරත්න මහතා (2023.01.24 - 2026.01.15) | 12 |
| ටී.ආර්. වරුණ ධනපාල (2023.06.08 - 2026.01.15) | 13 |
| අනුජ කෞශික ප්‍රේමරත්න මහතා[4] | 3 |
| ආචාර්ය වෙනුර සිංගාරච්චි [5] | 1 |
| සුභාෂිනී මුණසිංහ මෙනවිය (2024.10.08 - 2026.01.15) | 2 |
| ආචාර්ය එස් ටෙරන්ස් ගාමිණී රාජා ද සිල්වා (2024.10.08 - 2026.01.15) | 2 |
| කේ.ඒ.එස්. ජුඩ් නානායක්කාර (2024.10.08 - 2026.01.15) | 3 |
| **සභාවේ ලේකම් - ලේඛකාධිකාරී (නිල බලයෙන්)** | |
| කේ.කේ.කේ. ධර්මතිලක මහතා | 13 |

1. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඒ.කේ.පී.ජේ. සෙනෙවිරත්න මහතාගේ පත්වීම් කාලය 2024 ඔක්තෝබර් 17 වන දිනෙන් අවසන් විය.
2. මේරි ටී. ඩික්මන් මහත්මිය 2023 ජනවාරි 16 වන දින සිට 2024 අගෝස්තු 13 වන දින දක්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පත්වීම්ලාභියෙකු විය.
3. සිරි රණසිංහ මහතා 2023 ජනවාරි 16 වන දින සිට 2024 ජනවාරි 09 වන දින දක්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පත්වීම්ලාභියෙකු විය.
4.අනුජ කෞෂික ප්‍රේමරත්න මහතා 2023 ජනවාරි 16 වන දින සිට 2024 අගෝස්තු 13 වන දින දක්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පත්වීම්ලාභියෙකු විය.
5. ආචාර්ය වෙනුර සිංගාරච්චි මහතා 2023 මාර්තු 11 වන දින සිට 2024 ජූලි 23 වන දින දක්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පත්වීම්ලාභියෙකු විය.

## 2.3. සනාතන සභාව

සනාතන සභාව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අධිකාරිය වන අතර උපකුලපතිවරයා නිලබලයෙන් සනාතන සභාවේ සභාපතිවරයා ද වේ. පුරාවිද්‍යා පශ්චාද් උපාධි ආයතනයේ (PGIAR) සහ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ආයතනයේ (PGIPBS) අධ්‍යක්ෂවරුන්, පීඨාධිපතිවරුන්, අධ්‍යයන අංශ ප්‍රධානීන්, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් සහ මහාචාර්යවරුන්, පුස්තකාලයාධිකාරී සහ අදාළ පීඨයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් අතරින් තේරී පත්වන අධ්‍යයන සාමාජිකයින් දෙදෙනෙකුගෙන් ද සනාතන සභාව සමන්විත වේ.

සනාතන සභාව මගින් එහි රාජකාරී කටයුතු ඉටු කිරීමේ දී, පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා ස්ථාවර කමිටු කිහිපයක් පත් කර ඇත. එක් එක් කමිටුවේ සංයුතිය සහ අභියෝගය පිළිබඳ වැඩිදුර විස්තර මෙම වාර්තාවේ 2.7 වගන්තියේ දක්වා ඇත.

- ඇතුළත් කිරීම්
- විෂයමාලාව, ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම
- ගෞරව උපාධි
- නිවාඩු සහ සම්මාන
- පුස්තකාලය
- තත්ත්ව ආරක්ෂණය
- පර්යේෂණ සහ ප්‍රකාශන

## 2.4. පීඨ මණ්ඩල

සනාතන සභාවේ පාලනයට යටත්ව අදාළ පීඨවල ඉගැන්වීම්, විභාග සහ පර්යේෂණ සම්බන්ධ කරුණු නියාමනය කරනු ලබන්නේ පීඨ මණ්ඩල මගිනි. සියලුම අධ්‍යයන අංශ අදාළ පීඨ මණ්ඩලයේ විෂය පථය යටතට ඇතුළත් වේ. අදාළ අධ්‍යයන අංශයේ විෂයමාලා සංවර්ධනය, ඉගැන්වීම්, ඇගයීම්, පර්යේෂණ සහ අනෙකුත් අදාළ අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් අධ්‍යයන අංශ වගකිව යුතු වේ.

## 2.5. පාලන ලේඛනඃ උපාය මාර්ගික සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2022-2024 සඳහා වන උපායමාර්ගික සැලැස්ම පිළියෙළ කර ඇත්තේ විශ්වවිද්‍යාලයේ අත්‍යවශ්‍ය ආයතනික තීරණවලට බලපෑම් කරමින්, කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ ප්‍රමුඛ අවශ්‍යතා ඉටු කරන අතරම ඉදිරි වසර තුන සඳහා විශ්වවිද්‍යාලයේ සමස්ත දැක්ම එහි හවුල්කරුවන් සමඟ බෙදා ගැනීමට හැකි වන පරිදි ප්‍රායෝගික, තාත්වික සහ අදාළ වන පරිදිය. ඉදිරි වසර තුන තුළ විශ්වවිද්‍යාලයේ කටයුතු මෙහෙයවනු ලබන වටිනාකම් මාලාවක් ප්‍රකාශ කිරීමේ වේදිකාවක් ලෙස ද මෙය ක්‍රියා කරයි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මගින් 2022-2024 කාලසීමාව සඳහා විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සැලැස්මට අනුකූලව 2024 වර්ෂය සඳහා වන ක්‍රියාකාරකම් කෙරෙහි ඍජුවම අවධානය යොමු කර ඇත. උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම ද විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කර ඇත.

මෙම උපායමාර්ගික රාමුව ඉගැන්වීම් සහ ඉගෙනුම් වැඩිදියුණු කිරීම, පීඨ සාමාජිකයින් සහ කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම, ලෝක මට්ටමේ පර්යේෂණ සංස්කෘතියක් ගොඩනැගීම, සමාජ හා ආර්ථික සම්බන්ධතාව ශක්තිමත් කිරීම, සහ කාර්යක්ෂම පාලනය සහ මූල්‍ය කළමනාකරණය සහතික කිරීම යනාදී වශයෙන් වන මූලික අරමුණු පහක් කේන්ද්‍ර කර ගෙන ගොඩනගා ඇත. මෙම සෑම අරමුණක්ම විශ්වවිද්‍යාලයේ සමස්ත දැක්ම හා මෙහෙවරට අනුකූලව පෙළගස්වා ඇති අතර, පැහැදිලි අරමුණු, මැනිය හැකි ක්‍රියාමාර්ග, ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs), සහ අයවැය වෙන් කිරීම් මගින් ඒවාට සහාය ලැබේ. මේවා ආයතනයේ වර්තමාන තත්ත්වය

වැඩිදියුණු කිරීමට පමණක් නොව, ජාතික හා ගෝලීය මට්ටමින් උසස් අධ්‍යාපනයේ අනාගත ඉල්ලීම් සපුරාලීම සඳහා විශ්වවිද්‍යාලය සූදානම් කිරීමටද සැලසුම් කර ඇත.

පළමු අරමුණ තුළින් උසස් තත්ත්වයේ සහ නම්‍යශීලී ඉගැන්වීම් සහ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, විෂයමාලා සංශෝධනය කිරීම, සහ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සහ ගෝලීය ශාස්ත්‍රීය ආයතන සමඟ සබඳතා දිරිගැන්වීම මගින් ජාත්‍යන්තරකරණය වැඩිදියුණු කිරීම මෙහි අරමුණයි. මෘදු කුසලතා, ප්‍රායෝගික අත්දැකීම්, මෙන්ම ශාරීරික හා මානසික යන දෙඅංශයෙන්ම ශිෂ්‍ය සුභසාධනය සහතික කිරීම කෙරෙහි ද අවධාරණය කෙරේ. ජාත්‍යන්තර සිසුන් සහ විශේෂ අවශ්‍යතා ඇති සිසුන් ඇතුළුව විවිධ පසුබිම්වලින් පැමිණෙන සිසුන්ට සහාය වීම සඳහා ප්‍රවේශ්‍යතාව සහ අන්තර්ගතභාවයට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. මෙම අරමුණ සඳහා වන ප්‍රධාන කාර්ය සාධන දර්ශක අතරට 91%ක අභ්‍යන්තර උපාධි සම්පූර්ණ කිරීමේ අනුපාතයක්, උපාධිය ලබා මාස හයකට පසු 87%ක රැකියා නියුක්ත වීමේ අනුපාතයක්, සහ ඉගැන්වීම් සඳහා 84%ක, ආබාධිත සිසුන් සඳහා 90%ක, පුස්තකාල සේවා සඳහා 76%ක, සහ තොරතුරු තාක්ෂණ, සුභසාධන, සහ වෛද්‍ය පහසුකම් සඳහා 70%කට වැඩි ශිෂ්‍ය තෘප්තිකර අනුපාත 2024 වන විට ළඟා කර ගැනීම ඇතුළත් වේ. ක්‍රීඩා සහ සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලට සහභාගීත්වය ද පිළිවෙලින් 40% සහ 69% දක්වා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

දෙවන අරමුණ වනුයේ ඉහළම තත්ත්වයේ අධ්‍යයන, පරිපාලන, සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, සංවර්ධනය කිරීම, සහ රඳවා තබා ගැනීම සහතික කිරීමයි. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, සැලැස්මට ශ්‍රම බලකා සැලසුම්කරණය, අනුප්‍රාප්තික සැලසුම්කරණය, රැකියා මාරු කිරීම, සහ වෘත්තීය දියුණුව සඳහා වන යාන්ත්‍රණ ඇතුළත් වේ. සෞඛ්‍ය, මානසික සුවතාව, සහ සේවා ස්ථානයේ තෘප්තිය කෙරෙහි අවධානය යොමු කළ වැඩසටහන් හරහා කාර්ය මණ්ඩල සුභසාධනය සම්බන්ධයෙන් කටයුතු කෙරේ. ශාස්ත්‍රීය සුදුසුකම් සහ වෘත්තීය පුහුණුව සඳහා වන සහාය ද ශක්තිමත් කෙරේ. මෙම අරමුණ සඳහා වන ප්‍රධාන කාර්ය සාධන දර්ශක අතරට ආචාර්ය උපාධිධාරී කාර්ය මණ්ඩල ප්‍රතිශතය 49% දක්වා, මහාචාර්යවරුන් 29% දක්වා වැඩි කිරීම, සහ ආචාර්ය උපාධිධාරීන්ගේ සහ උපාධිධාරීන්ගේ අනුපාතය 2024 වන විට 60% දක්වා ඉහළ නැංවීම ඇතුළත් වේ. අතිරේක දර්ශක අතරට වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලට සහභාගීත්වය වැඩි කිරීම සහ ජාතික හා ජාත්‍යන්තර ශාස්ත්‍රීය කාර්යයන් සඳහා කාර්ය මණ්ඩලයේ මැදිහත්වීම ඇතුළත් වේ.

තෙවන උපායමාර්ගික අරමුණ වනුයේ ගෝලීය තත්ත්වයේ බහු-විෂය පර්යේෂණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමයි. පර්යේෂණ ව්‍යාපෘති, ප්‍රකාශන, සහ සම්මන්ත්‍රණ ඉදිරිපත් කිරීම් සංඛ්‍යාව හා ගුණාත්මකභාවය වැඩි කිරීම මෙයට ඇතුළත් වේ. දේශීය හා ජාත්‍යන්තර සහයෝගිතාවන්ට සහාය දක්වමින් විශ්වවිද්‍යාලය සිය ප්‍රාග්ධන අයවැයෙන් අවම වශයෙන් 8%ක් පර්යේෂණ ප්‍රදාන සඳහා වෙන් කිරීමට උත්සාහ කරයි. විද්‍යුත් පුස්තකාල වැඩිදියුණු කිරීම්, අන්තර්-විෂය පර්යේෂණ අවස්ථා, සහ වාණිජකරණය සඳහා කර්මාන්ත හවුල්කාරිත්වයන් ඇතිකර ගැනීම ද මෙම අරමුණෙහි අනිවාර්ය අංග වේ. 2024 සඳහා වන ප්‍රධාන කාර්ය සාධන දර්ශක මගින් ද ආයතනය තුළ පර්යේෂණ සංවර්ධනය සහ ශාස්ත්‍රීය විශිෂ්ටත්වයෙහි සැලකිය යුතු ප්‍රගතියක් පිළිබිඹු කරයි. ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය සඳහා පර්යේෂණ ප්‍රදාන 25ක් පිරිනමන ලද අතර, පර්යේෂණ සභාව සප්තවාර්ෂික නිවාඩු ශිෂ්‍යත්ව 6කට, නව්‍ය නියමු පර්යේෂණ ප්‍රදාන 11කට, විදේශ සංචාරක ප්‍රදාන 9කට, සම්මන්ත්‍රණ ලියාපදිංචි ගාස්තු ප්‍රදාන 12කට, සහ ප්‍රකාශන ගාස්තු අරමුදල් 6කට සහාය දැක්විය. පිළිගැනීමේ ප්‍රයත්නයන්ට සනාතන සභා සම්මාන සහ මුදල් ත්‍යාග 440ක්, උපකුලපති සම්මාන (පර්යේෂණ සම්බන්ධ) 50ක්, සහ ජනාධිපති සම්මාන පිළිගැනීම් 6ක් ඇතුළත් විය. පර්යේෂණ සභාව විශ්වවිද්‍යාල මට්ටමින් 1ක්, පීඨ මට්ටමින් 7ක්, දෙපාර්තමේන්තු මට්ටමින් 15ක්, සහ මධ්‍යස්ථාන/ඒකක මට්ටමින් 4ක් වශයෙන් පර්යේෂණ සම්මන්ත්‍රණ/පරිසංවාද 17ක් සඳහා අරමුදල් සම්පාදනය කළේය. තවද, උරුම-සම්බන්ධ ශාස්ත්‍රීය වැඩසටහන් 15ක් පවත්වන ලද අතර, පර්යේෂණ සභාවේ සහාය ලත් ව්‍යාපෘති හරහා සඟරා ලිපි 27ක් ප්‍රකාශයට පත් කරන ලදී. පර්යේෂණ-සම්බන්ධ ක්‍රියාකාරකම් 21ක් හරහා ශාස්ත්‍රීය සංවර්ධනයට තවදුරටත් සහාය ලැබූ අතර, කාර්ය මණ්ඩල සාමාජිකයෝ 115 දෙනෙක් ගූගල් ස්කොලර් ය-දර්ශකය 10ක් හෝ ඊට වැඩි අගයක් ලබා ගත්හ. විශ්වවිද්‍යාලය සිය තිරසාර ශාස්ත්‍රීය දෘශ්‍යතාව ප්‍රදර්ශනය කරමින් වෙබෝමෙට්‍රික්ස් ලෝක ශ්‍රේණිගත කිරීම්වල 1272 වන ස්ථානය පවත්වා ගෙන ගියේය.

සිව්වන අරමුණ වනුයේ විශ්වවිද්‍යාලය පිළිබඳ මහජන ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම සහ එහි ආර්ථික හා සමාජ දායකත්වය පුළුල් කිරීමයි. වෘත්තීය ආයතන, කර්මාන්ත, සහ ප්‍රජාවන් සමඟ සක්‍රියව සම්බන්ධ වීම තුළින් මෙම අරමුණ සාක්ෂාත් කරගනු ලැබේ. මෙම සැලැස්ම උපදේශන සේවා, නවෝත්පාදන මධ්‍යස්ථාන, ආදි ශිෂ්‍ය මැදිහත්වීම, සහ මහජන සම්මන්ත්‍රණ, ආයතනික සමාජ වගකීම් වැඩසටහන්, සහ මාධ්‍ය දෘශ්‍යතාව වැනි ප්‍රතිරූප ගොඩනැගීමේ ප්‍රයත්නයන් ප්‍රවර්ධනය කරයි. හරිත වැඩසටහන් හරහා සංස්කෘතික, ආගමික, සහ විනෝදාශ්වාද ක්‍රියාකාරකම් මෙන්ම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ තිරසාරත්වය ප්‍රවර්ධනය කිරීම, විශ්වවිද්‍යාලයේ සමාජ වගකීම තවදුරටත් ශක්තිමත් කරයි. ප්‍රධාන මිනුම් දඬු අතරට පේටන්ට් බලපත්‍ර 12ක්

ගොනු කිරීම, නවෝත්පාදන සහාය වැඩසටහන් 8ක් දියත් කිරීම, උපදේශන සංඛ්‍යාව 21 දක්වා වැඩි කිරීම, සහ විශ්වවිද්‍යාල බලපෑම ඉස්මතු කරන ලිපි හෝ මාධ්‍ය වැඩසටහන් 120ක් ප්‍රකාශයට පත් කිරීම ඇතුළත් වේ. ස්ත්‍රී පුරුෂ භාවය හා සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳ ශිෂ්‍යයන්ගේ තෘප්තිය මෙන්ම ප්‍රජා සත්කාරක වැඩසටහන්වල දෘශ්‍යතාව සහ ඵලදායීතාව ද නිරීක්ෂණය කෙරේ.

පස්වන සහ අවසාන අරමුණ පාලන පද්ධතිය සහ මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම පිළිබඳ අවධාරණය කරයි. එය ඩිජිටල් පරිවර්තනය, වඩා හොඳ යටිතල පහසුකම්, වැඩිදියුණු කළ අයවැයකරණය, කෙරෙහි මෙන්ම ශිෂ්‍යත්ව සහ පර්යේෂණ අරමුදල් වැනි සම්පත් භාවිතයේ වගවීම කෙරෙහි අවධානය යොමු කරයි. පරිපාලන කාර්යක්ෂමතාව, විනිවිදභාවය, සහ ආයතනික ආදායම් වර්ධනය මෙහි ප්‍රධාන අවධානම් ක්ෂේත්‍ර වේ. ප්‍රධාන කාර්ය සාධන දර්ශක අතරට අයවැය වෙන්කිරීමෙන් 80%ක් භාවිත කිරීම, පරිගණක පාදක වැඩසටහන් 18ක් සංවර්ධනය කිරීම, 2024 වන විට ආයතනික ආදායම 40% කින් වැඩි කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සහ තොරතුරු තාක්ෂණ පාදක සේවා පරිසරය පිළිබඳව පිළිවෙලින් 68%ක් සහ 57%ක් වන කාර්ය මණ්ඩල තෘප්තිය ඇතුළත් වේ. අභ්‍යන්තර සන්නිවේදන සහ මූල්‍ය සෝදිසි ක්‍රියාවලීන්හි වැඩිදියුණු කිරීම් ද අපේක්ෂිත ප්‍රධාන ප්‍රතිඵල වේ.

මෙම සෑම උපායමාර්ගික අරමුණක්ම 2024 සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම මගින් අනුබල දෙනු ලබන අතර, එයට නිශ්චිත ක්‍රියාකාරකම්, වගකිවයුතු ඒකක, අයවැය වෙන් කිරීම්, සහ කාලරාමු ඇතුළත් වේ. පීඨ සහ ඒකක මට්ටමේ සම්බන්ධීකාරකවරුන්ගෙන් සමන්විත උපායමාර්ගික සැලසුම් අධීක්ෂණ කමිටුව මගින් අධීක්ෂණය සහ ඇගයීම් යාන්ත්‍රණ මෙහෙයවනු ලැබේ. මෙම ව්‍යුහය මගින් ක්‍රයාකාරකම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම, ප්‍රධාන කාර්ය සාධන දර්ශක හරහා ප්‍රගතිය නිරීක්ෂණය කිරීම, සහ ප්‍රතිපෝෂණ සහ වාර්ෂික සමාලෝචන මත පදනම්ව කාලෝචිත ගැලපීම් කිරීමට අවකාශ සැලසීම සිදුකරනු ලබයි.

අවසාන වශයෙන්, උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම හුදෙක්ම පරිපාලන රාමු වශයෙන් ක්‍රියාත්මක වනවා පමණක් නොව - ඒවා ශාස්ත්‍රීය විශිෂ්ටත්වය, නවෝත්පාදනය, සහ සමාජ දායකත්වය සඳහා විශ්වවිද්‍යාල ප්‍රජාවගේ සාමූහික අපේක්ෂාව සහ කැපවීම නියෝජනය කරයි. මෙම මාර්ගෝපදේශක ලේඛන හරහා, කැලණිය විශ්වවිද්‍යාලය උසස් අධ්‍යාපනයෙහි ජාතික හා ගෝලීය නායකයෙකු ලෙස ස්ථානගත වීමට අපේක්ෂා කරයි. මැනිය හැකි ප්‍රගතිය, අවධානය යොමු වූ නායකත්වය, සහ සහයෝගීතා ක්‍රියාමාර්ග සමඟින්, විශ්වවිද්‍යාලය 2024 අවසානය වන විට සිය උපායමාර්ගික දැක්ම සාක්ෂාත් කර ගැනීමටත්, අනාගතයටත් සිය පරිවර්තනීය උරුමය අඛණ්ඩව පවත්වාගෙන යාමටත් සූදානම්ව සිටී.

# 2.6. ව්‍යවස්ථාපිත කමිටු

## 2.6.1. මූල්‍ය කමිටුව

මූල්‍ය හා සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් මූල්‍ය කමිටුවක් (FC) පත් කර ඇත. මූල්‍ය කමිටුවේ සංයුතිය පහත දක්වා ඇති පරිදි වේ.

- උපකුලපති - සභාපති
- සියලුම පීඨවල පීඨාධිපතිවරු
- පාලක සභාවේ සාමාජිකයින් දෙදෙනෙකු
- ලේඛකාධිකාරී
- මූල්‍යාධිකාරී (කැඳවුම්කරු)

මූල්‍ය කමිටුව මසකට වරක් රැස්වී විශ්වවිද්‍යාලයේ මූල්‍ය සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් තීරණ ගනියි. වැඩසටහන් අයවැය ඇතුළු සියලුම මූල්‍ය කටයුතු පාලන රෙගුලාසිවලට අනුකූලව සහ විශ්වවිද්‍යාල සංවර්ධන සැලැස්මට අනුව නිසි ලෙස ඇගයීමට ලක් කෙරේ. මූල්‍ය කමිටුවේ නිර්දේශ පාලක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරේ. උපකුලපතිවරයා, පීඨාධිපතිවරුන්, ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී, අධ්‍යයන අංශ ප්‍රධානීන්, අංශ ප්‍රධානීන් හෝ සනාතන සභාව විසින් යොමු කරන ලද කරුණු මූල්‍ය කමිටුව වෙත ඉදිරිපත් කෙරේ. මූල්‍ය කමිටුව යනු පාලක සභාවේ අනුකමිටුවලින් එකකි.

## 2.6.2. ප්‍රසම්පාදන කමිටු

කැලණිය විශ්වවිද්‍යාලය සඳහා ද දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (DPC) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා එහි පසුකාලීන සංශෝධනවලට අනුකූලව පත් කර ඇත. මේ අනුව, ප්‍රධාන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සහ සුළු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වශයෙන් විශ්වවිද්‍යාලය තුළ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (DPC) වර්ග දෙකක් ක්‍රියාත්මක වේ. වත්මන් මාර්ගෝපදේශවලට අනුව, සුළු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් රුපියල් මිලියන 5 ට අඩු ප්‍රසම්පාදන සිදු කරන අතර ප්‍රධාන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව රුපියල් මිලියන 200 දක්වා ප්‍රසම්පාදන සිදු කරයි. මසකට වරක් රැස්වන ප්‍රධාන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව කමිටුවේ සභාපතිවරයා ද වන උපකුලපතිවරයාගෙන් ද, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද සාමාජිකයෙකුගෙන් සහ 3 වන සාමාජිකයා වශයෙන් මූල්‍යාධිකාරිවරයාගෙන් ද සමන්විත වේ.

සතියකට වරක් රැස්වන සුළු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ කමිටු සභාපතිවරයා වශයෙන් උපකුලපතිවරයා ද, සාමාජිකයන් වශයෙන් ලේඛකාධිකාරි සහ මූල්‍යාධිකාරි ද කටයුතු කරති. එමෙන්ම, ශ්‍රී ලංකා රුපියල් 500,000/- දක්වා ප්‍රසම්පාදන භාර ගැනීම සඳහා පාලක මණ්ඩලය විසින් සැපයුම් කමිටුවක් (SC) ද පත් කරනු ලබයි. ලෝක බැංකුව මගින් අරමුදල් සපයනු ලබන AHEAD ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද ප්‍රසම්පාදන අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවක් (PPC) ද විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වේ.

## 2.6.3. විගණන කමිටුව

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක P.E.D./31 අනුව, විගණන කමිටුව අවම වශයෙන් වසරකට හතර වතාවක් රැස්විය යුතු වේ. විගණන කමිටුවේ ප්‍රධාන අරමුණ වන්නේ විශ්වවිද්‍යාලයේ මූල්‍ය කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සහ ඒ ආශ්‍රිත කළමනාකරණ කටයුතු සිදු කිරීමට විශ්වවිද්‍යාල පාලක සභාවට සහාය වීමයි.

මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සහ අධීක්ෂණය, මූල්‍ය වාර්තාකරණය සහ විගණන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම, විශ්වවිද්‍යාලයේ මූල්‍ය කටයුතු හා සම්බන්ධ කරුණු පරීක්ෂා කිරීම, වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම් සහ වැඩසටහන් අනුමත කිරීම, අභ්‍යන්තර විගණන සැලැස්ම සහ වැඩසටහන අධීක්ෂණය කිරීම, බාහිර හා අභ්‍යන්තර විගණන වාර්තා විමර්ශනය කිරීම සහ නිර්දේශ පිළිබඳ පසු විපරම් සිදු කිරීම විගණන කමිටුවේ ප්‍රධාන වගකීම් වේ. එමෙන්ම, ඵලදායි කාර්යසාධනය සහතික කිරීම සඳහා පද්ධති පාලනයන්ට අනුකූල වීම සමාලෝචනය කිරීම, අධීක්ෂණය කිරීම සහ පරීක්ෂා කිරීම, පිරිවැය-ඵලදායීතාවය සඳහා නියමිත කාල පරාස තුළ කාර්යසාධනය සමාලෝචනය කිරීම සහ නාස්තිකාර වියදම් අවම කිරීම යනාදිය, සහ ප්‍රඥප්ති, රෙගුලාසි, නීතිරීති සහ චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කරනු ලබන්නේ ද යන්න නිශ්චය කර ගැනීම විගණන කමිටුවේ සියලුම වගකීම්වලට අයත් වේ.

වගුව 2: 2024 වර්ෂය තුළ පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව

| ව්‍යවස්ථාපිත කමිටු | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| විශ්වවිද්‍යාල පාලක සභාව | 13 |
| සනාතන සභාව | 10 |
| මූල්‍ය කමිටුව | 10 |
| ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) | 13 |
| ප්‍රසම්පාදන කමිටුව (සුළු) | 41 |
| විගණන කමිටුව | 4 |

# 2.7. සනාතන සභාවේ ස්ථාවර කමිටු

**ඇතුළත් කිරීමේ කමිටුව** උපකුලපතිවරයා සහ සියලුම පීඨාධිපතිවරුන්ගෙන් සමන්විත වන අතර අධ්‍යයන අංශය භාර විධායක නිලධාරියා මෙම කමිටුවේ ලේකම්වරයා සහ කැඳවුම්කරු ලෙස කටයුතු කරයි. සෑම වසරකම විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන එක් එක් උපාධි පාඨමාලා සඳහා උපාධි අපේක්ෂකයින් ඇතුළත් කර ගැනීම සඳහා පවතින ස්ථාන සංඛ්‍යාව සම්බන්ධයෙන් මෙම කමිටුව විසින් සනාතන සභාව හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කරයි.

**විෂයමාලා, ඉගෙනුම්, ඉගැන්වීම් සහ ඇගයීම් කමිටුව** උපකුලපතිවරයා, සියලුම පීඨාධිපතිවරුන්, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් සහ මහාචාර්යවරුන්ගෙන් සමන්විත වන අතර, අධ්‍යයන අංශය භාර විධායක නිලධාරියා ලේකම්වරයා සහ කැඳවුම්කරු ලෙස කටයුතු කරයි. මසකට වරක් රැස්වන කමිටුව නව පාඨමාලාවල විෂයමාලා, පවතින පාඨමාලාවල විෂයමාලා සඳහා සිදු කළ යුතු සංශෝධන සහ අනෙකුත් අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් සනාතන සභාවට නිර්දේශ ඉදිරිපත් කරයි.

**ගෞරව උපාධි කමිටුව** සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන් සෑම පීඨයකින්ම නම් කරන ලද ජ්‍යෙෂ්ඨ විද්වතුන් වන අතර, එහි සභාපතිත්වය දරනු ලබන්නේ ජ්‍යෙෂ්ඨතම සාමාජිකයා විසිනි. ගෞරව උපාධි පිරිනැමීම සඳහා පීඨ මණ්ඩල විසින් කරන ලද නාමයෝජනා සමාලෝචනය කිරීමට සහ නාමයෝජනා අදාළ රෙගුලාසිවලට අනුකූල වීම සම්බන්ධයෙන් සනාතන සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීමට අධ්‍යයන අංශය භාර විධායක නිලධාරියා අවශ්‍ය පරිදි රැස්වීම් කැඳවයි.

**නිවාඩු සහ සම්මාන කමිටුව** උපකුලපතිවරයා සහ පීඨාධිපතිවරුන්ගෙන් සමන්විත වන අතර, අධ්‍යයන ආයතන අංශය භාර විධායක නිලධාරියා මෙම කමිටුවේ ලේකම්වරයා සහ කැඳවුම්කරු වශයෙන් කටයුතු කරයි. අදාළ රෙගුලාසිවලට අනුකූල වීම කෙරෙහි ද, අදාළ අධ්‍යයන අංශයේ අවශ්‍යතා සම්බන්ධයෙන් ද විශේෂ අවධානයක් යොමු කරමින්, අධ්‍යයන කාර්ය මණ්ඩලය ස්ථිර කිරීම, අවශ්‍ය අවස්ථාවල පරිවාස කාලය දීර්ඝ කිරීම මෙන්ම අධ්‍යයන නිවාඩු සහ සබත් නිවාඩු ඉල්ලීම් පිළිබඳ කරුණු සමාලෝචනය කිරීමට කමිටුව මසකට වරක් රැස්වේ.

**පුස්තකාල කමිටුව** සමන්විත වන්නේ උපකුලපතිවරයා සහ පීඨාධිපතිවරුන්, පුස්තකාලයාධිකාරී, විශ්වවිද්‍යාල පුස්තකාලවල සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩලය මෙන්ම සෑම පීඨ මණ්ඩලයකින්ම එක් නාමිකයෙකුගෙන් ය. පුස්තකාලයට අනුයුක්ත කර ඇති විධායක නිලධාරියා මසක් හැර මසක් රැස්වන මෙම කමිටුවේ ලේකම්වරයා සහ කැඳවුම්කරු වේ. පුස්තකාල කමිටුව විශ්වවිද්‍යාලයේ සියලුම සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පුස්තකාලය මගින් ඉගෙනුම් සම්පත් ලබාදීමට අදාළ සියලු කටයුතු සිදු කරයි.

**තත්ත්ව ආරක්ෂණය පිළිබඳ සනාතන සභා ස්ථාවර කමිටුව** සමන්විත වන්නේ උපකුලපතිවරයා සහ පීඨාධිපතිවරුන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින් අතරින් විශ්වවිද්‍යාල පාලක සභාව විසින් නම් කරන ලද සාමාජිකයන් දෙදෙනෙකු, ලේඛකාධිකාර සහ මූල්‍යාධිකාරී, විශ්වවිද්‍යාල තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අධ්‍යක්ෂවරයා, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, උපාය මාර්ගික සැලසුම් සහ සංඛ්‍යාලේඛන සඳහා වූ විශ්වවිද්‍යාල මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ සහ සෑම පීඨයකම තත්ත්ව සහතිකකරණ සම්බන්ධීකාරකවරුන්ගෙනි. විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන සියලුම අධ්‍යයන වැඩසටහන්වල අභ්‍යන්තර හා බාහිර තත්ත්ව සහතිකකරණයට අදාළ කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මසකට වරක් රැස් වන මෙම කමිටුවේ ලේකම්වරයා සහ කැඳවුම්කරු අධ්‍යයන අංශය භාර විධායක නිලධාරියා වේ.

**පර්යේෂණ සහ ප්‍රකාශන කමිටුව** උපකුලපතිවරයා සහ පීඨාධිපතිවරුන්ගෙන් සහ එක් එක් පීඨ මණ්ඩලයේ නාමිකයෙකුගෙන් සමන්විත වේ. මසකට වරක් රැස්වන මෙම කමිටුවේ ලේකම්වරයා සහ කැඳවුම්කරු පර්යේෂණ සහ ප්‍රකාශන අංශය භාර විධායක නිලධාරියා වේ. භාණ්ඩාගාර අරමුදල්වලින් අධ්‍යයන කාර්ය මණ්ඩලයට පර්යේෂණ ප්‍රදාන ලබා දීම සහ උපාධි අපේක්ෂක වැඩසටහන්වල අත්‍යවශ්‍ය අංගයක් වන ක්ෂේත්‍ර චාරිකා සඳහා අරමුදල් ලබා දීම සම්බන්ධයෙන් කමිටුව නිර්දේශ ඉදිරිපත් කරයි. මෙම කමිටුව එම ප්‍රදාන භාවිතා කිරීමේ ප්‍රගතිය පිළිබඳව අධීක්ෂණය කරන අතර විශ්වවිද්‍යාල ප්‍රකාශන සඳහා විශ්වවිද්‍යාල අරමුදල් බෙදා හැරීම සම්බන්ධයෙන් නිර්දේශ ද ඉදිරිපත් කරයි.

## 2.8. පර්යේෂණ සඳහා වන ආචාර ධර්මානුකූල ප්‍රමිති

විශ්වවිද්‍යාලය සතුව ආචාර ධර්ම සමාලෝචන කමිටු (ERC) දෙකක් ඇත. වෛද්‍ය පීඨයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව උපාධි අපේක්ෂකයින්, පශ්චාද් උපාධි සිසුන්, විද්වතුන් සහ පුළුල් පර්යේෂක ප්‍රජාව අතර පර්යේෂණ ආචාර ධර්ම ප්‍රවර්ධනය කිරීම සඳහා 1995 වර්ෂයේ දී ස්ථාපනය කරන ලදී. එහි මූලික පරමාර්ථය වන්නේ ජෛව වෛද්‍ය පර්යේෂණ සඳහා සහභාගී වන මිනිසුන්ගේ ආරක්ෂාව සැලසීමය. මෙය සාක්ෂාත් කර ගනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ආචාර ධර්ම සමාලෝචන කමිටු සංසදයේ (FERCSL) මාර්ගෝපදේශ සහ අනෙකුත් අදාළ ජාතික සහ ජාත්‍යන්තර නීති සම්පාදන සහ මාර්ගෝපදේශ අනුව සිදු කෙරෙන සමාලෝචන සහ අධීක්ෂණ ක්‍රියාවලි මගිනි.

කැලණිය විශ්වවිද්‍යාලයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව උසස් තත්ත්වයේ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2016 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද අතර එහි දැක්ම සහ මෙහෙවර තුළ අන්තර්ගතව ඇති ඉහළම ආචාර ධර්ම ප්‍රමිති පවත්වාගෙන යාමට එම කමිටුව කැපවී සිටියි. කැලණිය විශ්වවිද්‍යාලයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව මගින් වාණිජ හා කළමනාකරණ, පරිගණක හා තාක්ෂණ, උපාධි අධ්‍යයන, මානව ශාස්ත්‍ර, විද්‍යා සහ සමාජ විද්‍යා පීඨ මගින් සිදු කරනු ලබන පර්යේෂණවලට අදාළ පර්යේෂණ ආචාර ධර්මවල අංශ කිහිපයක් ආවරණය කරයි.

## 2.9. සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම

විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය සේවාව විශ්වවිද්‍යාල සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට රෝගවලින් තොර ක්‍රියාශීලී ජීවිතයක් ගත කිරීමට උපකාර කිරීම සඳහා සංවිධානය කර ඇති අතර එය සිසුන්ගේ සමාජ යහපැවැත්ම සඳහා දායක වන අතර විස්තීර්ණ වෛද්‍ය සහ රෝග නිවාරණ සෞඛ්‍ය සේවාවක් සපයයි. එය ප්‍රවේශ විය හැකි, උසස් තත්ත්වයේ සත්කාර හරහා සිසුන්ගේ, කාර්ය මණ්ඩලයේ සහ පීඨයේ විවිධ අවශ්‍යතා සපුරාලයි. සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම, රෝග වැළැක්වීම සහ ආරක්ෂිත සහ සහායක විශ්වවිද්‍යාල පරිසරයක් සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, විශ්ව විද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය විශ්ව විද්‍යාල ප්‍රජාවේ සමස්ත යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

විශ්ව විද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය විශ්ව විද්‍යාල ප්‍රජාවේ විවිධ සෞඛ්‍ය සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා පුළුල් වෛද්‍ය සේවා රැසක් පිරිනමයි. බාහිර රෝගී අංශය (OPD) සාමාන්‍ය සහ නිදන්ගත සෞඛ්‍ය ගැටළු සඳහා විශේෂඥ උපදේශන ලබා දෙන අතර, කඩිනම් සහ ඵලදායී සත්කාර සහතික කරයි. උග්‍ර තත්වයන් සහ අනපේක්ෂිත සිදුවීම් සඳහා ක්ෂණික වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සඳහා හදිසි ප්‍රතිකාර පහසුවෙන් ලබා ගත හැකිය. IV චිකිත්සාව සහ තුවාල සත්කාර වැනි කෙටි කාලීන ක්‍රියා පටිපාටි ඇතුළුව දිවා ප්‍රතිකාර සඳහා ද මධ්‍යස්ථානය පහසුකම් සපයයි. උසස් වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය අවස්ථා සඳහා, යොමු කිරීමේ සේවාවන් විශේෂිත සායන සහ රෝහල් සමඟ බාධාවකින් තොරව සම්බන්ධීකරණය සහතික කරයි. මීට අමතරව, මධ්‍යස්ථානය මගින් වෛද්‍ය සහතික කිරීම් සහ යෝග්‍යතා තක්සේරු කිරීම්, වෘත්තීය ඇගයීම් ලබා දීම සහ අධ්‍යයන, වෘත්තීය සහ පුද්ගලික අරමුණු සඳහා සහතික නිකුත් කරයි.

තවද, මෙම මධ්‍යස්ථානය පුළුල් පරාසයක සෞඛ්‍ය සේවා සැපයීම සඳහා නිර්මාණය කර ඇති අති නවීන

පහසුකම්වලින් සමන්විත වේ. මෙම ස්ථානයේ පවතින ඖෂධාගාරය අත්‍යවශ්‍ය ඖෂධ සහ බෙහෙත් වට්ටෝරු සඳහා පහසු සහ කාලෝචිත ප්‍රවේශයක් සහතික කරන අතර නිවැරදි හා ඵලදායී වෛද්‍ය ප්‍රතිකාර සඳහා සහාය වීම සඳහා රසායනාගාර සේවාවන් මගින් පුළුල් රෝග විනිශ්චය පරීක්ෂණ සිදු කරයි. ඊට අමතරව, දන්ත සත්කාර ඒකකය මගින් විශේෂඥ උපදේශන සහ ප්‍රතිකාර ලබා දෙමින් විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා ප්‍රශස්ත මුඛ සෞඛ්‍යය සහතික කරයි. ආයුර්වේද ප්‍රතිකාර ඒකකයේ දී සාම්ප්‍රදායික සුව කිරීමේ ක්‍රම ඒකාබද්ධ කිරීම සඳහා රාජගිරිය ආයුර්වේද රෝහල සමඟ හවුල්කාරිත්වයෙන් ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයන් වෙතින් සතිපතා උපදේශන ලබා දෙයි. මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා, මානසික සෞඛ්‍ය සායනය වෛද්‍ය පීඨයේ මනෝචිකිත්සක දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් උපදේශක මනෝචිකිත්සකයින්ගේ නායකත්වයෙන් සතිපතා සැසි පවත්වයි. තවද, ශ්‍රවණාගාරය මහජන සෞඛ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන්, අධ්‍යාපනය පෝෂණය කිරීම සහ විශ්වවිද්‍යාලය පුරා යහපැවැත්ම පිළිබඳ සංස්කෘතියක් දිරිමත් කිරීම සඳහා පහසුකම් සපයයි.

මෙම මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල ප්‍රජාවේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ මහජන සෞඛ්‍ය මුලපිරීම් සඳහා ක්‍රියාකාරීව සම්බන්ධ වේ. සෞඛ්‍ය අධ්‍යාපනය සහ දැනුවත් කිරීමේ ව්‍යාපාර මගින් සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවන් ප්‍රවර්ධනය කිරීම සහ සිසුන්, කාර්ය මණ්ඩලය සහ පීඨය අතර සෞඛ්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා නිර්මාණය කර ඇති අන්තර්ක්‍රියාකාරී වැඩසටහන් ඉදිරිපත් කරයි. ඊට අමතරව, මධ්‍යස්ථානය වැළැක්වීමේ සෞඛ්‍ය සේවා සපයන අතර, ඒ සඳහා කැපවූ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් සිදු කරනු ලබන අඛණ්ඩ මහජන සෞඛ්‍ය අධීක්ෂණය ද මෙයට ඇතුළත් වේ. සැමට පිරිසිදු, ආරක්ෂිත සහ සනීපාරක්ෂක පරිසරයක් පවත්වා ගැනීම සඳහා විශේෂයෙන් ආපනශාලා, නේවාසිකාගාර සහ අනෙකුත් විශ්වවිද්‍යාල පහසුකම් වැනි ක්ෂේත්‍රවල පාරිසරික සනීපාරක්ෂාව පිළිබඳ නිතිපතා තක්සේරු කිරීම් සිදු කරනු ලබන බව මෙමගින් සහතික කරයි. මෙම මුලපිරීම් විශ්වවිද්‍යාලය පුරා සෞඛ්‍ය සහ යහපැවැත්ම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමට උපකාරී වේ.

ක්ෂණික සෞඛ්‍ය ගැටළු සහ වැළැක්වීමේ පියවර යන දෙකම සඳහා විසඳුම් ලබා දීම පමණක් නොව, විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය සහයෝගය සහ යහපැවැත්මේ වැදගත් අංගයක් වශයෙන් කටයුතු කරමින් විවිත්‍රවත් සහ සෞඛ්‍ය-සවිඥානික විශ්වවිද්‍යාල පරිසරයක් පවත්වා ගැනීමට ද දායක වේ.

# 2.10. තත්ත්ව සහතික කිරීම

2019/09 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා (UGC) චක්‍රලේඛය යටතේ ස්ථාපනය කරන ලද තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA), කැලණිය විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. තත්ත්ව සහතික කිරීමේ අධ්‍යක්ෂවරයාගේ මෙහෙයවීම යටතේ කටයුතු කරන මෙම මධ්‍යස්ථානයට තත්ත්ව සහතික කිරීමේ සනාතන සභා ස්ථාවර කමිටුව (SSC-QA) මගින් මඟපෙන්වනු ලබයි. පීඨය පදනම් කරගත් තත්ත්ව සහතික යාන්ත්‍රණයන් සඳහා පීඨ හතට අයත් එක් එක් පීඨයේ ස්ථාපිත පීඨ තත්ත්ව සහතික කිරීමේ ඒකක (FQACs) මගින් සහාය ලබා දෙයි. මීට අමතරව, 2022 වර්ෂයේ දී, විවිධ විෂයපථ හරහා ගුණාත්මකභාවය නිරීක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම ශඳහා විශ්වවිද්‍යාලයේ ධාරිතාව පුළුල් කරමින් IQAC-CDCE, IQAC-පරිපාලන සහ පුස්තකාල අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකක ද ස්ථාපනය කර ඇත.

තත්ත්ව සහතික කිරීමේ සනාතන සභා ස්ථාවර කමිටුව (SSC-QA) මාසිකව රැස්වන අතර එහිදී පීඨ තත්ත්ව සහතික කිරීමේ ඒකක (FQACs) හතේ ප්‍රගතිය සහ IQAC තුනේ ප්‍රගතිය සහ සමාරම්භකයන් සමාලෝචනය කරනු ලැබේ. ගුණාත්මක ප්‍රමිතීන් අභ්‍යන්තරීකරණය දිරිමත් කිරීම සහ සමස්ත අධ්‍යන හා පරිපාලන මෙහෙයුම් වැඩිදියුණු කිරීම සඳහා පීඨ සහ දෙපාර්තමේන්තු හරහා හොඳම භාවිතයන් බෙදා ගනු ලැබේ.

## 2.10.1. 2024 වර්ෂයේ දී තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) මගින් සම්පූර්ණ කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

**අ) බාහිර සමාලෝචන**

- ආයතනික සමාලෝචනය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම - 2021 වර්ෂයේ දී සාර්ථකව ක්‍රියාත්මක කරන ලද අතර, එය 85% ක් සම්පූර්ණ කර ඇත. බාහිර සමාලෝචන ක්‍රියාවලියෙන් ලැබෙන නිර්දේශ ඒකාබද්ධ කිරීමට ගන්නා වූ වෑයම මෙයින් පිළිබිඹු වේ.

- විද්‍යා පීඨය ජීව විද්‍යාව සහ භෞතික විද්‍යාව සඳහා පොකුරු වැඩසටහන් සමාලෝචන (A, B, C, සහ D පොකුරු) සම්පූර්ණ කරන ලදී. මෙම සමාලෝචනවලට අධ්‍යයන ප්‍රමිතීන් සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන් සමඟ විෂයමාලා පෙළගැස්ම පිළිබඳ පුළුල් තක්සේරුවක් ඇතුළත් විය.

**ආ) ප්‍රතිපත්ති සංවර්ධනය**

2024 වර්ෂයේ දී, ප්‍රධාන ප්‍රතිපත්ති ලේඛන කිහිපයක් සංවර්ධනය කිරීමත් සමඟ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) විශ්වවිද්‍යාලයේ පාලනය සහ මෙහෙයුම් රාමු වැඩිදියුණු කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

- අධ්‍යයන කාර්ය මණ්ඩල කාර්යසාධන ඇගයීම් පද්ධතිය පිළිබඳ ප්‍රතිපත්තිය: අධ්‍යයන කාර්ය මණ්ඩල කාර්යසාධනය තක්සේරු කිරීම සඳහා පුළුල් රාමුවක්

- පශ්චාත් උපාධි නිබන්ධන අධීක්ෂණ ප්‍රතිපත්තිය: විවිධ ක්ෂේත්‍ර හරහා උසස් තත්ත්වයේ උපාධි නිබන්ධන අධීක්ෂණය සහතික කරන මාර්ගෝපදේශ.

- අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මානව සම්පත් සැලසුම් ප්‍රතිපත්තිය: පීඨ බඳවා ගැනීම, රඳවා ගැනීම සහ සංවර්ධනය සඳහා දිගුකාලීන උපාය මාර්ග ස්ථාපිත කිරීම.

- කැලණිය විශ්වවිද්‍යාලය සමඟ අනුබද්ධ වීමට අපේක්ෂා කරන ආයතන පිළිගැනීම: කැලණිය විශ්වවිද්‍යාලය විසින් ප්‍රදානය කරන ලද සුදුසුකම් සඳහා අධ්‍යයන වැඩසටහන් පැවැත්වීමට කැමති බාහිර ආයතන පිළිගැනීම සඳහා ප්‍රතිපත්තියක්.

**ඇ) වෙනත් විශේෂ වැඩසටහන්**

- හෙළ බොජුන් ආපන ශාලාව: විශ්වවිද්‍යාලයේ ආහාර සේවා විකල්ප වැඩිදියුණු කිරීම, දේශීය ආහාර ප්‍රවර්ධනය කිරීම සහ සිසුන්ගේ යහපැවැත්ම පෝෂණය කිරීම අරමුණු කර ගනිමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) විසින් මෙහෙයවනු ලබන නව සමාරම්භකයක්.

- පරිපාලන අංශ සඳහා ක්‍රියා පටිපාටි අත්පොත: විශ්වවිද්‍යාලයේ පරිපාලන අංශ සඳහා ක්‍රියා පටිපාටි සහ සම්මත මෙහෙයුම් මාර්ගෝපදේශ ගෙනහැර දක්වන පුළුල් අත්පොතක් නිර්මාණය කිරීම සඳහා 2024 දී කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

## 2.10.2. වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

අඛණ්ඩ වැඩිදියුණු කිරීම සහ ධාරිතා වර්ධනය සඳහා වූ කැපවීමට අනුකූල වන පරිදි, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) මගින් 2024 වර්ෂයේ දී වැඩමුළු සහ පුහුණු සැසි කිහිපයක් සංවිධානය කරන ලදී. අධ්‍යයන හා පරිපාලන කාර්යයන්හි ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි මෙම වැඩසටහන් මගින් අවධානය යොමු කළ අතර, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ පිළිවෙත් ශක්තිමත් කිරීමට ඒවා උපකාරී විය.

- අධ්‍යයන කාර්ය මණ්ඩල කාර්යසාධන ඇගයීම් පද්ධතිය: අලුතින් ක්‍රියාත්මක කරන ලද ඇගයීම් පද්ධතිය පිළිබඳව කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා පීඨ හයක් පුරා වැඩමුළු පවත්වන ලදී.
- විෂයමාලා සංවර්ධන ක්‍රියාවලිය: නවීන විෂයමාලා නිර්මාණය පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා වැඩමුළු, අධ්‍යයන වැඩසටහන් ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල වන බවත් විකාශනය වන අධ්‍යයන අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන බවත් සහතික කිරීම.
- විභාග රාජකාරි, ප්‍රශ්නපත්‍ර සැකසීම සහ ප්‍රශ්නපත්‍ර මධ්‍යස්ථකරණය: වගකීම් පැහැදිලි කිරීම, විභාග ප්‍රශ්නපත්‍ර සැකසීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ මධ්‍යස්ථකරණ ක්‍රියාවලියේ අනුකූලතාව සහ සාධාරණත්වය සහතික කිරීම සඳහා සැසි පවත්වන ලදී.

## 2.10.3. ඉදිරිමඟ

2025 වසර වන විට, කැලණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා මෙහෙයුම් ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමට තත්ත්ව සහතික මධ්‍යස්ථානය කැපවී සිටී. 2024 වර්ෂයේ දී සිදු කරන ලද මුලපිරීම් අනාගත සංවර්ධනය සඳහා ශක්තිමත් පදනමක් සකසන අතර, අධ්‍යාපනය, පර්යේෂණ සහ ප්‍රජා සේවයේ විශිෂ්ටත්වය කරා විශ්වවිද්‍යාලය ගමන් කිරීමේ දී තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) විසින් ඒ සඳහා අඛණ්ඩව සහාය වනු ඇත.

# 2.11. විශ්වවිද්‍යාලය 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතට අනුකූලවීම

## 2.11.1. නිකුත් කරන ලද තොරතුරු පිළිබඳ විස්තර

කැලණිය විශ්වවිද්‍යාලයේ කළමනාකාරිත්වය විසින් රජයේ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ විධිවිධානවලට අනුකූල වීමේ වැදගත්කම හඳුනා ගන්නා ලදී. එය විශ්වවිද්‍යාල තීරණවල විනිවිදභාවය පිළිබඳ මූලධර්මයට ද අනුකූල විය. එබැවින්, කැලණිය විශ්වවිද්‍යාලය විසින් 2024 වසරේ ඉල්ලා සිටි කරුණු කිහිපයකට අදාළ සියලුම තොරතුරු නිකුත් කර ඇත. එම ඉල්ලීම් පිළිබඳ විස්තර සහ විශ්වවිද්‍යාල තොරතුරු නිකුත් කිරීම පහත දක්වා ඇත (වගුව 3).

වගුව 3: තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතට අනුව 2024 වර්ෂයේ දී තොරතුරු නිකුත් කිරීම

| **තොරතුරු ඉල්ලුම් කරන ලද පුද්ගලයාගේ නම** | **ඉල්ලීම සිදු කළ දිනය** | **තොරතුරු ලබා දුන් දිනය** | **තොරතුරුවල ස්වභාවය** |
|---|---|---|---|
| **1. රන්මලී මීපාගල මෙනවිය** | 17.04.2024 | 10.09.2024 | 2016 සිට 2023 දක්වා පාලි අධ්‍යයන සහ බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයේ පීඨ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආචාර්ය උපාධි සහ දර්ශනපති නිබන්ධන මාතෘකා පිළිබඳ තොරතුරු |
| **2. ඩී.ආර්.එස්. විජේසිංහ මහතා** | 16.07.2024 | 10.09.2024 | පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය විසින් පවත්වන ලද ආචාර්ය උපාධි වැඩසටහන් සහ ඉංග්‍රීසි භාෂා වැඩසටහන් පිළිබඳ තොරතුරු |
| **3. අයි.එස්.ඒ.එස්. පොතුහර මෙනවිය** | 21.08.2024 | 22.08.2024 | පොතුහැර මහත්මියට එරෙහිව පවත්වන ලද පරීක්ෂණය පිළිබඳ තොරතුරු |
| **4. බී.ඒ.බී.එස්. ජයවර්ධන මහතා** | 31.08.2024 සහ 07.11.2024 | මෙතෙක් ලබා දී නොමැත | අයදුම්කරුගේ පර්යේෂණ නිබන්ධනය පිළිබඳ තොරතුරු |
| **5. කේ.ඒ.බී.පී. දයාරත්න මහතා** | 02.09.2024 | 14.10.2024 | ජනසන්නිවේදන දෙපාර්තමේන්තුවේ සම්මානිත මහාචාර්යවරුන් පිළිබඳ තොරතුරු |
| **6. තත්සර දුජේන්ද්‍ර මහතා (නීතිඥ)** | 05.09.2024 | 09.10.2024 | H.S. බෝපගේ (PS/2015/361) විසින් V.L.T. ප්‍රබුද්ධ (PS/2015/397) ට එරෙහිව කරන ලද සියලුම පැමිණිලි පිළිබඳ තොරතුරු |
| **7. ජයන්ත කලංසූරිය මහතා** | 18.09.2024 | 23.10.2024 | අවසන් වසර විභාගය 2024 කළමනාකරණ ආර්ථික විද්‍යාව (SRMG 41414) විෂය සඳහා වෙනම ප්‍රශ්න පත්‍ර පැවැත්වීමට පීඨ මණ්ඩලය, සනාතන සභාව සහ පාලක සභාව විසින් ගත් තීරණ පිළිබඳ තොරතුරු |
| **8. ආචාර්ය සී.ඩී. චතුරංග** | 15.10.2024 | 28.10.2024 | අයදුම්කරුට නිකුත් කරන ලද තනතුර හැර යෑමේ (VOP) නිවේදනය සම්බන්ධයෙන් පාලක සභාව විසින් ගත් තීරණ පිළිබඳ තොරතුරු |
| **9. ආචාර්ය නාමල් නිශාන්ත බාලසූරිය මුදියන්සේලාගේ** | 12.11.2024 | 11.12.2024 | අයදුම්කරුට නිකුත් කරන ලද තනතුර හැර යෑමේ (VOP) නිවේදනය සම්බන්ධයෙන් පාලක සභාව විසින් ගත් තීරණ පිළිබඳ තොරතුරු |
| **10. පූජ්‍ය මාදුරුඔය ධම්මිස්සර හිමි** | 19.11.2024 | 04.12.2024 | පූජ්‍ය මාදුරුඔය දම්මිස්සර හිමියන්ට එරෙහිව පවත්වන ලද මූලික සහ විධිමත් විනය පරීක්ෂණ පිළිබඳ තොරතුරු |
| **11. කේ.පී.එස්. හේමාලි මෙනවිය** | 20.11.2024 | තවමත් ඉදිරිපත් කර නොමැත | පුද්ගලික ගොනුවේ ඇගේ සැමියාගේ (හර්ෂ කුමාර මහතා / වැඩ සහායක) පෞද්ගලික තොරතුරු පිළිබඳ තොරතුරු |

| | |
|---|---|
| 2024 වසර තුළ ලැබුණු මුළු ඉල්ලීම් සංඛ්‍යාව | - 11 |
| 2024 වසර තුළ තොරතුරු ලබා නොදුන් මුළු අවස්ථා සංඛ්‍යාව | - 01 |
| ඒ අනුව, 2024 වසර තුළ ලැබුණු මුළු ප්‍රතිචාර සංඛ්‍යාව | - 10 |
| ඉල්ලීමේ ප්‍රතිශතයක් ලෙස මුළු ප්‍රතිචාර | - 91% |

## 2.12. අවදානම් කළමනාකරණය

2022 වර්ෂයේ පැවති ආර්ථික අර්බුදයෙන් පැනනැඟුණු දුෂ්කර තත්ත්වයන් 2024 දක්වා පැවතුනි. දැඩි බඳවා ගැනීමේ පිළිවෙත් සහ අයවැය සීමාවන් සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය ආකර්ෂණය කර ගැනීම සහ රඳවා ගැනීම යන ද්විත්යම සඳහා නොවැළැක්විය හැකි අභියෝග සහ අවදානම් ඇති කළ අතර විශ්වවිද්‍යාලයේ අනෙකුත් මෙහෙයුම් කටයුතු සඳහා ද එමඟින් බලපෑම් ඇති විය. සීමිත සම්පත් සමඟ පරිණාමය වන සමාජීය හා ආර්ථික ඉල්ලීම්වලට අනුවර්තනය වීමේ අවශ්‍යතාවය සමතුලිත කිරීම, ඒ සමඟම දැඩි අධ්‍යයන ප්‍රමිතීන් සහ අඛණ්ඩතාව පවත්වා ගැනීම තීරණාත්මක බව සනාථ වූ නමුත් විශ්වවිද්‍යාලයේ දිගුකාලීන ශක්‍යතාව මත සැලකිය යුතු පීඩනයක් ඇති කරන ලදී.

### 2.12.1. මූල්‍ය ස්ථාවරත්වය සහ තිරසාරභාවය

2024 වර්ෂයේ දී වඩාත්ම බලගතු අවදානම වූයේ මූල්‍ය තිරසාරභාවයයි. අරමුදල් කප්පාදු කිරීම සහ විශ්වවිද්‍යාලය සඳහා පුනරාවර්තන සහ ප්‍රාග්ධන වෙන් කිරීම දැඩි ලෙස අධීක්ෂණය කිරීම ඇතුළු අයවැය පාලනයන් හේතුවෙන්, උපාධි අපේක්ෂක සිසුන් සඳහා යටිතල පහසුකම් පුළුල් කිරීම සහ ජාත්‍යන්තර ශිෂ්‍යයන් ඇතුළත් තර ගැනීම සඳහා ඔවුන්ව ආකර්ෂණය කර ගැනීම සඳහා විශ්වවිද්‍යාලය සිදු කළ සැලසුම් සඳහා දැඩි බලපෑමක් ඇති විය. දැඩි ආර්ථික පසුබෑම හේතුවෙන් රජයේ අරමුදල් අඩුවීම, විශ්වවිද්‍යාලයේ සම්පත් මත දැවැන්ත පීඩනයක් ඇති කරන ලදී. අත්‍යවශ්‍ය ඉගැන්වීම් සහ පර්යේෂණ සම්පත් ලබා ගැනීම, තීරණාත්මක යටිතල පහසුකම් නඩත්තු කිරීම සහ සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් මෙමඟින් දුෂ්කරතා ඇති විය. මුදල් අමාත්‍යාංශයෙන් ලැබුණු සීමිත රජයේ අරමුදල් හේතුවෙන් එහි උපාධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පීඨ පර්යේෂණ සඳහා සහාය වීම සහ අධ්‍යයන පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීමේ අත්‍යවශ්‍ය පිරිවැය අතර පරතරය පියවීම සඳහා විශ්වවිද්‍යාලය මගින් අභ්‍යන්තරව ජනනය කරන ලද සියලුම ආදායම භාවිත කර තිබුණි. අස්ථාවර ආර්ථික වාතාවරණය දිගුකාලීන මූල්‍ය සැලසුම්කරණය කෙරෙහි සැලකිය යුතු අභියෝගයක් එල්ල කළ අතර, උපායමාර්ගික මුලපිරීම් සඳහා ආයෝජනය කිරීමට සහ පහසුකම් වැඩිදියුණු කිරීමට අප සතු හැකියාවට ද එමඟින් බාධා සිදු විය. මූල්‍ය ස්ථාවරත්වය සහ දිගුකාලීන තිරසාරභාවය සහතික කිරීම සඳහා ප්‍රධාන උපාය මාර්ගයක් වූයේ ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමයි. මෙයට ගාස්තු මත පදනම් වූ වැඩසටහන් පුළුල් කිරීම, සැලකිය යුතු පර්යේෂණ ප්‍රදාන ලබා ගැනීම සහ කර්මාන්ත සමඟ ශක්තිමත් හවුල්කාරිත්වයන් ගොඩනැගීම ඇතුළත් විය. කෙසේ වුවද, දීර්ඝ පරිපාලන හා මූල්‍ය ක්‍රියා පටිපාටි සමඟ සම්බන්ධ වූ රජයේ නියෝගවල මෑත කාලීනව සිදු වූ වෙනස්කම්, ඇතැම් මුලපිරීම් තරඟකාරී ලෙස ක්‍රියාත්මක කිරීමේ හැකියාවට බාධාවක් විය. විශ්වවිද්‍යාලයේ ප්‍රාග්ධන ආයෝජන සඳහා අරමුදල් නැවැත්වීම හෝ සීමා කිරීම විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීම් සඳහා සීමාවන් ඇති කළ අතර විශ්වවිද්‍යාලයේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් හෝ යෝජනා ශක්තිමත් කිරීමට එමඟින් හැකි විය. ආයෝජන සහ අරමුදල් කළමනාකරණයේ අවදානම අවම කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් ආයෝජන කමිටුවක් පත් කිරීම මගින් ඉමහත් සහයෝගයක් ලැබී තිබුණි.

### 2.12.2. මානව සම්පත් රඳවා ගැනීම සහ අත්පත් කර ගැනීම

"බුද්ධිගලනය" හේතුවෙන් 2024 වර්ෂයේ දී සැලකිය යුතු මට්ටමින් කාර්ය මණ්ඩල සාමාජිකයන් විශ්වවිද්‍යාලය හැර යෑමේ අවස්ථා අත්විඳීමට විශ්වවිද්‍යාලයට සිදු විය. ආර්ථික පසුබෑමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ මූල්‍ය දුෂ්කරතා, තරඟකාරී නොවන වැටුප්, පර්යේෂණ සඳහා අරමුදල් ලබා දීම සීමාකිරීමට සිදුවීම, සහ බදු වැඩි වීම යන සියල්ල අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයන් ගණනාවක් විශ්වවිද්‍යාලයෙන් ඉවත්ව යෑමට හේතු විය. පළපුරුදු, ඉහළ මට්ටමේ ශාස්ත්‍රඥයින් විදේශ රටවල සහ පෞද්ගලික අධ්‍යාපන අංශයේ පිරිනමන වඩා හොඳ වැටුප් සහ සේවා කොන්දේසි මගින් ආකර්ෂණය කර ගත් අතර, එමඟින් විභව කුසලතා පරතරයක් ඇති කරන ලදී. මෙම විශේෂඥතාව අහිමි වීම මගින් ඉගැන්වීමේ ගුණාත්මකභාවය, පර්යේෂණ ප්‍රතිදානය සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා උපදේශකත්වය ලබා දීමේ කටයුතු අනතුරේ හෙළන ලදී. බඳවා ගැනීම් ප්‍රබල අන්දමින් අත්හිටුවීම මගින් මෙම ගැටළුව තවදුරටත් උග්‍ර විය. විධායක, අධ්‍යයන සහායක සහ අධ්‍යයන නොවන තනතුරු සඳහා බඳවා ගැනීම සම්පූර්ණයෙන්ම නැවැත්වීම ඉතිරි කාර්ය මණ්ඩලය මත දැවැන්ත පීඩනයක් ඇති කළ අතර, ඔවුන්ගේ වැඩ ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩි වී තිබුණි. අධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සඳහා වන සමහර සීමාවන් ලිහිල් කළද, ඉහළ පෙළේ කුසලතා සහිත පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීම, විශේෂයෙන් අපගේ වන්දි පැකේජ තරඟකාරී නොවූ තාක්ෂණ ක්ෂේත්‍රවල ඉහළ

පෙළේ කුසලතා සහිත පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීම අතිශයින් දුෂ්කර විය. මෙමඟින් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය සහ එහි පර්යේෂණ ධාරිතාව යන දෙකටම බරපතල අවදානමක් ඇති විය. 2024 වර්ෂයේ දී සහ එම වසරට පෙර බුද්ධි ගලනය හේතුවෙන්, බැඳුම්කර උල්ලංඝනයන් වැඩි වෙමින් පැවති අතර විශ්වවිද්‍යාලයට සිදු වූ පාඩුව සැලකිය යුතු මට්ටමින් වැඩි විය. 2022, 2023 සහ 2024 වර්ෂවලදී ප්‍රධාන චක්‍රලේඛ තුනක් නිකුත් කරමින් මහා භාණ්ඩාගාරය විසින් අධ්‍යයන කාණ්ඩ, පරිපාලන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහායක සේවා කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාණ්ඩවලට බඳවා ගැනීම අත්හිටුවීම හේතුවෙන් විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාමට බරපතල අභියෝගයක් එල්ල වී තිබුණි. එබැවින්, පැවරුම් සහ/හෝ කොන්ත්‍රාත් පදනම මත එම කාර්ය මණ්ඩල කාණ්ඩවලට බඳවා ගැනීම් අනුමත කිරීමට සහ භාණ්ඩාගාරයට වැය බරක් නොවන පරිදි සහ මුදල් අමාත්‍යාංශයේ නියෝගවලට සහාය වීම පිණිස විශ්වවිද්‍යාලය මගින් ඉපයූ ආදායම්වලින් අරමුදල් ලබා දීමට විශ්වවිද්‍යාල පාලක සභාවට බල කෙරුනි. අභ්‍යාසලාභීන් යෙදවීම, පැවරුම්/කොන්ත්‍රාත් මත බඳවා ගැනීම, විශ්‍රාමික සේවකයින් රඳවා ගැනීම, වැඩ බලන පදනම මත සේවය ආවරණය කිරීම සහ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි වැඩසටහන් ආවරණය කිරීම සඳහා වත්මන් කාර්ය මණ්ඩලයට අතිකාල ගෙවීම වැනි මිශ්‍ර ප්‍රවේශයක් උපයෝගී කර ගනිමින් විශ්වවිද්‍යාලය ඉල්ලා අස්වීම්, විශ්‍රාම ගැනීම්, මාරුවීම් හෝ සේවය අවසන් කිරීම් හේතුවෙන් ඇති වූ පුරප්පාඩු සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.

## 2.12.3. ඉහළ යන මහජන අපේක්ෂාවන් සපුරාලීම සඳහා වෙනස්කම් කළමනාකරණය කිරීම

රාජ්‍ය විශ්වවිද්‍යාල පිළිබඳ මහජන අපේක්ෂාවන් වේගයෙන් වෙනස් වෙමින් පවතී. වැඩිවන පෞද්ගලික අධ්‍යාපන ආයතන සංඛ්‍යාව සමඟ තරඟකාරීව සිටිය යුතු අතරතුර නැගී එන සමාජ ආර්ථික අවශ්‍යතා සපුරාලීම සැලකිය යුතු මට්ටමේ අභියෝගයක් ඇති කරයි. අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාළත්වය පවත්වා ගැනීම සඳහා නිරන්තර උත්සාහයක් දැරීම ද අවශ්‍ය වේ. සම්පත්වල පවතින සීමා මගින් වත්මන් පර්යේෂණ, නවීන උපකරණ සහ පීඨ වෘත්තීය සංවර්ධනය සඳහා ප්‍රවේශය සීමා කළ හැකිය. පරිණාමය වෙමින් පවතින රැකියා වෙළඳපොළ සමඟ ගැළපෙන පරිදි විෂයමාලා පෙළගැස්ම සඳහා අඛණ්ඩ සමාලෝචනය සහ අනුවර්තනය අවශ්‍ය වේ. යල් පැන ගිය වැඩසටහන් සහ අදාළ කුසලතා නොමැති උපාධිධාරීන් මගින් රැකියා ලබා ගැනීමේ හැකියාවට සහ ආයතනයේ කීර්තියට තර්ජනයක් එල්ල කරයි. මෙය විසඳීම සඳහා ශක්තිමත් කර්මාන්ත සම්බන්ධතා සහ සේවා යෝජකයින්ගෙන් සහ ආදි ශිෂ්‍යයන්ගෙන් ලැබෙන ප්‍රතිපෝෂණ ඉතා වැදගත් වේ. මෙම අවදානම් අවම කිරීම සඳහා නව්‍ය විසඳුම් සංවර්ධනය කිරීමට ප්‍රතිඵල වෙත නැඹුරු වූ ඒකාබද්ධ ඉගැන්වීමේ සහ ඉගෙනුම් පරිසරයක් පෝෂණය කිරීම වෙනුවෙන් සියලුම අධ්‍යයන, අනධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලවල මානසිකත්වයේ සහ ආකල්පවල මූලික වෙනසක් සිදු කළ යුතුය. මෙම නැගී එන අභියෝගය 2024 වර්ෂයේ විශේෂ අවධානයක් යොමු කළ යුතු අවස්ථාවක් විය.

## 2.12.4. විශ්වවිද්‍යාල මෙහෙයුම් කටයුතු ඩිජිටල්කරණය කිරීම

කාර්ය මණ්ඩල අවශ්‍යතා ප්‍රතිව්‍යුහගත කිරීම සහ පවතින මානව සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීම සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට සහ කොටස්කරුවන්ට උසස් තත්ත්වයේ සේවාවක් සැපයීම සඳහා විශ්වවිද්‍යාලය අතින් සිදු කරන ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීම ආරම්භ කරන ලදී. මේ අනුව, විශ්වවිද්‍යාලය මානව සම්පත් තොරතුරු පද්ධතියේ (HRIS) ක්‍රියාකාරිත්වය ආරම්භ කර ඇත.

මේ අතර, ඩිප්ලෝමා/සහතික පාඨමාලා සඳහා වෙනම පද්ධතියක්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තවත් පද්ධතියක්, උපාධි සත්‍යාපනය කිරීම සඳහා පද්ධතියක් සහ විශ්වවිද්‍යාලය සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතියක් ලබා ගැනීම සඳහා කටයුතු සිදු කරයි. ඊට අමතරව, විද්‍යුත් දත්ත කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති මාර්ගෝපදේශක ලේඛනයක් හඳුන්වා දෙන ලදී.

## 2.12.5. එක්සත් ජාතීන්ගේ (UN) තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වලට අනුකූලව කටයුතු කිරීම

2023 වර්ෂය ඉලක්ක කරගත් තිරසාර විසඳුම් මධ්‍යස්ථානය (CSS) හරහා එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වලට අනුකූල වීම සඳහා විශ්වවිද්‍යාලය ක්‍රියාකාරකම් ආරම්භ කර ඇත. තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) යටතේ පිළිගත් ක්‍රියාකාරකම් විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මට සහ 2024-2026 උපායමාර්ගික සැලැස්මට ඇතුළත් කර ඇත.

# 2.13. හරිත පිළිවෙත්

2024 දී කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම හරිත විශ්ව විද්‍යාලය ලෙස පෙරමුණ ගෙන සිටින අතර, තිරසාරභාවය සඳහා ස්ථිර කැපවීමක් මූර්තිමත් කරයි. 2014 දෙසැම්බර් 10 වන දින පාරිසරික ප්‍රතිපත්තියක් සම්මත කර ගැනීමත් සමඟ ආයතනයේ සෑම අංශයකටම තිරසාරභාවය ඒකාබද්ධ කිරීම සඳහා අඩිතාලම දමමින් මෙම චාරිකාව ආරම්භ විය. වසර ගණනාවක් පුරා, කැලණිය විශ්වවිද්‍යාලය එහි අධ්‍යයන හා පරිපාලන රාමු තුළ පමණක් නොව, බලපෑමක් සිදු කළ හැකි ප්‍රජා සහභාගීත්වයන් තුළින් ද පාරිසරික, ආර්ථික සහ සමාජ වගකීම් සඳහා නොසැලෙන කැපවීමක් පෙන්නුම් කර ඇත.

කැලණිය විශ්වවිද්‍යාලය මගින් තිරසාරභාවය පිළිබඳ නායකත්වය අත්පත් කර ගැනීමේ දී, එහි පාරිසරික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා නිර්මාණය කර ඇති පුරෝගාමී සමාරම්භකයක් වන තිරසාර විසඳුම් මධ්‍යස්ථානය (CSS) ස්ථාපනය කරන ලදී. තිරසාර විසඳුම් මධ්‍යස්ථානය (CSS) විශ්වවිද්‍යාලයේ පුළුල් දැක්ම සහ මෙහෙවර වන "පරිසර හිතකාමී ප්‍රවේශයන් සහ භාවිතයන් තුළින් රටේ තිරසාර සංවර්ධනයට දායක වීම" සමඟ සමපාත වන අතර ආසියාවේ ප්‍රමුඛතම හරිත විශ්වවිද්‍යාලය ලෙස කැලණිය විශ්වවිද්‍යාලය ස්ථානගත කිරීමට එම මධ්‍යස්ථානය ප්‍රයත්න දරයි.

එම මධ්‍යස්ථානයේ ආරම්භයේ සිටම, තිරසාර විසඳුම් මධ්‍යස්ථානය (CSS) ශක්තිමත් ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම, පරිසර හිතකාමී භාවිතයන් පෝෂණය කිරීම, මැනිය හැකි ඉලක්ක නියම කිරීම සහ වගවීම සහතික කිරීම සඳහා ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සම්බන්ධයෙන් බොහෝ සමාරම්භක ක්‍රියාත්මක කර ඇත. තිරසාර විසඳුම් මධ්‍යස්ථානය (CSS) 2030 වර්ෂය වන විට, එක්සත් ජාතීන්ගේ සියලුම තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සඳහා උපායමාර්ගිකව දායකත්වය ලබා දීම ඉලක්ක කර ගනිමින් සන්ධිස්ථාන වාර්තා කරන බැවින් තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ දී විනිවිදභාවය පවත්වාගැනීම තිරසාර විසඳුම් මධ්‍යස්ථාන (CSS) ප්‍රවේශයේ මූලික අවශ්‍යතාවක් වේ.

ධනාත්මක වෙනසක් ඇති කිරීම සඳහා යථාර්ථවාදී තිරසාර ඉලක්ක නියම කිරීම සහ විශ්වවිද්‍යාලයේ දෛනික මෙහෙයුම්වලට පාරිසරික විඥානය ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් තිරසාර විසඳුම් මධ්‍යස්ථානය (CSS) මූලික මූලධර්ම හයක් අනුගමනය කර ඇත. බලශක්තිය, ජලය, වාසස්ථාන සහ අපද්‍රව්‍ය කළමනාකරණය වැනි ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින්, විශ්වවිද්‍යාල ප්‍රජාව පුරා පාරිසරික භාරකාරත්වය පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කරන අතරම, එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) 17 සාක්ෂාත් කර ගැනීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලය දක්වන කැපවීමට තිරසාර විසඳුම් මධ්‍යස්ථානය (CSS) සහාය ලබා දෙයි.

තිරසාර විසඳුම් මධ්‍යස්ථානයේ (CSS) තිරසාර උපාය මාර්ගවලට ඇතුළත් වන්නේ:

- අපද්‍රව්‍ය කළමනාකරණය: කාර්යක්ෂම භාවිතය, නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය, කාබනික අපද්‍රව්‍ය කොම්පෝස්ට් බවට පත් කිරීම සහ ලියාපදිංචි ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍ර හරහා ද්‍රව්‍ය (උදා: වීදුරු, ප්ලාස්ටික් සහ කඩදාසි) නිසි ලෙස බැහැර කිරීම සහතික කිරීම තුළින් අපද්‍රව්‍ය අඩු කිරීම.
- ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම: විද්‍යුත් අපද්‍රව්‍ය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා වගකිවයුතු ප්‍රතිචක්‍රීකරණ පිරිස් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණය: රසායනික හා සායනික අපද්‍රව්‍ය ආරක්ෂිතව බැහැර කිරීම සඳහා පද්ධති ස්ථාපනය කිරීම.
- තිරසාර ඉදිකිරීම්: නව ගොඩනැගිලි ඉදිකිරීමේ දී සහ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීමේ දී පරිසර හිතකාමී ඉදිකිරීම් මූලධර්ම ප්‍රවර්ධනය කිරීම.
- දේශගුණික ක්‍රියාමාර්ග: දේශගුණික විපර්යාස බලපෑම් අවම කිරීම සඳහා පුළුල් කාබන් කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
- දූෂණ වැළැක්වීම: දූෂණය වැළැක්වීම සඳහා විමෝචන සහ විසර්ජන කළමනාකරණය කිරීම සහ අඩු කිරීම.
- ජල සංරක්ෂණය: වැසි ජලය රැස් කිරීම, අපජල පිරිපහදු කිරීම සහ වාරිමාර්ග සඳහා නැවත භාවිතා කිරීමේ පද්ධති හඳුන්වා දීම.
- බලශක්ති කාර්යක්ෂමතාව: බලශක්ති කාර්යක්ෂම තාක්ෂණයන් සහ භාවිතයන් ප්‍රවර්ධනය කිරීම.
- ජෛව විවිධත්ව සංරක්ෂණය: විවිධ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති තුළින් වනජීවී වාසස්ථාන වැඩි දියුණු කිරීම.
- පාරිසරික අධ්‍යාපනය: අධ්‍යාපනික සමාරම්භක තුළින් පරිසරය පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සහ පරිසරය පිළිබඳ ගෞරවය වර්ධනය කිරීම.




ජනාධිපති පාරිසරික සම්මාන - 2024

## 2.13.1. කැපී පෙනෙන ජයග්‍රහණ

### ප්‍රමුඛ GreenMetric ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්

කැලණිය විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් තිරසාර විසඳුම් මධ්‍යස්ථානය වාර්ෂිකව UI GreenMetric ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම සඳහා සහභාගී වේ. 2024 ශ්‍රේණිගත කිරීමේදී, පාරිසරික තිරසාරභාවය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ නොසැලෙන කැපවීම පැහැදිලිව පෙන්නුම් කරමින්, ශ්‍රී ලංකාවේ දෙවන විශිෂ්ටතම හරිත විශ්වවිද්‍යාලය ලෙස එහි ශ්‍රේණිගත කිරීම ඉමහත් අභිමානයෙන් යුක්තව තහවුරු කර ගැනීමට කැලණිය විශ්වවිද්‍යාලය සමත් විය.

### ජනාධිපති පාරිසරික සම්මාන - 2024

2024 වර්ෂයේ දී, කීර්තිමත් ජනාධිපති පාරිසරික සම්මාන - 2024 උළෙලේදී පරිසරයට දායකත්වය දක්වන විශිෂ්ටම රාජ්‍ය ආයතනය යන කාණ්ඩය යටතේ කැලණිය විශ්වවිද්‍යාලය කුසලතා සම්මානයකින් පිදුම් ලැබීය. පාරිසරික තිරසාරභාවය ප්‍රගමණය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ නොසැලෙන කැපවීම සහ ආයතනය තුළ සහ පුළුල් ප්‍රජාව තුළ පරිසර හිතකාමී භාවිතයන් පෝෂණය කිරීම සඳහා විශ්වවිද්‍යාලය ලබා දෙන නායකත්වය පිළිගනිමින් මෙම සම්මානය ප්‍රදානය කර තිබුණි.

### SLAAS පාරිසරික සම්මාන

2024 වර්ෂයේ දී කීර්තිමත් ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLAAS) මගින් පවත්වන ලද පාරිසරක සම්මාන උළෙලේදී ආයතනික කාණ්ඩයේ පරිසර සම්මානයේ ජයග්‍රාහකයා ලෙස නම් කිරීම මගින් කැලණිය විශ්වවිද්‍යාලය කැපී පෙනෙන සන්ධිස්ථානයක් සනිටුහන් කරන ලදී.

### 2023 වර්ෂයේ වාර්ෂික තිරසාරභාවය පිළිබඳ වාර්තාව එළිදැක්වීම

2023 වාර්ෂික තිරසාරභාවය පිළිබඳ වාර්තාව මගින් තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සමඟ සමපාත වන තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීමේදී කැලණිය විශ්වවිද්‍යාලය ලබා ගත් ප්‍රගතිය සහ සමාරම්භක ඉස්මතු කරයි. බලශක්ති කාර්යක්ෂමතාව, අපද්‍රව්‍ය කළමනාකරණය, තිරසාර ප්‍රවාහනය, අධ්‍යාපනය සහ පර්යේෂණ, දේශගුණික විපර්යාස සහ ජෛව විවිධත්ව සංරක්ෂණය යන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාලයේ ජයග්‍රහණ පිළිබඳ සවිස්තරාත්මක දළ විශ්ලේෂණයක් මෙම වාර්තාව මඟින් සපයන අතර පාරිසරික හා සමාජ වගකීම් පෝෂණය කිරීම සඳහා එහි කැපවීම ද පෙන්නුම් කරයි.

### රුක් හැඳුනුම්පත් ව්‍යාපෘතිය දියත් කිරීම

රුක් හැඳුනුම්පත් ව්‍යාපෘතිය යනු පාරිසරික දැනුවත්භාවය සහ ජෛව විවිධත්ව සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගත් කැලණිය විශ්වවිද්‍යාලයේ නව්‍ය සමාරම්භකයකි. QR කේත හරහා ප්‍රවේශ වී සවිස්තරාත්මක තොරතුරු ලබා ගැනීමට හැකි වන පරිදි ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියට විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පවතින රුක් හඳුනා ගැනීම සහ නාමාවලිගත කිරීම ඇතුළත් වේ. සොබාදහම පිළිබඳ අත්‍යන්ත සම්බන්ධතාවයක් පෝෂණය කිරීමට සහ තිරසාරභාවය සඳහා කැපවීමෙන් කටයුතු කිරීම පිණිස සිසුන්ට, කාර්ය මණ්ඩලයට සහ අමුත්තන්ට විශ්වවිද්‍යාලයේ සශ්‍රීක ශාක විවිධත්වය පිළිබඳව ඉගෙන ගැනීමට තාක්ෂණය සහ අධ්‍යාපනය ඒකාබද්ධ කර සකසා ඇති රුක් හැඳුනුම්පත් ව්‍යාපෘතිය මගින් ආකර්ශනීය මෙවලමක් හඳුන්වා දී ඇත.

## 2.13.2. තිරසරභාවය සඳහා කැපවීම

**බලශක්ති කළමනාකරණය සඳහා කැපවීම**

කැලණිය විශ්වවිද්‍යාලය බලපෑමක් සිදු කළ හැකි සමාරම්භක සහ තිරසාර ප්‍රතිපත්ති මගින් බලශක්ති කළමනාකරණය සඳහා එහි කැපවීම විදහා දක්වයි. උපකුලපතිවරයාගේ මනා සහයෝගය සහිතව තිරසාර විසඳුම් මධ්‍යස්ථානය විසින් මෙහෙයවනු ලබන පරිදි මෙම විශ්වවිද්‍යාලය, කාමර උෂ්ණත්වයෙන් $2^0C$ තුළ උෂ්ණත්වය පවත්වා ගැනීම සහ මෙහෙයුම් වේලාවන් පෙ.ව. 10:30 සිට ප.ව. 3:30 දක්වා සීමා කිරීම ඇතුළුව වායු සමීකරණ භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා මාර්ගෝපදේශ ක්‍රියාත්මක කර ඇත. මෙම පියවරයන් බලශක්ති පරිභෝජනය අඩු කිරීම සඳහා ක්‍රියාශීලී ප්‍රවේශයක් පිළිබිඹු කරයි. LED ආලෝකකරණය, ඉන්වර්ටර් වායු සමීකරණ සහ සූර්ය බලශක්ති පද්ධති වැනි බලශක්ති කාර්යක්ෂම තාක්ෂණික ක්‍රම අනුගමනය කිරීම මගින් විශ්වවිද්‍යාලයේ කාබන් පියසටහන අවම කිරීම සඳහා එහි කැපවීම පිළිඹිබු කරයි. විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රයේ 5KW පද්ධති සහ පරිගණක හා තාක්ෂණ පීඨයේ 250KW පද්ධතියක් ඇතුළු සූර්ය බලශක්තිය ස්ථාපනය කිරීම් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් උපයෝගී කර ගැනීමේ ප්‍රයත්නවලට නිදසුන් ලෙස දැක්විය හැකිය. ඊට අමතරව, 5KW සුළං බල පද්ධතිය මගින් විශ්වවිද්‍යාලයේ පුනර්ජනනීය බලශක්ති කළඹ වැඩි දියුණු කරයි.

විශ්වවිද්‍යාලයේ සමාරම්භකයන් ජීව වායු නිෂ්පාදනය දක්වා පුළුල් වී ඇති අතර, ජීව වායු ඒකක දෙකක් මගින් දිනකට මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 30කින් ජීව වායුව නිෂ්පාදනය කරමින් ජීව වායු කිලෝග්‍රෑම් 2 ක් සහ දියර කොම්පෝස්ට් ලීටර් 100 ක් ජනනය කරයි. මෙම උත්සාහයන් පරිසර සංරක්ෂණය ප්‍රවර්ධනය කරන අතරම තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණයට ද දායක වේ. දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් මගින්, බලශක්ති නාස්තිය අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම සහ අනාගත ඉංජිනේරුවන් දිරිගැන්වීම සඳහා ප්‍රදර්ශන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් කැලණිය විශ්වවිද්‍යාලය තිරසාර බලශක්ති කළමනාකරණයේ පෙරමුණ ගෙන සිටී.

**වාසස්ථාන කළමනාකරණය සඳහා කැපවීම**

ජෛව විවිධත්වය, තිරසාරභාවය සහ ප්‍රජා සහභාගීත්වය පෝෂණය කරන බලපෑමක් කළ හැකි වැඩසටහන් මාලාවක් මගින් කැලණිය විශ්වවිද්‍යාලය වාසස්ථාන කළමනාකරණය සඳහා විශ්වවිද්‍යාලයේ කැපවීම මනාව ප්‍රදර්ශනය කරයි. පීඨ පුරා හරිත පරිච කමිටු/හරිත සමාජ විසින් මෙහෙයවනු ලබන රුක් රෝපණ සමාරම්භකයන් මගින් විශ්වවිද්‍යාලයේ විවිධ වාසස්ථාන ප්‍රවර්ධනය කරන අතරම රුක් ආවරණය ඉහළ නැංවීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. විශ්වවිද්‍යාලයේ භූමි අලංකරණ අංශයේ සහාය ලබා ගනිමින් සිදු කරනු ලබන මෙම ප්‍රයත්නයන් මගින් විවිධ පළතුරු, මල් පිපෙන, ඖෂධ පැළෑටි සහ දුර්ලභ ශාක විශේෂ හඳුන්වා දී විශ්වවිද්‍යාල පරිශ්‍රය ජෛව විවිධත්වයෙන් සශ්‍රීක කර ඇති අතර එමඟින් සමනල සහ පක්ෂි විශේෂ වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට ද සමත්ව ඇත. නව්‍ය රුක් හැඳුනුම්පත් ව්‍යාපෘතිය මගින් ජෛව විවිධත්වය සංරක්ෂණය සඳහා විශ්වවිද්‍යාලයේ කැපවීම තවදුරටත් ඉස්මතු කරයි. විශ්වවිද්‍යාලයේ රුක් හඳුනාගෙන නාමාවලිගත කිරීම සහ QR කේත හරහා සවිස්තරාත්මක තොරතුරු සැපයීම මගින්, මෙම ව්‍යාපෘතිය මගින් පාරිසරික දැනුවත්භාවය සහ අධ්‍යාපනය වැඩි දියුණු කරමින්, සිසුන්, කාර්ය මණ්ඩලය සහ අමුත්තන් ස්වභාවික ලෝකයත් සමඟ සම්බන්ධ කරයි.

මීට අමතරව, වෛද්‍ය පීඨයේ හරිත පරිච කමිටුව සමඟ සහයෝගයෙන් සහ සුභ පතන්නන්ගේ සහාය ඇතිව විශ්වවිද්‍යාලය මගින් කැපී පෙනෙන එළවළු ගෙවතු වගා ව්‍යාපෘතියක් සිදු කරයි. අක්කර 3 ක් පමණ ආවරණය වන මෙම උද්‍යානය කාබනික වගාවක් ලෙස ක්‍රියාත්මක වන අතර, විශ්වවිද්‍යාලයේ කොම්පෝස්ට් කම්හල් මගින් නිපදවන කොම්පෝස්ට් මෙ සඳහා භාවිතා කරයි. මෙම සංවෘත තිරසාර ආකෘතිය ජෛව විවිධත්වයට සහාය වනවා පමණක් නොව, ආහාර සුරක්ෂිතතාව සම්බන්ධ ගැටළුවලට විසඳුම් ලබා දෙමින්, සෞඛ්‍ය සම්පන්න ආහාර පුරුදු ප්‍රවර්ධනය කරමින් විශ්වවිද්‍යාල ආපනශාලාවලට මෙම නැවුම්, පෝෂ්‍යදායී නිෂ්පාදන අලෙවි කරන අතර විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලයට ද සහන මිල ගණන් යටතේ එම නිෂ්පාදන ලබා ගැනීමේ අවස්ථාව සලසා ඇත. "හේන" එළවළු උද්‍යානය ශ්‍රමදාන ව්‍යාපාර හරහා සිසුන්ට ප්‍රායෝගික ඉගෙනීමේ සහ වගා කිරීමේ කටයුතු සඳහා සම්බන්ධ වීමේ අවස්ථා ද උදා කර ඇති අතර එමඟින්, සිසුන් තුළ පාරිසරික භාරකාරත්වය සහ ප්‍රජා සහභාගීත්වය පිළිබඳ හැඟීමක් ද ජනිත කරයි. මෙම සමාරම්භක මගින් කැලණිය විශ්වවිද්‍යාලයේ තිරසාර කෘෂිකාර්මික පිළිවෙත්, ජෛව විවිධත්වය වැඩිදියුණු කිරීම මෙන්ම ආහාර සුරක්ෂිතතාව සහ පාරිසරික තිරසාරභාවය වැනි ගෝලීය අභියෝගවලට මුහුණ දීමේදී ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය සඳහා ඇති කැපවීම ද විශිෂ්ට මට්ටමින් පිළිබිඹු කරයි.

**ප්‍රජා සහයෝගිතා වැඩසටහන් සඳහා කැපවීම**

2024 වර්ෂයේ දී, තිරසාරභාවය සහ පාරිසරික දැනුවත්භාවය වැඩි දියුණු කරන බලපෑමක් සිදු කළ හැකි වැඩසටහන් මගින් ප්‍රජා සහයෝගිතාව වර්ධනය කිරීම සඳහා තිරසාර විසඳුම් මධ්‍යස්ථානයේ (CSS) ස්ථිරසාර කැපවීම අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. ප්‍රධාන වශයෙන් කැපී පෙනෙන කරුණු වූයේ රුක් රෝපණ වැඩසටහන් වන අතර එමගින් සිසුන්, කාර්ය මණ්ඩලය සහ ප්‍රජා සාමාජිකයින් හරිත අවකාශයන් පුළුල් කිරීම සහ වන විනාශයට එරෙහිව සටන් කිරීම සඳහා සම්බන්ධ කර ගන්නා ලදී. මෙම සමාරම්භකයන් මගින් දේශීය ජෛව විවිධත්වය වැඩි දියුණු කළ අතර වාසස්ථාන සංරක්ෂණයේ වැදගත්කම අවධාරණය කරන ලදී. වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සහ පාරිසරික භාරකාරත්වය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් තිරසාර විසඳුම් මධ්‍යස්ථානය (CSS) මගින් වෙරළ පවිත්‍ර කිරීමේ වැඩසටහන් කිහිපයක් ද මෙහෙවන ලදී. මෙම පවිත්‍ර කිරීම් මගින් අපද්‍රව්‍ය ඉවත් කිරීම පමණක් නොව, ප්ලාස්ටික් දූෂණයේ අහිතකර බලපෑම් පිළිබඳව ද, වගකිවයුතු අපද්‍රව්‍ය බැහැර කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ද සහභාගිවන්නන් දැනුවත් කිරීම අරමුණු කරගෙන සිදු විය. තිරසාර ප්‍රවාහනය පිළිබඳ වැඩමුළුව 2024 වර්ෂයේ දී සැලකිය යුතු සන්ධිස්ථානයක් වූ අතර එමගින් ශුන්‍ය විමෝචන වාහන භාවිතා කිරීම, බයිසිකල් ජාල පුළුල් කිරීම සහ පරිසර හිතකාමී ගමනාගමන විකල්පවල වැදගත්කම අවධාරණය කරන ලදී. කාබන් විමෝචනය අඩු කිරීම සහ තිරසාර සංචලන සංස්කෘතියක් පෝෂණය කිරීම පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා මෙම වැඩමුළුව වේදිකාවක් ලෙස උපයෝගී කර ගන්නා ලදී. මෙම විවිධාකාර සමාරම්භක තුළින් කැලණිය විශ්වවිද්‍යාලය පරිසර හිතකාමී ප්‍රජාවක් පෝෂණය කිරීම, ඉක්මනින් විසඳුම් ලබා දිය යුතු පාරිසරික අභියෝගවලට විසඳුම් ලබා දීම සහ තිරසාර අනාගතයක් සඳහා සාමූහික ක්‍රියාමාර්ග දිරිගැන්වීම සඳහා එහි වගකීම ප්‍රදර්ශනය කරන ලදී.

ඊට අමතරව, කැලණිය විශ්වවිද්‍යාලයේ භූමි අලංකරණ අංශය, තිරසාර විසඳුම් මධ්‍යස්ථානය සමඟ සහයෝග යෙන්, පාරිසරික ගැටළු, සම්පත් සීමා සහ නිෂ්පාදන ඉල්ලුම වැඩි කිරීම අරමුණු කරගත් තිරසාර ව්‍යාපෘති කිහිපයකට ක්‍රියාකාරීව සම්බන්ධ වී ඇත.

**අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා කැපවීම**

කැලණිය විශ්වවිද්‍යාලය, අපද්‍රව්‍ය අඩු කිරීම, නැවත භාවිතා කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම අරමුණු කරගත් නව්‍ය උපාය මාර්ග සහ සමාරම්භක මගින් තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා එහි ස්ථිරසාර කැපවීම ප්‍රදර්ශනය කරයි. තිරසාර විසඳුම් මධ්‍යස්ථානය (CSS) විසින් මෙහෙයවනු ලබන මෙම විශ්වවිද්‍යාලය, පාරිසරික බලපෑම අවම කිරීම සහ චක්‍රීය ආර්ථික පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සඳහා පුළුල් අපද්‍රව්‍ය කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක කර ඇත. ආපනශාලා සහ නේවාසිකාගාරවලින් ඉවත් කරන කාබනික අපද්‍රව්‍ය උසස් තත්ත්වයේ කොම්පෝස්ට් බවට පරිවර්තනය කරන කොම්පෝස්ට් පහසුකම් ක්‍රියාත්මක කිරීම මෙම ප්‍රධාන සමාරම්භක අතරට ඇතුළත් වේ. මෙම කොම්පෝස්ට් විශ්වවිද්‍යාලයේ භූමි අලංකරණ සහ එළවළු ගෙවතු වගා ව්‍යාපෘතිවල භාවිතා වන අතර, මෙමඟින් සංවෘත-පුඩු අපද්‍රව්‍ය-සම්පත් ආකෘතියක් පෙන්නුම් කරයි. මීට අමතරව, විශ්වවිද්‍යාලයේ ජීව වායු ඒකක දෙකක් මගින් දෛනිකව මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 30 ක් ජීව වායු කිලෝග්‍රෑම් 2 ක් සහ දියර කොම්පෝස්ට් ලීටර් 100 ක් බවට කාර්යක්ෂමව පරිවර්තනය කරයි. එමගින් සාම්ප්‍රදායික බලශක්ති ප්‍රභවයන් සහ රසායනික පොහොර මත යැපීම තවදුරටත් අඩු කරයි.

විශ්වවිද්‍යාලය පුරා උපායමාර්ගිකව පවත්වාගෙන යන කාබනික, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි සහ ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය සඳහා නම් කරන ලද බඳුන් පවත්වා ගනිමින් අපද්‍රව්‍ය ඒවායේ ප්‍රභවවලදීම වෙන් කිරීම ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කරයි. දේශීය ප්‍රතිචක්‍රීකරණ සමාගම් සමඟ සහයෝග යෙන් පවත්වනු ලබන ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපාර, ප්ලාස්ටික්, කඩදාසි සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම සහතික කරන අතර, එමඟින් අපද්‍රව්‍ය ගොඩ ගැසීමේ අවස්ථා අඩු කරයි. දැනුවත්භාවය වැඩි කිරීම සඳහා, තිරසාර විසඳුම් මධ්‍යස්ථානය (CSS) මගින් සිසුන්, කාර්ය මණ්ඩලය සහ පුළුල් ප්‍රජාව ඉලක්ක කර ගනිමින් අපද්‍රව්‍ය කළමනාකරණයේ මනා පිළිවෙත් පිළිබඳ නිතිපතා වැඩමුළු සහ ව්‍යාපාර සංවිධානය කරයි. මෙම වැඩසටහන් මගින් එක් අවශ්‍යතාවක් සඳහා පමණක් ප්ලාස්ටික් භාවිතය අඩු කිරීම, නැවත භාවිතා කළ හැකි විකල්ප අනුගමනය කිරීම සහ නුසුදුසු අපද්‍රව්‍ය බැහැර කිරීමේ කටයුතුවලින් ඇති වන පාරිසරික බලපෑම අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දෙයි.

කැලණිය විශ්වවිද්‍යාලයේ භූමි අලංකරණ අංශය, තිරසාර විසඳුම් මධ්‍යස්ථානය (CSS) සමඟ එක්ව, කොම්පෝස්ට් නිෂ්පාදනය හරහා ඝන අපද්‍රව්‍ය සාර්ථකව කළමනාකරණය කරමින් පාරිසරික තිරසාරභාවයට දායක වේ. පසුගිය වසර තුන තුළ (2020-2023) නිෂ්පාදන අගයන් මගින් ඒ සඳහා දක්වන ලද අඛණ්ඩ උත්සාහයන් පෙන්නුම් කරයි:

වගුව 4: විශ්වවිද්‍යාලය තුළ කොම්පෝස්ට් නිෂ්පාදනය

| වර්ෂය | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|
| **නිෂ්පාදනය (කි.ග්‍රෑම්)** | 9061 | 20294 | 6084 | 7788 |
| **උත්පාදනය කරන ලද ආදායම (ශ්‍රී ලංකා රුපියල්)** | 175160 | 405880 | 121680 | 181850 |

කඩදාසි ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා සිදු කරන ලද සමාරම්භක පාරිසරික වශයෙන් ප්‍රයෝජනවත් වන බව සහ ආර්ථික වශයෙන් ශක්‍ය වන බව සනාථ කර ඇත:

වගුව 5: විශ්වවිද්‍යාලයේ කඩදාසි ප්‍රතිචක්‍රීකරණය

| වර්ෂය | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|
| **උත්පාදනය කරන ලද ආදායම (ශ්‍රී ලංකා රුපියල්)** | 4465 | 20780 | 6842.5 | 3871 |
| **ප්‍රතිචක්‍රීකරණය කරන ලද කඩදාසි ප්‍රමාණය (කි.ග්‍රෑ.)** | 44650 | 415600 | 136850 | 7742 |

එබැවින්, ප්‍රතිචක්‍රීකරණය කරන ලද කඩදාසි කිලෝග්‍රෑම් 3, 871කින් පමණක් ගණනය කරන ලද ඉතුරුම් ප්‍රමාණය දළ වශයෙන් පහත දැක්වේ.

- වැඩුණු ගස් 65.47
- ජලය ලීටර් 103,048.22
- විදුලිය කිලෝවොට් පැය 2,326.75
- තෙල් ලීටර් 846.55
- කාබන් විමෝචනය කි.ග්‍රෑ. 776.01

මෑත වසරවලදී, කාර්යක්ෂම ප්‍රතිචක්‍රීකරණ ප්‍රයත්නයන් තුළින් ප්ලාස්ටික් අපද්‍රව්‍ය අඩු කිරීම සඳහා කැපී පෙනෙන පියවර ගෙන ඇත. මෙම සමාරම්භක මගින් කාබන් පියසටහන අවම කර ධනාත්මක පාරිසරික බලපෑමක් ඇති කර ඇති අතර ඒ සමඟම ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍ය වගකීමෙන් යුතුව විකිණීම හරහා ආදායමක් ද උපයාගෙන ඇත. එවැනි ක්‍රියාමාර්ග තුළින් තිරසාරභාවය සඳහා ස්ථිරසාර කැපවීමක් ඉස්මතු කරන අතර, පාරිසරික වගකීම සහ ආර්ථික ශක්‍යතාවයේ අන්තර් සම්බන්ධිත ප්‍රතිලාභ පිළිබිඹු කරයි. මීට අමතරව, හරිතකරණය සහ තිරසාර භාවිතයන් ඉස්මතු කරන රුක් රෝපණ ව්‍යාපෘති සිදු කිරීමෙන් පරිසර සංරක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා භූමි අලංකරණ අංශය ක්‍රියාකාරී පියවර ගෙන තිබේ. මෙම ප්‍රයත්නයන් උද්‍යාන අලංකරණය ඉක්මවා ගොස් ඇත. එයට හේතුව වන්නේ කණ්ඩායම ගෘහස්ථව නිපදවන කොම්පෝස්ට් පමණක් භාවිතා කිරීම මගින් පරිසර හිතකාමී ක්‍රම අනුගමනය කර තිබීමය. මෙම ප්‍රවේශය මගින් අපද්‍රව්‍ය අඩු කිරීම පමණක් නොව, කාබනික පෝෂ්‍ය පදාර්ථවලින් පස පොහොසත් කිරීමට සිදු කරයි. අලුතින් රෝපණය කරන ලද ගස්වල සෞඛ්‍ය සම්පන්න වර්ධනය සහතික කරයි. එමෙන්ම, තිරසාර අනාගතයක් ඇති කිරීම සඳහා ස්ථිරසාර කැපවීමක් පෙන්නුම් කරයි.

# 2.14. බාහිර ආයතන සමඟ හවුල්කාරිත්වය

කැලණිය විශ්වවිද්‍යාලය, අධ්‍යයන හා පර්යේෂණ කටයුතු ඇතුළු විවිධ අරමුණු සඳහා බොහෝ ජාතික හා ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ විධිමත් හවුල්කාරිත්වයන් ඇති කර ගෙන ඇත. පහත 6 වන වගුවේ 2024 වර්ෂයේ දී විශ්වවිද්‍යාලය විසින් අත්සන් කරන ලද ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම්වල සාරාංශයක් දක්වා ඇත.

වගුව 6: අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම්

| අංකය | ගිවිසුමේ / අවබෝධතා ගිවිසුමේ නම | අත්සන් කළ දිනය |
|---|---|---|
| **අවබෝධතා ගිවිසුම් - ජාත්‍යන්තර** | | |
| 1 | මෙඩික්ස් ඇකඩමි, ඩෙවොන්, එංගලන්තය | 17.01.2024 |
| 2 | ලා ට්‍රෝබ් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව | 15.08.2024 |
| 3 | රාජකීය සිවිල් සේවා කොමිසම, භූතානයේ රාජකීය රජය | 27.12.2024 |
| **අවබෝධතා ගිවිසුම් - දේශීය** | | |
| 4 | HSBC ඉලෙක්ට්‍රොනික් ඩේටා ප්‍රොසෙසින් ලංකා පුද්ගලික සමාගම | 09.04.2024 |
| 5 | ඇෆ්රියෙල් (ගැරන්ටි) ලිමිටඩ් | 15.08.2024 |
| 6 | වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය | 04.09.2024 |
| 7 | යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී | 01.10.2024 |
| 8 | ද ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ටර්නල් ඕඩිටර්ස් ලංකා චැප්ටර් (IIALC) | 02.10.2024 |
| 9 | යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී | 13.11.2024 |
| 10 | සුරැකුම්පත් සහ ආයෝජන සඳහා වරලත් ආයතනය, එක්සත් රාජධානිය | 16.12.2024 |
| **ගිවිසුම් - ජාත්‍යන්තර** | | |
| 11 | චීන ජාත්‍යන්තර අධ්‍යාපන පදනම (CIEF) සහ චොංකිං නෝමල් යුනිවර්සිටි (CNU) සහ කැලණිය විශ්වවිද්‍යාලය චීනයේ කොන්ෆියුසියස් ආයතනය පිළිබඳ සහයෝගීතාව සම්බන්ධයෙන් | 07.06.2024 |
| 12 | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, UNDP | 18.07.2024 |
| **ගිවිසුම් - දේශීය** | | |
| 13 | ශ්‍රී ලංකා මහ බැංකුවේ පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථානය (LIC) | 01.07.2024 |
| 14 | රෙමීඩියුමෝන් (පුද්) සමාගම | 28.08.2024 |



# උප උපාධි මට්ටමේ පාඨමාලා පිළිබඳ තොරතුරු

කැලණිය විශ්වවිද්‍යාලය මගින් සිසුන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය අවශ්‍යතා සපුරාලීම සඳහා විවිධ පරාසයක උප-උපාධි මට්ටමේ වැඩසටහන් ඉදිරිපත් කරයි. මේවාට සහතිකපත්‍ර පාඨමාලා 20 ක්, උසස් සහතිකපත්‍ර වැඩසටහන් 3 ක්, ඩිප්ලෝමා වැඩසටහන් 31 ක් සහ උසස් ඩිප්ලෝමා වැඩසටහන් 13 ක් ඇතුළත් වේ. මෙම උප-උපාධි පාඨමාලා අතරින් පාඨමාලා 43 ක් සඳහා සමාලෝචිත වසර තුළ සිසුන් ඇතුළත් වී තිබුණි. මෙම වැඩසටහන් විවිධ විෂයයන් පිළිබඳ මූලික, අතරමැදි සහ උසස් දැනුම ලබා දීම, සිසුන්ගේ කුසලතා, රැකියා ලබා ගැනීමේ හැකියාව සහ අධ්‍යයන ප්‍රගතිය වැඩි දියුණු කිරීම සඳහා නිර්මාණය කර ඇත.

වගුව 7: උප උපාධි මට්ටමේ පාඨමාලා පිළිබඳ විස්තර

| පීඨය | වැඩසටහනේ නම | 2024 දී ඇතුළත් කර ගත් සංඛ්‍යාව | 2024 දී උප උපාධිය පිරිනමන ලද සංඛ්‍යාව |
|---|---|---|---|
| FCMS | ව්‍යවසාය සම්පත් සැලසුම්කරණය පිළිබඳ ඩිප්ලෝමාව | 207 | 54 |
| | පුද්ගල කුසලතා පිළිබඳ ඩිප්ලෝමාව | 144 | 32 |
| | අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව | 65 | 35 |
| | ව්‍යාපාර ගිණුම්කරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | 68 | 32 |
| | ව්‍යාපාර මූල්‍ය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | 94 | 40 |
| | ව්‍යාපාර පිළිබඳ උසස් ඩිප්ලෝමාව | 83 | 32 |
| | අලෙවිකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | 40 | 46 |
| | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | 62 | 40 |
| FCT | වෙබ් පාදක මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව | 28 | - |
| FHU | ජ්‍යොතිෂය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 43 | - |
| | වෘත්තීය අරමුණු සඳහා ජපන් භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | - | - |
| | විදේශීය සිසුන් සඳහා දෙමළ භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 5 | 1 |
| | විදේශීය සිසුන් සඳහා සිංහල භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 9 | - |
| | සම්බන්ධ කිරීම: ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අතරමැදි පාඨමාලාවක් | 19 | - |
| | යෝග දර්ශනය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | 29 | - |
| | වෘත්තීය අරමුණු පිළිබඳ ඩිප්ලෝමාව | 24 | - |
| | දෙමළ භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව | 137 | 126 |
| | භාෂා පරිවර්තනය සහ භාෂණ පරිවර්තනය පිළිබඳ ඩිප්ලෝමාව | 100 | 168 |
| | ප්‍රංශ භාෂාව පිළිබඳ ප්‍රවීණතා පාඨමාලාව | 129 | 25 |
| | ජර්මන් භාෂාව පිළිබඳ ප්‍රවීණතා පාඨමාලාව | 170 | 51 |
| | චීන භාෂාව පිළිබඳ ප්‍රවීණතා පාඨමාලාව | 79 | 17 |
| **විද්‍යාපති / ශාස්ත්‍රපති උපාධිය** | - | 12 | 10 | 171 | 193 |
| **දර්ශනපති හෝ එයට සමාන උපාධි** | - | - | 1 | 71 | 72 |
| **දර්ශනශූරි උපාධිය** | - | - | 1 | 342 | 343 |
| **එකතුව** | **304** | **386** | **52** | **714** | **1456** |



# පර්යේෂණ සහ සංවර්ධනය

පර්යේෂණ යනු ඉහළම ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු අවශ්‍යතාවක් ලෙස කැලණිය විශ්වවිද්‍යාලය හඳුනාගෙන ඇත. විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව විසින් පත්‍රිකා ප්‍රකාශනය කිරීම සහ උපකරණ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම සඳහා නව ප්‍රදාන යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලද අතර එය 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. කැලණිය විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය විසින් 2024 වසරේදී ප්‍රකාශන 1056ක් සම්පූර්ණ කර ඇති අතර ඉන් 307ක් SCOPUS-සුචිගත සඟරාවල ප්‍රකාශයට පත් කර ඇත. එපමණක් නොව, විශ්වවිද්‍යාල පේටන්ට් බලපත්‍ර පහක් ලබාගෙන ඇති අතර 2024 වර්ෂයේ දී විද්‍යා හා තාක්ෂණ නිමැවුම් අටක් සිදු කර තිබුණි.

## 7.1. පර්යේෂණ සහ ප්‍රකාශන - 2024

2024 වසරේ පර්යේෂණ ප්‍රකාශන නිමැවුමෙන් වැඩිම සංඛ්‍යාව (436) සම්මන්ත්‍රණ කාර්යසටහන්වල සාරාංශ පළ කිරීම්වලින් සමන්විත විය. එපමණක් නොව, සුචිගත යොමුගත වාර සඟරාවල ලිපි 307ක් ප්‍රකාශයට පත් කරන ලද අතර ඉන් වැඩි ප්‍රමාණයක් විදේශීය සඟරාවල ප්‍රකාශයට පත් කර ඇත. ඊට අමතරව, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය විසින් වසර තුළ සුචිගත නොවූ යොමුගත වාර සඟරාවල ලිපි 151ක්, ග්‍රන්ථ පරිච්ඡේද 26 ක් සහ පාඨ ග්‍රන්ථ 21ක් ප්‍රකාශයට පත් කර ඇත.

වගුව 25: විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සහ ප්‍රකාශන නිමැවුම

| | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය |
| 1 | විද්‍යුත් වාර සඟරා ඇතුළු සුචිගත යොමුගත වාර සඟරාවල පළ කිරීම් සංඛ්‍යාව | | 39 | 253 |
| 2 | විද්‍යුත් සඟරා ඇතුළුව සුචිගත නොකළ යොමුගත සඟරාවල පළ කිරීම් සංඛ්‍යාව | | 98 | 70 |
| 3 | සම්මන්ත්‍රණ කාර්යසටහන් | 3.1 සම්පූර්ණ ලිපි ලෙස පළ කළ ලිපි සංඛ්‍යාව | 94 | 21 |
| | | 3.2 සාරාංශ පළ කිරීම් සංඛ්‍යාව | 364 | 70 |
| 4 | පළ කළ ග්‍රන්ථ පරිච්ඡේද | | 11 | 15 |
| 5 | විශේෂඥ ක්ෂේත්‍රවල පළ කළ ග්‍රන්ථ/ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව | 5.1 ප්‍රකාශකයෙකු මගින් | 17 | 1 |
| | | 5.2 කර්තෘවරයෙකු මගින් | 3 | - |

## 7.2. පර්යේෂණ පරිසංවාද - 2024

කැලණිය විශ්වවිද්‍යාලය මගින් සෑම වසරකම සංවිධානය කරන පර්යේෂණ සම්මන්ත්‍රණ සහ පර්යේෂණ පරිසංවාද සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාව අරමුදල් ප්‍රදානය කරයි. 2024 වර්ෂයේ දී පර්යේෂණ සභාව විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පරිසංවාද 12ක් සඳහා අරමුදල් සපයා ඇත.

වගුව 26: පර්යේෂණ සභාව විසින් අරමුදල් සපයන ලද 2024 දී පවත්වන ලද පර්යේෂණ පරිසංවාද

| පීඨය | අංකය | විස්තරය |
|---|---|---|
| FCMS | 01 | ව්‍යාපාර සහ තොරතුරු පිළිබඳ 15 වන ජාත්‍යන්තර සමුළුව, 2024 නොවැම්බර් 01 සහ 02 |
| | 02 | 13 වන ශිෂ්‍ය පර්යේෂණ පරිසංවාදය 2023, 2024 නොවැම්බර් 19 සහ 20, මූල්‍ය අධ්‍යයනාංශය |
| FCT | 03 | පරිගණක හා තාක්ෂණ පීඨයේ පර්යේෂණ සම්මන්ත්‍රණය 2024, 2024 නොවැම්බර් 08 |
| | 04 | විදුලි හා ඉලෙක්ට්‍රොණික ඉංජිනේරු ආයතනය සම අනුග්‍රාහකත්වය මත පවත්වන ලද තාක්ෂණයේ සහ පරිගණකකරණයේ දියුණුව පිළිබඳ 9 වන ජාත්‍යන්තර සමුළුව 2024 (ICATC 2024) |
| FGS | 05 | ජාත්‍යන්තර පශ්චාත් උපාධි පර්යේෂණ සමුළුව (IPRC) 2024, 2024 නොවැම්බර් 29 |
| FHU | 06 | 7 වන මානව ශාස්ත්‍ර උපාධි පර්යේෂණ පරිසංවාදය (HUG 2024), 2024 පෙබරවාරි 18 සහ 19 |
| | 07 | සිංහල අධ්‍යයනය පිළිබඳ ජාතික සමුළුව (NCSS) 2024, 2025 ජනවාරි 30 දින සිංහල අධ්‍යයනාංශය |
| FMED | 08 | මහාචාර්ය කාලෝ ෆොන්සේකා අනුස්මරණ තරුණ පර්යේෂකයින්ගේ දිනය 2024, 2024 අගෝස්තු 23, මහජන සෞඛ්‍ය සහ වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය |
| FSC | 09 | ස්මාර්ට් පරිගණක සහ පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ (SCSE) 2024 සම්මන්ත්‍රණය, 2024 අප්‍රේල් 04, කාර්මික කළමනාකරණ අධ්‍යයනාංශය |
| | 10 | ව්‍යවහාරික සහ ශුද්ධ විද්‍යාවන් පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ICAPS) - 2024, 2024 ඔක්තෝබර් 11 |
| FSS | 11 | 6 වන ජාත්‍යන්තර අධ්‍යයන ශිෂ්‍ය පර්යේෂණ සම්මන්ත්‍රණය 2023, 2023 ඔක්තෝබර් 11, ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යයනාංශය |
| Library | 12 | "Exploring Boundless Horizons( University Insights through Secondary Sources" යන මැයෙන් 2024 ඔක්තෝබර් 25 දින පවත්වන ලද සම්මන්ත්‍රණය |

## 7.3. අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන - 2024

පෙර වර්ෂවල දී මෙන්ම 2024 වර්ෂයේ දී ද උපරිම වශයෙන් රු.500,000.00කට යටත්ව, නියමිත අවසාන දිනයක් ද නම් කරමින් පූර්වයෙන් පිළියෙළ කළ අයදුම්පත්‍රයක් භාවිතා කරමින් විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලු□ම සාමාජිකයන්ට ආරාධනා කරන ලදී. රුපියල් 300,000ක් දක්වා වූ මුළු අයවැයක් සහිත අයදුම්පත්, අදාළ පීඨ මණ්ඩල විසින් නම් කරන ලද අභ්‍යන්තර සමාලෝචකයින් විසින් සමාලෝචනය කරන ලද අතර, රුපියල් 500,000ක් දක්වා අයවැයක් සහිත අයදුම්පත්, පර්යේෂණ සහ ප්‍රකාශන කමිටුව විසින් නම් කරන ලද බාහිර සමාලෝචකයින් වෙත ඉදිරිපත් කරන ලදී.

සමාලෝචන අදහස් අයදුම්කරුවන් සමඟ බෙදා ගන්නා ලද අතර, අදාළ නිවැරදි කිරීම් ඇතුළත් කර විශ්වවිද්‍යාල පර්යේෂණ සහ ප්‍රකාශන කමිටුවේ නිර්දේශය සහ සනාතන සභාවේ සහ විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය සඳහා එම අයදුම්පත් ඉදිරිපත් කරන ලදී. අරමුදල් නිදහස් කිරීමට පෙර ප්‍රදානය ලබන්නන් විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹීම අවශ්‍ය වේ. පර්යේෂණ සහ ප්‍රකාශන කමිටුව මාස 6ක ප්‍රගති වාර්තා සහ අවසාන වාර්තා මගින් ප්‍රගතිය අධීක්ෂණය කරයි. ඒ අනුව, 2024 වර්ෂයේ දී රු. 8,675,360ක වටිනාකමක් සහිත විශ්වවිද්‍යාල අධ්‍යයන පර්යේෂණ ප්‍රදාන ලබා ගැනීම සඳහා වාණිජ හා කළමනාකරණ අධ්‍යයන, පරිගණක හා තාක්ෂණ, මානව ශාස්ත්‍ර, වෛද්‍ය, විද්‍යා සහ සමාජ විද්‍යා යන පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 21 දෙනෙකුගේ අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු සිදු කරන ලදී. මේ පිළිබඳ විස්තර පහත 27 වගුවේ දක්වා ඇත.

ඉහත කරුණු වලට අමතරව, අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන සඳහා පවතින මාර්ගෝපදේශ සහ ආකෘති 2024 දී නැවත සමාලෝචනය කර සුදුසු පරිදි සංශෝධනය කරන ලද අතර, ප්‍රකාශන ප්‍රමාණය වැඩි කිරීම සහ ප්‍රදාන පිරිනැමීමේදී  සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමේදී පර්යේෂකයින් සහ පරිපාලනය යන දෙපිරිසටම මුහුණ දීමට සිදුවන සංකීර්ණතා අවම කිරීම මෙහි අරමුණු වී ඇත.

වගුව 27: 2024 අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන පිළිබඳ විස්තර

| පීඨය | අධ්‍යයනාංශයේ නම | අයදුම් කරන ලද පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව | ඉල්ලුම් කරන ලද අරමුදල් ප්‍රමාණය (රු.) |
|---|---|---|---|
| **වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය** | Commerce and Financial Management | 01 | 232,000.00 |
| **පරිගණක හා තාක්ෂණ පීඨය** | Applied Computing<br>Computer System Engineering | 02 | 750,000.00 |
| **මානව ශාස්ත්‍ර පීඨය** | Pali and Buddhist Studies<br>Modern Languages<br>Sinhala | 03 | 1,200,000.00 |
| **වෛද්‍ය පීඨය** | Psychiatry<br>Pharmacology<br>Medical Education<br>Biochemistry and Clinical Chemistry<br>Medical Microbiology<br>Physiology | 07 | 2,893,360.00 |
| **විද්‍යා පීඨය** | Physics and Electronics<br>Chemistry<br>Zoology and Environmental Management | 06 | 2,950,000.00 |
| **සමාජ විද්‍යා පීඨය** | Geography | 02 | 650,000.00 |
| | **මුළු එකතුව** | **21** | **8,675,360.00** |

# 7.4. පේටන්ට් බලපත්‍ර - 2024

වගුව 28: 2024 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයට ලැබුණු පේටන්ට් බලපත්‍ර

| පේටන්ට් බලපත්‍රයේ නම | පේටන්ට් බලපත්‍රලාභියාගේ / බලපත්‍රලාභීන්ගේ නම/නම් | පේටන්ට් බලපත්‍රය ලැබුණු දිනය |
|---|---|---|
| Addressable, Reliable, and Bidirectional Data Communication System for Internet of Things (IoT) and Industrial Internet of Things (IIoT) Applications Based on Controller Area Network (CAN) Protocol to Monitor, Control & Visualize Real-time Data on a Local or Remote Dashboard. | එල්.ඩී.පුබුදු සංජුක ජයසේකර මයා, තරිඳු නිරෝෂන් ගුරුසිංහ මයා, හිරුණි එරංගා විජේසූරිය මිය, ආර්.එම්. ඉෂාර උදයන්ත රාජපක්ෂ මයා, ආචාර්ය පී.එල්.ඒ.කේ පියුමාල්, ආචාර්ය ඒ.එල්.ඒ.කේ.රණවීර, ආචාර්ය කේ.එම්.ඩී.සී.ජයතිලක, ආචාර්ය ජෙහාන් සෙනෙවිරත්න, මහාචාර්ය එල්.ඩී.ඩී.ආර්.පී.විජේසුන්දර, මහාචාර්ය එස්.ආර්.ඩී.කාලිංගමුදලි. | 07.05.2024 |
| An Artificial Intelligence Based Smart Liquid Petroleum Gas Level Indicator Device | ආර්.එම්.ඉෂාර උදයන්ත රාජපක්ෂ මයා, එල්.ඩී.පුබුදු සංජුක ජයසේකර මයා, තරිඳු නිරෝෂන් ගුරුසිංහ මයා, හිරුණි එරංගා විජේසූරිය මිය, එම්.පී.ඒ.වී.ගුණවර්ධන මයා, ආචාර්ය පී.එල්.ඒ.කේ.පියුමාල්, ආචාර්ය ඒ. එල්. ඒ. කේ. රණවීර, ආචාර්ය කේ. එම්. ඩී. සී. ජයතිලක, ආචාර්ය ජෙහාන් සෙනෙවිරත්න, මහාචාර්ය එල්. ඩී. ඩී. ආර්. පී. විජේසුන්දර, මහාචාර්ය එස්. ආර්. ඩී. කාලිංගමුදලි | 21.10.2024 |

වගුව 28: (සම්බන්ධයි)

| | | |
|---|---|---|
| Automated Liquid Fertilizer Manufacturing Apparatus (Industrial Design) | ආචාර්ය ආර්. එම්. සී. එස්. රත්නායක, පී. ඩී. අවන්ත ප්‍රසාද් මහතා | 02.04.2024 |
| Internet Independent Wireless Real-Time Water Quality Monitoring Unit (Industrial Design) | හිරුණි එරංගා විජේසූරිය මිය, එල්.ඩී. පුබුදු සංජුක ජයසේකර මයා, තරිඳු නිරෝෂන් ගුරුසිංහ මයා, ආර්. එම්. ඉෂාර උදයන්ත රාජපක්ෂ මයා, එම්.පී.ඒ.වී. ගුණවර්ධන මයා, ආචාර්ය පී. එල්. ඒ. කේ. පියුමාල්, ආචාර්ය ඒ. එල්. ඒ. කේ. රණවීර, ආචාර්ය කේ. එම්. ඩී. සී. ජයතිලක, ආචාර්ය ජෙහාන් සෙනෙවිරත්න, මහාචාර්ය එල්. බී. ඩී. ආර්. පී. විජේසුන්දර, මහාචාර්ය එස්. ආර්. ඩී. කාලිංගමුදලි | 02.04.2024 |
| Safety Electrical Switch (Industrial Design) | ආර්.එම්.ඉෂාර උදයන්ත රාජපක්ෂ මයා, තරිඳු නිරෝෂන් ගුරුසිංහ මයා, හිරුණි එරංගා විජේසූරිය මිය, එල්.ඩී.පුබුදු සංජුක ජයසේකර මයා, එම්.පී.ඒ.වී.ගුණවර්ධන මයා, ආචාර්ය පී.එල්.ඒ.කේ.පියුමාල්, ආචාර්ය ඒ. එල්. ඒ. කේ. රණවීර, ආචාර්ය කේ. එම්. ඩී. සී. ජයතිලක, ආචාර්ය ජෙහාන් සෙනෙවිරත්න, මහාචාර්ය එල්. බී. ඩී. ආර්. පී. විජේසුන්දර, මහාචාර්ය එස්. ආර්. ඩී. කාලිංගමුදලි. | 31.07.2024 |

වගුව 29: 2024 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලය මගින් ගොනු කරන ලද පේටන්ට් බලපත්‍ර

| පේටන්ට් බලපත්‍රයේ නම | පේටන්ට් බලපත්‍රලාභියාගේ / බලපත්‍රලාභීන්ගේ නම/නම් | පේටන්ට් බලපත්‍රය ගොනු කළ දිනය |
|---|---|---|
| A Cost-effective, Wearable, Wireless, Real-Time Hand Gesture System & Method for the Interpretation of Sign Language | එම්. එන්. කුසලංග, ආචාර්ය. එච්. කේ. ටී. කේ.විජයසිරිවර්ධන, එස්. ජී. වී.ශාන්ත ජයලාල්. | 19.06.2024 |
| A Formulation of Herbal cream containing Curcuma longa L. (Turmeric) and Elaeocarpus serratus L. (Ceylon Olive) with anti-Inflammatory properties | ආචාර්ය ඩී.ජී.එම්. ජයමිණි ගුණරත්න, ඩී.කේ.එම්.විමලසූරිය | 26.08.2024 |

# 7.5. විද්‍යා හා තාක්ෂණ සංවර්ධන නිමැවුම - 2024

වගුව 30: 2024 වර්ෂයේ දී විද්‍යා සහ තාක්ෂණ සංවර්ධන නිමැවුම

| විද්‍යා හා තාක්ෂණ සංවර්ධන නිමැවුමේ නම | තත්ත්වය |
|---|---|
| **නව නිෂ්පාදන/ක්‍රියාවලි සංවර්ධනය** | |
| ස්වයංක්‍රීය ද්‍රව පොහොර නිෂ්පාදන උපකරණ | සංවර්ධනය කර ඇත |
| හයිඩ්‍රොපොනික් ශාක ජල කළමනාකරණ පද්ධතිය | සංවර්ධනය කර ඇත |
| ෆ්ලෝලෝ - ස්වයංක්‍රීය ස්මාර්ට් සාප්පු කරත්තය | සංවර්ධනය කර ඇත |
| ජල ආරක්ෂිත ස්ලයිඩ්-සිපර් ජැකට් | සංවර්ධනය කර ඇත |
| ස්මාර්ට් අත් පටියක් | සංවර්ධනය කර ඇත |
| බලශක්ති ඉතිරිකිරීමේ ආලෝකකරණ පද්ධතිය | සංවර්ධනය කර ඇත |
| **පවතින නිෂ්පාදන/ක්‍රියාවලි වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම** | |
| සුවපහසු, පීඩාවකින් තොර ගමන් සඳහා රැගෙන යා හැකි 3-in-1 neck pillow එකක් | සංවර්ධනය කර ඇත |
| ස්මාර්ට් දිවා ආහාර පෙට්ටිය - Nutri Go | සංවර්ධනය කර ඇත |



# ශිෂ්‍ය සුබසාධන පහසුකම්

කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන්ට සිය පංති කාමර, දේශන ශාලා අධ්‍යයන කටයුතුවලින් පරිබාහිරව භාවිත කිරීම සඳහා විවිධ පහසුකම් සපයා ඇත. පුස්තකාල ප්‍රවේශය, ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාල නේවාසිකාගාර, ආපනශාලා, වෛද්‍ය මධ්‍යස්ථානය, ක්‍රීඩා පහසුකම්, රසායනාගාර පහසුකම් සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පහසුකම් සහ තවත් බොහෝ දේ මෙම පහසුකම්වලට ඇතුළත් වේ.

2024 වසරේ උපාධි අපේක්ෂකයින් 5,505 දෙනෙකුට මහපොළ ශිෂ්‍යත්ව ලබා දුන් අතර සිසුන් 3,794 දෙනෙකුට ශිෂ්‍යාධාර ලැබී ඇත. මහපොළ ශිෂ්‍යත්වලාභීන්ට එක් වාරිකයක් සඳහා රු. 5,000.00ක් ලබා දෙන අතර ශිෂ්‍යාධාර ලබන්නන්ට එක් වාරිකයක් සඳහා රු.4000.00ක් බැගින් එක් අධ්‍යයන වර්ෂයකට වාරික 10ක් සඳහා ශිෂ්‍යාධාර ලැබේ. මෙයට අමතරව, කැලණිය විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය, විද්‍යා පීඨයේ ආදි සිසුන් සහ විශේෂිත අධ්‍යයනාංශ මගින් පිරිනමනු ලබන තවත් ශිෂ්‍යත්ව කිහිපයක් ද උපාධි අපේක්ෂකයින් සඳහා ලබා දෙනු ලැබේ.

## 8.1. ශිෂ්‍යත්ව

වගුව 31: මහපොළ සහ ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව

| පීඨය | ඇතුළත් කර ගන්නා ලද වර්ෂය | අධ්‍යයන වර්ෂය | ආධාර ලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | මහපොළ | ශිෂ්‍යාධාර |
| FCMS | 2022/23 | 1 | - | 481 |
| | 2021/22 | 2 | 552 | 110 |
| | 2020/21 | 3 | 503 | 185 |
| | 2019/20 | 4 | 475 | 194 |
| | | **එකතුව** | ***1530*** | ***970*** |
| FCT | 2022/23 | 1 | - | 105 |
| | 2021/22 | 2 | 141 | 15 |
| | 2020/21 | 3 | 142 | 14 |
| | 2019/20 | 4 | 176 | 19 |
| | | **එකතුව** | ***459*** | ***153*** |
| FHU & FSS | 2022/23 | 1 | - | 855 |
| | 2021/22 | 2 | 893 | 220 |
| | 2020/21 | 3 | 738 | 374 |
| | 2019/20 | 4 | 628 | 365 |
| | | **එකතුව** | ***2259*** | ***1814*** |
| FMED | 2022/23 | 1 | - | 84 |
| | 2021/22 | 2 | 101 | 27 |
| | 2020/21 | 3 | 120 | 46 |
| | 2019/20 | 4 | 98 | 26 |
| | 2018/19 | 5 | 72 | 6 |
| | 2017/18 | 5 | - | - |
| | | **එකතුව** | ***391*** | ***189*** |
| FSC | 2022/23 | 1 | - | 369 |
| | 2021/22 | 2 | 357 | 127 |
| | 2020/21 | 3 | 382 | 147 |
| | 2019/20 | 4 | 127 | 25 |
| | | **එකතුව** | ***866*** | ***668*** |
| | | **මුළු එකතුව** | **5505** | **3794** |

කැලණිය විශ්වවිද්‍යාලය ශිෂ්‍යාධාර සහ මහපොළ ශිෂ්‍යත්ව ලබාදීමට අමතරව සිසුන්ට උපකාර කිරීම සඳහා බොහෝ ශිෂ්‍යත්ව සහ ත්‍යාග පිරිනමයි.

මෙම ශිෂ්‍යත්ව සහ ත්‍යාග පදනම් වන්නේ සිසුන්ගේ අනාගතය වෙනුවෙන් උපකාර කිරීම පිණිස අවංකවම කැප වූ පරිත්‍යාගශීලීන්ගේ පරිත්‍යාග මත වන අතර මූල්‍ය අවශ්‍යතා සහිත සිසුන්ට පිරිනමන ශිෂ්‍යත්ව සහ විශිෂ්ට කාර්යසාධනයක් පෙන්නුම් කරන සිසුන්ට පිරිනමනු ලබන ත්‍යාග ලෙස ඒවා ප්‍රධාන වර්ග දෙකකට ඇතුළත් කෙරේ. මූල්‍ය අවශ්‍යතා සහිත සිසුන්ට පිරිනමනු ලබන ශිෂ්‍යත්ව දිගු කාලයක් පුරා සපයනු ලබන මූල්‍ය ආධාර වන අතර අයදුම්පත් කැඳවීමෙන් සිසුන් ඒ සඳහා තෝරා ගනු ලැබේ. විශිෂ්ට කාර්යසාධනයක් සහිත සිසුන්ට පිරිනමනු ලබන ත්‍යාග වන්නේ 1 වන වසරේ හෝ අවසාන විභාගවල ඔවුන්ගේ කාර්යසාධනය මත පදනම්ව මුදල් ත්‍යාග හෝ පදක්කම් ලෙස එක් වරක් ලබා දෙන සම්මාන වේ. මේ වන විට ශිෂ්‍යත්ව සහ ත්‍යාග 20 ක් ක්‍රියාත්මක වේ. මෙම සියලුම ශිෂ්‍යත්ව සහ ත්‍යාග සඳහා ඒවාටම සුවිශේෂී වූ නිර්ණායක ඇත. මෙම නිර්ණායක පරිත්‍යාග ශීලීන් විසින්ම යෝජනා කරනු ලබන අතර, නැතහොත් සිසුන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා පවතින අරමුදල් මත පදනම්ව අදාළ අධ්‍යයනාංශ විසින් සකස් කරන ලද නිර්ණායක ද පවතී.

ශිෂ්‍යත්ව සහ ත්‍යාග ක්‍රියාත්මක කරනු ලබන්නේ අදාළ නිර්ණායක සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ අදාළ පීඨ මණ්ඩලයේ සහ සනාතන සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, එක් එක් අධ්‍යයන වර්ෂය සඳහා තෝරාගත් සිසුන් සඳහා ද අනුමැතිය ලබා ගැනීමෙන් පසුවය. අදාළ ගිණුම්වල සැලකිය යුතු පොළී මුදලක් ප්‍රයෝජනයට නොගෙන පවතින බව මෑතකදී අවධානයට ලක් විය. ඒ අනුව කාලීන අවශ්‍යතා සපුරාලීම සඳහා මෙන්ම අදාළ සිසුන්ට ලැබෙන ප්‍රතිලාභය වැඩි වන ආකාරයෙන් ද නිර්ණායක සංශෝධනය කිරීමට කටයුතු කරන ලදී. සිසුන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම පොළී ශේෂය ප්‍රශස්ථ ධාරිතාවට අනුව උපයෝජනය කිරීම සහතික කිරීමට මෙම සංශෝධන මාලාව උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# 8.2. නේවාසිකාගාර පහසුකම්

නිවාස සැපයීම සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, නේවාසිකාගාර ඉල්ලා සිටින බොහෝ සිසුන්ට කැලණිය විශ්වවිද්‍යාලය මගින් නවාතැන් පහසුකම් ලබා දෙයි. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන, පරිගණක හා තාක්ෂණ, මානව ශාස්ත්‍ර, විද්‍යා සහ සමාජීය විද්‍යා පීඨවල සමස්තයක් වශයෙන් උපාධි අපේක්ෂකයින් 6,011 දෙනෙකුට දළුගම පිහිටි විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ සහ ඒ අවටින් නේවාසිකාගාර පහසුකම් සපයා ඇති අතර රාගම වෛද්‍ය පීඨය මඟින් නේවාසිකාගාර පහසුකම් ඉල්ලා ඇති සියලුම ශිෂ්‍යයන් සඳහා නේවාසිකාගාර පහසුකම් සලසා දී ඇත.

වගුව 32: 2024 වර්ෂයේ නේවාසිකාගාර පහසුකම් ලබා ගත් සිසුන්

| පීඨය | අධ්‍යයන වර්ෂය | ඇතුළත් කර ගන්නා ලද වර්ෂය | නේවාසිකාගාර පහසුකම් ලබා ගත් සිසුන් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | පිරිමි | කාන්තා | එකතුව |
| FCMS | 1 | 2022/23 | 94 | 209 | 303 |
| | 2 | 2021/22 | 60 | 146 | 206 |
| | 3 | 2020/21 | 76 | 182 | 258 |
| | 4 | 2019/20 | 59 | 183 | 242 |
| FCT | 1 | 2022/23 | 82 | 38 | 120 |
| | 2 | 2021/22 | 54 | 22 | 76 |
| | 3 | 2020/21 | 50 | 29 | 79 |
| | 4 | 2019/20 | 68 | 33 | 101 |
| FHU & FSS | 1 | 2022/23 | 82 | 688 | 770 |
| | 2 | 2021/22 | 86 | 636 | 722 |
| | 3 | 2020/21 | 85 | 699 | 784 |
| | 4 | 2019/20 | 74 | 684 | 758 |
| FMED | 1 | 2022/23 | 36 | 42 | 78 |
| | 2 | 2021/22 | 54 | 237 | 291 |
| | 3 | 2020/21 | 76 | 239 | 315 |
| | 4 | 2019/20 | 58 | 79 | 137 |
| FMED | 5 | 2018/19 | 55 | 108 | 163 |
| | 5 | 2017/18 | - | 1 | 1 |
| FSC | 1 | 2022/23 | 105 | 127 | 232 |
| | 2 | 2021/22 | 58 | 105 | 163 |
| | 3 | 2020/21 | 49 | 77 | 126 |
| | 4 | 2019/20 | 34 | 52 | 86 |
| | | එකතුව | *1395* | *4616* | *6011* |


RICHMORAL

9

# ක්‍රීඩා ක්‍රියාකාරකම්

විවිධ ක්‍රීඩා රැසකට සහාය ලබා දීමට හැකි වන පරිදි කැලණිය විශ්වවිද්‍යාලය සතුව විශිෂ්ට ගණයේ පහසුකම් පවතී. එම පහසුකම්වලට පහත 33 වගුවේ දක්වා ඇති පහසුකම් සහ 34 වගුවේ ලැයිස්තුගත කර ඇති කාර්ය මණ්ඩලය ඇතුළත් වේ.

වගුව 33: ක්‍රීඩා පහසුකම්

| | |
|---|---|
| **ගෘහස්ත ක්‍රීඩාංගණ** | නව ගෘහස්ථ ව්‍යායාම ශාලාව |
| | ශිෂ්‍ය කේන්ද්‍රයේ ව්‍යායාම ශාලාව |
| | ව්‍යායාම ශාලාව, වෛද්‍ය පීඨය, රාගම |
| | ශක්ති පුහුණු මධ්‍යස්ථානය, කැලණිය |
| | ශක්ති පුහුණු මධ්‍යස්ථානය, කන්නන්ගර නේවාසිකාගාර පරිශ්‍රය |
| | ශාරීරික යෝග්‍යතා මධ්‍යස්ථානය, කාන්තා නේවාසිකාගාර දාමය |
| | කැරම් පරිශ්‍ර |
| **එළිමහන් ක්‍රීඩාංගණ** | ප්‍රධාන ක්‍රීඩා පිටිය, කැලණිය |
| | පිටිය අංක 2, කැලණිය |
| | එළිමහන් පැසිපන්දු පිටිය |
| | ටෙනිස් පිටිය |
| | එළිමහන් වොලිබෝල් පිටිය 1 |
| | එළිමහන් නෙට්බෝල් පිටිය |
| | එළිමහන් පැසිපන්දු පිටිය, වෛද්‍ය පීඨය |
| | එළිමහන් දැල්පන්දු සහ වොලිබෝල් පිටිය, වෛද්‍ය පීඨය |

වගුව 34: කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

| | |
|---|---|
| 1 | ජී.ජී.යූ. සමන් කුමාර: වැ.බ. ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 2 | එච්.ඩී.එස්.ජී විජයගුණරත්න: ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක I ශ්‍රේණිය |
| 3 | කේ.එන්. සඳමාල් කුමාරි: ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක II ශ්‍රේණිය |
| 4 | ජී.ඒ සරණි ගොඩමුනේ: ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක III ශ්‍රේණිය |
| 5 | එච්එම්කේටී කරුණාරත්න: ශාරීරික අධ්‍යාපන උපදේශක III ශ්‍රේණිය |
| 6 | එම්අයිජී කුමාරි: ශාරීරික අධ්‍යාපන උපදේශක III ශ්‍රේණිය |
| 7 | අරවින්ද අතුකෝරල: ශාරීරික අධ්‍යාපන උපදේශක III ශ්‍රේණිය |
| 8 | ජීආර්සී කුලරත්න: ශාරීරික අධ්‍යාපන උපදේශක III ශ්‍රේණිය |
| 9 | සීජීකේ කරුණාසේන: ව්‍යායාම ශාලා සහායක පහළ ශ්‍රේණිය |
| 10 | ඩබ්ලිව්.ජී.ජී ප්‍රදීප්: ව්‍යායාම ශාලා සහායක පහළ ශ්‍රේණිය |
| 11 | කේඒඩී නන්දිසුමිත්‍ර: වැඩ සහායක I ශ්‍රේණිය |
| 12 | ජේ.එම්.එන්.නිශාන්ත මහතා: වැඩ සහායක II ශ්‍රේණිය |
| 13 | එස්ජීඑම්පී වීරසිංහ මහතා: වැඩ සහායක III ශ්‍රේණිය |
| 14 | ජේ.ඒ.ඩී.එස්. මධුශංක මහතා: වැඩ සහායක III ශ්‍රේණිය |
| 15 | එම්.ඒ.සී.එස්. මල්ලවආරච්චි මහතා: කම්කරු III ශ්‍රේණිය |
| 16 | සතීස්වරන් මහත්මිය: වැඩ සහායිකා III ශ්‍රේණිය |
| 17 | ආර්.එන්. නිශාන්ත මහතා: වැඩ සහායක III ශ්‍රේණිය |

# 9.1. ක්‍රීඩා කටයුතු සංවිධානය කිරීම සහ සහභාගීත්වය

වගුව 35: ක්‍රීඩා ඉසව්

| | | | |
|---|---|---|---|
| ඇරොබික් ජිම්නාස්ටික් | (පිරිමි සහ කාන්තා) | පැරා ස්පෝර්ට්ස් | (පිරිමි සහ කාන්තා) |
| බැඩ්මින්ටන් | (පිරිමි සහ කාන්තා) | රයිෆල් වෙඩි තැබීම | (පිරිමි සහ කාන්තා) |
| බේස්බෝල් | (පිරිමි) | රග්බි | (පිරිමි) |
| පැසිපන්දු | (පිරිමි සහ කාන්තා) | ස්ක්‍රැබල් | (පිරිමි සහ කාන්තා) |
| බොක්සිං | (පිරිමි) | පිහිනීම | (පිරිමි සහ කාන්තා) |
| කැරම් | (පිරිමි සහ කාන්තා) | මේස පන්දු | (පිරිමි සහ කාන්තා) |
| චෙස් | (පිරිමි සහ කාන්තා) | ටයිකොන්ඩෝ | (පිරිමි සහ කාන්තා) |
| ක්‍රිකට් | (පිරිමි) | ටෙනිස් | (පිරිමි සහ කාන්තා) |
| එල්ලේ | (පිරිමි සහ කාන්තා) | ජවන හා පිටිය | (පිරිමි සහ කාන්තා) |
| පාපන්දු | (පිරිමි සහ කාන්තා) | වොලිබෝල් | (පිරිමි සහ කාන්තා) |
| හොකී | (පිරිමි සහ කාන්තා) | බර ඉසිලීම | (පිරිමි සහ කාන්තා) |
| ජූඩෝ | (පිරිමි සහ කාන්තා) | මල්ලවපොර | (පිරිමි සහ කාන්තා) |
| කබඩි | (පිරිමි සහ කාන්තා) | වුෂු | (පිරිමි සහ කාන්තා) |
| කරාටේ | (පිරිමි සහ කාන්තා) | යෝග | (පිරිමි සහ කාන්තා) |
| දැල්පන්දු | (කාන්තා) | | |

| | | |
|---|---|---|
| මුළු කණ්ඩායම් ගණන (පිරිමි සහ කාන්තා) | - | 53 |
| සංචිත සාමාජිකයින්ගේ මුළු සංඛ්‍යාව | - | 978 |
| තරඟකාරී ක්‍රීඩා වලට සම්බන්ධ සිසුන් සංඛ්‍යාව | - | 2,078 |
| විනෝදාත්මක මට්ටමින් ක්‍රීඩාවට සම්බන්ධ සිසුන් සංඛ්‍යාව | - | 2,414 |

# 9.2. ක්‍රීඩා පුහුණු වැඩසටහන් සහ ක්‍රීඩා ඉසව්

2024 ජනවාරි 01 දිනෙන් ආරම්භ කර 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පරිදි සියලුම ක්‍රීඩා සඳහා පුහුණු සැසි 1,801ක් පවත්වන ලදී. තවද, පැරා ක්‍රීඩා සහ යෝග හැර ක්‍රීඩා විෂයයන් 27ක් සඳහා සිසුන් 88 දෙනෙකු නායක සහ උප නායක (පිරිමි සහ කාන්තා) ලෙස පත් කර ඇත.

වගුව 36: 2024 දී පැවැත්වූ ක්‍රීඩා ඉසව් සහ සහභාගීත්වය

| ක්‍රීඩා ඉසව් | සහභාගිවන්නන් සංඛ්‍යාව (සිසුන්) |
|---|---|
| පුහුණු වැඩසටහන් (තරඟ ද ඇතුළුව) | 2,234 |
| සියලුම පීඨවල නවක සිසුන් සඳහා ක්‍රීඩා වැඩසටහන | 1,183 |
| අන්තර් පීඨ ශූරතා (ක්‍රීඩා විෂයයන් 26ක් සඳහා) | 2025 පෙබරවාරි මස පැවැත්වීමට සැලසුම් කර ඇත |
| ක්‍රීඩා අධ්‍යාපන අංශය | 144 |
| ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ | Not held |
| මිත්‍රශීලී සහ ද්විත්ව තරග සංඛ්‍යාව | 164 ( සිසුන් 1902) |
| සහභාගී වූ ජාත්‍යන්තර තරඟ සංඛ්‍යාව | 04 |
| ජාත්‍යන්තර තරඟ සඳහා සහභාගී වූ සිසුන් සංඛ්‍යාව | 04 |
| වාර්ෂිකව වර්ණ ලබා ගත් සිසුන් සංඛ්‍යාව | 363 |
| මාණ්ඩලික ක්‍රීඩා තරඟ සඳහා සහභාගිවන්නන් සංඛ්‍යාව | 108 |

# 9.3. 2024 වර්ෂයේ දී ජාතික සහ අන්තර් විශ්වවිද්‍යාල මට්ටමේ තරඟවල දී දක්වන ලද කුසලතා

**අන්තර් විශ්වවිද්‍යාල ශූරතා 2024**

1983 සිට වසර 41ක කාලපරිච්ඡේදයකට පසු අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවලියේ සමස්ත අනුශූරතාවය දිනා ගනිමින් විශ්වවිද්‍යාලීය ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කිරීමට කැලණිය විශ්වවිද්‍යාලය ආඩම්බරයෙන් සමත් විය. මෙය සියලුම සිසුන්ගේ, පුහුණුකරුවන්ගේ සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශයේ සහ ක්‍රීඩා උපදේශක මණ්ඩලයේ සියලුම කාර්ය මණ්ඩලයේ කැපවීම නිසා ලැබූ ජයග්‍රහණයකි. ක්‍රීඩා 21 කින් පළමු ස්ථාන තුනට ළඟා වීමට සහ ශූරතා 5 ක් දිනා ගැනීමට හැකිවීම අපගේ සිසුන් පෙන්නුම් කළ විශිෂ්ට ජයග්‍රහණයකි. එමෙන්ම සියලුම ක්‍රීඩා ඉසව්වල පිහිටුවා ඇති නව වාර්තා 24 න් 12 ක් අපගේ සිසුන් විසින් හිමිකර ගැනීම ද කැපී පෙනෙන ජයග්‍රහණයකි.

වගුව 37: 2024 අන්තර් විශ්ව විද්‍යාල මට්ටමේ තරඟවල දක්ෂතා

| Sport Event | Performance |
|---|---|
| **වොලිබෝල්** | පිරිමි, ශූරතා |
| | කාන්තා, ශූරතා |
| **ටයිකොන්ඩෝ** | කාන්තා, ශූරතා |
| **කරාටේ** | කාන්තා, ශූරතා |
| | පිරිමි, දෙවන අනුශූරතාව |
| **බැඩ්මින්ටන්** | පිරිමි, ශූරතා |
| | කාන්තා, දෙවන අනුශූරතාව |
| **කැරම්** | පිරිමි, පළමු අනුශූරතාව |
| | කාන්තා, පළමු අනුශූරතාව |
| **චෙස්** | කාන්තා, පළමු අනුශූරතාව |
| | පිරිමි, දෙවන අනුශූරතාව |
| **ජවන හා පිටිය** | කාන්තා, පළමු අනුශූරතාව |
| | පිරිමි, දෙවන අනුශූරතාව |
| **එල්ලේ** | පිරිමි, දෙවන අනුශූරතාවය |
| **එල්ලේ** | කාන්තා, දෙවන අනුශූරතාවය |
| **හොකී** | පිරිමි, දෙවන අනුශූරතාව |
| | පිරිමි, තෙවන අනුශූරතාව |
| | කාන්තා, අර්ධ අවසන් පූර්ව වටයට සුදුසුකම් ලැබූ කණ්ඩායම් |
| **බීච් වොලිබෝල්** | පිරිමි, දෙවන අනුශූරතාවය |
| **බේස්බෝල්** | පිරිමි, දෙවන අනුශූරතාවය |
| | පිරිමි, අර්ධ අවසන් පූර්ව වටයට සුදුසුකම් ලැබූ කණ්ඩායම් |
| **මේස පන්දු** | පිරිමි, දෙවන අනුශූරතාව |
| | පිරිමි, අර්ධ අවසන් පූර්ව වටයට සුදුසුකම් ලැබූ කණ්ඩායම් |
| | කාන්තා, අර්ධ අවසන් පූර්ව වටයට සුදුසුකම් ලැබූ කණ්ඩායම් |
| **මල්ලවපොර** | පිරිමි, දෙවන අනුශූරතාවය |
| **කබඩි** | කාන්තා, දෙවන අනුශූරතාවය |
| **රග්බි** | පිරිමි, තෙවන අනුශූරතාවය |
| **බර ඉසිලීම** | පිරිමි, තෙවන අනුශූරතාවය |
| **නෙට්බෝල්** | කාන්තා, තෙවන අනුශූරතාවය |
| **පැසි පන්දු** | පිරිමි, අර්ධ අවසන් පූර්ව වටයට සුදුසුකම් ලැබූ කණ්ඩායම් |
| | කාන්තා, අර්ධ අවසන් පූර්ව වටයට සුදුසුකම් ලැබූ කණ්ඩායම් |
| **පා පන්දු** | පිරිමි, අර්ධ අවසන් පූර්ව වටයට සුදුසුකම් ලැබූ කණ්ඩායම් |

# 9.4. 2024 දී ජාත්‍යන්තර තරඟවලදී දක්වන ලද කුසලතා

**ලෝක විශ්වවිද්‍යාල චෙස් ශූරතාවලිය - එන්ටෙබේ, උගන්ඩාව**

වෛද්‍ය පීඨයේ පළමු වසරේ සිසුවියක වන නික්ලේෂා තරුෂි, මේ වසරේ ජුනි මස 25 සිට 30 දක්වා උගන්ඩාවේ කම්පාලා හි පැවති ලෝක විශ්වවිද්‍යාල චෙස් ශූරතාවලියේදී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල චෙස් කණ්ඩායම නියෝජනය කළාය. මෙම තරඟයේදී නික්ලේෂා විශිෂ්ට දස්කම් දැක්වූ අතර එහිදී ඇය කේවල වටයේ සිව්වන ස්ථානය දිනා ගැනීමට සමත් වූවාය. ඇයගේ මෙම දස්කම ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟයකදී ශ්‍රී ලාංකික සිසුවියක් ඕනෑම ක්‍රීඩාවකින් මෙතෙක් ලබා ගත් ඉහළම දස්කම විය.

**පළමු දකුණු ආසියානු සෙස්ටෝබෝල් ශූරතාවලිය - චික්කබල්ලපූර්, ඉන්දියාව**

විද්‍යා පීඨයේ ක්‍රීඩා විද්‍යා අධ්‍යයනාංශයේ දෙවන වසරේ සිසුවියක වන මධුකා රණසිංහ, 2024 ජුනි 02 සිට 09 දක්වා ඉන්දියාවේ චික්කබල්ලපූර් හි පැවති පළමු දකුණු ආසියානු චෙස්ටෝබෝල් ශූරතාවලියේදී ශ්‍රී ලංකා කාන්තා චෙස්ටෝබෝල් කණ්ඩායම නියෝජනය කළාය. අවසන් තරගයේදී ශ්‍රී ලංකා කණ්ඩායම ශක්තිමත් ඉන්දීය කණ්ඩායම පරාජය කරමින් ශූරතාව දිනා ගැනීමට සමත් විය.

**එක්සත් අරාබි බේස්බෝල් ක්ලැසික් - ඩුබායි, එක්සත් අරාබි එමීර්**

විශ්වවිද්‍යාලයේ බේස්බෝල් කණ්ඩායමේ නායකයා වූ ඩබ්ලිව්.පී.ජී.ඒ. වීරවර්ධන මහතා 2024 නොවැම්බර් 07 සිට 09 දක්වා එක්සත් අරාබි එමීර් රාජධානියේ ඩුබායි නගරයේදී පැවැති ජාත්‍යන්තර බේස්බෝල් ශූරතා තරඟාවලියට සහභාගි වූ ශ්‍රී ලංකා ජාතික බේස්බෝල් කණ්ඩායම නියෝජනය කිරීමට සමත් විය. රටවල් 9 ක ක්‍රීඩා කණ්ඩායම්වල සහභාගිත්වයෙන් පැවැති මෙම තරඟාවලියේදී ඔවුන් ඉතා ශක්තිමත් කණ්ඩායම් පරාජය කරමින් සිව්වැනි ස්ථානය දිනා ගැනීමට සමත් විය. මෙය විදේශීය තරඟයකදී කැලණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකු ජාතික කණ්ඩායම නියෝජනය කළ පළමු අවස්ථාවයි.

**පොදුරාජ්‍ය මණ්ඩලීය කරාතේ ශූරතාවලිය - දකුණු අප්‍රිකාවේ ඩර්බන්**

ව්‍යවහාරික විද්‍යා පීඨයේ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ තුන්වන වසරේ ඉගෙනුම ලබන රෂ්මි ශ්‍රවින්ද්‍යා ඒකනායක, 2024 නොවැම්බර් 27 සිට දෙසැම්බර් 03 දක්වා දකුණු අප්‍රිකාවේ ඩර්බන් හි පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය කරාතේ ශූරතාවලියේදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා සුදුසුකම් ලබා ගත්තාය. කැලණිය විශ්වවිද්‍යාලයෙන් ප්‍රථම වරට කරාතේ පුහුණුව ලබා විශ්වවිද්‍යාලයේ කරාතේ කණ්ඩායමේ සාමාජිකාවක් වීමට ලැබීමත්, එම පුහුණුව තුළින් ජාතික මට්ටමින් දස්කම් දැක්වීමටත් ඇයට හැකි වීමත් සුවිශේෂී කරුණකි. තරඟයේදී ඇයගේ බර පන්තියේ ඉහළම අට දෙනා අතරට සුදුසුකම් ලැබීමට ඇය සමත්වූවාය.

## 9.5. 2024 වර්ෂයේ ජාතික ශූරතා තරඟවලදී දක්වන ලද කුසලතා

වගුව 38: 2024 ජාතික මට්ටමේ තරඟවල දක්ෂතා

| ක්‍රීඩා ඉසව්ව | දක්වන ලද දක්ෂතා | පදක්කම් ලාභීන් |
|---|---|---|
| මලල ක්‍රීඩා | කාන්තා, ප්‍රථම ස්ථානය (මීටර් 5000) | රාසාරා විජේසූරිය |
| | කාන්තා, දෙවන ස්ථානය (මීටර් 400) | එල්.සයුරි මෙන්ඩිස් |
| චෙස් | කාන්තා, තෙවන ස්ථානය | නික්ලේෂා තරුෂි |
| වුෂු | කාන්තා, පළමු ස්ථානය | චා ක්වාන් |
| | කාන්තා, පළමු ස්ථානය | ෆැන්සි ක්වාන් |
| ටයිකොන්ඩෝ | තෙවන ස්ථානය: කිලෝග්‍රෑම් 62-67 කාණ්ඩය | මල්ෂි සුරවීර |
| | තෙවන ස්ථානය: කිලෝග්‍රෑම් 53-57 කාණ්ඩය | එච්.එච් වැලිකල |
| පිහිනුම් (දිගු දුර) | පළමු ස්ථානය: මීටර් 50 සමනලයා (පිරිමි) | සන්දෙව් සේනාරත්න |
| | පළමු ස්ථානය: මීටර් 100 සමනල ආර (පිරිමි) | |
| | දෙවන ස්ථානය: මීටර් 200 සමනල ආර (පිරිමි) | |
| | තෙවන ස්ථානය: මීටර් 50 නිදහස් ආර (කාන්තා) | ෂෙනේෂි හේරත් |
| | දෙවන ස්ථානය: මීටර් 100 සමනල ආර (කාන්තා) | |
| | පළමු ස්ථානය: මීටර් 200 නිදහස් ආර (කාන්තා) | |
| පිහිනුම් (කෙටි දුර) | දෙවන ස්ථානය: මීටර් 50 සමනල ආර (කාන්තා) | ෂෙනේෂි හේරත් |
| | දෙවන ස්ථානය: මීටර් 100 සමනල ආර (කාන්තා) | |
| | තෙවන ස්ථානය: මීටර් 200 නිදහස් ආර (කාන්තා) | |
| කරාතේ | තෙවන ස්ථානය: කාටා, කුමිටේ (කි.ග්‍රෑ. 55) සහ කාටා කණ්ඩායම් | පී.එම්.එල්.වයි. ඒකනායක |

## 9.6. 2024 වර්ෂයේ අනුබද්ධ ක්‍රීඩා පාලන ආයතන

කැලණිය විශ්වවිද්‍යාලය 2024 වර්ෂය තුළ පහත දක්වා ඇති ශ්‍රී ලංකා ජාතික සහ පළාත් මට්ටමේ ක්‍රීඩා පාලන ආයතන (විධායක ඡන්ද බලය සහිත) සමඟ අනුබද්ධ විය.ජාතික සංගම්වල නියෝජනය

**ජාතික සංගම්වල නියෝජනය**

1. ශ්‍රී ලංකා ක්‍රිකට්
2. ශ්‍රී ලංකා බර ඉසිලීමේ සම්මේලනය
3. ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනය
4. ශ්‍රී ලංකා මේසපන්දු සංගමය
5. ශ්‍රී ලංකා චෙස් සම්මේලනය
6. ශ්‍රී ලංකා ජූඩෝ සම්මේලනය
7. ශ්‍රී ලංකා ජාතික ජල ක්‍රීඩා සංගමය (NASU)

**පළාත් සහ දිස්ත්‍රික් සංගම්**

1. බස්නාහිර පළාත් රග්බි පාපන්දු සංගමය
2. ගම්පහ දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය
3. ගම්පහ දිස්ත්‍රික් නෙට්බෝල් සංගමය
4. බස්නාහිර පළාත් බැඩ්මින්ටන් සංගමය
5. ගම්පහ දිස්ත්‍රික් පැසිපන්දු සංගමය

**වෙනත් සංගම්**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය

## 9.7. 2024 වර්ෂය තුළ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් දරන ලද ක්‍රීඩා සම්බන්ධ වෙනත් තනතුරු

වගුව 39: කාර්ය මණ්ඩලය විසින් දරන ලද වෙනත් තනතුරු

| කාර්ය මණ්ඩල සාමාජිකයාගේ නම | තනතුර |
|---|---|
| **ජී.ජී.යූ. සමන් කුමාර මහතා** | ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ මහලේකම් |
| | 2024 පැරිස් නුවර පැවැති 33 වන ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා සහභාගී වූ ජාතික මලල ක්‍රීඩා කණ්ඩායමේ කණ්ඩායම් නායක |
| | ශ්‍රී ලංකා මලල ක්‍රීඩා තේරීම්, සංඛ්‍යාලේඛන සහ ප්‍රමිති උප කමිටුවේ සභාපති |
| | ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පත් කරන ලද ක්‍රීඩා සම්මාන සභාපතිවරයාගේ විනිශ්චය මණ්ඩලයේ සාමාජික |
| **එච්.ඩී.එස්.පී. විජේගුණරත්න මහතා** | ශ්‍රී ලංකා මේසපන්දු සංගමයේ උප සභාපති |
| | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ බැඩ්මින්ටන්, රගර් අනුකමිටු සාමාජික |
| **ජී.ඒ.එස්.ජී. ගොඩමුනේ මහත්මිය** | ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනයේ සහකාර ලේකම් |
| | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ කරාටේ, දැල් පන්දු, පැසිපන්දු සහ හොකී අනු කමිටු සාමාජිකා |
| **එච්.එම්.කේ.ටී. කරුණාරත්න මෙනවිය** | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ චෙස් සහ එල්ලේ අනු කමිටු සාමාජිකා |
| **අයි.පී.කේ. මහදුලා මෙනවිය** | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ ටෙනිස් සහ පිහිනුම් අනු කමිටු සාමාජිකා |
| **ඒ.එම්.ඒ. අතුකෝරල මහතා** | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ වොලිබෝල්, රගර් සහ බේස්බෝල් එල්ලේ අනු කමිටු සාමාජික |



# පීඨ, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සහ පුස්තකාලය

## 10.1. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

### 10.1.1. මෙහෙවර

“ලෝකය වඩාත් යහපත් ස්ථානයක් බවට පත් කිරීමට සක්‍රියව දායක වන පරිපූර්ණ නායකයින් පුහුණු කිරීමට හා බිහි කිරීමට හැකියාව ඇති, අනාගතයට සරිලන, ව්‍යවහාරික සහ සහයෝගී අධ්‍යාපන ක්‍රම හා පර්යේෂණ අත්දැකීම් සංකලනය කිරීමට වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය තුළදී අපි අපේක්ෂා කරමු”

### 10.1.2. ආයතනික ව්‍යුහය පිළිබඳ සාරාංශය

කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය ශ්‍රී ලංකාවේ ශීඝ්‍රයෙන් දියුණු වන පීඨයක් වන අතර එය 1976 දී සමාජීය විද්‍යා පීඨයෙන් වෙන්ව ස්ථාපනය කර පවත්වා ගෙන යන ලදී. මේ වන විට, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය කැලණිය විශ්වවිද්‍යාලයේ කීර්තිමත් පීඨයක් බවට පත්ව ඇත. එහි කාර්ය මණ්ඩලයේ, සිසුන්ගේ හා අනෙකුත් අධ්‍යයන අංශවල දැඩි පරිශ්‍රමයෙන් කටයුතු කිරීම, නොපසුබට උත්සාහය, සහ කැපවීම හේතුකොට ගෙන 1995 දී එයට පීඨයක් වශයෙන් පිළිගැනීමක් ලබා ගත හැකි විය. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 130 ක්, පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල සාමාජිකයින් 5ක්, අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 32 ක් මෙම පීඨයේ සේවයේ නිරතව සිටින අතර ප්‍රථම උපාධි අපේක්ෂකයෝ 4025 ක් ද මෙම පීඨයේ අධ්‍යාපනය හදාරති. පීඨය තුළ බහු සංස්කෘතික සහ බහු වාර්ගික සිසුන් සිටින අතර සමාජ සංහිඳියාව සහ සංස්කෘතික විවිධත්වයෙන් යුතුව ඔවුහු සහයෝගීව කටයුතු කරති.

### 10.1.3. පීඨය විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන්

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය එහි අධ්‍යයනාංශ (5) යටතේ වැඩසටහන් රාශියක් පවත්වයි. වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය (DCFM), මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය (DHRM), ගණකාධිකරණ අධ්‍යයන අංශය (DoA), අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය (DMM), සහ මූල්‍ය අධ්‍යයන අංශය (DFin) යන අධ්‍යයනාංශ යටතේ උපාධි පාඨමාලා දාහතරක් (14) මෙම පීඨය මඟින් පිරිනමනු ලබයි. එමෙන්ම එක් (01) ව්‍යාපාර පරිපාලන ආචාර්ය උපාධි (DBA) වැඩසටහනක්, ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් අටක් (08), ඩිප්ලෝමා පාඨමාලා පහක් (05), සහ උසස් ඩිප්ලෝමා වැඩසටහන් හයක් මෙයට ඇතුළත් වේ. 2024 වර්ෂයේදී, ප්‍රකාශනය පිළිබඳ ශ්‍රී ලංකාවේ ප්‍රථම ආචාර්ය උපාධි (PhD) උපාධි වැඩසටහන ආරම්භ කරමින් පීඨය ඓතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. මීට අමතරව, අධ්‍යයනාංශ විසින් සංවිධානය කරනු ලබන විෂය බාහිර ක්‍රියාකාරකම් වලින් පොහොසත් වූ සමස්ත අධ්‍යාපනික අත්දැකීමක් තුළින් උපාධි අපේක්ෂකයින්ට ප්‍රතිලාභ ලැබෙන අතර එමඟින් ඔවුන්ගේ ශාස්ත්‍රීය හා පෞද්ගලික වර්ධනය යන දෙඅංශයම පෝෂණය වේ.

මෙම පීඨය ඉහළ ප්‍රමිතියක් පවත්වා ගනිමින් සාර්ථක අන්දමින් විශ්වවිද්‍යාල පාර්ශ්වකරුවන්ගේ සහ ප්‍රජාවගේ ආකර්ෂණය දිනා ගැනීමට සමත්ව ඇත. උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය ඉහළ මට්ටමක පවත්වා ගනිමින් මෙරට කළමනාකරණ පීඨ අතරින් ඉහළම උපාධිධාරී සේවා නියුක්ති අනුපාතය වන 86% ක් වාර්තා කිරීමට මෙම පීඨය සමත්ව ඇත. තවද, අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය, මූල්‍ය අධ්‍යයන අංශය, වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන සඳහා ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානයේ (ISO) සහතිකය ලබා ගැනීම පීඨය ලද ඉතා වැදගත් ජයග්‍රහණයකි. එමෙන්ම, මූල්‍ය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය, මූල්‍ය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය, වෘත්තීය මූල්‍ය දර්ශනපති උපාධිය සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ වරලත් මූල්‍ය විශ්ලේෂකයන්ගේ (CFA) ආයතනයේ පිළිගැනීම හිමි කර ගැනීම මඟින් ද පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන්වල ගුණාත්මක බව පිළිබිඹු වෙයි. එමෙන්ම, 2024 වසර සඳහා AACSB (The Association to Advance Colegiate Schools of Business) ආයතනයෙහි සාමාජිකත්වය අලුත් කිරීමට ද පීඨය විසින් කටයුතු කරන ලදී. තවද, ශාස්ත්‍රීය ගුණාත්මකභාවය සහ නවෝත්පාදනය යන අංශයන්හි වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් සියලුම විශේෂ උපාධි වැඩසටහන් මේවන විට සාර්ථකව ගෞරව උපාධි වැඩසටහන් බවට පරිවර්තනය කර ඇත.

## 10.1.4. අධ්‍යයන කාර්ය මණ්ඩලය

පීඨය මගින් ලබා දෙන සහයෝගය හේතු කොට ගෙන, කාර්ය මණ්ඩල සාමාජිකයින් තම පර්යේෂණ කටයුතු වැඩිදියුණු කර ගැනීමට පෙළඹීම මඟින් එහි අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මක බවද වැඩිදියුණු වෙයි. 2024 දී, උසස් තත්ත්වයේ පර්යේෂණ ප්‍රකාශන සඳහා උපකුලපති සම්මාන 9ක් දිනා ගැනීමට පීඨ කාර්ය මණ්ඩලය සමත් විය. තවද, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 51 දෙනෙකු ආචාර්ය උපාධිධාරීන් (PhD) වන අතර සාමාජිකයින් 112 දෙනෙකු ශාස්ත්‍රපති උපාධිය ලබා ගෙන ඇත. තවත් සාමාජිකයියෝ 18 දෙනෙක් මේවන විට ආචාර්ය උපාධිය හදාරමින් සිටිති.

පර්යේෂණ සහ අධ්‍යාපනය තුළ විශිෂ්ටත්වය සඳහා වූ සුවිශේෂී ශාස්ත්‍රීය දායකත්වයන් සහ කැපවීම පිළිබිඹු කළ මූල්‍ය අධ්‍යයන අංශයේ එක් මහාචාර්යවරයෙකුට කීර්තිමත් ෆුල්බ්‍රයිට් ශිෂ්‍යත්වය පිරිනමන ලදී.

## 10.1.5. නවෝත්පාදන

2024 වර්ෂයේදී, අරමුදල් අවස්ථා උදාකර ගනිමින් හා කළමනාකරණය කර ගනිමින් වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය පර්යේෂණවල සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත්තේය. පීඨය දැනට ක්‍රියාකාරී පර්යේෂණ ප්‍රදාන දෙකක් පවත්වාගෙන යන අතර, වසර තුළ විශ්වවිද්‍යාලය විසින් අරමුදල් සපයන ලද රු. 150,000 ක අතිරේක නව ප්‍රදානයක් ද ක්‍රියාත්මක වේ. මෙම ප්‍රදාන උසස් තත්ත්වයේ පර්යේෂණ පෝෂණය කිරීම සහ ශාස්ත්‍රීය දියුණුවට දායක වීම සඳහා පීඨය විසින් දරනු ලබන අඛණ්ඩ කැපවීම සඳහා සහාය වේ.

2024 වර්ෂයේදී, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය දැනුම සහ නවෝත්පාදනයන් වැඩිදියුණු කිරීම සඳහා ඇති කැපවීම පෙන්නුම් කරමින් බලපෑම් සහගත සම්මන්ත්‍රණ කිහිපයක් පවත්වන ලදී. පීඨයේ ප්‍රමුඛතම සමුළුව වන ව්‍යාපාර සහ තොරතුරු පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ICBI) 15 වන වරටත් නොවැම්බර් 1 සහ 2 යන දෙදින තුළ වත්තල පෙගාසස් රීෆ් හෝටලයේදී "විශිෂ්ටත්වයෙන් ඔබ්බට: තිරසාර ව්‍යාපාර නවෝත්පාදන සඳහා AI ඒකාබද්ධ කිරීම" යන තේමාව යටතේ පැවැත්විණි. වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය විසින් 2024 ශ්‍රී ලංකා ව්‍යවසායකත්ව සංසදය (SLFE) සංවිධානය කරන ලද අතර, එමඟින් ව්‍යවසායකත්ව දියුණුව පිළිබඳ කථිකාවක් ඇති විය. මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය (HRM) විසින් අධ්‍යයන ජයග්‍රහණ සහ කර්මාන්ත සහභාගීත්වය සමරමින් 10 වන මානව සම්පත් කළමනාකරණ ශිෂ්‍ය පර්යේෂණ සම්මන්ත්‍රණය සහ සීමාවාසික සහතික ප්‍රදානය කිරීමේ උත්සවය පවත්වන ලදී. මීට අමතරව, ගිණුම්කරණ අධ්‍යයනාංශය පෙබරවාරි 1 වන දින 9 වන ජාත්‍යන්තර ගිණුම්කරණ පර්යේෂණ සහ අධ්‍යාපනඥයින්ගේ සමුළුව (ICARE 2023) සාර්ථකව පැවැත්වීය. එහි වාර්ෂික පර්යේෂණ සංසදය ගිණුම්කරණ අධ්‍යාපනය සහ පර්යේෂණ ක්ෂේත්‍රයේ තීරණාත්මක කතිකාවන් සඳහා වේදිකාවක් ලෙස සනිටුහන් කළේය.

## 10.1.6. යටිතල පහසුකම් සංවර්ධනය

2024 දී, පීඨය සිය පහසුකම් වැඩිදියුණු කිරීම සහ වැඩිවෙමින් පවතින අවශ්‍යතා සපුරාලීම සඳහා වැදගත් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කළේය. මෙහි ප්‍රධාන කාර්යයන් ලෙස දේශන ශාලා පුනරුත්ථාපනය කිරීම, ආනන්ද පටබැඳිගේ ගොඩනැගිල්ල සහ F4 ගොඩනැගිල්ලේ පොදු පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සාර්ථකව නිම කරන ලදී. එමගින් සිසුන් සහ කාර්ය මණ්ඩලයට වැඩිදියුණු කරන ලද, ක්‍රියාකාරී සහ සුව පහසු පරිසරයක් ලබාදීම සහතික කර ඇත. මීට අමතරව, පීඨය එහි වත්මන් පහසුකම්වල පවතින සීමාවන්, විශේෂයෙන් වැඩිවන පීඨ සාමාජිකයින් සංඛ්‍යාව සඳහා කාර්යාල අවකාශ සහ වාහන නැවැත්වීමේ පහසුකම් ප්‍රමාණවත් නොවීම ආදී ගැටළුවලට පිළියම් යෙදීම සඳහා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කළේය. මෙම වැඩසටහන යටතේ නව කාමර පහසුකම් ඇති කිරීම සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ඇතුළත් වන අතර එමගින් වඩා කාර්යක්ෂම සහ හිතකර කාර්ය පරිසරයක් නිර්මාණය වේ.

## 10.1.7. කර්මාන්ත සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ හවුල්කාරිත්වයන් ගොඩනගා ගැනීම

2024 වර්ෂයේ දී, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය, අධ්‍යයන හා වෘත්තීය කටයුතු වැඩිදියුණු කර ගැනීම සඳහා කර්මාන්ත සහ අනෙකුත් ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ එහි සහයෝගීතාවය ශක්තිමත් කළේය. එමෙන්ම, දැනුම හුවමාරුව සහ වෘත්තීය සංවර්ධනය සඳහා අවස්ථා උදාකර ගනිමින් පීඨය විසින් NDB වෙල්ත් මැනේජ්මන්ට්, ජාතික සංවර්ධන බැංකු පොදු සමාගම, වරලත් සුරැකුම්පත් සහ ආයෝජන ආයතනය (ශ්‍රී.ලං.), යුනියන් ඇෂුවරන්ස් පොදු සමාගම සහ ශ්‍රී ලංකාවේ වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය වැනි ප්‍රමුඛ සංවිධාන සමඟ ඉතා වැදගත් ගිවිසුම් ඇති කර ගන්නා ලදී. මීට අමතරව, ජාත්‍යන්තර අධ්‍යයන සහයෝගිතාවේ වැදගත් පියවරක් ලෙස, පීඨය චීනයේ Bluebird Yinuo (Beijing) Technology සමාගම සමඟ සහයෝගීතා ගිවිසුමක් අත්සන් කරමින් වාණිජ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළේය. තවද, 2024 දී සිදුකරන ලද විෂයමාලා සංශෝධන ක්‍රියාවලියේදී පීඨය කාර්මික ක්ෂේත්‍රයේ විශේෂඥයන් සමඟ සමීපව කටයුතු කරමින් සිය පාඨමාලා වත්මන් වෘත්තීය අවශ්‍යතා හා ගැළපෙන පරිදි යාවත්කාලීන කිරීම සිදු කළ අතර එමඟින්, උපාධිධාරීන්ට වර්ධනය වන සේවා ක්ෂේත්‍ර අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි අවශ්‍ය දැනුම සහ කුසලතා වර්ධනය කර ගැනීමට අවකාශ සැලසුනි.

## 10.1.8. අධ්‍යයන සහයෝගීතා

අධ්‍යාපනික සහ පර්යේෂණ අවස්ථා වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය කීර්තිමත් ජාත්‍යන්තර සහ දේශීය හවුල්කරුවන් සමඟ ශක්තිමත් අධ්‍යයන සහයෝගීතා ගොඩනගා ගෙන ඇත. ඒ අනුව, එක්සත් රාජධානියේ බ්‍රැඩ්ෆර්ඩ් විශ්ව විද්‍යාලය සමඟ ඇති කර ගත් සුවිශේෂී සහයෝගිතාව හරහා මූල්‍ය පිළිබඳ උසස් ඩිප්ලෝමාධාරීන්ට ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ ගෞරව උපාධිය ලබා ගැනීමට මංපෙත් විවර කර ඇත. වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය, බංග්ලාදේශයේ ඩකා විශ්ව විද්‍යාලය සමඟ දැනුම හුවමාරුව සහ ඒකාබද්ධ වැඩසටහන් ක්‍රියාවට නංවමින් එහි පර්යේෂණ සහ අධ්‍යයන සහයෝගීතාවය අඛණ්ඩව පවත්වාගෙන යයි. අලෙවිකරණ කළමනාකරණ අධ්‍යයනාංශය, ව්‍යවසාය සම්පත් සැලසුම් පාදක ඉගෙනුම් හඳුන්වා දීම සඳහා SAP විශ්වවිද්‍යාල සන්ධාන හවුල්කරු (SAP-UAP) සමඟ සහයෝගයෙන් කටයුතු කර ඇති අතර, එමඟින් ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) විසඳුම් සමඟ සිසුන්ට ප්‍රායෝගික අත්දැකීම් ලබා දේ. මෙම වැඩසටහන මගින් සිසුන් උසස් මෙවලම් සහ කුසලතා වලින් සන්නද්ධ කරන අතර ඔවුන්ගේ තරඟකාරී වාසිය එමගින් වැඩි දියුණු කරයි. මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය ජර්මානු අධ්‍යයන හුවමාරු සේවය (DAAD) සමඟ අධ්‍යයන හවුල්කාරිත්වයන් ගොඩනගා ගෙන ඇත. මීට අමතරව වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය (ACCA), අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ ශ්‍රී ලංකා ශාඛාව (IIA), කොළඹ කොටස් හුවමාරුව (CSE), සීමා ආයතනය සහ FORTUDE වැනි සංවිධාන සමඟ හවුල් වීමෙන් පීඨය එහි අධ්‍යයන හා වෘත්තීය සම්බන්ධතා පුළුල් කර ඇත.

## 10.1.9. තිරසර සංවර්ධන ඉලක්ක හා සම්බන්ධ ක්‍රියාකාරකම්

පීඨය, විවිධ බලපෑම් සහගත ක්‍රියාකාරකම් හරහා තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සඳහා සක්‍රීයව දායක වෙමින් කටයුතු කරයි. මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශයේ උපාධි අපේක්ෂකයින්, තිරසර සංවර්ධන ඉලක්ක 02 - කුසගින්න තුරන් කිරීම සහ තිරසර සංවර්ධන ඉලක්ක 04 - ගුණාත්මක අධ්‍යාපනය යන ඉලක්ක හා අනුකූල වන ප්‍රජා මූලික ව්‍යාපෘති සඳහා සහභාගී වී ඇත. එමගින්, කුසගින්න හා සම්බන්ධව දේශීයව පවතින අභියෝගවලට විසඳුම් සෙවීම සහ අධ්‍යාපන අවස්ථා වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කර තිබේ. වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය ද, මූල්‍ය සාක්ෂරතාවය සහ නව්‍ය ව්‍යාපාර විසඳුම් පෝෂණය කිරීම අරමුණු කරගත් කොටස් වෙළෙඳපොළ අභියෝගය 2024 සහ අන්තර් විශ්වවිද්‍යාල ව්‍යාපාර සැලසුම් තරඟය ඇතුළුව තිරසර සංවර්ධන ඉලක්ක අරමුණු කරගත් ක්‍රියාකාරකම් කිහිපයක් සංවිධානය කර ඇත. මීට අමතරව, තරුණ ව්‍යාපාර තාක්ෂණ සහ ව්‍යවසායකත්ව පර්යේෂණ කොංග්‍රසය (YBTER) තරුණ නවෝත්පාදකයින්ට ව්‍යවසායකත්ව පර්යේෂණ කටයුතු සඳහා දායක වීම සඳහා වේදිකාවක් ලෙස ක්‍රියාත්මක විය. එමෙන්ම, අධ්‍යයනාංශය විසින් ක්‍රියාත්මක කරන SDG කැප්ස්ටෝන් ව්‍යාපෘති හරහා තිරසර සංවර්ධනය සඳහා වූ අන්තර් විෂයීය ප්‍රයත්නයන් තවදුරටත් විද්‍යාමාන කරනු ලැබීය.

## 10.1.10. 2024 වසරේ විශේෂ අවස්ථා

කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය, අධ්‍යාපනය, පර්යේෂණ සහ නවෝත්පාදනය යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වය සඳහා වූ සිය කැපවීම පිළිබිඹු කරමින්, 2024 වර්ෂයේදී කැපී පෙනෙන ජයග්‍රහණ කිහිපයක් සමරන ලදී.

- පීඨයේ ප්‍රමුඛතම සමුළුව වන ව්‍යාපාර සහ තොරතුරු පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ICBI) 15 වන වරටත් නොවැම්බර් 1 සහ 2 යන දෙදින තුළ වත්තල පෙගාසස් රීෆ් හෝටලයේදී "විශිෂ්ටත්වයෙන් ඔබ්බට: තිරසාර ව්‍යාපාර නවෝත්පාදන සඳහා AI ඒකාබද්ධ කිරීම" යන තේමාව යටතේ පැවැත්විණි. මෙම වැඩසටහන ගෝලීය සහභාගීත්වයක් ආකර්ෂණය කර ගැනීමට සමත්වූ අතර, කෘත්‍රිම බුද්ධිය (AI) සහ තිරසර ව්‍යාපාරික භාවිතයන් පිළිබඳ ප්‍රමුඛ පෙළේ සාකච්ඡා සඳහා අවකාශ සලසන ලදී.
- පීඨය විසින් සිසුන්ගේ අධ්‍යයන සහ බාහිර ක්‍රියාකාරකම්වල ජයග්‍රහණ ඉස්මතු කරමින් 2024 පෙබරවාරි 2 වන දින, "පීඨාධිපතිගේ ලැයිස්තුව" සහ "පීඨ සම්මාන" යන ප්‍රධාන කාණ්ඩ දෙකක් යටතේ විශිෂ්ඨ දක්ෂතා දැක්වූ සිසුන් ඇගයීම සඳහා 2024 පීඨ විශිෂ්ටතා සම්මාන උළෙල පවත්වන ලදී.
- පර්යේෂකයන්ට උසස් තත්ත්වයේ ප්‍රකාශිත කෘති හරහා ආචාර්ය උපාධි ලබා ගැනීමට සුවිශේෂී මාර්ග යක් විවර කරමින් මෙම පීඨය විසින් ප්‍රකාශනය පිළිබඳ ශ්‍රී ලංකාවේ ප්‍රථම ආචාර්ය උපාධි වැඩසටහන ආරම්භ කරන ලදී.
- උපකුලපති සම්මාන කාණ්ඩය යටතේ, විශ්වවිද්‍යාලයේ හොඳම වෙබ් අඩවිය තරඟයෙන් පීඨයට ප්‍රථම ස්ථානය හිමි වූ අතර, එමඟින් ඩිජිටල් සම්බන්ධතාවය සහ සන්නිවේදනයේ එහි නායකත්වය ශක්තිමත් කරමින් නවීන, පරිශීලක-හිතකාමී සහ තොරතුරු සහිත මාර්ගගත පැවැත්මක් නිර්මාණය කිරීම කෙරෙහි පීඨය දක්වන ලද අවධානය මැනවින් ඉස්මතු විය.

මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේදී, සමාජ සුබසාධනයට අත්‍යවශ්‍ය තීරණ ගැනීමේ හැකියාව, කුසලතා සහ ආකල්ප සහිත ලෝකය සඳහා විශිෂ්ට නායකයින් බිහි කිරීමේ සේවාව පීඨය මගින් සිදු කෙරෙයි. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය මේ වන විට උපාධිධාරීන් 16,000 කට අධික ප්‍රමාණයක් බිහි කර ඇති අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කළමනාකරණ ක්ෂේත්‍රයේ ඉහළ තනතුරු දරන අතර ඇතැම් උපාධිධාරීහූ රටේ ප්‍රමුඛ ව්‍යවසායකයින් බවට පත්වී සිටිති.

**මහාචාර්ය ඩබ්. එම්. සී. බී. වන්නිනායක**
**පීඨාධිපති/ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

# 10.2. පරිගණක හා තාක්ෂණ පීඨය

## 10.2.1. මෙහෙවර

ජාතියේ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා නවෝත්පාදන, දැනුම බෙදා හැරීම හා ධාරිතා ගොඩ නැංවීම තුළින් පරිගණක හා තාක්ෂණයේ විශිෂ්ටත්වය ළඟා කරගැනීමට පරිගණක හා තාක්ෂණ පීඨය ප්‍රයත්න දරයි.

## 10.2.2. ආයතනික ව්‍යුහය පිළිබඳ සාරාංශය

පරිගණක හා තාක්ෂණ පීඨය (FCT) කැලණිය විශ්වවිද්‍යාලයේ හත්වන පීඨය ලෙස 2015 දෙසැම්බර් මාසයේදී ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පරිගණක සහ තාක්ෂණය යන දෙඅංශයෙන්ම විශේෂඥතාවයක් දක්වන එකම පීඨය මෙය වන අතර මෙම පීඨය විසින් අ.පො.ස. (උසස්පෙළ) විභාගයේ විද්‍යා හා තාක්ෂණ විෂය ධාරාවේ සිසුන් සඳහා සකස් කරන ලද උපාධි වැඩසටහන් පිරිනමනු ලබයි.

පරිගණක හා තාක්ෂණ පීඨය (FCT) ව්‍යවහාරික පරිගණක අධ්‍යයනාංශය, පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශ සහ මෘදුකාංග ඉංජිනේරු අධ්‍යයනාංශය යනුවෙන් වන අධ්‍යයනාංශ තුනකින් සමන්විත වේ. මෙම පීඨය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 36 දෙනෙකුගෙන් සමන්විත වන අතර, පරිපාලන නිලධාරියෙකු, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 15 දෙනෙකුගේ සහායද ලැබේ. ආසන්න වශයෙන් 1035 ක පමණ උපාධි අපේක්ෂක සිසුන් සංඛ්‍යාවකින් සමන්විතව, පීඨය විවිධ සංස්කෘතික හා සමාජ-ආර්ථික පසුබිම්වලින් සිසුන් ආකර්ෂණය කර ගනිමින්, සියල්ල ඇතුළත් සහ බහුවිද අධ්‍යයන පරිසරයක් පෝෂණය කරයි. ඉංජිනේරු, විද්‍යා සහ ගණිතය යන ක්ෂේත්‍ර ආවරණය වන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ බහු විෂයානුබද්ධ විශේෂඥතාවය, පීඨයේ ශාස්ත්‍රීය හා පර්යේෂණ විශිෂ්ටත්වය තවදුරටත් වැඩි දියුණු කරයි.

## 10.2.3. පීඨය මගින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන්

පරිගණක හා තාක්ෂණ පීඨය විසින් මේවන විට විවිධ අධ්‍යයන පසුබිම් සඳහා සුදුසු පරිදි සකස් කර ඇති උපාධි පාඨමාලා තුනක් පිරිනමනු ලබයි. පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය, අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ විද්‍යා විෂය ධාරාව හදාරන සිසුන් සඳහා සකස් කර ඇත. එමෙන්ම, ඉංජිනේරු තාක්ෂණවේදී (ගෞරව) උපාධිය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී (ගෞරව) උපාධිය තාක්ෂණ විෂය ධාරාවේ සිසුන් සඳහා සකස් කර ඇත.

2025 දී ආරම්භ කිරීමට නියමිත ජෛව පද්ධති තාක්ෂණවේදී (ගෞරව) උපාධි පාඨමාලාවේ අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යෝජනාවක් ඉදිරිපත් කරමින් 2024 දී පීඨය විසින් තම අධ්‍යයන පාඨමාලා පුළුල් කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු පියවරක් තබනු ලැබීය. මීට අමතරව, සිඩ්නි ගිවිසුම යටතේ ඉංජිනේරු තාක්ෂණවේදී (ගෞරව) උපාධිය ප්‍රතීතනය කිරීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයට අයදුම්පතක් ඉදිරිපත් කරනු ලැබීමෙන් පීඨය තම වැඩසටහන් සඳහා වෘත්තීය පිළිගැනීමක් ලබා ගැනීමේදී විශිෂ්ට ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

පශ්චාද් උපාධි අධ්‍යාපන ක්‍රියාවලියේ දී, මෙම පීඨය විසින් සිය ඉගැන්වීම් සහ පරිපාලන භාවිතයන් සඳහා තොරතුරු තාක්ෂණය මුසු කිරීමට ප්‍රයත්න දරන අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය පිරිනමනු ලබනු ලබයි. තවද, 2024 දී, පීඨය විසින් වෙබ් පාදක මෘදුකාංග ඉංජිනේරු ඩිප්ලෝමාව සාර්ථකව හඳුන්වා දුන් අතර, එමඟින් එහි අධ්‍යාපන අවස්ථා විෂය පථය තවදුරටත් පුළුල් විය.

## 10.2.4. අධ්‍යයන කාර්ය මණ්ඩලය

පරිගණක හා තාක්ෂණ පීඨය, ඉංජිනේරු විද්‍යාව, විද්‍යා විෂයයන් සහ ගණිතය පිළිබඳ මනා පසුබිමක් ඇති වෘත්තිකයන් ඇතුළු බහුවිධ විශේෂඥතා සපිරි එහි අධ්‍යයන කාර්ය මණ්ඩලය නිසාවෙන් පීඨය සුවිශේෂී ලෙස කැපී පෙනේ. අධ්‍යයන විශේෂීකරණයේ මෙම විවිධත්ව මගින් උසස් තත්ත්වයේ අධ්‍යාපනය සහ පර්යේෂණ

ලබා දීමට පීඨයට ඇති හැකියාව වැඩි දියුණු කරයි. තවද, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ඇති අතර එමගින් ඔවුන් සිය ඉංජිනේරු හෝ විද්‍යා දැනුම් පසුබිම් සපුරාලයි.

පීඨයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 36 දෙනා අතරින් 21 දෙනෙකු ආචාර්ය උපාධි සුදුසුකම් ලබා ඇති අතර තවත් සාමාජිකයින් 07 දෙනෙක් මේවන විට ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතුවල නියැලී සිටිති. විදේශයන්හි අවස්ථා අපේක්ෂාවෙන් ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් කිහිප දෙනෙකු ඉල්ලා අස්වීම හමුවේ මතුවූ අභියෝග මධ්‍යයේ වුවද, පීඨය නව සාමාජිකයින් 06 දෙනෙකු, විශේෂයෙන් ආධුනික කථිකාචාර්ය තනතුරු සඳහා බඳවා ගැනීමට සමත්වූ අතර එමගින් එහි අධ්‍යයන වැඩසටහන්වල අඛණ්ඩතාව සහ අභිවෘද්ධිය සහතික කිරීමට හැකිවිය.

## 10.2.5. පර්යේෂණ

2024 වසර තුළදී පීඨය පර්යේෂණ ක්ෂේත්‍රයේ සුවිශේෂී ප්‍රගතියක් අත්කර ගත් අතර, එය එහි ඉතිහාසයේ වඩාත්ම සාර්ථක වසරක් ලෙස සනිටුහන් විය. 9 වැනි වාර්ෂික තාක්ෂණවේදය සහ පරිගණකකරණයේ අභිවෘද්ධිය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICACT 2024) මෙහිලා වැදගත් සන්ධිස්ථානයක් විය. එම සම්මන්ත්‍රණය සඳහා ප්‍රථම වරට විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ (IEEE) තාක්ෂණික සම අනුග්‍රහය හිමි කර ගැනීම තුළින් වැඩසටහනේ ජාත්‍යන්තර පිළිගැනීම තවදුරටත් ඉහළ නැංවිණි.

මීට අමතරව, එක් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකාවකට, ලෝක විද්‍යා ඇකඩමියේ සත්කාරකත්වයෙන් ක්‍රියාත්මක වන යුනෙස්කෝ (UNESCO) වැඩසටහනක් වන, සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ විද්‍යා ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන් සඳහා වන සංවිධානයේ (OWSD) 'මුල් වෘත්තීය සාමාජිකත්වය' යටතේ ඇමරිකානු ඩොලර් 50,000ක පර්යේෂණ ප්‍රදානයක් හිමිවිය. තවත් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙතින් රු. 500,000 ක පර්යේෂණ ප්‍රදානයක් ලබා ගැනීමට සමත් වූ අතර, ඔහු ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ E1 අංශය මගින් පිරිනමන කීර්තිමත් 'පශ්චාත් උපාධි පර්යේෂණ සම්මානය '2024' ද හිමි කර ගත්තේය. එපමණක් නොව, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් දස දෙනෙකු එක්ව අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන හරහා රු. මිලියන 3.15 ක මුදලක් ලබා ගත් අතර, එමගින් පීඨයේ පර්යේෂණ හැකියාවන් තවදුරටත් ශක්තිමත් විය.

## 10.2.6. යටිතල පහසුකම් සංවර්ධනය

2024 වසරේදී පීඨය ලැබූ සුවිශේෂී සන්ධිස්ථානයක් වූයේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන්, මැයි මස 10 වැනි දින එහි අති නවීන ගොඩනැගිලි සංකීර්ණය නිල වශයෙන් විවෘත කිරීමයි. මෙම අති උත්කර්ෂවත් අවස්ථාව සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ශ්‍රී ලංකා කලාපීය අධ්‍යක්ෂවරයා ද ඇතුළුව සම්භාවනීය අමුත්තන් කිහිප දෙනෙකු සහභාගී විය.

ගොඩනැගිලි හයකින් සමන්විත මෙම සංකීර්ණය, ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද අතර, එහි සම්පූර්ණ පිරිවැය රුපියල් මිලියන 5000 ඉක්මවයි. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තිරසාර යටිතල පහසුකම් සම්බන්ධයෙන් සුවිශේෂී ලකුණක් සනිටුහන් කරමින් මෙම ගොඩනැගිලි සංකීර්ණයට ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය මගින් පිරිනමන කීර්තිමත් ප්ලැටිනම් හරිත ගොඩනැගිලි ඇගයීම හිමි විය. මෑතකදී විවෘත කරන ලද, ආසන 1,000 කින් සමන්විත ශ්‍රවණාගාරය වසර පුරාම අධ්‍යයන සහ ආයතනික උත්සව ගණනාවක් පැවැත්වීම සඳහා පහසුකම් සලසා ඇති අතර එමගින් පීඨයට සහ විශ්වවිද්‍යාලයට ආදායම් උත්පාදනය කිරීම සඳහා එහි ඇති හැකියාව තවදුරටත් විද්‍යාමාන වුනි.

## 10.2.7. කර්මාන්ත සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ හවුල්කාරිත්වයන් ගොඩනගා ගැනීම

පරිගණකකරණය සහ තාක්ෂණය සඳහා වන කර්මාන්ත අන්තර් ක්‍රියාකාරී ඒකකය (IICfCT) 2024 වසර පුරාම කර්මාන්ත පාර්ශ්වකරුවන් සමඟ ශක්තිමත් සහයෝගීතාවයන් අඛණ්ඩව වර්ධනය කළේය. මෙම සම්බන්ධතාවයේ ප්‍රතිඵලයක් ලෙස, සිසුන් 250 කට අධික සංඛ්‍යාවක් ශ්‍රී ලංකාව පුරා පිහිටි කීර්තිමත් සමාග

මීවල සීමාවාසික පුහුණු අවස්ථා සඳහා සාර්ථකව ස්ථානගත කිරීමට හැකි වූ අතර, එමගින් ඔවුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා නිරාවරණය සහ සේවා නියුක්තිය සඳහා ඇති හැකියාව ඉහළ නැංවිණි.

පීඨය විසින් සිය දෙවන පරිගණකකරණ හා තාක්ෂණ පීඨ (FCT) වෘත්තීය ප්‍රදර්ශනය 2024 ජූලි මාසයේදී සංවිධානය කරන ලද අතර, ඒ සඳහා ප්‍රමුඛ පෙළේ සමාගම් 40 කට අධික සංඛ්‍යාවක සක්‍රීය සහභාගීත්වය දක්නට ලැබිණි. මෙම වැඩසටහන මගින් සිසුන්ට වටිනා සම්බන්ධතා ගොඩනගා ගැනීමේ අවස්ථා හිමි වූ අතර, අනාගත සේවා යෝජකයින් සමඟ සෘජුවම සම්බන්ධ වීමටත්, වෘත්තීය අපේක්ෂාවන් සම්බන්ධයෙන් කර්මාන්තය තුළ පවතින අවස්ථා පිළිබඳ ගවේෂණය කිරීමටත් එමගින් මග පෑදිණි.

මීට අමතරව, පීඨය විසින් කර්මාන්ත විශේෂඥයින්ගේ සහ සම්පත් දායකයින්ගේ සහභාගීත්වයෙන් වෘත්තීය වැඩමුළු 20කට අධික සංඛ්‍යාවක් සංවිධානය කිරීම, කර්මාන්ත චාරිකා 10කට වැඩි ප්‍රමාණයක් පැවැත්වීම මෙන්ම කර්මාන්ත හා විශ්වවිද්‍යාල හවුල්කාරීත්වයන් ශක්තිමත් කිරීම සඳහා බොහෝ සහයෝගීතා සාකච්ඡා සඳහා පහසුකම් සැලසීම සිදුකර ඇත. මෙම සියලුම වැඩසටහන් උපාධිධාරීන්ගේ රැකියා ලෝකය සඳහා වන සූදානම ඉහළ නැංවීම අරමුණු කර සංවිධානය කර ඇත.

## 10.2.8. අධ්‍යයන සහයෝගීතා

පරිගණකකරණ හා තාක්ෂණ පීඨය, කලාපයේ ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාල සමඟ ශාස්ත්‍රීය හවුල්කාරීත්වයන් ගොඩනැගීම සඳහා සැලකිය යුතු පියවර ගනිමින් සිටී. 2024 වසරේදී පීඨය විසින් පර්යේෂණ ක්ෂේත්‍රයේ, ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සහ අනෙකුත් අධ්‍යයන වැඩසටහන් සම්බන්ධයෙන් ගොඩනගා ගත හැකි සහයෝගීතාවයන් පිළිබඳව සොයා බැලීම සඳහා ඉන්දියානු තාක්ෂණ ආයතන (IITs) සමඟ, විශේෂයෙන් IIT-මැඩ්රාස් ආයතනය කෙරෙහි අවධානය යොමු කරමින් සාකච්ඡා ආරම්භ කරන ලදී. මෙම සාකච්ඡා, පීඨයේ ගෝලීය ශාස්ත්‍රීය පැවැත්ම ඉහළ නැංවීම සහ ජාත්‍යන්තරව පිළිගත් ආයතන සමඟ දැනුම බෙදා ගැනීමේ අවස්ථා වර්ධනය කිරීම සඳහා වූ තීරණාත්මක පියවරක් සනිටුහන් කරයි.

## 10.2.9. තිරසර සංවර්ධන ඉලක්ක හා සම්බන්ධ ක්‍රියාකාරකම්

විවිධ ඵලදායී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම හරහා එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සඳහා දායක වීමට පීඨය සක්‍රීයව කැපවී කටයුතු කරයි. කැලණිය විශ්වවිද්‍යාලය විසින් සිදු කරන ලද විශිෂ්ට තිරසාරත්ව වැඩසටහන් සඳහා, මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පිරිනමන " පරිසරයට දායක වන හොඳම රාජ්‍ය ආයතනය" සඳහා වන ජනාධිපති කුසලතා සම්මානය දිනා දීම සඳහා මෙම පීඨය ඉතා අගනා කාර්යභාරයක් ඉටු කළේය.

පීඨයේ ගොඩනැගිලි සංකීර්ණය මගින් කිලෝවොට් 250ක සූර්ය බලශක්තියක් සහ කිලෝවොට් 5ක සුළං බලශක්තියක් ජනනය කිරීමේ හැකියාව පවතින අතර, එය තිරසාර බලශක්ති භාවිතයන් සඳහා ආයතනයේ ඇති කැපවීම පිළිබිඹු කරයි. තවද, තිරසර සංවර්ධන ඉලක්ක-4 ගුණාත්මක අධ්‍යාපනය යන අරමුණට අනුකූල වෙමින් පීඨය විසින් පාසල් දරුවන් සඳහා අධ්‍යයන චාරිකා මෙන්ම පාසල් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් ද සංවිධානය කර ඇත.

## 10.2.10. වසරේ විශේෂ අවස්ථා

- තාක්ෂණවේදය සහ පරිගණකකරණයේ අභිවෘද්ධිය පිළිබඳ 9 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICACT 2024), zLeveraging Advances in Computing and Technology Towards a Circular Economy' යන තේමාව යටතේ, විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ ආයතනයේ තාක්ෂණික සම අනුග්‍රහය ද සහිතව, 2024 දෙසැම්බර් මස 18 වැනි දින සාර්ථකව පවත්වන ලදී.
- නව පීඨ ගොඩනැගිලි සංකීර්ණය 2024 මැයි මස 10 වැනි දින නිල වශයෙන් විවෘත කරන ලදී.
- ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය විසින් පීඨ ගොඩනැගිලි සංකීර්ණය සඳහා ප්ලැටිනම් හරිත ගොඩනැගිලි ඇගයීම් සම්මානය 2024 දෙසැම්බර් මස 19 වැනි දින පිරිනමන ලදී.

**ආචාර්ය ආර්.එල්.සී.එස්. පුෂ්පකුමාර**

**පීඨාධිපති/ පරිගණක හා තාක්ෂණ පීඨය**

# 10.3. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

## 10.3.1. දැක්ම

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ (FGS) දැක්ම පුරාණ කාලයේ සිට පැවත එන අධ්‍යාපනයේ අරමුණ මත පදනම්ව නිර්මාණය වී ඇත. එනම් "දැනුම හා සැසඳිය හැකි අන් බලයක් නොමැත" හෝ පාලියෙහි එන නත්ථි විජ්ජා සමාම්පන්න හෝ "දැනුම යනු බලයයි" යන අදහස ඉදිරිපත් කරන, ipsa scientia potestas est යන ලතින් වැකිය.' එබැවින්, එහි උපාධිධාරීන් පර්යේෂණ සඳහා කැපවීම, නව අදහස්වලට විවෘතවීම සහ විශ්ලේෂණ නිපුණතා ප්‍රගුණ කිරීම තුළින් විවිධ ක්ෂේත්‍ර පිළිබඳ ඔවුන්ගේ දැනුම මනාව භාවිත කරමින් ලෝකය වඩාත් යහපත් ස්ථානයක් බවට පත් කරනු ඇතැයි උපාධි අධ්‍යයන පීඨය අපේක්ෂා කරයි.

## 10.3.2. මෙහෙවර

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ මෙහෙවර වන්නේ පශ්චාද් උපාධි මට්ටමින් පර්යේෂණ කිරීම සහ බෙදා හැරීම දිරිමත් කිරීමයි. පශ්චාද් උපාධි අධ්‍යාපනයේ විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය කැලණිය විශ්වවිද්‍යාලයේ සියලුම පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩලය, සිසුන් සහ පරිපාලන කාර්ය මණ්ඩලය සමඟ එක්ව කටයුතු කරයි. එබැවින්, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සිය සිසුන් සඳහා ක්‍රියාශීලි බුද්ධිමය වාතාවරණයක් නිර්මාණය කිරීම සඳහා පශ්චාද් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති උපාධි, දර්ශනපති උපාධි සහ දර්ශනශූරි උපාධි යන පශ්චාද් උපාධි වැඩසටහන් පිරිනැමීම සඳහා විශ්වවිද්‍යාලය තුළ ඇති සියලුම අධ්‍යයන අංශ සමඟ එක්ව කටයුතු කරයි.

## 10.3.3. ආයතනික ව්‍යුහය පිළිබඳ සාරාංශය

පීඨයේ අධ්‍යයන හා පරිපාලන කටයුතුවල ප්‍රධානියා වන්නේ උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයාය. පීඨයේ පරිපාලන කටයුතු සඳහා නියෝජ්‍ය ලේඛකාධිකාරිවරයකු සිටින අතර පශ්චාද් උපාධි මට්ටමේ වැඩසටහන්වල ගාස්තු අයකිරීමේ මූල්‍ය කටයුතු පහසු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිවරයෙකු සහිත මූල්‍ය අංශයක් විධිමත් ලෙස ස්ථාපනය කර ඇත.

## 10.3.4. පීඨය විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන්

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය මඟින් පහත දැක්වෙන අධ්‍යයන මණ්ඩලවල (BoS&) පුළුල් විෂය ක්ෂේත්‍ර යටතේ පශ්චාද් උපාධි වැඩසටහන් 60කට අධික ප්‍රමාණයක් පිරිනමනු ලබයි:

i. වාණිජ හා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
ii. පරිගණක විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
iii. ඩිජිටල් අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
iv. මානවශාස්ත්‍ර පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
v. වෛද්‍ය විද්‍යා පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
vi. බහු විධ අධ්‍යයන පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
vii. විද්‍යා පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
viii. සමාජීය විද්‍යා පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
ix. තාක්ෂණය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

බොහෝ බාධක සහ රට තුළ ඇතිවූ ආර්ථික අර්බුදය මධ්‍යයේ වුවද, 2024 වසර සඳහා උපාධි අධ්‍යයන පීඨයට 2650 කට අධික මුළු ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමට හැකි විය.

# 10.3.5. 2024 වසරේ විශේෂ අවස්ථා

**ශ්‍රී ලංකාවේ ප්‍රථම වෛද්‍ය සංඛ්‍යාන විද්‍යා ශාස්ත්‍රපති උපාධි වැඩසටහන ආරම්භ කිරීම**

බහු විෂයීය අධ්‍යයන මණ්ඩලය විසින් සංවර්ධනය කරන ලද ශ්‍රී ලංකාවේ ප්‍රථම වෛද්‍ය සංඛ්‍යාන විද්‍යා ශාස්ත්‍රපති උපාධි වැඩසටහන, සෞඛ්‍ය සේවා දත්ත විශ්ලේෂණය සහ අර්ථ නිරූපණය පිළිබඳ නිපුණතා සහිත වෘත්තිකයන් සඳහා ඇති වර්ධනය වන ඉල්ලුම සපුරාලයි. මෙම විෂය මාලාව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF මට්ටම 09) සහ ජාත්‍යන්තර අධ්‍යාපන ප්‍රමිතීන්ට (IES) අනුකූලව සකස්කර ඇති අතර, එමගින් උපාධිධාරීන් දේශීය හා ගෝලීය සෞඛ්‍ය සේවා පරිසරයන්හි විශිෂ්ටතා දැක්වීමට අවශ්‍ය දැනුමින් සහ කුසලතාවලින් සන්නද්ධ කෙරේ. මෙම වැඩසටහන 2023 දී ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අතර ඉහළම අධ්‍යයන ප්‍රමිතීන් සපුරාලීම සඳහා නිර්මාණය කර ඇත.

වෛද්‍ය සංඛ්‍යාන විද්‍යා වැඩසටහනේ සමාරම්භක උත්සවය 2024 අගෝස්තු 25 වන දින කොළඹ නෙළුම් කුළුණේ "කොස්මික්" සිට්‍රස් හිදී පවත්වන ලදී. එහිදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය පාලිත මහිපාල මහතා ප්‍රධාන දේශනය පවත්වමින් රට තුළ මෙවැනි පෙරළිකාර වැඩසටහනක් ආරම්භ වීම දැක ගැනීමට හැකිවීම පිළිබඳව සිය ප්‍රසාදය පළ කළේය.

**ප්‍රකාශනය පිළිබඳ ශ්‍රී ලංකාවේ ප්‍රථම ආචාර්ය උපාධි වැඩසටහන ආරම්භ කිරීම**

කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන මණ්ඩලය විසින් සංවර්ධනය කරන ලද ප්‍රථම ප්‍රකාශන පිළිබඳ ආචාර්ය උපාධි වැඩසටහන, ආචාර්ය උපාධියක් ලබා ගැනීම සඳහා සුවිශේෂී මාවතක් විවර කරයි. මෙම වැඩසටහන මඟින් අපේක්ෂකයින්ට ඔවුන්ගේ ප්‍රකාශිත පර්යේෂණ පත්‍රිකා එකතුවක් තම නිබන්ධනය ලෙස ඉදිරිපත් කිරීමට අවකාශ සැලසෙන අතර, එමගින් අධ්‍යයන ක්‍රියාවලියේ ඔවුන්ගේ දායකත්වය සහ පර්යේෂණ ප්‍රවීණත්වය මැනවින් පිළිබිඹු වෙයි. මෙම වැඩසටහන උසස් තත්ත්වයේ පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීම තුළින් අපේක්ෂකයින්ගේ ශාස්ත්‍රීය ජයග්‍රහණ හඳුනාගෙන වලංගුතාවය ලබා දෙන අතර, පර්යේෂකයන්ගේ අධ්‍යයන හා වෘත්තීය සුදුසුකම් වැඩි දියුණු කර ඔවුන්ගේ ක්ෂේත්‍රවලට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට ඔවුන්ට හැකියාව ලබා දෙයි. එමෙන්ම එය ශාස්ත්‍රීය විශිෂ්ටත්වය සහ නවෝත්පාදනයන බිහිකරන පරිසරයක් පෝෂණය කරයි. එසේම සැබෑ ලෝක අභියෝගයන්ට මුහුණ දීමට හැකියාව ඇතිකරන අති නවීන පර්යේෂණවල නිරත වීමට අපේක්ෂකයින් දිරිමත් කරයි. තවද, ශාස්ත්‍රීය ප්‍රජාව තුළ සහ ඉන් ඔබ්බෙහි ඔවුන්ගේ කාර්යයන් ප්‍රචාරණය කිරීම තුළින් පර්යේෂකයන්ගේ වෘත්තීය සංවර්ධනයට සහාය වේ. මෙම උපාධිය ලබා ගැනීම සඳහා සපුරාලීමට අවශ්‍ය නිර්ණායක පහත පරිදි වේ: නිබන්ධනයට ඇතුළත් ප්‍රකාශන (ජර්නල් ලිපියක්) පහත සඳහන් සඟරාවේ සමපදස්ත සමාලෝචන ක්‍රියාවලියෙන් පසු විද්‍යාත්මක ප්‍රකාශනය ප්‍රකාශයට පත් කළ යුතුය හෝ පිළිගත යුතුය.

අ) පහතසඳහන් කර ඇති සඟරාවක අවම වශයෙන් එක් ලිපියක් ප්‍රකාශයට පත්කිරීම.

i) උපුටා දැක්වීමේ දර්ශක (පුළුල් කරන ලද විද්‍යාත්මක උපුටා දැක්වීමේ දර්ශකය හෝ සමාජ විද්‍යා උපුටා දැක්වීමේ දර්ශකය හෝ කලා හා මානව ශාස්ත්‍ර උපුටා දැක්වීමේ දර්ශකය)

ii) ව්‍යාපාර විද්‍යාල සංගමය (ABS) -(4* සහ 4), හෝ

iii) ඕස්ට්‍රේලියානු ව්‍යාපාර පීඨාධිපති කවුන්සිලයේ (ABDC) සඟරා ලැයිස්තුව - (A හෝ A*) හෝ

iv) ස්කොපස්-දර්ශක (Q1 හෝ Q2) සඟරා වල එක් ලිපියක්

සහ

ආ) ස්කොපස් සුචිගත සඟරාවල (Q3 හෝ ඉහළ) ලිපි දෙකක්*

මෙම වැඩසටහනේ සමාරම්භක උත්සවය 2024 ඔක්තෝබර් 24 වන දින කොළඹ නෙළුම් කුළුණේදී පැවැත්විණි.

## 10.3.6. පර්යේෂණ

### අ) වාර්ෂික ජාත්‍යන්තර පශ්චාද් උපාධි පර්යේෂණ සම්මන්ත්‍රණය (IPRC) - 2024

කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨය විසින් "ආර්ථික සංවර්ධනය සඳහා පර්යේෂණ සහ නවෝත්පාදන" යන තේමාව යටතේ 24 වැනි ජාත්‍යන්තර පශ්චාත් උපාධි පර්යේෂණ සමුළුව (IPRC) නොවැම්බර් 29 වන දින සාර්ථකව පවත්වන ලදී. මෙම උත්සවය ශාස්ත්‍රඥයින්, පර්යේෂකයින්, පශ්චාත් උපාධි සිසුන් සහ කර්මාන්ත විශේෂඥයින්ට පර්යේෂණ සහ සංවර්ධනයේ පරිවර්තනීය විභවය පිළිබඳ ඔවුන්ගේ අදහස් හුවමාරු කර ගැනීමට නිර්මාණය වූ වේදිකාවක් බඳු විය. ප්‍රමුඛ කර්මාන්තකරුවකු වන රාජිත කාරියවසන් මහතා "ආර්ථික සංවර්ධනය සඳහා පර්යේෂණ සහ සංවර්ධනය සහ නවෝත්පාදන" යන මාතෘකාව යටතේ ප්‍රධාන දේශනය පැවැත්වීය. එසේම, ප්‍රධාන ආරාධිත අමුත්තා වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල සෙනෙවිරත්න මහතා, ගෞරවනීය ආරාධිත අමුත්තා වූ කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා මහත්මිය සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ වැඩබලන පීඨාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදත් ආර්.ඩී.කලිංගමුදලි මහතා ඔවුන්ගේ වටිනා අදහස් සහ සහයෝගයමේ සඳහා ලබා දෙමින් මෙම අවස්ථාවට සහභාගී වූහ. පීඨාධිපතිවරුන්, සභා සාමාජිකයින්, ලේඛකාධිකාරී, පුස්තකාලයාධිපති, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, මහාචාර්යවරුන් සහ අනෙකුත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් මෙම අවස්ථාව තවදුරටත් වර්ණවත් විය. පර්යේෂණ සහ නවෝත්පාදනවල විවිධ අංශ පිළිබඳ විශේෂඥ දැනුම සහ අදහස් බෙදාගැනීම ඇතුළත් සම්මන්ත්‍රණ සැසි ප්‍රධාන දේශකයින් තිදෙනෙකු විසින් පවත්වන ලදී. එක්සත් ජනපද - ශ්‍රී ලංකා ෆුල්බ්‍රයිට් කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පැට්‍රික් මැක්නමරා මහතා විසින් "ආර්ථික සංවර්ධනය සඳහා බහු විෂයානුබද්ධ පර්යේෂණ, නිර්මාණශීලිත්වය සහ නවෝත්පාදනය" පිළිබඳ විශිෂ්ට සම්මන්ත්‍රණ දේශනයක් පවත්වන ලදී. Typefi Systems සමාගමෙහි මෙරටේ ප්‍රධානී සහ උප සභාපතිනි චතුනි උඩුවන මහත්මිය" සීමා සම්බන්ධ කිරීම: ආර්ථික වර්ධනය සඳහා බහුවිෂයානුබද්ධ නවෝතපාදන" යන මැයෙන් හරවත් දේශනයක් පැවැත්වූ අතර, බනාරස් හින්දු විශ්වවිද්‍යාලයේ සහකාර මහාචාර්ය ආචාර්ය බී. සත්‍යවර ප්‍රසාද් මහතා දකුණු ඉන්දීය කර්ණාටක සම්භාව්‍ය සංගීතයේ තාල වාද්‍ය සහය සංකල්පය පිළිබඳ වටිනා දේශනයක් පැවැත්වීය. ඒ අනුව, සමාන්තර සැසි දහනවයක් ස්ථාන හයකදී සාර්ථකව පැවැත්වුණි. සමුළුව සඳහා ප්‍රකාශන සාරාංශ ඉදිරිපත් කිරීම් 250 ක් පමණ ලැබුණු අතර, ඉන් 143 ක් පිළිගත් ගන්නා ලදී. එසේම සාරාංශ 132 ක් ඉදිරිපත් කරන ලදී. කැලණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රඥයින් සහ භාහිරින් පැමිණි විශේෂඥයින්ගෙන් සමන්විත සජීවී ප්‍රජාවක් මෙම අවස්ථාවේ සාර්ථක කර ගැනීම සඳහා දායක විය.

### ආ) බහු විෂයානුබද්ධ සහ පරිවර්තන පර්යේෂණ සඟරාව" (JMTR)

2023 වර්ෂයේදී ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු උපාධි අධ්‍යයන පීඨයේ නිල සඟරාව, කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන ක්ෂේත්‍රයේ සැලකිය යුතු සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. මීට පෙර මෙම සඟරාව උපාධි අධ්‍යයන පීඨයේ සඟරාව ලෙස හැඳින්වූ අතර අනතුරුව එය බහු විෂයානුබද්ධ සහ පරිවර්තන පර්යේෂණ සඟරාව ලෙස නම් කරන ලදී. මෙමගින් පුළුල් විෂය පථයක් කරා ප්‍රවේශවීම සහ බහු විෂයානුබද්ධ පර්යේෂණ පෝෂණය කිරීම සඳහා පීඨයේ ඇති කැපවීම පිළිබිඹු කරයි. අධ්‍යයන ක්ෂේත්‍රයේ පුරෝගාමී වේදිකාවක් ලෙස ස්ථාපිත බහු විෂයානුබද්ධ සහ පරිවර්තන පර්යේෂණ සඟරාව, විෂයීය සීමා බිඳ දමා පරිවර්තන පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා එහි ඇති කැපවීම හේතුවෙන් දේශීය හා ගෝලීය පුළුල් පරාසයක විද්වතුන් ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කරයි. මෙම විවෘත ප්‍රවේශය සහිත, සමපදස්ත-සමාලෝචිත සඟරාව, උපාධි අධ්‍යයන පීඨය විසින් වසරකට දෙවරක් ප්‍රකාශයට පත් කරන අතර, සංකීර්ණ, අන්තර්-විෂයානුබද්ධ අභියෝග වාර්තා කරයි. බහු විෂයානුබද්ධ සහ පරිවර්තන පර්යේෂණ සඟරාවේ කීර්තිමත් තත්ත්වය, එය ගූගල් ස්කෝලර්, ජාත්‍යන්තර සම්මත අනුක්‍රමික අංකය (ISSN) සහ ජාතික විද්‍යා පදනම යටතේ ශ්‍රී ලංකා ජර්නල්ස් ඔන්ලයින් (SLJOL) ඇතුළු ප්‍රධාන දර්ශක වේදිකාවල ඇතුළත් වීම මගින් අවධාරණය කෙරේ. මීට අමතරව, ගෝලීය ශාස්ත්‍රීය ප්‍රජාව තුළ එහි ප්‍රවේශය සහ බලපෑම තවදුරටත් වැඩිදියුණු කරන පියවරක් ලෙස, සඟරාව Crossref, DOAJ සහ Scopus හි සුචිගත කිරීම සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලියක නිරත වේ. සඟරාවේ උසස් තත්ත්වය සහ ශාස්ත්‍රීය දැඩි බව පවත්වාගෙන යාම සඳහා අඛණ්ඩව කැපවීමකින් කටයුතු කරයි. බහු විෂයානුබද්ධ සහ පරිවර්තන පර්යේෂණ සඟරාවේ (JMTR) 9 වන වෙළුම, II කලාපය 2024 දෙසැම්බර් එහි නවතම කලාපය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

**ඇ) දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය - AyurEx Colombo 2024**

ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීතාවයෙන්, උපාධි අධ්‍යයන පීඨය විසින් 2024 මැයි 3 සිට 5 දක්වා " මිනිසුන්ගේ, සතුන්ගේ සහ පරිසර පද්ධතිවල තිරසාර සහ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා එක් සෞඛ්‍යයක් " යන තේමාව යටතේ 2 වැනි ජාත්‍යන්තර දේශීය වෛද්‍ය පර්යේෂණ සම්මන්ත්‍රණය සාර්ථකව සංවිධානය කරන ලදී. මෙම සම්මන්ත්‍රණය දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ විවිධ විද්වතුන්, වෘත්තිකයන් සහ විශේෂඥයින් එකට එක් කරමින් තිරසාර සෞඛ්‍ය සේවා පද්ධති පිළිබඳ දැනුම සහ අවබෝධය හුවමාරු කර ගැනීමට වේදිකාවක් නිර්මාණය කළේය. මානව, සත්ව සහ පාරිසරික සෞඛ්‍යයේ අන්තර් සම්බන්ධිතභාවය කෙරෙහි මෙම වැඩසටහනේ අවධානය යොමු කිරීම, සෞඛ්‍යය හා යහපැවැත්ම සඳහා වඩා හොඳ ප්‍රවේශයක් සඳහා වන ගෝලීය අවශ්‍යතාවය ප්‍රතිරාවය කළේය. කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය නිලන්ති ද සිල්වා මැතිණිය මෙහි ගෞරවනීය ආරාධිත අමුත්තා ලෙස සහභාගී වෙමින්, තිරසාර සෞඛ්‍ය විසඳුම් සඳහා දේශීය වෛද්‍ය ක්‍රම නවීන සෞඛ්‍ය ක්‍රම සමඟ ඒකාබද්ධ කිරීමේ වැදගත්කම අවධාරණය කරමින් ආකර්ෂණීය දේශනයක් පැවැත්වූවාය. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වෙමින්, දේශීය වෛද්‍ය ක්‍රම ප්‍රවර්ධනය කිරීමෙහිලා අධ්‍යාපනයේ කාර්යභාරය සහ රටේ සෞඛ්‍ය සේවා පද්ධතියට එහි ඇති දායකත්වය ඉස්මතු කළේය. ආයුර්වේද විද්‍යාව පිළිබඳ මධ්‍යම පර්යේෂණ සභාවේ (CCRAS) අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය වෛද්‍ය රබීනාරායන් ආචාර්ය මහතා ප්‍රධාන දේශනය පවත්වමින්, සමකාලීන සෞඛ්‍ය අභියෝගයන්ට විසඳුම් සෙවීමේදී ආයුර්වේද පර්යේෂණවල ඇති තීරණාත්මක කාර්යභාරය සහ දේශීය වෛද්‍ය ක්‍රම දියුණු කිරීම සඳහා ජාතීන් අතර සහයෝගීතාවයේ වැදගත්කම අවධාරණය කළේය. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.ඩී. පරණගම මහතා විසින් සම්මන්ත්‍රණයේ සභාපතිත්වය ද, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඩී.කේ.පී.ජේ. සෙනෙවිරත්න මහතා විසින් සම සභාපතිත්වය ද උසුලන ලද අතර, ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වෛද්‍ය ධම්මික අබේගුණවර්ධන මහතා විසින් මෙම උත්සවය සම සංවිධානය කරන ලදී.

**ඈ) පූර්ව සම්මන්ත්‍රණ වැඩමුළුව: ඖෂධ සහ ශාක සාරය විශ්ලේෂණය සහ සත්‍යාපනය සඳහා උසස් විශ්ලේෂණ උපකරණ**

ආයුර් එක්ස් 2024 ප්‍රධාන උත්සවයේ හඳුන්වාදීමේ අදියරක් ලෙස, 2024 අප්‍රේල් 24 වන දින සම්මන්ත්‍රණයට පූර්වයෙන් වැඩමුළුවක් පැවැත්විණි. මෙම වැඩමුළුව කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ තොරතුරු සහ පර්යේෂණ මධ්‍යස්ථානය සහ උපාධි අධ්‍යයන පීඨය (FGS) අතර පවත්වන ලද සහයෝගීතා වැඩසටහනකි. කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඩී.කේ.පී.ජේ. සෙනෙවිරත්න මහතා සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද කොමසාරිස් වෛද්‍ය ධම්මික අබේගුණවර්ධන මහතා විසින් වැඩමුළුවේ සමාරම්භක උත්සවය පවත්වන ලදී. මෙම වැඩමුළුව මහාචාර්ය ඩබ්ලිව්.ඩී.පී.ජේ. ප්‍රේමරත්න මහතා විසින් සම්බන්ධීකරණය කරන ලදී. මෙම වැඩමුළුව ඖෂධ සහ ශාක සාර විශ්ලේෂණය සහ සත්‍යතාව තහවුරු කිරීම සඳහා "උසස් විශ්ලේෂණ උපකරණ" සම්බන්ධයෙන් අවධානය යොමු කළ අතර, HPLC" ICP-MS සහ GC වැනි ප්‍රධාන ශිල්පීය ක්‍රම පිළිබඳව මෙම වැඩමුළුවේදී ආවරණය කළේය. සහභාගීවන්නන්, මෙම උසස් විශ්ලේෂණ ක්‍රම ප්‍රගුණ කිරීම සඳහා අත්‍යවශ්‍ය න්‍යායාත්මක දැනුමෙන් පරිපූර්ණ, නියැදි සකස් කිරීම, විශ්ලේෂණය සහ දෝෂ නිරාකරණය පිළිබඳ සැසිවල නිරත විය. සම්පත් දායකයින්ගේ විශේෂඥතාවය සහභාගීවන්නන්ට මෙම විශ්ලේෂණ ශිල්පීය ක්‍රම පිබඳව සහ ඒවායේ ප්‍රායෝගික යෙදුම් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දුන්නේය. විවිධවූ සහභාගීවන්නන් 80කට අධික පිරිසක් වැඩමුළුවට සහභාගී වූ අතර, ප්‍රායෝගික පුහුණුව සහ විශේෂඥයින්ගේ මඟ පෙන්වීමෙන් ඔවුහු ප්‍රතිලාභ ලැබූහ. වැඩමුළුව අවසානයේදී, සහභාගීවන්නන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය සහ ලබාගත් නව කුසලතා පිළිග නිමින් සහතික පත්‍ර ප්‍රදානය කරන ලදී.

## 10.3.7. ඩිජිටල්කරණය

**අ) වවුචර් සහ අයවැය කළමනාකරණ ක්‍රමය**

පශ්චාද් උපාධි වැඩසටහන් අයවැය සහ වවුචර සම්බන්ධ ක්‍රියාවලීන් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට පහසුකම් සැලසීම සඳහා උපාධි අධ්‍යයන පීඨය විසින් රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ ප්‍රථම වරට මාර්ගගත අයවැය සහ වවුචර් ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. සේවා ශක්තිමත් කිරීම සඳහා පද්ධතිය අඛණ්ඩව වැඩිදියුණු කිරීම් වසර පුරා සිදු කරන ලදී.

**ආ) MPhil/PhD පද්ධතිය සහ සම්පූර්ණ ගෙවීම් විසඳුම ක්‍රියාත්මක කිරීම**

M.Phil සහ Ph.D උපාධි ආශ්‍රිත ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීම සඳහා පාලක සභාවෙන් මූල්‍ය සහ නියාමන අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව, පද්ධතියේ අවශ්‍යතා පිරිවිතර, සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම 2023 මුල් භාගයේදී ආරම්භ කෙරිණි. තවද, උප පද්ධතියක් ලෙස, M.Phil / Ph.D පද්ධතියට, පාර්ශවකරුවන් සඳහා සම්පූර්ණ ගෙවීම පිළිබඳ විසඳුම් පැකේජයක් හඳුන්වා දීම පිණිස මහජන බැංකුව සමඟ සාකච්ඡා මාලාවක් පවත්වන ලදී. එයට මාර්ගගත සහ මාර්ගගත නොවන හා තත්‍ය කාලීනව සිදු කරන ගෙවීම් යාවත්කාලීන කිරීම්, ආයතනික බැංකුකරණය, QR මත පදනම් වූ ගෙවීම්, Point of Sales (POS) යන්ත්‍ර හඳුන්වාදීම යනාදිය ඇතුළත් වේ. මෙම ක්‍රියාවලිය පසුගිය වසරේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයෙන් ප්‍රවේශය ලබාදීම සහ මුදල් අංශවලින් අනුමැතිය ලබාදීම ප්‍රමාද වීම හේතුවෙන්, නියමිත කාලය තුළ වැඩ නිම කිරීමට නොහැකි විය.

**ඇ) උපාධි වැඩසටහන් කළමනාකරණ තොරතුරු පද්ධතිය**

මෙම පද්ධතිය 2016 වසරේ හඳුන්වා දුන් අතර, පරිශීලක අන්තර්ක්‍රියාකාරිත්වය ප්‍රශස්ත කිරීමට සහ පරිපාලන කාර්යයන් වේගවත් කිරීමට සැලසුම් කර ඇති කළමනාකරණ තොරතුරු පද්ධතියේ (MIS) වැඩිදියුණු කළ අනුවාදය 2024 නොවැම්බර් 7 වන දින සෙනෙට් සභා ශාලාවේදී උපාධි අධ්‍යයන පීඨය විසින් දියත් කරන ලදී. යාවත්කාලීන කරන ලද කළමනාකරණ තොරතුරු පද්ධතියේ ක්‍රියා පටිපාටි සරල කරන, විද්‍යුත් තැපෑල සහ කෙටි පණිවුඩ හරහා ස්වයංක්‍රීය දැනුම්දීම් සපයන සහ සිසුන්, වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් සහ අනෙකුත් පාර්ශවකරුවන් සඳහා ප්‍රයෝජනවත් පරිශීලක-හිතකාමී යෙදවුම් සපයන උසස් ක්‍රියාකාරිත්වයන් ඇතුළත් වේ. පරිගණක හා තාක්ෂණ පීඨයේ මෘදුකාංග ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය ගාමිණී විජයරත්න මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන උපදේශක ලෙස කටයුතු කළේය. 16-සංඛ්‍යා කේතය 2021 වසරේ දියත් කරන ලද අතර, එය 2023-2024 වසර සඳහා පශ්චාත් උපාධි වැඩසටහන්වලින් හඳුනා නොගත් ආදායම අඩු වීමට හේතු විය.

## 10.3.8. විදේශීය හවුල්කරුවන් සමඟ අධ්‍යයන සහයෝගීතාව

**අ) බංගලාදේශයෙන් පිරිනමනු ලබනු MBA උපාධිය**

කැලණිය විශ්වවිද්‍යාලය 2019 වසරේ සිට බංගලාදේශයේ Cambrian ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානය (CISC) සමඟ සහයෝගීතාවයෙන් යුතුව කටයුතු කරගෙන යනු ලබයි. මෙම සහයෝගීතාවයට අනුව බංගලාදේශයෙන් MBA උපාධිය පිරිනමනු ලබන අතර, 2024 වසර දක්වා කණ්ඩායම් හතරක් බඳවා ගෙන ඇත. මෙහි සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, බංග්ලාදේශ සිසුන් සඳහා වන පශ්චාත් උපාධි වැඩසටහන්වල පළමු උපාධිධාරිනිය ලෙස නාහිදා අක්ටර් මහත්මිය, 2024 සැප්තැම්බර් 25 වන දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) පැවති විශ්වවිද්‍යාලයේ 145 වන උපාධි ප්‍රදානෝත්සවයේදී ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති (MBA) උපාධිය ලබා ගත්තාය.

**ආ) බංගලාදේශයෙන් පිරිනමනු ලබන M.Phil /PhD උපාධි**

2022 නොවැම්බර් මාසයේදී, කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ MPhil සහ PhD උපාධි පිරිනැමීම සඳහා එම ආයතනය සමඟ වෙනම ගිවිසුමක් අත්සන් කරන ලදී. 2024 අවසානය වන විට, බංගලාදේශයෙන් ලැබුණු අයදුම්පත් 32 න් MPhil /PhD උපාධි සඳහා සිසුන් පස් දෙනෙකු ලියාපදිංචි වී ඇත. ඉතිරි අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

**ඇ) කැළණිය විශ්වවිද්‍යාලය සහ ජපානයේ කියෝතෝ පරිගණක තොරතුරු උපාධි පාසල (KCGI) අතර සහයෝගීතා ගිවිසුම**

කැළණිය විශ්වවිද්‍යාලය සහ කියෝතෝ පරිගණක තොරතුරු උපාධි පාසල අතර 2019 දී ස්ථාපිත කරන ලද ගිවිසුමක් මත පදනම් වූ අඛණ්ඩ සහයෝගීතාවයේ කොටසක් ලෙස, සහයෝගීතාවය තවදුරටත් ශක්තිමත් කිරීම සහ ශාස්ත්‍රීය හා පර්යේෂණ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා, කියෝතෝ පරිගණක තොරතුරු උපාධි පාසලේ කණ්ඩායමක් 2024 දී කැළණිය විශ්වවිද්‍යාලයට පැමිණි අතර එහිදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, හවුල්කාරිත්වය තවදුරටත් වර්ධනය කිරීම, සහයෝගීතාව සඳහා නව අවස්ථා ගවේෂණය කිරීම සහ ඒකාබද්ධ ශාස්ත්‍රීය ව්‍යාපෘතිවල සාර්ථකත්වය සහතික කිරීම මෙන්ම සහයෝගීතාව ශක්තිමත් කිරීම පිළිබඳව කරුණු සාකච්ඡා කළහ.

## 10.3.9. පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා කළමනාකරණ මාර්ගෝපදේශ

පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා වන කළමනාකරණ ක්‍රියාවලි විධිමත් කිරීමට සහ ප්‍රමිතිගත කිරීමට පශ්චාද් උපාධි කළමනාකරණ මාර්ගෝපදේශය සකස් කරන ලදී. මෙම මාර්ගෝපදේශය, පශ්චාද් උපාධි කළමනාකරණ ක්‍රියාවලියේ සෑම අදියරක්ම නිරවද්‍යතාවයෙන් සහ පැහැදිලිතාවයෙන් ආවරණය කරමින්, සවිස්තරාත්මක අත්පොතක් ලෙස ක්‍රියා කරයි. විධිමත් මාර්ගෝපදේශ ලබා දීමෙන්, මෙම මාර්ගෝපදේශය නොගැලපීම් අවම කරන අතර, අතීත භාවිතයන් මත රඳා පැවැත්මෙන් ඔබ්බට ගොස් කටයුතු කිරීමට සම්බන්ධීකාරකවරුන්ට හැකියාව සලසයි. පශ්චාත් උපාධි වැඩසටහන් සම්බන්ධීකරණ ක්‍රියාවලියට අදාළව මූලික පත්වීමේ සිට අවසාන පරිපාලන කාර්යයන් දක්වා වූ සම්පූර්ණ පරාසය ආවරණය කිරීමෙන්, මෙම මාර්ගෝපදේශය නව සහ පළපුරුදු සම්බන්ධීකාරකවරුන් යන දෙපාර්ශවයටම එකසේ මෙහෙයුම් අඛණ්ඩතාව සහ සුමට පරිවර්තනයක් සහතික කරයි. මෙම මාර්ගෝපදේශයට ප්‍රධාන දායකයින් ලෙස ප්‍රධාන සංස්කාරක වශයෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඩී.කේ.පී.ජේ සෙනෙවිරත්න මහතා ද, සංස්කාරක මණ්ඩල සාමාජිකයින් ලෙස වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ, මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශයේ ආචාර්ය ප්‍රභාෂිණී විජේවන්ත මහත්මිය සහ උපාධි අධ්‍යයන පීඨයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී කේ.බී.එස්.එල්. විජේරත්න මහතා ද ඇතුළත් වේ. මෙම මාර්ගෝපදේශය 2024 නොවැම්බර් මස 07 වන දින දියත් කරන ලදී.

## 10.3.10. මාර්ගෝපදේශ සහ ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම

උපාධි අධ්‍යයන පීඨය විසින් පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කර ඇතත්, ඇතැම් ප්‍රධාන ක්ෂේත්‍රවලට අදාළ උපදෙස් මඟ හැරී ඇත. එබැවින්, උපාධි අධ්‍යයන පීඨය විසින් වරින් වර මාර්ගෝපදේශ සකස් කර අනුමැතිය සඳහා පීඨ මණ්ඩලයට සහ සනාතන සභාවට ඉදිරිපත් කරන ලදී. සිසුන්ට, අධීක්ෂකවරුන්ට, විභාග පරීක්ෂකවරුන්ට සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන්ට අදාළ උපදෙස් මාර්ගෝපදේශ සහ ප්‍රතිපත්තිවලට ඇතුළත් විය. ඒ අනුව, පහත සඳහන් ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ, ආකෘති පත්‍ර සහ ආදර්ශ සකස් කර අනුමැතිය ලබා ගන්නා ලදී;

- විදේශයන්හි පදිංචි සිසුන් සඳහා මෙන්ම වෙනත් වලංගු හේතූන් මත මාර්ගගත විභාග පැවැත්වීම.
- පූර්ණ කාලීන පදනමක් මත MPhil /PhD සහ අනෙකුත් පශ්චාත් උපාධි වැඩසටහන් හැදෑරීමට අවකාශ සැලසීම.
- උපාධි අධ්‍යයන පීඨය විසින් ප්‍රකාශයට පත් කරන ලද ජර්නලයේ නම වෙනස් කිරීම සඳහා අනුමැතිය ඉල්ලා සිටීම.
- පීඨ මණ්ඩල තීරණය දැනුම්දීම- වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් විසින් සකස් කරන ලද ශිෂ්‍ය අත්පොත්/ප්‍රොස්පෙක්ටස් වල තොරතුරු වල නොගැලපීම සහ පරස්පරතාව.
- විදේශයන්හි පදිංචි සිසුන් සඳහා මෙන්ම වෙනත් වලංගු හේතූන් මත මාර්ගගත විභාග පැවැත්වීම.
- ඉල්ලුම් කරන ලද/අපේක්ෂිත ප්‍රතිඵල/උපාධි වාර්තා නිකුත් කිරීම කඩිනම් කිරීම.
- පශ්චාද් උපාධි වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් විසින් විභාග ප්‍රතිඵල ආශ්‍රිත ලේඛන නිකුත් කිරීම.

## 10.3.11. 2024 නිපුණතා සංවර්ධන වැඩසටහන

දර්ශන පති /දර්ශන ශූරී සිසුන් සඳහා වන නිපුණතා සංවර්ධන වැඩසටහන වසර තුළදී සාර්ථකව නිම කරන ලදී. විශ්වවිද්‍යාලයේ දර්ශන පති සහ දර්ශන ශූරී සිසුන් හැරුණු විට බාහිර අපේක්ෂකයන් රැසක් ද මෙම වැඩසටහනට සහභාගී වූහ. තොරතුරු සාක්ෂරතාව, පර්යේෂණ ක්‍රමවේද, විද්‍යාත්මක ලේඛන සහ සංඛ්‍යානමය විශ්ලේෂණ පිළිබඳ පශ්චාද් උපාධි සිසුන්ගේ කුසලතා වර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය. ඒ අනුව, වාණිජ හා ව්‍යාපාර කළමනාකරණය විෂය ධාරාවෙන් 89 ක්, පරිගණකකරණයෙන් 18 ක්, මානව ශාස්ත්‍ර 79 ක්, විද්‍යා විෂය ධාරාවෙන් 58 ක්, සමාජ විද්‍යා 99 ක්, වෛද්‍ය විද්‍යා 35 ක් යනාදී වශයෙන් විවිධ විෂය ධාරා වලින් අයදුම්කරුවන් 418 ක් මේ සඳහා අයදුම් කර තිබුණි. මෙම 418 දෙනාගෙන් අපේක්ෂකයින් 125 ක් ලියාපදිංචි වූ අතර, ඇගයීම් සැසියට මුහුණ දීමෙන් පසු සිසුන් 74 දෙනෙක් වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කළහ.

## 10.3.12. පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා අතුරු ව්‍යවස්ථා

පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට විධිමත් මාර්ගෝපදේශ සහ කමිටුවක් ස්ථාපිත කරන ලදී. ඒ අනුව, පළමු කෙටුම්පත 2024 අවසානය වන විට අවසන් කරන ලදී.

## 10.3.13. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SGD) සපුරාලීම සඳහා පර්යේෂණ පැවැත්වීම

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලීම සඳහා සියලුම MPhil / PhD ව්‍යාපෘති සකස් කර ඇත. උසස් උපාධි පර්යේෂණ අයදුම්පත් සහ යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේ දී කිසියම් පර්යේෂණයක් මගින් ආවරණය වන අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපනය කරන ලදී.

## 10.3.14. යටිතල පහසුකම් සංවර්ධනය

උපාධි අධ්‍යයන පීඨයේ කටයුතුවලට වැඩිවෙමින් පවතින ඉල්ලුම හා ව්‍යාප්තීන් හේතු කොටගෙන, උපාධි අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල සඳහා නව ගොඩනැගිලි කොටසක් 2023 වසර තුළ දී ඉදිකරන ලදී. එය සම්පූර්ණ කොට 2024 වර්ෂයේදී කාර්යාල උපකරණ මිලදී ගන්නා ලද අතර, නව කාර්යාල අවකාශය උපාධි අධ්‍යයන පීඨයේ මෙහෙයුම් සඳහා යොදා ගන්නා ලදී.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි**
**වැඩබලන පීඨාධිපති / උපාධි අධ්‍යයන පීඨය**

# 10.4. මානව ශාස්ත්‍ර පීඨය

## 10.4.1. දැක්ම

මානවශාස්ත්‍ර ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් බවට පත්වීම.

## 10.4.2. මෙහෙවර

භාෂාව, කලා සහ ආගමික ක්ෂේත්‍රවල අධ්‍යාපනය සහ පර්යේෂණ තුළින් මානව සම්පත් ශක්තිමත් කිරීම.

## 10.4.3. ආයතනික ව්‍යුහය පිළිබඳ සාරශය

කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨය, සංස්කෘතිය හා ශිෂ්ටාචාරය අධ්‍යයනය කිරීම සඳහා වන එහි බහු භාෂාමය, බහු සංස්කෘතික ප්‍රවේශය පිළිබිඹු කරන සංස්කෘතීන්, සම්ප්‍රදායන් සහ භාෂාවන්ගේ අනර්ඝ සංකලනයකින් සමන්විත වන අතර, එය පහත සඳහන් අධ්‍යයන අංශවලින් සමන්විත වේ.

- නාට්‍ය, සිනමා සහ රූපවාහිනී අධ්‍යයනාංශය
- ඉංග්‍රීසි අධ්‍යයනාංශය
- ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය
- ලලිත කලා අධ්‍යයන අධ්‍යයනාංශය
- හින්දි අධ්‍යයනාංශය
- වාග්විද්‍යා අධ්‍යයනාංශය
- නූතන භාෂා අධ්‍යයනාංශය
- පාලි සහ බෞද්ධ අධ්‍යයනාංශය
- සංස්කෘත සහ පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය
- සිංහල අධ්‍යයනාංශය
- බටහිර සම්භාව්‍ය සංස්කෘති සහ ක්‍රිස්තියානි සංස්කෘති අධ්‍යයනාංශය
- අධ්‍යාපන ඒකකය

## 10.4.4. පීඨය මඟින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන්

වගුව 40: මානවශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන වැඩසටහන් අනුව සිසුන්

| අංකය | අධ්‍යයන වැඩසටහන | සමස්ත සිසුන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | 2022/23 | 2021/22 | 2020/21 | 2019/20 |
| 1 | ශාස්ත්‍රවේදී සාමාන්‍ය කලා උපාධි වැඩසටහන | 529 | 556 | 525 | 169 |
| 2 | ව්‍යාපාර සහ  චීන අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | - | - | - | 66 |
| 3 | චිත්‍රපට සහ රූපවාහිනී අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 57 | 57 | 63 | 67 |
| 4 | බෞද්ධ සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | 13 | - | 12 |
| 5 | බෞද්ධ දර්ශනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | 12 | 2 | 14 |
| 6 | බෞද්ධ මනෝ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | - | - | 10 |
| 7 | ක්‍රිස්තියානි සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | 3 | 5 | 4 |
| 8 | පරිගණක අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | - | - | 4 |
| 9 | නාට්‍ය හා රංග කලාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | - | - | 13 |
| 10 | ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | 5 | 11 | 15 |
| 11 | ප්‍රංශ භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | - | 8 | 8 |
| 12 | ජර්මන් භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | - | - | 22 |
| 13 | හින්දි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | 11 | 13 | 11 |

වගුව 40: (සම්බන්ධයි).

| | | | | | |
|---|---|---|---|---|---|
| **14** | මූර්ති කලා පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | - | - | 7 |
| **15** | ජපන් භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | - | - | 16 |
| **16** | කොරියානු භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | - | - | 15 |
| **17** | වාග් විද්‍යා පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | - | - | 13 |
| **18** | සාහිත්‍ය විචාරය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | 5 | 2 | 1 |
| **19** | ප්‍රාසාංගික කලාව (නැටුම්) පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | - | - | 33 |
| **20** | පාලි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | 5 | 12 | 7 |
| **21** | ප්‍රාසාංගික කලාව (සංගීතය) පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | 12 | 6 | 12 |
| **22** | රුසියානු භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | 7 | 8 | 2 |
| **23** | සංස්කෘත භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | 8 | 11 | 9 |
| **24** | සිංහල භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | - | - | 76 |
| **25** | දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 38 | 38 | 47 | 39 |
| **26** | පරිවර්තන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 28 | 28 | 41 | 28 |
| **27** | වාස්තු ශාස්ත්‍ර පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | - | - | 32 |
| **28** | දෘශ්‍ය කලා පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (කලා, පරිගණක නිර්මාණ | - | - | - | 19 |
| **29** | බටහිර සම්භාව්‍ය සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | - | 6 | 8 | 2 |
| | **මුළු සංඛ්‍යාව** | **652** | **766** | **762** | **726** |

## 10.4.5. පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් පිළිබඳ විස්තර

2024 අවසන් වන විට මානවශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවක සංඛ්‍යාව 116ක් සහ තාවකාලික සේවක සංඛ්‍යාව 75ක් විය. අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් අඩකට ආසන්න සංඛ්‍යාවක් (45.38%) ආචාර්ය උපාධිධාරීන් වන අතර, හතරෙන් එකක් (23.53%) පමණ මහාචාර්ය හෝ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරු දරයි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 116 න් 56 ක්ම (47.06%) කාන්තාවන් වේ.

## 10.4.6. පර්යේෂණ

පහත සඳහන් සම්මන්ත්‍රණ 2024 දී පීඨය/ අධ්‍යයන අංශ විසින් සංවිධානය කරන ලදි.

- 2023 මානව ශාස්ත්‍ර උපාධි පර්යේෂණ සම්මන්ත්‍රණය 2024 පෙබරවාරි 20 වන දින පවත්වන ලදී.
- 2023 සිංහල අධ්‍යයනය පිළිබඳ ජාතික සමුළුව (NCSS) 2024 ඔක්තෝබර් 24 වන දින පවත්වන ලදී.

## 10.4.7. අදාළ ක්ෂේත්‍රවල කර්මාන්ත සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ හවුල්කාරිත්වයන් ගොඩනගා ගැනීම

හොංකොං විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය සහ බුද්ධ ධර්ම මධ්‍යස්ථානය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබේ.

**ආචාර්ය සුදත් සෙනරත්**
**පීඨාධිපති/මානව ශාස්ත්‍ර පීඨය**

# 10.5. වෛද්‍ය පීඨය

## 10.5.1. දැක්ම

පරිපූර්ණ සහ තිරසාර සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කරමින්, සෞඛ්‍ය වෘත්තීය අධ්‍යාපනය, පර්යේෂණ සහ සෞඛ්‍ය සේවාව යන ක්ෂේත්‍රයන්හි ගෝලීය ප්‍රමුඛයෙකු වීම.

## 10.5.2. මෙහෙවර

සහයෝගීතාව, නවෝත්පාදනය සහ සදාචාරාත්මක භාවිතයන් තුළින් ජාතිකව සහ ගෝලීයව තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කරමින් සහ ප්‍රජා සුභසාධනය වැඩිදියුණු කරමින්, අධ්‍යාපනය දියුණු කිරීමට, පුරෝගාමී පර්යේෂණ කිරීමට සහ දයානුකම්පිත සෞඛ්‍ය සේවාවක් ලබාදීමට කැපවූ සෞඛ්‍ය සේවා වෘත්තිකයන් සංවර්ධනය කිරීම සඳහා ගතික සහ සියල්ලන් ඇතුළත් ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම.

## 10.5.3. සංවිධාන ව්‍යුහය

කායව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයනාංශය, ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය, භෞතවේදය අධ්‍යයනාංශය, පරපෝෂවේද අධ්‍යයනාංශය, වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයනාංශය, ව්‍යාධිවේද අධ්‍යයනාංශය, භිෂග්වේදය අධ්‍යයනාංශය, අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, මහජන සෞඛ්‍ය අධ්‍යයනාංශය, පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, ළමා රෝග අධ්‍යයනාංශය, වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, ප්‍රසව හා නාරිවේද අධ්‍යයනාංශය, වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය හා ආබාධිතතා අධ්‍යයනාංශය යන අධ්‍යනාංශ 17 න් වෛද්‍ය පීඨය සමන්විත වේ.

අණුක වෛද්‍ය ඒකකය, රිකට්සියල් සහ වාහක මගින් බෝවන රෝග රසායනාගාර මගින් රෝග විනිශ්චය සේවා සපයන අතර ආසාදන පිළිබඳ පර්යේෂණ ද සිදු කරයි. මඳසරුබව, ආමාශ ආන්ත්‍රයික, ස්වයංසාධක ක්‍රියාකාරිත්වය, රක්තපාත විද්‍යාව, පටක ව්‍යාධි විද්‍යාව, සෛල ව්‍යාධි විද්‍යාව සහ ක්ෂුද්‍රජීව විද්‍යා රසායනාග ාර ප්‍රධාන වශයෙන් සායනික පර්යේෂණ සඳහා දායක වන අතරම රෝග විනිශ්චය සේවා සපයයි. ස්වාභාවික නිෂ්පාදන පිරික්සුම් රසායනාගාරය, සායනික පරීක්ෂණ ඒකකය සහ ජෛව මාත්‍රාමිතික රසායනාගාර පර්යේෂණ මධ්‍යස්ථාන ලෙස ක්‍රියා කරයි.

පීඨය විසින් ළමා පියස / ළමා ආරක්ෂණ ඒකකය, තැලසීමියා මධ්‍යස්ථානය, ආඝාත ඒකකය, අයති මධ්‍යස්ථානය සහ අක්මා රෝග සඳහා කොළඹ උතුරු මධ්‍යස්ථානය ආදී වශයෙන් විශේෂ තෘතියික සත්කාර සෙවා පහසුකම් සපයනු ලබන ඒකක හා මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබයි. 2021/2022 දී පිහිටුවන ලද සෞඛ්‍ය දත්ත විද්‍යා ඒකකය, තොරතුරු තාක්ෂණ කුසලතා වැඩි දියුණු කරන අතර පීඨ පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා සහාය වේ.

සියලුම සිසුන්ගේ විෂය බාහිර ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සහ ශිෂ්‍ය උපදේශනය, වෘත්තීය මාර්ගෝපදේශනය සහ ශිෂ්‍ය සුභසාධන කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා ශිෂ්‍ය කටයුතු අංශයක් පිහිටුවා ඇත. තවද, ශිෂ්‍යයින්ගේ යහපැවැත්ම තහවුරු කරනු වස් අධ්‍යයන ආතතිය සහ පෞද්ගලික අභියෝග මධ්‍යයේ කටයුතු කරන සිසුන්ට සහාය වීම පිණිස පූර්ණ කාලීන ශිෂ්‍ය උපදේශකයින් දෙදෙනෙකුගෙන් සමන්විත 'පීස් පොයින්ට්' මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී.

## 10.5.4. අධ්‍යයන වැඩසටහන් සහ සිසුන්

පස් අවුරුදු MBBS අධ්‍යයන වැඩසටහන අවයව පද්ධති මත පදනම් වූ, සමෝධානික විෂයමාලාවක් ලෙස පවත්වනු ලැබේ. එහි අධ්‍යයන අදියර තුනක් ඇති අතර එක් එක් අධ්‍යයන අදියර අවසානයේ දී කඩඉම් විභාග යක් පැවැත් වේ. විෂය මාලාව තොරතුරු තාක්ෂණය සහ ඉංග්‍රීසි, මූලික සහ ව්‍යවහාරික විද්‍යා, වෘත්තීය සංවර්ධන සහ පවුල් වෛද්‍ය විද්‍යාව, ප්‍රජා සෞඛ්‍ය සහ සායනික කුසලතා යන සංරචක පහකින් සමන්විත වේ. ලෝක වෛද්‍ය අධ්‍යාපන සම්මේලනය (WFME) විසින් පිළිගෙන ලැබ ඇති ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ප්‍රතීතන ඒකකය විසින් MBBS වැඩසටහන ප්‍රතීතනය කර ඇති අතර ඇගයීමට ලක් කරන ලද ප්‍රමිත අටෙන්ම ඉතා

සතුටුදායක - සතුටුදායක ලෙස ශ්‍රේණිගත කර බර තැබූ ලකුණු ප්‍රතිශතය මත ඉහළ ශ්‍රේණියක් ලබා ගන්නා ලදී.

මෙම පීඨය, ශ්‍රී ලංකාවේ කථන සහ භාෂා චිකිත්සාව සහ ශ්‍රවණවේදය සඳහා අනුමත කරන ලද ප්‍රථම වෘත්තීය පුහුණු වැඩසටහන වන, කථන සහ ශ්‍රවණ විද්‍යාව පිළිබඳ BSc (SHS) උපාධිය ද පිරිනමයි. පාඨමාලා ඒකකක්‍රමය මත විධිමත්ව සකස් කර ඇති මෙම සිව් අවුරුදු වැඩසටහන මගින්, සිසුන්ට පුළුල් සායනික පුහුණුවක් ලබා දේ. ප්‍රධාන පුහුණු මධ්‍යස්ථානයක් වන ආයති මධ්‍යස්ථානය, කථන සහ ශ්‍රවණ විද්‍යා සිසුන්ට මෙන්ම අනෙකුත් අනුබද්ධ සෞඛ්‍ය වෘත්තිකයන්ට ද සහාය වෙමින්, සේවාදායකයින් 14,000කට අධික සංඛ්‍යාවක් ලියාපදිංචි කර ඇත. ඊට අමතරව, සිසුන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ශික්ෂණ රෝහල් කිහිපයකදී ද සායනික පළපුරුද්ද ලබා ගනී.

2024 වර්ෂයේ දී, 29 වන වෛද්‍ය සිසුන් කණ්ඩායම (2016/2017) සහ 12 වන කථන සහ කථන සහ ශ්‍රවණ විද්‍යා උපාධි වැඩසටහනේ 12 වන ශිෂ්‍ය කණ්ඩායම මෙම පීඨයෙන් උපාධිය ලබා ගත්හ. 34 වන කණ්ඩායමේ (2022/23 ඇතුළත් වූ) ශිෂ්‍යයෝ 203 ක් MBBS උපාධි වැඩසටහන සඳහා ලියාපදිංචි වී 2023 ජනවාරි 30 වන දින ඔවුන්ගේ අධ්‍යයන කටයුතු ආරම්භ කළහ. කථන සහ ශ්‍රවණ විද්‍යා උපාධි වැඩසටහනේ 16 වන කණ්ඩායමේ සිසුන් අසූ එක් දෙදෙනෙකු වෘත්තීය චිකිත්සක උපාධි වැඩසටහනේ දෙවන කණ්ඩායමේ සිසුන් 41 දෙනෙකු සමඟ ඔවුන්ගේ අනුස්ථාපන වැඩසටහන 2023 ජුනි 26 වැනි දින ආරම්භ කළහ. 2023 දෙසැම්බර් වන විට, සම්පූර්ණ උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව 1,664 ක් විය. එයට MBBS සිසුන් 1,207ක්, SHS (කථන සහ ශ්‍රවණ විද්‍යාව) සිසුන් 334ක් සහ වෘත්තීය චිකිත්සක සිසුන් 123ක් ඇතුළත් වන අතර, භූතාන සිසුන් 25 දෙනෙකු ද ඊට අයත් වේ. 2023 වර්ෂයට සාපේක්ෂව මෙය සිසුන් 124 දෙනෙකුගේ වැඩිවීමක් වන අතර, මෙම වැඩිවීමට අමතර MBBS සිසුන් 73 දෙනෙකු, කථන සහ ශ්‍රවණ විද්‍යා වැඩසටහනේ සිසුන් 29 දෙනෙකු සහ වෘත්තීය චිකිත්සක වැඩසටහනේ සිසුන් 36 දෙනෙකු ඇතුළත් වේ.

මෙම පීඨය, මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (වසංගතවේදය) සහ වෛද්‍ය විද්‍යාවන් පිළිබඳ පර්යේෂණ මත පදනම් වූ PhD සහ MPhil උපාධි ඇතුළුව පශ්චාද් උපාධි වැඩසටහන් කිහිපයක් පිරිණමයි. එමෙන්ම, පශ්චාද් උපාධි වෛද්‍ය ආයතනයේ MD පුහුණුවන්නන් සඳහා විවිධ වෛද්‍ය විශේෂතා සඳහා සහාය වෙමින්, එය පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ද සේවය කරයි. මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (වසංගතවේදය) වැඩසටහනේ 7 වැනි කණ්ඩායම 2024 වසරේදී ලියාපදිංචි කරන ලදී.

තවද, මෙම පීඨය දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සමඟ ඒකාබද්ධව වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ භෞත චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය යන බාහිර උපාධි වැඩසටහන් දෙකක් ද පිරිනමයි. සිසුන් 24 දෙනෙකුගෙන් සමන්විත වන තුන්වන කණ්ඩායම භෞත චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධි වැඩසටහන හදාරයි. අපරාධ විමර්ශනය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් සමාජ විද්‍යා පීඨයේ සහයෝගීතාවයෙන් පොලිස් නිලධාරීන් සඳහා පිරිනමනු ලබන අතර, දැනට දෙවන නිලධාරි කණ්ඩායම මෙම වැඩසටහන හදාරයි. මීට අමතරව, හදිසි වෛද්‍ය සේවා කාර්ය මණ්ඩලය සඳහා විශේෂිත පුහුණුවක් ලබා දෙමින්, සුවසැරිය පදනම සහ සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව හදිසි වෛද්‍ය කාර්මික ශිල්පීන් සඳහා වූ පැරා වෛද්‍ය විද්‍යා ඩිප්ලෝමාවක් හඳුන්වා දෙන ලදී.

## 10.5.5. අධ්‍යයන කාර්ය මණ්ඩලය

පීඨයේ ස්ථිර සේවක සංඛ්‍යාව වශයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 126 ක් ද, තාවකාලික සේවක සංඛ්‍යාව වශයෙන් 40 දෙනෙකු පමණ ද, අනුබද්ධ ශික්ෂණ රෝහල්වලට අනුයුක්තව සිටින වෛද්‍ය උපදේශකයින්, කථන චිකිත්සකයින්, ශ්‍රව්‍ය විද්‍යාඥයින් සහ වෘත්තීය චිකිත්සකයින් ඇතුළු 50 කුට අධික බාහිර කාර්ය මණ්ඩලයක් ද සිටිති. 2024 වර්ෂයේදී බඳවාගැනීම් කිහිපයක් සිදු කළද, ප්‍රධානතම මහාචාර්යවරුන් ඇතුළු ජ්‍යෙෂ්ඨ ශාස්ත්‍රාලිකයින් දෙදෙනෙකුගේ විශ්‍රාම යෑම, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සිව් දෙනෙකුගේ ඉල්ලා අස්වීම, සහ නව බඳවාගැනීම් සඳහා වූ සීමා කිරීම් හේතුවෙන් ස්ථිර කාර්ය මණ්ඩල සංඛ්‍යාවේ සැලකිය යුතු වර්ධනයක් සිදු නොවීය.

මෙම අධ්‍යයන කාර්ය මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්/මහාචාර්යවරුන් 53 දෙනෙකුගෙන් (42%), ස්ථිර කරන ලද ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්/කථිකාචාර්යවරුන් 48 දෙනෙකුගෙන් (38%), සහ ස්ථිර නොකරන ලද පරිවාස කථිකාචාර්යවරුන්/කථිකාචාර්යවරුන් 25 දෙනෙකුගෙන් (20%) සමන්විත වේ. 2024 දෙසැම්බර් වන විට, අධ්‍යයනාංශ 14ක අනුමත අධ්‍යයනාංශ ප්‍රධානී තනතුරු පුරවා ඇත.

## 10.5.6. පර්යේෂණ

පීඨයට එහි පර්යේෂණ විශිෂ්ටත්වය පිළිබඳව ඉමහත් ආඩම්බරයක් ඇත. එය නිරන්තරයෙන්ම ශ්‍රී ලංකාවේ ඉහළම වෛද්‍ය පීඨ අතරට ශ්‍රේණිගත වේ. 2024 වර්ෂයේදී, එය ලොව හොඳම වෛද්‍ය විද්‍යාල 1,000 අතරට පිළිගැනුණු අතර, ටයිම්ස් හයර් එඩියුකේෂන් ශ්‍රේණිගත කිරීම් අනුව එය ශ්‍රී ලංකාවේ හොඳම වෛද්‍ය පීඨ තුන අතරට ශ්‍රේණිගත විය. තවද, ආයතනයේ ප්‍රබල පර්යේෂණ බලපෑම පිළිබිඹු කරමින් ජ්‍යෙෂ්ඨ පීඨ සාමාජිකයින් හතර දෙනෙකු ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලය විසින් ලොව හොඳම පර්යේෂකයින්ගෙන් 2% අතරට නම් කරන ලදී.

පීඨය විශ්වවිද්‍යාලයේ විද්‍යුත් සුරක්ෂිතාගාරය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. 2024 වසරේ පමණක් පර්යේෂණ නිමැවුම් 202 ක් ප්‍රකාශයට පත් කළ අතර එයට සඟරා ලිපි 181 ක්, සම්මන්ත්‍රණ සාරාංශ පත්‍රිකා 19 ක් සහ පොත් පරිච්ඡේද 2 ක් ඇතුළත් විය. සඟරා ලිපිවලින් බහුතරයක් ස්කොපස් දර්ශකගත කර ඇත.

2024 වර්ෂයේදී, කැලණිය විශ්වවිද්‍යාලයෙන් රුපියල් 3,250,000 ක් වටිනා අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන 9 ක් පීඨයට ලැබුණි. ඊට අමතරව, ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO), ජාතික විද්‍යා පදනම (NSF), ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය (IAEA), ජාතික පර්යේෂණ සභාව (NRC) සහ එක්සත් රාජධානියේ ජාතික සෞඛ්‍ය සහ සත්කාර පර්යේෂණ ආයතනය (NIHR) ඇතුළු කීර්තිමත් සංවිධාන කිහිපයකින් අරමුදල් සපයන බාහිර පර්යේෂණ ප්‍රදාන 20 කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක විය. පීඨයේ පර්යේෂණ කළඹට තැලසීමියා, ජෛව ස්කන්ධය, ගෝලීය සෞඛ්‍ය අභියෝග, LEAPS, ළමා අරමුදල, BTI, ළමා ලිංගික සංචාරක ව්‍යාපාරය (ELBS) සහ ආහාර පරිසර පර්යේෂණ සම්බන්ධ ව්‍යාපෘති ද ඇතුළත්වේ. ඒවාට Cerebral Palsy Alliance (ඕස්ට්‍රේලියාව) සහ Cerebral Palsy Alliance හි පර්යේෂණ පදනම වැනි සංවිධානවලින් අරමුදල් සපයා ඇත. මෙම පර්යේෂණ ක්‍රියාකාරකම් මගින් වෛද්‍ය දැනුම දියුණු කිරීමට සහ තීරණාත්මක ගෝලීය සෞඛ්‍ය අභියෝගවලට මුහුණ දීමට පීඨයේ අඛණ්ඩ කැපවීම ඉස්මතු කරයි.

## 10.5.7. යටිතල පහසුකම් සංවර්ධනය සහ ඩිජිටල්කරණය

2021 වසරේ ආරම්භ කරන ලද උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ අක්මා රෝග සඳහා වූ මධ්‍යස්ථානයේ රෝහල් පහසුකම් ඉදිකිරීම ආර්ථික හා ඉන්ධන අර්බුදය හේතුවෙන් ප්‍රමාද වූ නමුත් පරිත්‍යාගශීලීන්ගේ ආධාර මත ඉදිකිරීම් කටයුතු සිදු යළි ආරම්භ කෙරුණි. මෙම පහසුකම 2024 මුල් භාගය වන විට ක්‍රියාත්මක වීමට අපේක්ෂා කෙරේ. මෙම ආදර්ශ රෝහල කැලණිය විශ්වවිද්‍යාලයට අයත් වන අතර සෞඛ්‍ය අමාත්‍යාංශය සහ කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සමඟ සමීප සහයෝගයෙන් එය ක්‍රියාත්මක වේ. සිදු කරන ලද අනෙකුත් සියලුම ගොඩනැගිලි ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් සුළු එකතු කිරීම්, ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන ව්‍යාපෘති විය.

යාබදව පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ භාරකරුවන් සහ කැලණිය විශ්වවිද්‍යාලය විසින් අත්සන් කළ අවබෝධතා ගිවිසුම යටතේ කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මගින් පවත්වාගෙන යනු ලබන ඉඩම අංගසම්පූර්ණ එළවළු වත්තක් වශයෙන් සංවර්ධනය කර ඇත. ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම උදෙසා මෙම ප්‍රදේශයේ එළිමහන් විවේකය ලබා ගැනීම සහ ස්වායු අභ්‍යාස කිරීම පිණිස උපයෝගි කර ගැනීමට පහසුකම් ලබා දීමේ ප්‍රයත්නයක් ද වේ.

පරිපාලන ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීමේදී සැලකිය යුතු ප්‍රගතියක් ලබාගෙන ඇත. විශේෂයෙන්ම ශිෂ්‍ය අධ්‍යාපන ක්‍රියාකාරකම් කාලසටහන්ගත කිරීම සහ විභාග හා රැස්වීම් කාලසටහන්ගත කිරීමේදී මෙය වඩා වැදගත් විය. මෙම ප්‍රයත්නය හේතුවෙන් පරිපාලන වැඩ ප්‍රවාහයන් විධිමත් වීම, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැඩ බර අඩු වීම, කාර්යක්ෂමතාව වැඩි දියුණු වීම, විගණන ක්‍රියාවලීන් වැඩිදියුණු වීම යනාදිය සිදුවී ඇත. සෞඛ්‍ය දත්ත විද්‍යා ඒකකය (HDSU) මෙම මෘදුකාංග වැඩසටහන් අභ්‍යන්තරව සංවර්ධනය කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇති අතර, මෙනිසා විශ්වවිද්‍යාලයට අමතර වියදම් දැරීමට සිදුවී නොමැත. තවදුරටත් සිදුකරන ලද ඩිජිටල් වැඩිදියුණුවට අභ්‍යන්තර මානව සම්පත් භාවිතයෙන් නිර්මාණය කරන ලද වාහන කළමනාකරණ පද්ධතියක් සහ නේවාසිකාගාර වෙන්කිරීමේ පද්ධතියක් ඇතුළත් වේ.

ඊට අමතරව, ව්‍යාධිවේදය සහ ව්‍යුහ විද්‍යා අධ්‍යයනාංශ බාහිර අධ්‍යාපන ආයතන සඳහා කෞතුකාගාර සහ රසායනාගාර සැසි ආරම්භ කර ඇති අතර, එමගින් ඔවුන්ගේ අධ්‍යාපන ප්‍රවේශය වැඩි දියුණු කරන අතරම අමතර ආදායමක් උත්පාදනය කරයි.

## 10.5.8. අනාගත අපේක්ෂා

පීඨයේ සමාජ වගකීම වැඩි කිරීම සහ පීඨ සංවර්ධන අරමුදල ශක්තිමත් කිරීම සඳහා පීඨය මගින් රෝගීන් සඳහා ගාස්තු අය කරනු ලබන උපදේශන සේවාවක් සැපයීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පියවර ගෙන ඇත. මෙම සේවාව 2025 වර්ෂයේ දී ආරම්භ කිරීමට නියමිතය.

MBBS වැඩසටහන සඳහා වැඩි වැඩියෙන් විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීමේ උත්සාහයන් ධනාත්මක ප්‍රතිඵල ලබා දෙන බව පෙනෙන්නට ඇති අතර, ඉදිරියේදී බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් විදේශීය අයදුම්කරුවන්ගේ සංඛ්‍යාවේ සැලකිය යුතු වැඩි වීමක් දැකිය හැකිය.

පීඨයේ පුස්තකාලය සඳහා උපාය මාර්ගික ප්‍රවේශය නවීකරණය කිරීමට සැලසුම් කරනු ලබන කරනු ලබන අතර, එය දැනුම මධ්‍යස්ථානයක් සහ පර්යේෂණ සඳහා සහාය දක්වන මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කරනු ඇත.

මීට අමතරව, අධ්‍යාපනික අත්දැකීම් පොහොසත් කිරීම සඳහා සිසුන්ට වැඩිදියුණු කළ ඉගෙනුම් පරිසරයකට ප්‍රවේශය වීමට හැකියාව ලබා දෙමින්, ඔවුන්ගේ ඉගෙනුම් පහසුකම් වැඩිදියුණු කරනු ලැබේ.

සැලසුම් කරනලද සහ නිකුත් කරන ලද විෂයමාලා අදාළ වන බවත් සංවර්ධනය වන අධ්‍යාපනික හා වෘත්තීය ප්‍රමිතීන්ට අනුකූල වන බවත් සහතික කරමින්, තත්ත්ව සහතික කිරීමේ (QA) ක්‍රියාවලීන් සහ අවශ්‍ය සංශෝධන හරහා විෂයමාලා අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා පීඨය කැපවී කටයුතු කරයි.

**මහාචාර්ය මාධව චන්ද්‍රතිලක**
**පීඨාධිපති /වෛද්‍ය පීඨය**

# 10.6. විද්‍යා පීඨය

## 10.6.1. මෙහෙවර

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ මෙහෙවර වන්නේ ජාතික සංවර්ධනයට සහ මානව වර්ගයාගේ යහපැවැත්මට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට හා ස්වභාවික සම්පත් තිරසාර ලෙස භාවිතය සහ සංරක්ෂණය සඳහා පරිසරය පිළිබඳ වඩා යහපත් අවබෝධයක් පවත්වාගෙන යාමට විවිධ විද්‍යාත්මක විෂයයන්ට අදාළව උපදේශන සහ උපදේශක සේවා සැපයීම සඳහා ඉහළ පෙළඹවීමක් ඇති උපාධිධාරීන් සහ පශ්චාද් උපාධිධාරීන් බිහි කිරීමයි.

## 10.6.2. පීඨය පිළිබඳ හැඳින්වීම

කැලණිය විශ්වවිද්‍යාලයේ පවතින පීඨ හතෙන් එකක් වන විද්‍යා පීඨය 1967 දී ආරම්භ කරන ලදී. විද්‍යා පීඨය වර්තමානයේ දී රසායන විද්‍යාව, කර්මාන්ත පරිපාලන, ගණිතය, ක්ෂුද්‍රජීව විද්‍යාව, භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව, ශාක හා අණුක ජීව විද්‍යාව, සංඛ්‍යාලේඛන සහ පරිගණක විද්‍යාව, සහ සත්ව විද්‍යාව සහ පරිසර කළමනාකරණය යන අධ්‍යයන අංශ අටකින් සමන්විත වේ. මෙයට අමතරව, මෘදුකාංග ඉංජිනේරු ඉගැන්වීම් ඒකකය සහ ක්‍රීඩා සහ ව්‍යායාම විද්‍යා ඒකකය යන ඒකක දෙක ද එයට ඇතුළත් වේ.

විද්‍යා පීඨය මගින් වසර තුනක විද්‍යාවේදී උපාධි පාඨමාලා පහක් සහ වසර හතරක කාලසීමාවකින් යුත් විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන් 20ක් පිරිනමයි. ජීව විද්‍යා සහ භෞතික විද්‍යා විෂය ධාරා සඳහා අනුපිළිවෙලින් සිසුන් 221ක් සහ 362ක් ඇතුළත් කර ඇති අතර, පීඨය සඳහා වාර්ෂික සිසුන් බඳවා ගැනීම 1,136ක් විය. ව්‍යවහාරික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා සිසුන් 60 ක් ද, ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා සිසුන් 80 ක් ද, පරිසර සංරක්ෂණ හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සඳහා සිසුන් 109 ක්, කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය/තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා සිසුන් 119 ක්, භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සඳහා සිසුන් 76 ක්, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා සිසුන් 59 ක්, සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා සිසුන් 50 ක් වශයෙන් විශේෂීකරණ වැඩසටහන් සඳහා වෙනම ප්‍රවේශ හරහා සිසුන් ඇතුළත් කර ගැනීම ද විද්‍යා පීඨය මගින් සිදු කරයි.

2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුළත් කර ගන්නා ලද සිසුන් සංඛ්‍යාව 991 කි. 2024 වර්ෂයේදී, භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රොනික විද්‍යා අධ්‍යයනාංශය විසින් ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව හඳුන්වා දුන් අතර, ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාවේ පරිගණක විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව විශේෂීකරණ වැඩසටහන සඳහා සිසුන් බඳවා ගැනීම ආරම්භ කරන ලදී.

2024 වර්ෂයේදී පීඨය, එහි ජෛව රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව, පරිගණක අධ්‍යයනය, ගණිතමය භෞතික විද්‍යාව, ගණිතය, ක්ෂුද්‍රජීව විද්‍යාව, අණුක ජීව විද්‍යාව සහ ශාක ජෛව තාක්ෂණය, භෞතික විද්‍යාව, සංඛ්‍යානය, සහ සත්ත්ව විද්‍යාව යන විෂයයන්ට අදාළ විද්‍යාවේදී සහ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා කාණ්ඩ වශයෙන් සමාලෝචනය කරන ලදී.

විද්‍යාවේදී (භෞතික විද්‍යා විෂය ධාරාව), ගණිතමය භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය, ගණිතය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය, සහ භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය ඇතුළත් වූ කාණ්ඩය සඳහා වූ අවසන් වාර්තාව ලැබී ඇත. එහි සමස්ත කාර්යසාධනය 85.62% ක ලකුණු සංඛ්‍යාවක් සමඟ "A" ශ්‍රේණියක් හිමි කර ගනිමින්, 'ඉතා හොඳ' යන වර්ගීකරණය යටතේ ශ්‍රේණිගත කරන ලදී.

පීඨය දැනට පශ්චාද් උපාධි වැඩසටහන් 12ක් (විද්‍යාපති උපාධි වැඩසටහන් 10ක් සහ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් 2ක්) ක්‍රියාත්මක කරන අතර, එම වැඩසටහන් සඳහා ශාස්ත්‍රපති සහ/හෝ ඩිප්ලෝමා සුදුසුකම් සඳහා වන සුදුසු පරිදි කලින් ඉවත්වීමේ සහ අනුයාත විකල්ප ඇතුළත් වේ. මීට අමතරව, පීඨය ඩිප්ලෝමා වැඩසටහනක්ද පිරිනමයි. ආචාර්ය මණ්ඩල සාමාජිකයින් 139 දෙනෙකුගේ, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩල සාමාජිකයින් 3 දෙනෙකුගේ, සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 83 දෙනෙකුගේ සහාය ඇතිව උපාධි අපේක්ෂකයින් 3,176 දෙනෙකුට මෙමගින් සේවා සැපයේ.

## 10.6.3. වසරේ විශේෂ අවස්ථා

2024 වර්ෂයේදී විද්‍යා පීඨයට පහත දැක්වෙන සම්මාන හිමි විය.

අ. ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ (SLAAS) පොදු පර්යේෂණ කමිටුව (GRC) විසින් පිරිනමනු ලබන, එම සංගමයේ නවෝත්පාදන සහ වාණිජකරණය සඳහා වන සම්මානය, නවෝත්පාදනය සහ වාණිජකරණය පිළිබඳ විශිෂ්ටත්වය වෙනුවෙන් ශ්‍රී ලාංකික විද්‍යාඥයින් ඇගයීමට ලක් කරන ජීවිත කාලීන ජයග්‍රහණ සම්මානයකි (lifetime achievement award). 2024 වර්ෂයේදී, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 80 වැනි වාර්ෂික සැසිවාරයේදී මෙම ගෞරවනීය සම්මානය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි මහතා වෙත ප්‍රදානය කරන ලදී.

ආ. නව නිපැයුම් සඳහා වන ජනාධිපති සම්මාන (2017-2020):

- ලෝකඩ පදක්කම (ව්‍යවහාරික විද්‍යා සහ තාක්ෂණ): ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි.
- ලෝකඩ පදක්කම (දේශීය වෛද්‍ය විද්‍යාව): ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ.ඒ. ලියනගේ මිය.
- ලෝකඩ පදක්කම සහ කුසලතා සම්මානය (ආහාර තාක්ෂණවේදය): ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඒ.කේ.පී.ජේ. සෙනෙවිරත්න සහ මහාචාර්ය එන්. ජයතිලක මිය.

ඇ. තිරසරභාවය සඳහා කඩොලාන පිළිබඳ දෙවන ජාත්‍යන්තර සමුළුවේ (ICMS) දී, "දේශගුණික විපර්යාස මැඩලීම සඳහා කඩොලානවලට ඇති හැකියාව" යන අංශය යටතේ පිරිනැමුණු හොඳම විද්‍යාත්මක සම්මානය ආචාර්ය කේ.එච්.ඩබ්.එල්.ද සිල්වා මිය වෙත ප්‍රදානය කරන ලදී.

ඈ. ජාත්‍යන්තර සංවරණ අරමුදල වන, ඇමරිකානු ශාක ව්‍යාධිවේදී සංගමයේ පදනම් සම්මානය (2024) මහාචාර්ය ආර්.එන්. අත්තනායක මිය වෙත ප්‍රදානය කරන ලදී.

ඉ. මහාචාර්ය ආර්.එන්. අත්තනායක මිය 2024 වසරේ විශිෂ්ටතම ආසියානු විද්‍යාඥයින් 100 දෙනා අතරට නම් කරන ලදී.

ඊ. ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ (SLAAS) පොදු පර්යේෂණ කමිටුව මගින් 2024 වර්ෂය සඳහා පිරිනමනු ලබන, පශ්චාද් උපාධි පර්යේෂණ සඳහා වූ කීර්තිමත් සම්මානය, එම සංගමයේ 80 වැනි වාර්ෂික සැසිවාරයේදී පුබුදු ජයසේකර මහතා වෙත ප්‍රදානය කරන ලදී.

උ. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (NIPO) මගින් පහත සඳහන් පේටන්ට් බලපත්‍ර දෙක ප්‍රදානය කර ඇත. එහි නව නිපැයුම්කරුවන් වන්නේ ආචාර්ය ජේ.ඒ. සෙනෙවිරත්න, මහාචාර්ය ඒ.එල්.ඒ.කේ. රණවීර, මහාචාර්ය කේ.එම්.ඩී.සී. ජයතිලක, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්.බී.ඩී.ආර්.පී. විජේසුන්දර සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි යන මහත්වරුන් ය.

- Internet of Things (IoT) සහ Industrial Internet of Things (IIoT) යෙදවුම් සඳහා, දේශීය හෝ දුරස්ථ උපකරණ පුවරුවක තත්‍ය කාලීන දත්ත නිරීක්ෂණය, පාලනය සහ දෘශ්‍යකරණය කිරීමට Controller Area Network (CAN) ප්‍රොටෝකෝලය මත පදනම් වූ, ලිපිනගත කළ හැකි, විශ්වාසනීය සහ ද්විපාර්ශ්වික දත්ත සන්නිවේදන පද්ධතිය (පේටන්ට් අංක 22424)
- කෘත්‍රිම බුද්ධිය (AI) මත පදනම් වූ ස්මාර්ට් LP ගෑස් මට්ටම් දර්ශකය (පේටන්ට් අංක 22121)

ඌ. ජාතික විද්‍යා පදනමේ (NSF) 2023 වර්ෂය සඳහා වූ, පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා වන ආධාරක යෝජනා ක්‍රමයේ (SUSRED) සම්මානය පහත සඳහන් පීඨ සාමාජිකයින් විසින් හිමිකර ගන්නා ලදී.

- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.ඒ. පරණගම මිය
- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදත් ආර්.ඩී. කාලිංගමුදලි
- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඒ.කේ.පී.ජේ. සෙනෙවිරත්න
- මහාචාර්ය එන්. ජයතිලක මිය

- මහාචාර්ය ඩී.එස්.එම්. ද සිල්වා මිය
- මහාචාර්ය කේ.පී.ආර්.එන්. අත්තනායක මිය
- මහාචාර්ය ඒ.එල්.ඒ.කේ. රණවීර
- මහාචාර්ය අයි.වී.එන්. රත්නායක
- මහාචාර්ය ඩබ්.එම්.ඒ.පී. හල්මිල්ලෑව
- මහාචාර්ය එම්.පී. දීයමුල්ල
- ආචාර්ය එච්.එම්. හේරත් මිය

2024 වර්ෂයේදී, විශ්වවිද්‍යාල අරමුදල් ලෙස රුපියල් මිලියන 3.36 ක් සහ ලෝක විද්‍යා ඇකඩමියෙන් ඇමරිකානු ඩොලර් 22,513 ක් වශයෙන් මුළු වටිනාකමකින් යුත් නව පර්යේෂණ ප්‍රදාන අටක් පීඨය විසින් ලබා ගන්නා ලදී. දැනට ක්‍රියාත්මක වන ප්‍රදාන අතරට විශ්වවිද්‍යාලයෙන් ලැබුණු රුපියල් මිලියන 2.15ක් සහ ජාතික පර්යේෂණ සභාවෙන් ලැබුණු රුපියල් මිලියන 3.5 ක් ඇතුළත් වේ.

පීඨය විසින් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ දෙකක් සාර්ථකව පවත්වන ලදී. විද්‍යා පීඨය විසින් සංවිධානය කරන ලද, ව්‍යවහාරික සහ ශුද්ධ විද්‍යා පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2024, "නවෝත්පාදනය, නව නිපැයුම් සහ වාණිජකරණය සඳහා බහුවිධ පර්යේෂණ පෝෂණය කිරීම" යන්න තේමා කරගනිමින්2024 ඔක්තෝබර් 11 වන දින පවත්වන ලදී. කර්මාන්ත කළමනාකරණ අධ්‍යයන අංශය විසින් සංවිධානය කරන ලද, ස්මාර්ට් පරිගණනය සහ පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ 7 වන ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය 2024 අප්‍රේල් 4 වන දින පවත්වන ලදී.

BECS 31421 පාඨමාලාව හා සම්බන්ධ, ක්ෂුද්‍ර පාලක සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාගාරය PIC ක්ෂුද්‍ර පාලක, මෝටර් ධාවක, බ්‍රෙඩ්බෝඩ්, විදුලි සැපයුම් සහ අනෙකුත් අත්‍යවශ්‍ය ඉලෙක්ට්‍රොනික උපකරණවලින් සමන්විත කර ඇත. සත්ව විද්‍යා හා පාරිසරික කළමනාකරණ  අධ්‍යයනාංශය විසින් වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව සඳහා වූ විද්‍යාගාරයක් සහ භූ විද්‍යාත්මක අධ්‍යයන සඳහා වූ ප්‍රදර්ශන විද්‍යාගාරයක් ස්ථාපිත කර ඇත. මීට අමතරව, විද්‍යා පීඨය තුළ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා පහසුකම් වැඩි දියුණු කරමින්, පීඨය සඳහා නව දේශන ශාලා සංකීර්ණයක ඉදිකිරීම් සිදුවෙමින් පවතී.

කර්මාන්ත කළමනාකරණ අධ්‍යයනාංශය, වැඩමුළු, ශිෂ්‍ය පර්යේෂණ, ශිෂ්‍ය සංවර්ධන ව්‍යාපෘති සහ තාක්ෂණික කතිකා සඳහා CODETerriers, CrowdSnap, Hirdaramani, MAS-Stretch Line, Pagero සහ සෙලාන් බැංකුව සමඟ සාර්ථකව හවුල්කාරීත්වයකට පිවිස ඇත.

## 10.6.4. ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ අධ්‍යයන සහයෝගීතා ගොඩනගා ගැනීම

- කර්මාන්ත කළමනාකරණ දෙපාර්තමේන්තුව ජපානයේ යමගුචි විශ්වවිද්‍යාලය සමඟ පර්යේෂණ සහයෝගීතාවයක් ආරම්භ කර ඇත.
- සත්ව විද්‍යා හා පාරිසරික කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් විශ්වවිද්‍යාලය සහ ඉන්දියාවේ නාලන්දා විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තබා ඇත.
- ශාක හා අණුක ජීව විද්‍යා අධයයනාංශයේ මහාචාර්ය ආර්. එන්. අත්තනායක මිය, ඇමරිකා එක්සත් ජනපදයේ කොලරාඩෝ රාජ්‍ය විශ්වවිද්‍යාලය  සහ ජෝර්ජියා විශ්වවිද්‍යාලය සමඟ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින පර්යේෂණ සඳහා සහයෝගීතාවයෙන් කටයුතු කරයි.
- ශාක හා අණුක ජීව විද්‍යා අධයයනාංශයේ මහාචාර්ය ඩී. ඒ. ඩී. ඒ. දරණාගම මිය, තායිලන්තයේ චියැංමායි විශ්වවිද්‍යාලය සහ චීනයේ, කුජිං නෝමල් විශ්වවිද්‍යාලයට අනුබද්ධ යුනාන් සානු ජෛව සම්පත් ආරක්ෂණ හා උපයෝජන මධ්‍යස්ථානය සමඟ දැනට ක්‍රියාත්මක පර්යේෂණ සඳහා සහයෝගීතාවයෙන් කටයුතු කරයි.

කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දැඩි කැපවීම සහ ධෛර්ය හේතුවෙන්, කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය ශ්‍රී ලංකාවේ තෘතීයික අධ්‍යාපනය තුළ විශිෂ්ටතා මධ්‍යස්ථානයක් ලෙස මතුවී ඇත. චින්තනයේ නිදහස, නවෝත්පාදනය සහ නිර්මාණශීලීත්වය දිරිමත් කරන පරිසරයක් පීඨය විසින් නිර්මාණය කර ඇත. මෙම ගුණාංගවලින් සන්නද්ධ විද්‍යා පීඨයේ උපාධිධාරීන්, ගෝලීය ප්‍රගතියට සහ මනුෂ්‍යත්වයේ යහපැවැත්මට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට සූදානම්ව සිටී.

සිය මෙහෙවරට අනුකූලව, විද්‍යා පීඨය ආර්ථිකය මෙහෙයවීමට, සිවිල් සමාජයට සහ රජයට සහාය වීමට මෙන්ම මනුෂ්‍ය වර්ගයාගේ යහපත උදෙසා තීරණාත්මක තීරණ ගැනීමට අවශ්‍ය කුසලතා, හැකියාවන් සහ ආකල්ප සහිත විද්වතුන් සහ වෘත්තිකයන් සූදානම් කිරීමට සහ බිහිකිරීමට සුවිශේෂී සේවාවන් සපයමින් සිටී.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි**
**පීඨාධිපති / විද්‍යා පීඨය**

# 10.7. සමාජීය විද්‍යා පීඨය

## 10.7.1. දැක්ම

විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ සහ පොදුවේ දකුණු ආසියාවේ සංවර්ධනය සඳහා කැපවීමෙන් බහු-විෂයීය සහ අන්තර්-විෂයීය සහයෝගීතාව තුළින් නිදහස් චින්තනය, විවේචනාත්මක විශ්ලේෂණය, සමාජ වගකීම පිළිබඳ දැනුවත්භාවය, සංස්කෘතික විවිධත්වයට ගරු කිරීම සහ සදාචාරාත්මක වටිනාකම් පෝෂණය කිරීම තුළින් විශිෂ්ටත්වය පවත්වා ගැනීම.

## 10.7.2. මෙහෙවර

ඉගැන්වීම, පර්යේෂණ, නවෝත්පාදන සහ බුද්ධිමය නායකත්වය තුළින් ශ්‍රී ලාංකේය සමාජයේ සමාජ-ආර්ථික, දේශපාලන, සංස්කෘතික සහ ශාස්ත්‍රීය සංවර්ධනය ඉදිරියට ගෙනයාම සහ ප්‍රවර්ධනය කිරීම.

## 10.7.3. දළ විශ්ලේෂණය

සමාජීය විද්‍යා පීඨය කැලණිය විශ්වවිද්‍යාලයේ පැරණිතම සහ විශාලතම පීඨයන් අතරින් එක් පීඨයක් වේ. 1981/82 අධ්‍යයන වර්ෂයේදී එය වෙනම පීඨයක් ලෙස ආරම්භ කළද, පීඨයේ ඉතිහාසය විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ආරම්භය දක්වා දිව යයි.

එහි ආරම්භක අවධියේදී, කැලණිය විශ්වවිද්‍යාලයේ පූර්වගාමියා වූ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, පීඨ කිහිපයකින් සමන්විත වූ අතර, ඒ අතරින් ශාස්ත්‍ර පීඨය, පසුව සමාජීය විද්‍යා පීඨය සහ මානවශාස්ත්‍ර පීඨය ලෙස දෙකට බෙදී තිබුණි. ඔවුන්ගේ පොදු සම්භවය හේතුවෙන්, මෙම පීඨ දෙක ශක්තිමත් සම්බන්ධතාවක් අඛණ්ඩව පවත්වා ගෙන යයි.

විද්වතුන්ගේ සහ වෘත්තිකයන්ගේ කදිම සම්මිශ්‍රණයක් අධ්‍යනාංශවල අධ්‍යයන කාර්ය මණ්ඩලය මගින් නියෝජනය කෙරේ. ඉතිහාසය, පුරාවිද්‍යාව, භූගෝල විද්‍යාව, දර්ශනය, ආර්ථික විද්‍යාව සහ සමාජ විද්‍යාව යන සාම්ප්‍රදායික විෂයයන් පීඨයේ අධ්‍යයන අන්තර්ගතය ශක්තිමත් කරන අතරම, ජන සන්නිවේදනය, ජාත්‍යන්තර අධ්‍යයන, පුස්තකාලය සහ විඥාපන විද්‍යාව, සමාජ සංඛ්‍යාලේඛන, ක්‍රීඩා විද්‍යාව සහ ශාරීරික අධ්‍යාපනය වැනි අනෙකුත් අංශ වෘත්තිකයන්ට ඔවුන්ගේ දොරටු විවෘත කර ඇත. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයක ප්‍රථම ජනසන්නිවේදන අධ්‍යනාංශය සහ ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යනාංශය ස්ථාපනය කරන ලද්දේ ද කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨය තුළ ය.

පීඨය වර්තමානයේ පහත සඳහන් අධ්‍යයන අධ්‍යනාංශ 13 සමන්විත වන අතර එම අධ්‍යනාංශ 13 යටතේ එහි සේවාවන් සපයනු ලබයි.

1. පුරාවිද්‍යා අධ්‍යනාංශය
2. ආර්ථික විද්‍යා අධ්‍යනාංශය
3. ඉතිහාසය අධ්‍යනාංශය
4. ජාත්‍යන්තර අධ්‍යනාංශය
5. පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යනාංශය
6. දර්ශනය අධ්‍යනාංශය
7. දේශපාලන විද්‍යා අධ්‍යනාංශය
8. සමාජ විද්‍යා අධ්‍යනාංශය
9. සමාජ සංඛ්‍යානය අධ්‍යනාංශය
10. ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යනාංශය
11. භූගෝලවිද්‍යා අධ්‍යනාංශය
12. ජනසන්නිවේදන අධ්‍යනාංශය
13. තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශය

පීඨය විෂය ක්ෂේත්‍ර 18 ක ප්‍රථම උපාධි පිරිනමයි. ඇතුළත් වූ සිසුන්ට අධ්‍යයන විශිෂ්ටත්වය මත පදනම් වූ විශේෂිත විෂය ධාරාවක සාමාන්‍ය උපාධි වැඩසටහන හෝ ගෞරව උපාධි වැඩසටහන හෝ හැදෑරිය හැකිය. සමාජීය විද්‍යා පීඨය සිසුන්ට කලාව පිළිබඳ වසරක ශාස්ත්‍රපති උපාධි වැඩසටහනක් සහ සමාජ විද්‍යාව පිළිබඳ වසර දෙකක ශාස්ත්‍රපති උපාධි වැඩසටහනක් සම්පූර්ණ කිරීමට හැකිවන පරිදි පශ්චාද් උපාධි වැඩසටහන් පිරිනමයි. එපමණක් නොව, පර්යේෂකයන්ට සහ විද්වතුන්ට ඔවුන්ගේ දර්ශනපති සහ දර්ශනශූරි උපාධි සඳහා ලියාපදිංචි වී එම වැඩ කටයුතුවල  නියැලීමට හැකියාව පවතී.

## 10.7.4. පීඨය මගින් පිරිනමනු ලබන ඩිප්ලෝමා පාඨමාලා

1. භූගෝලීය තොරතුරු පද්ධතිය පිළිබඳ ඩිප්ලෝමාව
2. ආපදා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව
3. ඉතිහාසය පිළිබඳ ඩිප්ලෝමාව
4. ජාත්‍යන්තර අධ්‍යයන පිළිබඳ ඩිප්ලෝමාව
5. තොරතුරු කළමනාකරණය සහ තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව
6. පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව
7. ජන සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමාව
8. මහජන සම්බන්ධතා සහ මාධ්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව
9. උපදේශන ඩිප්ලෝමාව
10. බන්ධනාගාර නිලධාරීන් සඳහා නිවැරදි කිරීම් සහ පුනරුත්ථාපනය පිළිබඳ ඩිප්ලෝමාව (DCRP)
11. ක්‍රීඩා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව
12. ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව
13. තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව (අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් සඳහා ගාස්තු අයකිරීමෙන් තොරව)
14. පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමාව
15. සන්නිවේදනය සහ මහජන සම්බන්ධතා පිළිබඳ උසස් ඩිප්ලෝමාව
16. විශෝධනය හා පුනරුත්ථාපනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව
17. ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව
18. මහජන සම්බන්ධතා සහ මාධ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව

## 10.7.5. පීඨය මගින් පිරිනමනු ලබන ශාස්ත්‍රපති / විද්‍යාපති උපාධි වැඩසටහන්[5]

සමාජීය විද්‍යා පීඨය උපාධි අධ්‍යයන පීඨය තුළින් පහත සඳහන් එක් අවුරුදු සහ දෑ අවුරුදු උපාධී වැඩසටහන් ඉදිරිපත් කරයි.

1. පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති / විද්‍යාපති වැඩසටහන්
2. ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති / විද්‍යාපති වැඩසටහන්
3. ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රපති / විද්‍යාපති වැඩසටහන්
4. පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති / විද්‍යාපති වැඩසටහන්
5. ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති / විද්‍යාපති වැඩසටහන්
6. දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති / විද්‍යාපති වැඩසටහන්
7. දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති / විද්‍යාපති වැඩසටහන්
8. සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති / විද්‍යාපති වැඩසටහන්
9. භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති / විද්‍යාපති වැඩසටහන

5 මේ වන විට පශ්චාත් උපාධි වැඩසටහන් වල පවතින විෂයමාලා සංශෝධනය කරමින් පවතී. එබැවින්, ලබන වසර වන විට උපාධි වැඩසටහන් දෙකෙහි නම් වෙනස් වනු ඇත.

## 10.7.6. 2024 වසරේ විශේෂ අවස්ථා

2024 වර්ෂයේදී පීඨය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රකාශන නිමැවුමේ සාමාන්‍ය වර්ධනයක් දක්නට ලැබුණි.

විශේෂයෙන්ම, පුරාවිද්‍යා, භූගෝල විද්‍යා, පුස්තකාල හා විඥාපන විද්‍යා, ජනසන්නිවේදන, සමාජ විද්‍යා, ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන යන අධ්‍යයන අංශ සහ සමාජීය විද්‍යා පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානය මගින් සංවිධානය කරන ලද පහත දැක්වෙන පරිසංවාද, වැඩමුළු, සම්මන්ත්‍රණ, රැස්වීම් සහ සාකච්ඡා 2024 වර්ෂය තුළ පවත්වන ලදී.

- කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය (URSS-2024)
- වත්මන් තත්ත්වය තුළ සමාජ ගැටළු සහ අභියෝග පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය: බහු-විෂයීය ප්‍රවේශයක් (ISSICCS 2024).
- 3 වන ජාත්‍යන්තර ගංගා සමුළුව (IRC-).
- ජපානයේ කනසාවා සහ චුක්යෝ විශ්වවිද්‍යාල සමඟ 5 වන වාර්ෂික රැස්වීම
- “පුස්තකාල වෘත්තිකයන් සඳහා කෘතිම බුද්ධිය (AI)” පිළිබඳ ජාතික වැඩමුළුව.
- මෙන්ඩලි වැඩමුළු මාලාව - 01.
- භූගෝල විද්‍යා අධ්‍යයන අංශය විසින් පවත්වන ලද චීන-ශ්‍රී ලංකා අධ්‍යයන හුවමාරු වැඩමුළුව.
- ජන සන්නිවේදන අධ්‍යයන අංශය විසින් පවත්වන ලද “MACO Social Bridge” වැඩසටහන.
- දේශගුණික විපර්යාස ක්‍රියාමාර්ග පිළිබඳ සමාරම්භක වැඩමුළුව
- කැලණිය විශ්ව විද්‍යාලය සහ ජපානයේ චුක්යෝ විශ්ව විද්‍යාලය අතර අන්තර් සංස්කෘතික අධ්‍යයන හුවමාරුව.
- පොළොන්නරුව පුරාවිද්‍යා සහ මානව විද්‍යා නාගරික භූ දර්ශන ව්‍යාපෘතිය (PAAULP) 2024.
- “Why Masculinity@( Exploring Men" Desire" and UK Sex Clubs”යන මාතෘකාව යටතේ පවත්වන ලද විශේෂ ආරාධිත දේශනය.

තවද, පශ්චාද් උපාධි පාඨමාලාවල (ශාස්ත්‍රපති/විද්‍යාපති) සංශෝධිත විෂයමාලා අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

## 10.7.7. සම්මාන

2024 රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙලේදී 'Low-Density Urbanism’ යන මැයෙන් රචිත ග්‍රන්ථය සඳහා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන මහතා 2023 වසරේ හොඳම මුල් අධ්‍යයන හා පර්යේෂණ ග්‍රන්ථයට හිමි සම්මානයෙන් පිදුම් ලැබීය.

## 10.7.8. අනාගත අපේක්ෂා

සමාජීය විද්‍යා පීඨය 2025 වර්ෂයේ දී සියලුම මූලික උපාධි වැඩසටහන්වල විෂයමාලා යාවත්කාලීන කිරීමට සැලසුම් කරයි. මීට අමතරව, ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ අධ්‍යයන හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම සඳහා ඇති අවස්ථා පිළිබඳ සොයා බැලීමේ අපේක්ෂාවක් ද ඇත. තවද, තිරසාර සංවර්ධන ඉලක්කවලට (SDGs) අනුකූල වන පර්යේෂණවල නිරත වීමට සහ ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් එළඹෙන 2025 වර්ෂයේ දී ඉහළ බලපෑමක් සහිත ශාස්ත්‍රීය සඟරාවල පළ කිරීමට පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සියලු දෙනා දිරිමත් කළ යුතු වේ.

**මහාචාර්ය එම්.එම්.ගුණතිලක**
**පීඨාධිපති / සමාජීය විද්‍යා පීඨය**

# 10.8. පුස්තකාලය

2024 වර්ෂය කැලණිය විශ්වවිද්‍යාල පුස්තකාලයට ඉතා වැදගත් කාල පරිච්ඡේදයක් වූ අතර, එය වසර පුරා ක්‍රියාත්මකවූ සැලකිය යුතු සිදුවීම් වලින් සනිටුහන් විය. ඉතා ඵලදායී ක්‍රියාකාරකම් මාලාවක් හරහා, පුස්තකාලය විසින් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම්, ඉගෙනීම් සහ පර්යේෂණ ප්‍රයත්නයන්ට සහාය වෙමින්, ශාස්ත්‍රීය ප්‍රජාව වෙත සුවිශේෂී තොරතුරු සේවාවක් සාර්ථකව ලබා දෙන ලදී. මෙම වාර්තාව මගින් වසර පුරා පුස්තකාලයේ ජයග්‍රහණ, ක්‍රියාකාරකම් සහ එහි දායකත්වයන් ඉස්මතු කර දක්වයි.

2024 වර්ෂයේ පුස්තකාලය සඳහා වෙන් කරන ලද වාර්ෂික අයවැය ප්‍රතිපාදනය රු. 6,000,000.00 ක් වූ අතර, එය පොත්පත්, වාර සඟරා සහ දත්ත සමුදායන් මිලදී ගැනීම සඳහා භාවිතා කරන ලදී. පුස්තකාලය විසින් රු. 517,756.01 ක පිරිවැයක් දරමින් මුද්‍රිත පොත් 128 ක් සහ විද්‍යුත් පොත් (ඊ-පොත්) 4 ක් අත්පත් කර ගන්නා ලදී. පුස්තකාලය විසින් EBSCO Host, JSTOR, සහ Research4Life වැනි ප්‍රධාන දත්ත සමුදායන් සඳහා දායකත්වයන් අලුත් කිරීමට රු. 7,833,966.81 ක් වැය කරන ලදී. පොත්පත් සහ වාර සඟරා මිලදී ගැනීම සඳහා අවශ්‍යවූ මුදල, විශ්වවිද්‍යාලය විසින් භාණ්ඩාගාර අරමුදල් භාවිතා කරමින් ප්‍රදානය කරන ලදී. Shibboleth පිවිසුම හරහා පරිශීලකයින්ට දත්ත සමුදායන් වෙත දුරස්ථ ප්‍රවේශය සපයන ලදී.

2024 වර්ෂයේදී, පුස්තකාලයට පරිත්‍යාගශීලීන් 63 දෙනෙකුගෙන්, රු. 355,240.00 ක සම්පූර්ණ වටිනාකමකින් යුත් පොත් 263 ක් පරිත්‍යාග ලෙස ලැබුණි. මෙම පරිත්‍යාග කලා, මානව ශාස්ත්‍ර, විද්‍යා සහ සමාජ විද්‍යා ඇතුළු විවිධ විෂය ක්ෂේත්‍රයන් පුරා විහිදී පැවතුනි.

උපකුලපති සම්මාන (අයදුම්පත් 56), මහාචාර්ය පදවි අයදුම්පත් (අයදුම්පත් 06), සහ සනාතන සභා සම්මාන සඳහා වූ ඉදිරිපත් කිරීම් සමාලෝචනය කිරීමට සහාය වීමෙන්, ශාස්ත්‍රීය ප්‍රකාශනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේදී විෂය සම්බන්ධීකාරක පුස්තකාලයාධිපතිවරුන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළහ. ඔවුන්ගේ විශේෂඥ දැනුම පර්යේෂණ ප්‍රයත්නයන්හි ප්‍රමිතිය පවත්වා ගැනීම සඳහා සැලකිය යුතු ලෙස ඉවහල් විය.

විෂය සම්බන්ධීකරණ පුස්තකාල සේවාව, පරිශීලක ගැටළු වලට පිළිතුරු සැපයීම, පුහුණු සැසි පැවැත්වීම, සහ ලිවීම් සම්බන්ධව සහාය ලබා දීම වැනි විවිධ සේවාවන් රැසක් සපයමින්, පීඨ හයම සමඟ සමීපව කටයුතු කළේය. 2024 වර්ෂයේදී, විෂය සම්බන්ධීකාරක පුස්තකාලයාධිපතිවරුන් විවිධ මාධ්‍ය හරහා විෂය ක්ෂේත්‍ර පදනම් කරගත් පරිශීලක විමසීම් 252 කට ප්‍රතිචාර දැක්වූ අතර ලේඛන සැපයුම් සේවාව හරහා ලිපි සහ පොත් පරිච්ඡේද 92 ක් සැපයූහ. මීට අමතරව, ඔවුහු විශ්වවිද්‍යාල ප්‍රජාවේ ශාස්ත්‍රීය සංවර්ධනයට දායක වෙමින්, පරිශීලක අධ්‍යාපන වැඩසටහන් 55 ක් සහ පොදු වෙබ් සම්මන්ත්‍රණ 02 ක් සංවිධානය කළහ. විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් රචිත පොත් විකිණීම සඳහා ස්ථාපිත කරන ලද පුස්තකාලයේ පොත්හල මගින් 2024 වර්ෂය තුළදී රු. 58,425.00 ක වටිනාකමකින් යුත් පොත් 84 ක් අලෙවි කරන ලදී.

රචනා කුසලතා වැඩි දියුණු කිරීමට සහාය වීම සඳහා, පුස්තකාලය විසින් 2024 වර්ෂයේදී, විශ්වවිද්‍යාල සාමාජිකයින්ගේ විවිධ කාණ්ඩ සඳහා සේවා සපයමින්, පරිශීලකයින් 600 දෙනෙකු සඳහා ඇ.ඩො. 3,600 ක වියදමින් Grammarly යෙදවුමේ වාරික දායකත්වයක් සඳහා ආයෝජනය කරන ලදී. තවද, පුස්තකාලය විසින් අධ්‍යයන අරමුණු සඳහා රචනා සොරකම් හඳුනාගැනීමේ මෙවලමක් වන Turnitin, ඇ.ඩො. 11,001.78 ක වියදමින් පරිශීලකයින් 2,500 කට ප්‍රතිලාභ සලසමින් ලබා ගැනීමට පහසුකම් සලසන ලදී. 2024 වර්ෂයේ පුස්තකාලයේ භාවිතය පිළිබඳ සංඛ්‍යාලේඛන 41 වන වගුවේ සාරාංශගත කර ඇත.

වගුව 41: පුස්තකාලය භාවිත කිරීම පිළිබඳ සංඛ්‍යාලේඛන

| අංශය / සේවය | සංඛ්‍යාලේඛන |
|---|---|
| බැහැරදීමේ සේවාවන් භාවිතා කළ සාමාජිකයින්ගේ පැමිණීම් වාර ගණන | 157,954 |
| ආපසු භාර දෙන ලද ග්‍රන්ථ සංඛ්‍යාව | 42,518 |
| බැහැර දෙන ලද ග්‍රන්ථ සංඛ්‍යාව | 40,701 |
| විමර්ශන සේවාවන් භාවිතා කළ සාමාජිකයන්ගේ වාර ගණන | 303,808 |
| නිත්‍ය විමර්ශන අංශය භාවිතා කළ සාමාජිකයන්ගේ පැමිණීම් වාර සංඛ්‍යාව | 4,855 |
| වාර ප්‍රකාශන අංශය භාවිතා කළ සාමාජිකයන්ගේ පැමිණීම් වාර සංඛ්‍යාව | 4,586 |
| පුස්තකාල තොරතුරු අවකාශය භාවිතා කළ සාමාජිකයන්ගේ පැමිණීම් වාර සංඛ්‍යාව | 147,011 |
| පුස්තකාල කෞතුකාගාරය භාවිත කළ සාමාජිකයන්ගේ පැමිණීම් වාර සංඛ්‍යාව | 364 |
| ශ්‍රී ලංකා එකතුව භාවිත කළ සාමාජිකයන්ගේ පැමිණීම් වාර සංඛ්‍යාව | 10,958 |
| අන්තර්ක්‍රියාකාරී සහ සහයෝගී ඉගෙනුම් ඒකකය භාවිතා කළ සාමාජිකයන්ගේ පැමිණීම් වාර සංඛ්‍යාව | 3,511 |

**තාක්ෂණික දියුණුව**

තාක්ෂණික වැඩිදියුණු කිරීම් 2024 වර්ෂයේදී ප්‍රධාන අවධානයක් යොමු වූ ක්ෂේත්‍රයක් විය. පුස්තකාලය තුළට පරිශීලකයින් ප්‍රවේශ වීම සහ ඉන් පිටවීම් නිරීක්ෂණය කිරීම සඳහා ඇතුල්වීම්/පිටවීම් පද්ධතියක් හඳුන්වා දෙමින්, KOHA පුස්තකාල කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම මගින් පුස්තකාලයේ සේවාවන් පුළුල් කරන ලදී. මෙම පද්ධතිය, පුස්තකාල භාවිත රටාවන් පිළිබඳව මනා අවබෝධයක් ලබා දෙමින්, දෛනික, සතිපතා සහ මාසික පදනමින් පරිශීලක සංඛ්‍යාලේඛන රැස් කිරීමට පහසුකම් සලසන ලදී.

තාක්ෂණික සේවා අංශය තුළ, පුස්තකාලය විසින් අධයයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රකාශන සහ විශ්වවිද්‍යාලය මගින් මුද්‍රණය කරන ලද ප්‍රකාශන සඳහා පොත් 1,334 ක් සකස් කිරීම, ISBN අංක 44 ක් නිකුත් කිරීම සහ ISSN අංක 18 ක් නිකුත් කිරීම සිදු කරන ලදී.

තවද, පුස්තකාලය විසින් උපාධි නිබන්ධන සහ සංග්‍රහ 11 ක් ඇතුළුව පර්යේෂණ නිමැවුම් 1,712 ක් විශ්වවිද්‍යාලයේ ආයතනික සුරක්ෂිතාගාරයට එක් කරන ලදී. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර 82 ක්, මානව ශාස්ත්‍ර පීඨයේ පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර 632 ක්, වෛද්‍ය පීඨයේ පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර 74 ක්, විද්‍යා පීඨයේ පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර 393 ක්, සහ සමාජීය විද්‍යා පීඨයේ පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර 364 ක් 2024 වර්ෂය තුළදී පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර එකතුව වෙත උඩුගත කරන ලදී.

විද්‍යා පීඨයට අනුබද්ධ පශ්චාද් උපාධි පුස්තකාලය, 2024 වර්ෂයේදී KOHA පුස්තකාල කළමනාකරණ පද්ධතිය හරහා සියලුම පුස්තකාල පොත්වල ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කරන ලදී. 2024 වර්ෂයේදී සමස්ත පරිශීලකයින් 7,944 දෙනෙකු පුස්තකාලයට පැමිණ ඇත.

පුස්තකාලය තුළ අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ සැලකිය යුතු ප්‍රයත්නයක් වන්නේ, දෘශ්‍යාබාධිත සිසුන්ට සහාය වීම සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද ශ්‍රව්‍ය පොත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමයි. මෙම අභිලාෂකාමී ව්‍යාපෘතිය තුළින්, ප්‍රධාන පෙළේ ග්‍රන්ථ 80ක් ශ්‍රව්‍ය ආකෘතියට පරිවර්තනය කරන ලද අතර, දෘශ්‍යාබාධිත සිසුන්ගේ ඉගෙනීමේ අවශ්‍යතා සපුරාලීමට ගැලපෙන පරිදි, විෂය-විශේෂිත කියවීම් 50ක එකතුවක්ද පුස්තකාලය විසින් සම්පාදනය කරන ලදී. මෙම සම්පත්, සමාන ප්‍රවේශයකින් සිසුන්ට අත්‍යවශ්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය ලබාදීම සහ උසස් මට්ටමේ අධ්‍යයන සහාය උදෙසා තෝරාගන්නා ලද අතර, අන්තර්කරණය හා සමානාත්මතාවය වර්ධනය කරවීමේ ප්‍රධාන පියවරක් ලෙස මෙය සැලකේ.

පුස්තකාලයේ ජංගම යෙදුම (Mobile App) දියත් කිරීම හරහා සිසුන් සහ කාර්ය මණ්ඩලය යන දෙපාර්ශ්වයටම සඳහා පුස්තකාල සේවාවන්හි ප්‍රවේශ්‍යතාව සහ පහසුව වැඩි දියුණු කිරීමේ සැලකිය යුතු ඉදිරි පියවරක් සනිටුහන් කළේය. 2024 වසර අවසානය වන විට, මෙම යෙදුම පරිශීලකයින් 10,450 කට අධික සංඛ්‍යාවක් ආකර්ෂණය කරගෙන තිබූ අතර, එමගින් එහි පුළුල් පිළිගැනීම සහ ප්‍රයෝජනවත් බව පිළිබිඹු විය. KOHA පද්ධතියට දුරස්ථ ප්‍රවේශය, මාර්ගගත නාමාවලිය, විද්‍යුත් සුරක්ෂිතාගාරය, දායකත්වය දක්වන ලද දත්ත සමුදායන්, මෙන්ම විද්‍යුත් පොත් සහ විද්‍යුත් සඟරා ද ඇතුළුව ඉතා ප්‍රයෝජනවත් අංග කිහිපයක් මෙම යෙදුම මගින් ඒකාබද්ධ කරයි. මීට අමතරව, "පුස්තකාලයාධිපතිගෙන් විමසන්න" ("Ask a Librarian") යන අංගය, උපකාර පහසුවෙන් ලබා ගත හැකි බවට සහතික කරමින්, පුස්තකාල කාර්ය මණ්ඩලය සමඟ සෘජු සන්නිවේදනයට පහසුකම් සලසයි. මෙම යෙදුමේ "දැනුම්දීම්" නැමැති අංගය විශේෂයෙන් ප්‍රයෝජනවත් වන්නේ, එය පුස්තකාල ප්‍රජාව නවතම පුවත්, සිදුවීම් සහ අත්‍යවශ්‍ය නිවේදන සමඟ යාවත්කාලීනව තබමින්, තොරතුරු කේන්ද්‍රස්ථානයක් ලෙස පුස්තකාලයේ කාර්යභාරය තවදුරටත් තහවුරු කරන බැවිනි.

නවතමයෙන් ස්ථාපිත කරන ලද, අන්තර්ක්‍රියාකාරී සහ සහයෝගී ඉගෙනුම් අවකාශය විශේෂයෙන්ම උපාධි අපේක්ෂකයින් සඳහා නිර්මාණය කර ඇත. එය පර්යේෂණ, පුද්ගලික ඉගෙනීම සහ කණ්ඩායම් සහයෝගීතාව ඇතුළු පුළුල් පරාසයක ශාස්ත්‍රීය ක්‍රියාකාරකම් සඳහා සහාය වන උසස් ඩිජිටල් සම්පත් වලින් සමන්විතය. ශිෂ්‍ය ප්‍රජාවගේ ශාස්ත්‍රීය සහ සහයෝගීතා අවශ්‍යතා සපුරාලීමේ එහි ඵලදායීතාවය පෙන්නුම් කරමින් 2024 වර්ෂයේදී මෙම අවකාශය සිසුන් 3,500 කට අධික පිරිසක් විසින් භාවිතා කරන ලදී. ශාස්ත්‍රීය කටයුතුවල නිරත වීම සඳහා සුවපහසු සහ හිතකර පරිසරයක් සපයන, ඒ සෑම එකක්ම සිසුන් 21 දෙනෙකුට දක්වා පහසුකම් සැලසිය හැකි තොරතුරු ඒකක 03 ක් ද මීට ඇතුළත් වේ. මෙම කර්තව්‍යයෙන් පුස්තකාලයේ භෞතික යටිතල පහසුකම් වැඩි දියුණු කළා පමණක් නොව, ශිෂ්‍යයන්ගේ අධ්‍යයන සාර්ථකත්වයට සහ ක්‍රියාකාරී සහභාගීත්වයට ද සැලකිය යුතු ලෙස දායක විය.

**පර්යේෂණ සහ ප්‍රකාශන**

පුස්තකාලය විසින් දෙවන බහුවිෂයික පර්යේෂණ කෘති විමර්ශන සමුළුව (DRC 2024), 2024 ඔක්තෝබර් මස 25 වන දින කැලණිය විශ්වවිද්‍යාලයේ පරිගණක සහ තාක්ෂණ පීඨයේදී පවත්වන ලදී. මෙම සමුළුව, ද්විතීයික දත්ත සහ ද්විතීයික තොරතුරු මූලාශ්‍ර මත පදනම් වූ පර්යේෂණ ප්‍රයත්නයන් වැඩිදියුණු කිරීමේ අරමුණ පෙරදැරිව, පවත්වන ලදී. කෘෂිකර්මය, ශාස්ත්‍ර හා මානව ශාස්ත්‍ර, වාණිජ හා කළමනාකරණ අධ්‍යයනය, විද්‍යාව, තාක්ෂණය, වෛද්‍ය විද්‍යාව සහ සමාජ විද්‍යාවන් දක්වා විහිදෙන පුළුල් විෂය ක්ෂේත්‍ර ගණනාවක් මෙම සමුළුව මඟින් ආවරණය කරන ලදී. ඉංග්‍රීසි සහ සිංහල භාෂා මාධ්‍ය ද්විත්වයෙන්ම පවත්වන ලද සමගාමී තාක්ෂණික සැසි 9කදී ඉදිරිපත් කරන ලද සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා ගණන 97ක් විය. මෙම අවස්ථාවේ එක් සුවිශේෂී අංගයක් වූයේ, කලාප දෙකකින් සමන්විත "The Journal of Desk Research Review and Analysis" (ISSN: 3030-7007, e-ISSN: 3030-7015) නම් ද්විවාර්ෂික සඟරාවේ දෙවන වෙළුම එළිදැක්වීමයි. මෙම සුවිශේෂී අවස්ථාව, පර්යේෂණ මාතෘකාවල විවිධත්වය ප්‍රදර්ශනය කළා පමණක් නොව, පර්යේෂණ කෘති විමර්ශන ක්‍රමවේද සඳහා කැපවූ ශාස්ත්‍රීය වේදිකාවක් ස්ථාපිත කිරීමද සනිටුහන් කළේය. වසර තුළදී පුස්තකාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සඟරා ලිපි 4ක්, පොත් පරිච්ඡේද 2ක් සහ සම්මන්ත්‍රණ පත්‍රිකා 10ක් ප්‍රකාශයට පත් කරන ලදී.

**වෛද්‍ය පුස්තකාලය**

2024 වසරේදී වෛද්‍ය පුස්තකාලයට පැමිණීම් 12,440 ක සැලකිය යුතු සංඛ්‍යාවක් වාර්තා විය. විශ්වවිද්‍යාලයේ පැරණි ප්‍රශ්න පත්‍ර එකතුවට පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර 74ක් එක් කිරීම සහ පර්යේෂණ එකතුවට අධ්‍යයන කාර්ය මණ්ඩල ප්‍රකාශන 140ක් එක් කිරීම ඇතුළුව ප්‍රධාන කටයුතු කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. තවද, වෛද්‍ය පුස්තකාලය විසින් නව ශිෂ්‍ය අධ්‍යයන ප්‍රදේශයක්, පර්යේෂණ මධ්‍යස්ථානයක් සහ ශිෂ්‍ය-හිතකාමී අධ්‍යයන ප්‍රදේශයක් සහිත තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රධාන නවීකරණ ව්‍යාපෘතියක් දියත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය මඟින් නව ශිෂ්‍ය අධ්‍යයන ප්‍රදේශය සහ පර්යේෂණ මධ්‍යස්ථානය සාර්ථකව ස්ථාපිත කරන ලද අතර, ඒවා සිසුන්ට සහ ශාස්ත්‍රීය ප්‍රජාවට වඩා හොඳ සේවයක් සැලසීම සඳහා සිදුකරන ලද වැඩිදියුණු කිරීම් වේ.

2024 අප්‍රේල් මස 01 වන දින, සංවර්ධනය හා සාමය සඳහා වූ ජාත්‍යන්තර ක්‍රීඩා දිනයට සමගාමීව, පීඨයේ පුස්තකාල ශිෂ්‍ය කටයුතු කමිටුව සමඟ සහයෝගයෙන් යුතුව වෛද්‍ය පුස්තකාලය විසින් පුස්තකාල සම්මාන උළෙල පවත්වන ලදී. මෙම උත්සවයේදී 2024 වසරේ හොඳම පුස්තකාල පරිශීලකයා, පියයුරු පිළිකා දැනුවත් කිරීමේ පෝස්ටර් තරඟය සහ මාර්ගගත පුස්තකාල ප්‍රශ්න විචාරාත්මක තරඟය සඳහා සම්මාන ප්‍රදානය කරන ලද අතර, ඊට අමතරව "ක්‍රීඩා සහ ශාරීරික ව්‍යායාම වලදී සිදුවන අනතුරු වළක්වා ගන්නේ කෙසේද" යන්න පිළිබඳ ආරාධිත දේශනයක් පැවැත්වීම සහ වෛද්‍ය පුස්තකාල ප්‍රවෘත්ති ප්‍රකාශනයේ දෙවන වෙළුම එළිදැක්වීම ද සිදු විය.

යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වෛද්‍ය පුස්තකාල සංවර්ධන අරමුදලට රු. 700,000.00 ක පරිත්‍යාග යක් ලැබී ඇත. පුස්තකාල එකතුවෙන් යල් පැන ගිය පෙළපොත් 1,611ක් ඉවත් කිරීමට ද පුස්තකාලයට පුස්තකාල කමිටුවේ අනුමැතිය ලැබී ඇති අතර, සම්පත් අදාළ සහ යාවත්කාලීන ලෙස පවතින බව එමගින් සහතික කෙරේ. පීඨ පුස්තකාල කමිටුව විසින් නිර්දේශ කර, පීඨ තත්ත්ව සහතික කමිටුව සහ පීඨ මණ්ඩලය විසින් අනුමත කරන ලද "සෞඛ්‍ය වෘත්තිකයන් සඳහා පර්යේෂණ මූලික කරුණු පිළිබඳ කෙටි පාඨමාලාවක්" පැවැත්වීමට ද වෛද්‍ය පුස්තකාලය සැලසුම් කර ඇත.

**අනෙකුත් ක්‍රියාකාරකම් සහ ජයග්‍රහණ**

පුස්තකාලයේ ප්‍රයත්නයන් අගයමින්, 2024 උපකුලපති සම්මාන උළෙලේදී පහත සඳහන් සම්මාන කිහිපයකින් පුස්තකාලය පිදුම් ලැබීය. පුස්තකාලය "විශ්වවිද්‍යාලයේ හොඳම වෙබ් අඩවිය" (දෙවන ස්ථානය) සඳහා වන සම්මානය 2024 උපකුලපති සම්මාන උළෙලේදී දිනා ගත් අතර, පුස්තකාලයේ වෙබ් පරිපාලක (Webmaster) ලෙස සහකාර පුස්තකාලයාධිපති කේ. එස්. මුනසිංහ මහතා විසින් එම සම්මානය ලබා ගන්නා ලදී. මීට අමතරව, 2024 උපකුලපති සම්මාන උළෙලේදී පුස්තකාල කාර්ය මණ්ඩලය පහත සඳහන් සම්මාන ලබා ගන්නා ලදී. දීර්ඝ සේවා සම්මාන ප්‍රවර්ගය යටතේ වසර 35ක අඛණ්ඩ සේවය අගයනු වස්, පුස්තකාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර

පුස්තකාලයාධිපතිනි සී. එම්. අබේගුණසේකර මහත්මියට රන් ආලේපිත පදක්කම් සහ සහතික පත්‍ර ප්‍රදානය කරන ලදී. එමෙන්ම වසර 25ක අඛණ්ඩ සේවය සඳහා කාර්ය මණ්ඩල සහායක (පුස්තකාල සේවා) එම්. ඩබ්. ඒ. ඩී. එන්. විජේසූරිය මහතා සහ කාර්ය මණ්ඩල සහායක (පුස්තකාල සේවා) පී. ඩබ්. පී. විතානගේ මහත්මිය විසින් ලෝකඩ ආලේපිත පදක්කම් සහ සහතික පත්‍ර ලබා ගන්නා ලදී. කාර්ය සහායක (පුස්තකාල සේවා) කේ. එස්. ගජසිංහ මහත්මිය, 2024 වර්ෂයේ විධායක නිලධාරීන්, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වන උපකුලපති සම්මාන ප්‍රදානයේදී එම කාණ්ඩය යටතේ රන් පදක්කමක් සහ සහතිකයක් හිමි කර ගත්තාය. ප්‍රධාන පුස්තකාලයේ I වන ශ්‍රේණියේ පුස්තකාල තොරතුරු සහකාර ජී. එල්. එන්. සී. කුමාරසිරි මහතාට සහ III වන ශ්‍රේණියේ පුස්තකාල තොරතුරු සහකාර ඒ. එස්. පී. අහංගම මහතාට, 2024 වර්ෂයේ විධායක නිලධාරීන්, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වන උපකුලපති සම්මාන ප්‍රදානයේදී එම කාණ්ඩය යටතේ සමරු ඵලක සහ සහතික පත්‍ර පිරිනමන ලදී.

පුස්තකාලය, සිය ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස, 2024 නොවැම්බර් 22 වන දින බඩල්ගම, මාකඳුර ප්‍රදේශයේ පිහිටි "වෙල්කම් විලේජ්" වැඩිහිටි නිවාසයේ නේවාසිකයින් 85 දෙනෙකු සඳහා ප්‍රජා සත්කාරක ව්‍යාපෘතියක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහනට පොත් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්, ප්‍රජා පුස්තකාලයක් ස්ථාපිත කිරීම, වෛද්‍ය පීඨයේ කාර්ය මණ්ඩලය සහ සිසුන් සමඟ එක්ව පැවැත්වූ සෞඛ්‍ය කඳවුරක්, ජංගම සැලූනයක්, ශ්‍රමදාන වැඩසටහනක් සහ තෑගි පාර්සල් බෙදා දීම වැනි විවිධ ක්‍රියාකාරකම් ඇතුළත් විය. මීට අමතරව, නේවාසිකයින් සඳහා දානමය පිංකමක් සහ විනෝදාස්වාද වැඩසටහනක් ද මෙම අවස්ථාවට ඇතුළත් විය. මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. 149,188.00 ක් විය.

2024 ජනවාරි සහ මාර්තු අතර කාලය තුළ, පුස්තකාලය විසින් කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශයේ සිසුන් 17 දෙනෙකු සඳහා, ඔවුන්ගේ පුස්තකාල සීමාවාසික පුහුණු වැඩසටහනේ කොටසක් ලෙස දින 22ක පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මීට අමතරව, එම අධ්‍යයන අංශයේම බාහිර උපාධිධාරීන් හය දෙනෙකු ඔවුන්ගේ වෘත්තීය කුසලතා සහ ප්‍රායෝගික අත්දැකීම් තවදුරටත් වැඩි දියුණු කර ගනිමින් පුස්තකාලයේදී මාස හයක පුහුණු වැඩසටහනක් සම්පූර්ණ කළහ.

2024 මාර්තු 20 වන දින, පුස්තකාලය සිය පරිශ්‍රයේදී ප්‍රංශ භාෂා දිනය (ෆ්‍රැන්කොෆෝන් දිනය) සැමරුම් උළෙලක් සංවිධානය කරන ලදී. කොළඹ පිහිටි ප්‍රංශ තානාපති කාර්යාලයේ සහ Alliance Française ආයතනයේ සම්භාවනීය දූත පිරිසක් විශේෂ ආරාධිත අමුත්තන් ලෙස සහභාගී වීමෙන් මෙම අවස්ථාව අලංකාරවත් විය. මෙම සැමරුම් උළෙල සඳහා අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය, උපාධි අපේක්ෂකයින්, පාසල් සිසුන් මෙන්ම ප්‍රංශ භාෂාව සහ සංස්කෘතිය පිළිබඳ උනන්දුවක් දක්වන අනෙකුත් පුද්ගලයින්ගේ උද්යෝගිමත් සහභාගීත්වයක් ලැබුණි.

කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය, විශිෂ්ටත්වය, අන්තර්ගතභාවය සහ නව්‍යකරණ ක්‍රියාකාරකම් සඳහා වූ එහි කැපවීම තුළින්, සිසුන් සහ ආචාර්ය මණ්ඩලය යන දෙපාර්ශවයේම ශාස්ත්‍රීය අත්දැකීම පොහොසත් කරමින්, 2024 වර්ෂයේදී සැබවින්ම නොමැකෙන සටහනක් තබා ඇත.

**ආචාර්ය සී.සී. ජයසුන්දර**

**පුස්තකාලයාධිපති**

# 10.9. දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## 10.9.1. හැඳින්වීම

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය (CDCE) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 932 හි දක්වා ඇති චක්‍රලේඛ විධිවිධාන යටතේ සහ විශ්වවිද්‍යාලයේ නීතිවලට අනුකූලව ක්‍රියාත්මක වේ. ඒ අනුව, එය උපකුලපතිවරයාට සෘජුව වගකිව යුතු අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු ලියාපදිංචි කිරීම් සහ විභාග, ඉගෙනුම් සම්පත් සහ පුහුණුව යන අංශ තුන මෙහෙයවයි. සනාතන සභාවේ සහ විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය සහිතව අධ්‍යයන මණ්ඩල සහ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ (CDCE) කළමනාකරණ කමිටුව විසින් අදාළ වන පරිදි අධ්‍යයන සහ පරිපාලන තීරණ ගනු ලැබේ.

## 10.9.2. මෙහෙවර

අපගේ මෙහෙවර වන්නේ අධ්‍යාපනය ලබන තැනැත්තන් වෙත ජීවිතයේ වටිනාකමට ගරු කරමින් ලොවට සේවය සැලසීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීමට අවස්ථා සලසා දීම මගින් විශිෂ්ටත්වයට පත් වීමයි.

## 10.9.3. දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන්

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වසර 32 කට පෙර ආරම්භ කරන ලද අතර, එහි ආරම්භයේ සිටම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි වැඩසටහන පිරිනමනු ලබයි. එය දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වැඩිම ඉල්ලුමක් ඇති බාහිර උපාධි වැඩසටහන ද වේ. 2021 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ශාස්ත්‍රවේදී බාහිර උපාධි වැඩසටහන සඳහා නව විෂය නිර්දේශයක් හඳුන්වා දී ඇත. මෙම විෂය නිර්දේශය පෙර පැවැති පැරණි විෂය නිර්දේශයට වඩා බෙහෙවින් වැදගත් වේ.

වර්තමානයේ බාහිර උපාධි වැඩසටහන් පීඨ පහක් මගින් පිරිනමනු ලබයි:

1. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ
    - ශාස්ත්‍රවේදී උපාධිය - BA (බාහිර) - අවුරුදු 3 යි
2. විද්‍යා පීඨය
    - විද්‍යාවේදී උපාධිය - BSc. (බාහිර) - අවුරුදු 3 ය
3. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
    - වාණිජවේදී උපාධිය - BCom. (බාහිර) - අවුරුදු 4 යි
    - ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය - BBMgt. (බාහිර) - අවුරුදු 3 යි
4. වෛද්‍ය පීඨය
    - භෞත චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (බාහිර) - අවුරුදු 4 යි
    - වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (බාහිර) - අවුරුදු 3යි

## 10.9.4. නව ලියාපදිංචි කිරීම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුව, 2016 අධ්‍යයන වර්ෂයෙන් පසුව නව ලියාපදිංචි කිරීම් අත්හිටුවන ලද අතර ශාස්ත්‍රපති (බාහිර) උපාධිය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 01/2021 චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් මෙම උපාධි වැඩසටහනේ විෂයමාලාව ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කර ඇත.

2024 වසරේ දී, 2023 අධ්‍යයන වර්ෂය සඳහා වෙනත් උපාධි වැඩසටහන් සමඟ සංශෝධිත ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහනේ හතරවන කණ්ඩායම සඳහා නවක සිසුන් බඳවා ගන්නා ලද අතර මෑතකාලීනව පවත්වන ලද අ.පො.ස. උසස්පෙළ විභාගය සඳහා පෙනී සිටි සිසුන් උසස් පෙළ ප්‍රතිඵල නිකුත් වූ විගස සහ අභ්‍යන්තර ශිෂ්‍ය ලියාපදිංචි කිරීම්වලින් වහාම පසුව ලියාපදිංචි කිරීමට හැකි වීම කැපී පෙනෙන ජයග්‍රහණයක් විය. තවද, 2024

අධ්‍යයන වර්ෂය සඳහා සංශෝධිත ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහනේ පස්වන කණ්ඩායම සහ අනෙකුත් උපාධි වැඩසටහන් සඳහා නව අයදුම්පත් කැඳවන ලදී.

2024 වර්ෂයේ දී, අධ්‍යයන දින දර්ශනය හඳුන්වා දුන් අතර අධ්‍යයන දින දර්ශනයට අනුව පහත පරිදි අධ්‍යයන කටයුතු ආරම්භ විය.

වගුව 42: නව ලියාපදිංචිකිරීම් පිළිබඳ තොරතුරු

| අංකය | උපාධි පාඨමාලාව | ආරම්භක දිනය | පළමු වසර විභාග |
|---|---|---|---|
| 01 | ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය | 01.05.2024 | 2025 අප්‍රේල් |
| 02 | වාණිජවේදී උපාධිය | 01.05.2024 | 2025 අප්‍රේල් |
| 03 | ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය 3 වන වසර (පාර්ශ්වික ප්‍රවේශය) | 01.04.2024 | 2025 මාර්තු (3 වන වසර) |
| 04 | ශාස්ත්‍රවේදී උපාධිය | 01.08.2024 | 2025 ජූලි |
| 05 | විද්‍යාවේදී උපාධිය | 01.08.2024 | 2024 දෙසැම්බර් (1 වන සෙමෙස්තරය) |

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් (අංක 03 අයිතමයේ ඉහත සඳහන් කර ඇති පරිදි), කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කර ඇති ශිෂ්‍යයන්ට පාර්ශ්වික ප්‍රවේශයක් වශයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධි වැඩසටහනේ තුන්වන වසරට සෘජුවම ලියාපදිංචි වීම සඳහා අවස්ථාවක් සලසා ඇත. මෙම සිසුන්ගේ තෙවන වසර අධ්‍යයන කටයුතු ද 2024.04.01 දින ආරම්භ විය.

## 10.9.5. හැඳින්වීමේ වැඩසටහන

2023 අධ්‍යයන වර්ෂය සඳහා අලුතින් ලියාපදිංචි වූ සිසුන්, ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටි, අධ්‍යයන කටයුතු, විභාග සහ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය මඟින් සපයනු ලබන පහසුකම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා වූ ශිෂ්‍ය හැඳින්වීමේ වැඩසටහන් පහත පරිදි පවත්වන ලදී.

1. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය

වගුව 43: 1වන ශිෂ්‍ය හැඳින්වීමේ වැඩසටහන පිළිබඳ විස්තර

| මධ්‍යස්ථානය | ස්ථානය | දිනය | කාලය |
|---|---|---|---|
| කුරුණෑගල | නගර ශාලාව, කුරුණෑගල | 02.10.2024 | පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා |
| කැලණිය | කේ.සී.පී. ශාලාව, කඩවත | 04.10.2024 | පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා |
| ගාල්ල | වැලිගම නගර ශාලාව | 05.10.2024 | පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා |
| මොණරාගල | දිස්ත්‍රික් පුස්තකාල ශ්‍රවණාගාරය, මොණරාගල | 06.10.2024 | පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා |

2. වාණිජවේදී (විශේෂ) බාහිර උපාධිය

3. ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය

4. විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය

වගුව 44: 2වන,3වන,4වන ශිෂ්‍ය හැඳින්වීමේ වැඩසටහන පිළිබඳ විස්තර

| මධ්‍යස්ථානය | ස්ථානය | දිනය | කාලය |
|---|---|---|---|
| කැලණිය | කේ.සී.පී. ශාලාව, කඩවත | 03.10.2024 | පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා |

## 10.9.6. විභාග

2024 වර්ෂයේ දී පහත දක්වා ඇති පරිදි විභාග 17ක් පවත්වන ලද අතර ප්‍රතිඵල නිකුත් කිරීම කඩිනම් කිරීම සඳහා සම්මන්ත්‍රණ ලකුණු දීමේ ක්‍රමය ඇතුළු ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත.

වගුව 45: 2024 වර්ෂයේ දී පවත්වන ලද විභාග පිළිබඳ විස්තර

| අංකය | විභාගයේ නම | මාසය | විෂයයන් |
|---|---|---|---|
| 01 | BCom පළමු වසර - 2022 | මාර්තු | 07 |
| 02 | BCom දෙවන වසර - 2021 | අප්‍රේල් | 06 |
| 03 | BBMgt පළමු වසර - 2022 | අප්‍රේල් | 07 |
| 04 | BBMgt දෙවන වසර - 2021 | අප්‍රේල් | 06 |
| 05 | BBMgt තෙවන වසර - 2021 | අප්‍රේල් | 06 |
| 06 | BCom තෙවන වසර - 2021 | අගෝස්තු | 06 |
| 07 | BCom සිව්වන වසර - 2021 | අගෝස්තු | 06 |
| 08 | BA තෙවන වසර - 2021 (නව) | අගෝස්තු | 34 |
| 09 | BA තෙවන වසර - 2021 (පැරණි) | සැප්තැම්බර් | 35 |
| 10 | BSc තෙවන වසර 1වන සමාසිකය - 2022 | සැප්තැම්බර් | 08 |
| 11 | BA දෙවන වසර - 2021 (පැරණි) | ඔක්තෝම්බර් | 34 |
| 12 | BA පළමු වසර - 2022 (නව) | නොවැම්බර් | 34 |
| 13 | BA පළමු වසර - 2021 (පැරණි) | නොවැම්බර් | 34 |
| 14 | BA දෙවන වසර - 2022 (නව) | දෙසැම්බර් | 34 |
| 15 | BCom දෙවන වසර - 2022 | දෙසැම්බර් | 06 |
| 16 | BBMgt දෙවන වසර - 2022 | දෙසැම්බර් | 06 |
| 17 | BSc පළමු වසර 1වන සමාසිකය - 2023 | දෙසැම්බර් | 07 |
| | **එකතුව** | | **276** |

## 10.9.7. උපාධි ප්‍රදානෝත්සවය

2024 වර්ෂයේදී, දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ උපාධිධාරීහු 5670 දෙනෙක් පහත පරිදි උපාධි ප්‍රදානෝත්සවලට සහභාගී වූහ. අවසාන ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත බොහෝ සිසුන්ට උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි විය හැකි වීම 2024 වසරේ දී ලබා ගත් තවත් සුවිශේෂී ජයග්‍රහණයකි.

වගුව 46: උපාධි ප්‍රදානෝත්සව පිළිබඳ විස්තර

| දිනය | සැසිය | උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව |
|---|---|---|
| 2024 ජනවාරි 4 වෙනිදා | 1 වන සැසිය | 521 |
| | 2 වන සැසිය | 520 |
| | 3 වන සැසිය | 516 |
| 2024 අගෝස්තු 21 වෙනිදා | 2 වන සැසිය | 522 |
| | 3 වන සැසිය | 530 |
| 2024 සැප්තැම්බර් 25 වෙනිදා | 3 වන සැසිය | 520 |
| 2024 දෙසැම්බර් 3 වෙනිදා | 1 වන සැසිය | 500 |
| | 2 වන සැසිය | 500 |
| | 3 වන සැසිය | 500 |
| 2024 දෙසැම්බර් 12 වෙනිදා | 1 වන සැසිය | 526 |
| | 2 වන සැසිය | 515 |
| **එකතුව** | | **5670** |

## 10.9.8. මව්කිරි පෝෂණ කාමරය

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත විභාග සහ වෙනත් අවශ්‍යතා සඳහා පැමිණෙන කිරි දෙන මව්වරුන්ගේ (ශිෂ්‍යයින්ගේ) පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා 2022 වර්ෂයේ දී දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ මව්කිරි පෝෂණ කාමරයක් විවෘත කරන ලද අතර එය 2024 වර්ෂයේදී අමතර පහසුකම් සහිතව තවදුරටත් නවීකරණය කරන ලදී.

## 10.9.9. ඊ-පුස්තකාලය

වත්මන් ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීම සඳහා සිසුන්ට කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින්, දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සඳහා නව විද්‍යුත් පුස්තකාලයක් ඉදිකිරීමට මෙම අධ්‍යාපන කේන්ද්‍රය තීරණය කර ඇත. දිවයිනේ සෑම ප්‍රදේශයකම සිසුන් දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ලියාපදිංචි වී ඇති අතර ඔවුන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා නිරන්තරයෙන් මෙම අධ්‍යාපන කේන්ද්‍රය වෙත යාමට නොහැකි වේ. එසේ වුවද, ඊ-පුස්තකාලය භාවිතා කිරීම මගින් ඔවුන්ට නිර්දේශ කරන ලද කියවීමේ ද්‍රව්‍ය සඳහා අන්තර්ජාලය ඔස්සේ විශ්වසනීයව ප්‍රවේශ වීමට හැකි වේ. 2024 වර්ෂයේ දී දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ විද්‍යුත් පුස්තකාලයේ සිසුන්ගේ විමර්ශන සඳහා විවිධ ග්‍රන්ථ ලබා දී තිබේ.

## 10.9.10. මාර්ගගත ඉගෙනීම

COVID-19 වසංගත තත්ත්වයට විසඳුමක් ලෙස සූම් (Zoom) දේශන සහ සම්මන්ත්‍රණ වීඩියෝ යොදාගනිමින් ඉගැන්වීම් කටයුතු සිදුකිරීම සඳහා යොදාගත් ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය මගින් ඉගැන්වීමේ ක්‍රමවේදය 2024 වර්ෂයේදී දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සැලකිය යුතු ලෙස වැඩි දියුණු කර ඇත. කෙසේ වෙතත්, මෙම ක්‍රමවේදය මගින් මධ්‍යස්ථානය ඉහළම ප්‍රගතියක් ලබා ඇති බැවින්, එය අඛණ්ඩව භාවිතා කිරීමට දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය තීරණය කර ඇත.

## 10.9.11. විද්‍යුත් තැපෑල හරහා ශිෂ්‍ය සහාය සහ තොරතුරු

සිසුන් විසින් විද්‍යුත් තැපෑලෙන් අසනු ලබන ප්‍රශ්නවලට කඩිනමින් ප්‍රතිචාර දැක්වීම මගින් සහ ඔවුන්ට අවශ්‍ය තොරතුරු විද්‍යුත් තැපෑලෙන් ලබා දීම මගින් සිසුන්ගේ කටයුතු සඳහා සහාය ලබා දීමට දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය පියවර ගෙන ඇත.

## 10.9.12. දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීම

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් අඩවිය 2024 වර්ෂයේ දී වඩාත් ආකර්ශණීය සහ පැහැදිලි අන්දමින් ප්‍රතිසංස්කරණය කරන ලදී. නවීකරණය කරන ලද දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් අඩවිය මගින් සිසුන්ට යාවත්කාලීන කරන ලද තොරතුරු වඩාත් පැහැදිලිව ලබා දෙන අතර අවශ්‍ය අවස්ථාවල තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ පහසුකම ද සිසුන්ට ලබා දී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසරේ කැලණිය විශ්වවිද්‍යාලයේ විශිෂ්ටම වෙබ් අඩවිය සඳහා වන උපකුලපති සම්මානය දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් දිනා ගන්නා ලදී.

## 10.9.13. අධ්‍යයන ක්‍රියාකාරීත්වය විධිමත් කිරීම සඳහා වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් සහ විෂය සම්බන්ධීකාරකවරුන් පත් කිරීම

අධ්‍යයන ක්‍රියාකාරිත්වය විධිමත් කිරීම සඳහා එක් එක් උපාධි වැඩසටහන් සඳහා වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් සහ ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහනේ එක් එක් විෂයයන් සඳහා විෂය සම්බන්ධීකාරකවරුන් ද පත් කරන ලදී.

## 10.9.14. රැස්වීම්

2024 වර්ෂයේදී පහත සඳහන් කර ඇති රැස්වීම් පවත්වන ලදී.

1. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සමඟ රැස්වීම් - 12
2. අධ්‍යයන සම්බන්ධීකාරකවරුන් සමඟ රැස්වීම් - 08
3. විෂය සම්බන්ධීකාරකවරුන් සමඟ රැස්වීම් - 02
4. දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලය සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම - 12

## 10.9.15. ගොඩනැගිල්ල සමඟ ඉඩම බදු ගැනීම

විශ්වවිද්‍යාලයට අයත් වාහන සහ අනෙකුත් වාහන නැවැත්වීමේ දී දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයට මුහුණ පෑමට සිදු වූ දිගුකාලීන දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා වාහන නැවැත්වීම සඳහා වෙන් කිරීම පිණිස

ද, විභාග අතරතුර සිසුන්ට හා ඔවුන්ගේ දෙමාපියන්ට රැඳී සිටීමේ පහසුකම් සැපයීම සඳහා ද යාබද ඉඩම ගොඩනැගිල්ලක් සමඟ බදු පදනම මත ලබා ගැනීමට දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය පියවර ගෙන ඇත.

## 10.9.16. පරිගණක විද්‍යාගාරය යාවත්කාලීන කිරීම

ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහනේ ප්‍රතිව්‍යුහගත විෂයමාලාවට අනුව, වෘත්තීය පදනම් කර ගත් ඉංග්‍රීසි භාෂාව (CBEN) වසර තුනේම අනිවාර්ය විෂයයන්ගෙන් එකකි. මෙම විෂයයන්වල ඇගයීම කටයුතු පැවරුම්, ලිඛිත විභාග සහ ප්‍රායෝගික පරීක්ෂණ මගින් සිදු කෙරේ.

2023 වසරේදී දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් මෙම විෂයයේ ප්‍රායෝගික විභාග සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් ඩෙස්ක්ටොප් පරිගණක 100 ක් සහ ලැප්ටොප් පරිගණක 20ක් මිලදී ගෙන දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ පරිගණක විද්‍යාගාරය යාවත්කාලීන කරන ලදී. තවද, ප්‍රායෝගික විභාග ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා අන්තර්ජාල සම්බන්ධතාවේ කලාප ආවරණය වැඩි කිරීමට ද කටයුතු කරයි.

## 10.9.17. විකල්ප සුදුසුකම

ශාස්ත්‍රවේදී (බාහිර) උපාධිය, ව්‍යාපාර කළමනාකරණවේදී (බාහිර) උපාධිය සහ වාණිජවේදී (බාහිර) උපාධිය සඳහා වන විකල්ප සුදුසුකම් පිළිබඳ යෝජනාවක් 2024.08.22 දින පැවති පාලක සභාවේ 387 වැනි රැස්වීමේදී අනුමත කරන ලදී.

## 10.9.18. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ධුරයට නැවත පත් කිරීම

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණිය I, පූජ්‍ය ආචාර්ය දොඩම්කුඹුරේ ධම්මදස්සි හිමියන්, එම විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ධුරයේ දෙවන වාරය සඳහා 2024.08.11 දින සිට වැඩ භාර ගන්නා ලදී.

## 10.9.19. මූල්‍ය කටයුතු

2024 වර්ෂයේ දී දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් එක් එක් උපාධි වැඩසටහන සඳහා වෙනම අයවැයක් සකස් කරන ලදී. එක් එක් උපාධි වැඩසටහනේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වැඩසටහන් අනුව ආදායම් සහ වියදම් ප්‍රකාශන පිළියෙළ කිරීම මගින් දක්වනු ලැබේ. දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මනා විනිවිද පෙනෙන මූල්‍ය කළමනාකරණ යාන්ත්‍රණයක් යටතේ ක්‍රියාත්මක වන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ, මුදල් අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ සහ අනෙකුත් අදාළ රෙගුලාසිවල දක්වා ඇති සියලුම ක්‍රියා පටිපාටිවලට අනුකූලව මෙම කේන්ද්‍රය කටයුතු කරයි. අවශ්‍ය අවස්ථාවලදී, විශ්වවිද්‍යාල මූල්‍ය කමිටුවෙන් සහ පාලක සභාවෙන් අදාළ අනුමැති ලබා ගැනේ.

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ සියලුම මූල්‍ය කාර්යයන් සිදු කරනු ලබන්නේ අභ්‍යන්තරිකව සංවර්ධනය කරන ලද කළමනාකරණ තොරතුරු පද්ධතිය මගිනි. අනන්‍ය ඉලක්කම් 16 ක ගනුදෙනු කේතයක් භාවිතා කරමින් සිසුන්ගෙන් ලබා ගන්නා සියලුම මුදල් බැංකුව හරහා දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ජංගම ගිණුමට ලබා ගන්නා අතර සියලුම ගෙවීම් කළමනාකරණ තොරතුරු පද්ධතිය පද්ධතිය හරහා මාර්ගගතව සකසනු ලැබේ.

ඉහත සඳහන් විභාග පැවැත්වීමෙන් සහ නව ලියාපදිංචි කිරීම්වලින් 2024 වර්ෂයේදී දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය ශ්‍රී ලංකා රුපියල් මිලියන 324 ක ආදායමක් වාර්තා කර ඇති අතර, එම වර්ෂය තුළ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත ගලා ආ මුළු මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රුපියල් මිලියන 364 ක් විය.

**පූජ්‍ය ආචාර්ය දොඩම්කුඹුරේ ධම්මදස්සි හිමි**
**අධ්‍යක්ෂ/ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**




GYMNASIUM

11

# තිරසාර සංවර්ධනය

## 11.1. ප්‍රතිපත්ති ප්‍රකාශනය

- විශ්වවිද්‍යාලය රටේ පවතින අදාළ පාරිසරික නීති සහ රෙගුලාසිවලට අනුකූලව සිය ක්‍රියාකාරකම් සිදු කරයි.

- ධාරිතා ගොඩනැගීම, ව්‍යවස්ථාදායක මෙවලම් සහ වැඩිදියුණු කරන ලද අන්තර් ආයතනික සම්බන්ධීකරණය සහ සම්බන්ධතා තුළින් විශ්වවිද්‍යාලය මනා පරිසර කළමනාකරණයක් සඳහා වූ ආයතනික රාමුව ශක්තිමත් කරනු ලබයි.

- විශ්වවිද්‍යාල පරිසරය සහ ආයතනයේ ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම කළමනාකරණය කරනු ලබන්නේ අඛණ්ඩව යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබන පූර්වයෙන් නිර්වචනය කරන ලද පාරිසරික කළමනාකරණ පද්ධතියක් මගිනි.

- ආයතනයේ ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම අඛණ්ඩව තක්සේරු කර පුළුල් දර්ශක සමූහයක් මත පදනම්ව යෝග්‍ය සහ ආයතනගත කරන ලද අධීක්ෂණ රාමුවක් හරහා වාර්තා කරනු ලබන අතර අවශ්‍ය වැඩිදියුණු කිරීම් ද සිදු කරනු ලැබේ.

- පාරිසරික අරමුණු සහ ඉලක්ක ස්ථාපිත කිරීම සහ සමාලෝචනය කිරීමේ රාමුව විශ්වවිද්‍යාලය විසින් සපයනු ලැබේ.

- විශ්වවිද්‍යාලයේ පාරිසරික ප්‍රතිපත්තිය සඳහා ප්‍රවේශය මහජනතාවට ලබා දී ඇති අතර සෑම පාර්ශ්වකරුවෙකුම ආයතනයේ පාරිසරික ප්‍රතිපත්තිය සහ මෙම ප්‍රතිපත්තිය යටතේ ඔහුගේ/ඇයගේ වගකීම් පැහැදිලිව අවබෝධ කර ගත යුතු අතර සෑම පාර්ශ්වකරුවෙකුම පාරිසරික කළමනාකරණ පද්ධතියේ අන්තර්ගතයට අනුකූලව කටයුතු කළ යුතුය.

- විශ්වවිද්‍යාලයේ යහපත සඳහා පාරිසරික සේවාවල තිරසාර බව සහතික කිරීම සඳහා එවැනි සේවාවල ආර්ථික වටිනාකම පිළි ගනු ලැබේ.

## 11.2. උපාය මාර්ග

- කාර්යක්ෂම භාවිතය, නැවත භාවිතා කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය (3R) ප්‍රවර්ධනය කිරීම මගින් අපද්‍රව්‍ය උත්පාදනය අඩු කිරීම

- කාබනික අපද්‍රව්‍ය සඳහා කොම්පෝස්ට් ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම.

- ලෝහ, වීදුරු, ප්ලාස්ටික්/පොලිතීන් සහ කඩදාසි එකතු කර, ඒවා ලියාපදිංචි ප්‍රතිචක්‍රීකරණය කරන්නන් මගින් නිතිපතා බැහැර කිරීමට යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම.

- අඛණ්ඩව බැහැර කිරීමේ ක්‍රමවේදයක් නිර්මාණය කිරීම මගින් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීමට පහසුකම් සැලසීම.

- වගකිවයුතු ප්‍රතිචක්‍රීකරණය කරන්නන් වෙත යොමු කිරීම.

- රසායනාගාරවලින් ප්‍රමිතිගත රසායනික අපද්‍රව්‍ය එකතු කිරීම සහ ගබඩා කිරීම ස්ථාපනය කර ලියාපදිංචි සමාගම් වෙත ප්‍රවාහනය කිරීම.

- ජෛව අන්තරායකර අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්වයංක්‍රීය ක්ලේවිං ක්‍රමය හඳුන්වා දීම.

- නව ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණය කිරීමේදී තිරසාර ඉදිකිරීම් මූලධර්ම ප්‍රවර්ධනය කිරීම සහ නව ඉදිකිරීම් වලදී හරිත ගොඩනැගිලි මූලධර්ම අනුගමනය කිරීම.

- කාබන් කළමනාකරණ සැලැස්ම ඇතුළු විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් දේශගුණික විපර්යාසවල සෘණාත්මක බලපෑම අඩු කිරීම

- පරිසර හිතකාමී ප්‍රසම්පාදන සැලසුම් හරහා පාරිසරික බලපෑම අවම කිරීම.

- වාතයට විමෝචනය වීම සහ ජලයට මුදා හැරීම කළමනාකරණය කිරීම සහ අඩු කිරීම මගින් දූෂණය වැළැක්වීම.
- වැසි ජලය රැස් කිරීමට හුරුවීම.
- ගෙවතු වගා කටයුතු සඳහා අපජලය රැස් කිරීම, පිරිපහදු කිරීම සහ නැවත භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- බලශක්ති කාර්යක්ෂම භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- ජෛව විවිධත්ව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මගින් වනජීවී වාසස්ථාන නිර්මාණය කිරීම සහ වැඩිදියුණු කිරීම.
- පාරිසරික අධ්‍යාපනය මූලික මෙවලමක් ලෙස යොදා ගනිමින් විශ්වවිද්‍යාල ප්‍රජාව සහ සමාජය අතර පරිසරය කෙරෙහි ගෞරවනීය හැසිරීමක් ප්‍රවර්ධනය කිරීම.

## 11.3. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කවලට අදාළ ක්‍රියාකාරකම් සහ පර්යේෂණ

2024 වර්ෂයේදී, කැලණිය විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය තිරසාරභාවයට අදාළ ක්‍රියාකාරකම් සහ පර්යේෂණ කිහිපයක නියැලී සිට ඇත. වසර පුරාවටම, තිරසර සංවර්ධන ඉලක්ක ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් බලපෑම්කාරී ක්‍රියාකාරකම් සහ පර්යේෂණ වැඩසටහන් මාලාවක් සිදු කරන ලදී. මෙහා සම්බන්ධ ක්‍රියාකාරකම් සහ ප්‍රකාශන පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

### තිරසර සංවර්ධන ඉලක්ක 01: සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම

**ක්‍රියාකාරකම්:**

කැලණිය විශ්වවිද්‍යාලයේ ලියෝ සමාජයේ, Poverty and Hunger Avenue ඒකකය මගින් සංවිධානය කරන ලද 'දිරිසවි 3.0' වැඩසටහන, 2024 අප්‍රේල් මස 22 වන දින බණ්ඩාරවෙල, අත්තලපිටියේදී සාර්ථකව නිම කරන ලද බව සතුටින් දැනුම් දෙන්නෙමු. මෙම කලාපයේ පවතින දිළිඳුකම සහ සාගින්න පිළිබඳ උග්‍ර ගැටලුවලට විසඳුම් සෙවීම මෙම වැඩසටහනේ අරමුණ විය.

**සිදුකරන ලද පර්යේෂණ ගණන: 12**

### තිරසර සංවර්ධන ඉලක්ක 02: කුසගින්න තුරන් කිරීම

**ක්‍රියාකාරකම්:**

කොක්මාදුව සහ තම්මැන්නාව ප්‍රජාවන් වෙත වියළි ආහාර සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සපයමින්, කැලණිය විශ්වවිද්‍යාලය විසින් මන්දපෝෂණය මැඩලීමට සහ සෞඛ්‍යමත් අනාගතයකට සහාය වීමට පරිත්‍යාග වැඩසටහනක් සංවිධානය කරන ලදී. තවද, 'ප්‍රයාම' ව්‍යාපෘතිය මගින් ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කරමින් කැලණිය විශ්වවිද්‍යාලීය ලියෝවාදය විදහා දක්වන ලදී. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ 2024 අගෝස්තු 6 වන දින විවෘත කරන ලද 'හෙළබොජුන්' ආපනශාලාව සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා පෝෂ්‍යදායී සහ දැරිය හැකි මිලකට ආහාර සපයන අතර, එමඟින් සෞඛ්‍යමත් පරිසරයක් ස්ථාපිත කිරීමට විශ්වවිද්‍යාලයේ ඇති කැපවීම තවදුරටත් තහවුරු කරයි.

**සිදුකරන ලද පර්යේෂණ ගණන : 24**

## තිරසර සංවර්ධන ඉලක්ක 03: නිරෝගී බව සහ යහපැවැත්ම

**ක්‍රියාකාරකම්:**

දියවැඩියා අක්ෂි පරීක්ෂාව පිළිබඳ සැසිවාර සහ ලෝක ඒඩ්ස් වින්නත් දිනය, ලෝක අධි රුධිර පීඩන දිනය, සහ ලෝක ඔටිසම් දැනුවත් කිරීමේ දිනය වැනි ප්‍රධාන සෞඛ්‍ය සැමරුම් දින සඳහා වූ බ්ලොග් ලිපි ඇතුළත් සෞඛ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් කැලණිය විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම, 'Luminaria 2'0' සහ 'හසරැල්ල' සමඟින් බලපෑම් සහගත 'Mind U' ව්‍යාපෘතිය මඟින්ද කැලණිය විශ්වවිද්‍යාලීය ලියෝවාදය විදහා දක්වමින් ප්‍රජා සුභසාධනය ප්‍රවර්ධනය කරන ලදී. ඊට අමතරව, ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ සන්නිවේදන හා මහජන සම්බන්ධතා උසස් ඩිප්ලෝමාවේ 5 වන කණ්ඩායම විසින් සංවිධානය කරන ලද 'සුවාත්‍රා' සෞඛ්‍ය සායනය ඔක්තෝබර් 19 වන දින රත්නපුර, එරත්න, ලස්සකන්ද ශ්‍රී සමන්තභද්‍රාරාම විහාරස්ථානයේදී පවත්වන ලදී.

**සිදුකරන ලද පර්යේෂණ ගණන: 191**

## තිරසර සංවර්ධන ඉලක්ක 04: ගුණාත්මක අධ්‍යාපනයක්

**ක්‍රියාකාරකම්:**

රොටරැක්ට් දිස්ත්‍රික් 3220 හි 'TogetherSL' වැඩසටහනේ 'ගජබා' කණ්ඩායම විසින් මෙහෙයවන ලද 'ජනජය විද්‍යාලය මොරටුව' තොරතුරු තාක්ෂණ විද්‍යාගාර ව්‍යාපෘතිය මඟින් සිසුන්ට නවීන ඩිජිටල් ඉගෙනුම් සම්පත් ලබා දෙන ලදී. තවද, කැලණිය විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද 'ප්‍රදීප 2024' පොත් පරිත්‍යාග කිරීමේ වැඩසටහන මඟින් පාසල් දරුවන් සඳහා අධ්‍යාපනික ප්‍රවේශය වැඩි දියුණු කරන ලදී. ඊට අමතරව, විශ්වවිද්‍යාලය විසින් ව්‍යාපාර ගිණුම්කරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව සහ සිංහල ශාස්ත්‍රපති උපාධිය හඳුන්වා දෙනු ලැබූ අතර, එමඟින් සිසුන් සඳහා උසස් අධ්‍යයන අවස්ථා උදාකරන ලදී. පර්යේෂණ පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානය විසින් පවත්වන ලද 'අධ්‍යයන අවංකභාවය සහ කාර්යක්ෂමතාව' සහ 'සමාජ ආචාර විධි තුළින් ඔබගේ වෘත්තීය ජීවිතය නංවන්න' වැනි නිපුණතා වර්ධන වැඩමුළු සිසුන්ට සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයට උපකාරී විය.

**සිදුකරන ලද පර්යේෂණ ගණන: 30**

## තිරසර සංවර්ධන ඉලක්ක 05: ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

**ක්‍රියාකාරකම්:**

දැනුවත් කිරීමේ සැසිවාර, ගෝලීය රොටරැක්ටර්වරුන්ගේ සහභාගීත්වය, සහ 'Femina' සහ 'DefendHer' වැනි බලපෑම් සහගත වැඩසටහන් මඟින්, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය සක්‍රියව ප්‍රවර්ධනය කරන ලදී. ආරාධිත දේශනයක් මඟින් ස්ත්‍රී-පුරුෂ සමාජභාව ගතිකත්වය පිළිබඳ වැදගත් අවබෝධයක් ලබාදෙමින්, අර්ථවත් සාකච්ඡා ඇති කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලය සමඟ ගොඩනගන ලද සහයෝගීතා මඟින්, ආයතනික ක්‍රියාකාරකම් ශක්තිමත් වූ අතර ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය සඳහා වූ කැපවීම් තහවුරු විය. මීට අමතරව, සාක්ෂි මත පදනම් වූ සොයාගැනීම් ජනනය කිරීම සහ ප්‍රගතිශීලී ජාතික ප්‍රතිපත්ති හැඩගැස්වීම අරමුණු කරගෙන, අධිකරණ වෛද්‍ය විද්‍යාව, මහජන සෞඛ්‍යය සහ සමාජ විද්‍යාව යන ක්ෂේත්‍රවල විශේෂඥයින්ගේ සහභාගීත්වයෙන්, ලිංගික සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ දේශව්‍යාප්ත අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. ධාරිතා වර්ධන වැඩමුළු, ආත්මාරක්ෂක පුහුණු සැසි, සහ විශ්වවිද්‍යාලය මූලිකත්වයෙන් පවත්වන ලද උපදේශන වැඩසටහන් මඟින්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් අසමානතාවලට අභියෝග කිරීමට සහ සමාජ වෙනසක් ඇති කිරීමට පුද්ගලයින් තවදුරටත් සවිබල ගැන්විය.

**සිදුකරන ලද පර්යේෂණ ගණන: 16**

## තිරසර සංවර්ධන ඉලක්ක 06: පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව

**ක්‍රියාකාරකම්:**

කැලණිය විශ්වවිද්‍යාලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමඟ සහයෝග යෙන්, තම්මැන්නාව ප්‍රජාව සඳහා ආරක්ෂිත පානීය ජල ප්‍රවේශය තහවුරු කරන ලදී. විශ්වවිද්‍යාල සිසුන් විසින් ලියන ලද ලෝක ජල දිනය පිළිබඳ බ්ලොග් ලිපියක් මඟින් ගෝලීය ජල ගැටලු පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කරන ලදී. විශ්වවිද්‍යාලයේ මූලිකත්වයෙන් ආණමඩුව, කිවුල ප්‍රාථමික විද්‍යාලයේ ජල පිරිපහදු පද්ධතියක් ස්ථාපනය කිරීම, ප්‍රදේශයේ පාසල් ප්‍රජාවේ සෞඛ්‍යය සහ සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමට දායක විය. ජලජ සමාජය විසින් ප්‍රදේශයේ නිවාස සඳහා ජල පෙරණ සවි කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද අතර, එය ආරක්ෂිත ජල ප්‍රවේශය තහවුරු කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ ප්‍රයත්නයට තවදුරටත් සහාය විය. මීට අමතරව, කැලණිය විශ්වවිද්‍යාලීය ලියෝවාදය සංගමය මඟින් ක්‍රියාත්මක කරන ලද 'දිය දහර' ව්‍යාපෘතිය, පිරිසිදු ජලය පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් දැනුවත්භාවය සහ ක්‍රියාකාරීත්වය වැඩි කිරීම අරමුණු කර තිබුණි. විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද තෙවන ජාත්‍යන්තර ගංගා සමුළුව, අනාගත පරපුර සඳහා ජල සම්පත් සංරක්ෂණය කිරීමේ වැදගත්කම අවධාරණය කළේය.

**සිදුකරන ලද පර්යේෂණ ගණන: 44**

---

## තිරසර සංවර්ධන ඉලක්ක 07: දැරිය හැකි පිරිසිදු බලශක්තිය

**ක්‍රියාකාරකම්:**

දේශගුණික ක්‍රියාකාරීත්වය සඳහා සිය නව්‍ය ප්‍රවේශය විදහා දක්වමින් කැලණිය විශ්වවිද්‍යාලයේ 'Reclaim' කණ්ඩායම, 'Climate Tank Accelerator' වැඩසටහනේදී දෙවන ස්ථානය දිනා ගත්තේය. 'ජාත්‍යන්තර බලශක්ති සංරක්ෂණ දිනය' පිළිබඳ බ්ලොග් ලිපියක් මඟින් බලශක්ති සුරැකීමේ පිළිවෙත් වල වැදගත්කම අවධාරණය කළ අතර, 'අඳුරෙන් එළියට' ව්‍යාපෘතිය මඟින් බලශක්ති පිළිබඳ දැනුවත්භාවය සඳහා විශ්වවිද්‍යාලයේ කැපවීම විදහා දැක්විණි. මීට අමතරව, ප්‍රථම වරට නිර්මාණය කරන ලද ශ්‍රී ලාංකික මූලාකෘති සූර්ය පැනල ප්‍රදර්ශනය කරන ලද අතර, එමඟින් ප්‍රජාව සඳහා පිරිසිදු බලශක්ති විසඳුම් ඉදිරිපත් කිරීමේදී විශ්වවිද්‍යාලය දක්වන නායකත්වය අවධාරණය විය.

**සිදුකරන ලද පර්යේෂණ ගණන : 24**

---

## තිරසර සංවර්ධන ඉලක්ක 08: ගෞරවාන්විත රැකියා සහ ආර්ථික වර්ධනය

**ක්‍රියාකාරකම්:**

කැලණිය විශ්වවිද්‍යාලය, සිසුන් සහ උපාධිධාරීන් සවිබලගැන්වීම සඳහා ප්‍රධාන වැඩසටහන් කිහිපයක් ආරම්භ කර ඇත. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය (CGU) විසින් බ්‍රිටිෂ් කවුන්සිලය සමඟ එක්ව සංවිධානය කරන ලද "The Youth-Led Green and Inclusive Businesses Programme" නම් වැඩසටහන, උපාධි අපේක්ෂකයින් අතර තිරසාර ව්‍යාපාරික පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම අරමුණු කර පවත්වන ලදී. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය (CGU) විසින් සංවිධානය කරන ලද පූර්ව-වෘත්තීය ප්‍රදර්ශනය සඳහා වූ වැඩමුළු මාලාව, මාස් හෝල්ඩින් ආයතනය විසින් පැවැත්වූ "සම්මුඛ පරීක්ෂණ සහ ජීව දත්ත පත්‍රිකා ලිවීමේ කුසලතා" පිළිබඳ සැසිවාරයද ඇතුළුව පැවැත්වූ වැඩසටහන්, සිසුන්ට ඔවුන්ගේ වෘත්තීය අපේක්ෂාවන් වැඩි දියුණු කර ගැනීමට උපකාරී විය. මීට අමතරව, "උපාධිධාරී ව්‍යවසායකත්ව ප්‍රදර්ශනය සහ අලෙවිය (GEES) - 2024" සහ "DCF රැකියා ප්‍රදර්ශනය 2024" වැනි වැඩසටහන්, සිසුන්ට ව්‍යවසායකත්වය පිළිබඳ ගවේෂණය කිරීම සඳහා මෙන්ම වෘත්තීය සංවර්ධනය සඳහා ද අවස්ථා සලසා දෙන ලදී.

**සිදුකරන ලද පර්යේෂණ ගණන: 162**

## තිරසර සංවර්ධන ඉලක්ක 09: කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතලපහසුකම්

**ක්‍රියාකාරකම් :**

2024 වසරේදී තාක්ෂණික නවෝත්පාදනය සහ පර්යේෂණ ක්ෂේත්‍රයන්හි සැලකිය යුතු වර්ධනයක් අත්පත් කර ගන්නා ලද අතර ඒ හා සම්බන්ධ ප්‍රධාන වැඩසටහන් කිහිපයක් ද පැවැත්විණි. දෙසැම්බර් මාසයේදී ආචාර්ය පී. වෙන්කට රාම් මහතාගේ මගපෙන්වීම යටතේ පැවති පුස්තකාල වෘත්තිකයන් සඳහා කෘත්‍රිම බුද්ධිය පිළිබඳ ජාතික වැඩමුළුව, පුස්තකාල සේවා සඳහා කෘත්‍රිම බුද්ධි යෙදුම් භාවිතා කළ හැකි ආකාරය කෙරෙහි අවධානය යොමු කරන ලදී. අප්‍රේල් මාසයේදී පැවති ස්මාර්ට් පරිගණකකරණය සහ පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය, කීර්තිමත් විශේෂඥයින්ගේ ප්‍රධාන දේශන ඇතුළත් කිරීමෙන් ගෝලීය පර්යේෂකයන් එකට එක් කළ වේදිකාවක් විය. මැයි මාසයේදී පරිගණක හා තාක්ෂණ පීඨයේ ගොඩනැගිලි සංකීර්ණය විවෘත කරන ලදී. එය යටිතල පහසුකම් සංවර්ධනයේ ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. නොවැම්බර් මාසයේදී පැවති චීන-ශ්‍රී ලංකා ශාස්ත්‍රීය හුවමාරු වැඩමුළුව, ශ්‍රී ලංකාව සහ චීනය අතර භූගෝල විද්‍යාව සහ සමාජ විද්‍යාවන් යන ක්ෂේත්‍රයන්හි සහයෝගීතාව වර්ධනය කිරීමේ අවස්ථාවක් විය.

**සිදුකරන ලද පර්යේෂණ ගණනඃ 51**

---

## තිරසර සංවර්ධන ඉලක්ක 10: අසමානතා අවම කිරීම

**ක්‍රියාකාරකම්:**

2024 වසරේදී, කැලණිය විශ්වවිද්‍යාලය සියල්ලන් ඇතුළත් කර ගැනීම (අන්තර්ගතභාවය) ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රධාන වැඩසටහන් කිහිපයක් හඳුන්වා දෙනලදී. ඒ අතර, ආබාධ සහිත සිසුන් සඳහා වූ ඤහයිධ්ඤ නායකත්ව පාඨමාලාව වැනි වැඩසටහන් වූ අතර, එම ක්‍රියාකාරකම් මාර්තු මාසයේ පැවති උත්සවයකින් නිමාවට පත් විය. විශ්වවිද්‍යාලය ලෝක හින්දි දිනය ද සැමරූ අතර, කලා ප්‍රදර්ශන තුළින් විවිධ හැකියාවන් ඇති ආබාධිත සිසුන්ගේ නිර්මාණශීලීත්වයද ප්‍රදර්ශනය කරන ලදී. මීට අමතරව, ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ දැරියන්ගේ දිනය සහ ජාත්‍යන්තර ආබාධිත පුද්ගලයන්ගේ දිනය පිළිබඳව සිදුකළ දැනුවත් කිරීමේ වැඩසටහන්, අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සවිබල ගැන්වීම අරමුණු කර ගන්නා ලදී.

**සිදුකරන ලද පර්යේෂණ ගණනඃ 02**

---

## තිරසර සංවර්ධන ඉලක්ක 11: තිරසාර නගර සහ ප්‍රජාවන්

**ක්‍රියාකාරකම්:**

කැලණිය විශ්වවිද්‍යාලය, 2024 වසරේදී, වාර්ෂික ඉ-අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ වැඩසටහන, සිය ප්‍රථම තිරසාරභාවය පිළිබඳ වාර්තාව එළිදැක්වීම, සහ QR කේත භාවිතයෙන් විශ්වවිද්‍යාල භූමියේ ශාක විශේෂ නාමාවලිගත කරන (TreeID) ව්‍යාපෘතිය වැනි වැඩසටහන් හරහා තිරසාරභාවය සහ සංස්කෘතික හුවමාරුව සඳහා වූ සිය කැපවීම තවදුරටත් වැඩි දියුණු කළාය. එමෙන්ම, චීන-ශ්‍රී ලංකා අධ්‍යයන හුවමාරු වැඩමුළුව, සමාජ බලපෑම් ඇගයීම (SIA) පිළිබඳ ආරාධිත දේශනයක් පැවැත්වීම, සහ ශ්‍රී ලාංකික මුස්ලිම් සංගීත සම්ප්‍රදායන් ඉස්මතු කරන 'මිනාරට්ස්' (Minarets) වාර්තා චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීම තුළින් ශාස්ත්‍රීය හා සංස්කෘතික සම්බන්ධීකරණය ද වර්ධනය කරන ලදී

**සිදුකරන ලද පර්යේෂණ ගණනඃ 06**

## තිරසර සංවර්ධන ඉලක්ක 12: තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය

**ක්‍රියාකාරකම්:**

2024 වර්ෂයේදී, කැලණිය විශ්වවිද්‍යාලයේ තිරසර විසඳුම් මධ්‍යස්ථානය (CSS) සහ ඉලෙක්ට්‍රොනික නිර්මාණ සහ නවෝත්පාදන මධ්‍යස්ථානය (EDIC) එක්ව, විද්‍යුත් අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය ප්‍රවර්ධනය කරමින්, වාර්ෂික විද්‍යුත් අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහනේ අරමුණ වූයේ, විශ්වවිද්‍යාල ප්‍රජාව තුළ සහ ඉන් ඔබ්බට වගකීම් සහගත විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය දිරිගැන්වීම තුළින් පාරිසරික දූෂණය අවම කිරීමයි. මීට අමතරව, එම විශ්වවිද්‍යාලයේ ලියෝ සමාජය විසින්, විද්‍යුත් අපද්‍රව්‍යවලින් සිදුවන පාරිසරික උවදුරු පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීම සහ ත්‍රිත්ව සෘ මූලධර්ම වන " අඩු කිරීම, නැවත භාවිතය සහ ප්‍රතිචක්‍රීකරණය ඔස්සේ තිරසර අපද්‍රව්‍ය කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, අපද්‍රව්‍ය වලට වටිනාකමක් යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

**සිදුකරන ලද පර්යේෂණ ගණන: 108**

## තිරසර සංවර්ධන ඉලක්ක 13: දේශගුණික ක්‍රියාකාරකම්

**ක්‍රියාකාරකම්:**

පරිසර සංරක්ෂණ හා කළමනාකරණ සංගමය විසින් තිරසර පාරිසරික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රජාව උදෙසා "සුරකිමු සිරි පා" ව්‍යාපෘතිය සංවිධානය කරන ලදී. දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා වන නව්‍ය විසඳුම් වලට සහාය වීම පිණිස කැලණිය විශ්වවිද්‍යාලය, Climate Tank Accelerator සහ Climate Change Accelerator වැඩසටහන් සඳහා සහභාගී විය. තවද, දේශගුණික ක්‍රියාමාර්ග ගැනීමට සිසුන් සවිබල ගැන්වීම අරමුණු කරගත් " දේශගුණික විපර්යාස ක්‍රියාකාරී නායකත්වයන් දිරිගැන්වීම: දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සඳහා තරුණයින් සවිබල ගැන්වීම" ව්‍යාපෘතිය යටතේ විශ්වවිද්‍යාලය විසින් දැනුවත් කිරීමේ වැඩමුළුවක් ද පවත්වන ලදී. මීට අමතරව, කැලණිය විශ්වවිද්‍යාලය දේශගුණික පර්යේෂණ සම්බන්ධයෙන් සහයෝග යෙන් කටයුතු කිරීම සඳහා ජෝර්ජියාවේ භූ-විශ්ලේෂණ පර්යේෂණ මධ්‍යස්ථානය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීය. එමෙන්ම, පාරිසරික හානිය අවම කිරීම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් "මෝටර් රථ කර්මාන්තයේ පාරිසරික බලපෑම" පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් ද පවත්වන ලදී.

**සිදුකරන ලද පර්යේෂණ ගණන: 17**

## තිරසර සංවර්ධන ඉලක්ක 14: සාගරයේ ජීවය

**ක්‍රියාකාරකම්:**

කැලණිය විශ්වවිද්‍යාලයේ ජලජ සමාජය, තිරසර විසඳුම් මධ්‍යස්ථානය සමඟ එක්ව, සාගර දූෂණය අවම කිරීම සහ වෙරළබඩ පරිසරයන් සුරැකීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා වෙරළ පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානය සහ අනෙකුත් පාරිසරික සංවිධාන සමඟ සහයෝගීව ක්‍රියාත්මක කළ මෙම වැඩසටහන මගින්, උස්වැටකෙයියාව වෙරළ තීරය වඩාත් පිරිසිදු තත්ත්වයකට ගෙන ඒම සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූවන් සාර්ථක ලෙස දායක කර ගැනීමට හැකි විය. මීට අමතරව, විශ්වවිද්‍යාලයේ පාරිසරික භාරකාරත්වය සඳහා වන කැපවීම මැනවින් පිළිබිඹු කරමින්, "NaCl+H2O" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් ජලජ පරිසර පද්ධති සංරක්ෂණයේ වැදගත්කම අවධාරණය කෙරිණි. එමෙන්ම, "ස්වභාසමුද්‍ර" සංවිධාන කමිටුව ද, සාගර සංරක්ෂණය වෙනුවෙන් පෙනී සිටීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ අතර, ගෝලීය වශයෙන් වැදගත් සමුද්‍ර අභයභූමියක් වන Papahnaumokukea වැනි අතිශය

වැදගත් සාගර පරිසර පද්ධතිවලට ප්ලාස්ටික් දූෂණයෙන් එල්ල වන තර්ජන පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරන ලදී.

**සිදුකරන ලද පර්යේෂණ ගණන: 16**

## තිරසර සංවර්ධන ඉලක්ක 15: මිහිතලය මත ජීවය

**ක්‍රියාකාරකම් :**

කැලණිය විශ්වවිද්‍යාලය 'Spade to Shade 5.0' වැනි රුක් රෝපණ වැඩසටහන් සහ 'Growing Together' ගෝලීය වැඩසටහන වැනි ක්‍රියාකාරකම් හරහා පාරිසරික තිරසාරභාවය සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයා ඇත. 'ඉකෝඕරා', 'පිබිදුම', සහ 'හරිත පියමං' වැනි ව්‍යාපෘති මගින් ස්වභාවධර්ම සංරක්ෂණය පිළිබඳ විශ්වවිද්‍යාලයේ කැපවීම මැනවින් පිළිබිඹු වේ. මීට අමතරව, ලෝක හස්ති දිනය සහ ලෝක වන දිනය වැනි ප්‍රධාන පාරිසරික දිනයන්හිදී පළකරන බ්ලොග් ලිපි මගින් දැනුවත්භාවය වර්ධනය කරන අතර, ජෛව විවිධත්වයද ප්‍රවර්ධනය කරයි. එමෙන්ම, මෙම සාමූහික ප්‍රයත්නය 'ස්වභාසමුද්‍ර 2.0' ව්‍යාපෘතියේ පළමු අදියරේදී කැපවූ කණ්ඩායම් පහක් විශිෂ්ට කණ්ඩායම් හැඟීමකින් එක්ව කටයුතු කිරීම තුළින් මනාව ප්‍රදර්ශනය වේ.

**සිදුකරන ලද පර්යේෂණ ගණන: 26**

## තිරසර සංවර්ධන ඉලක්ක 16: සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන

**ක්‍රියාකාරකම්:**

කැලණිය විශ්වවිද්‍යාලය, 2024 අන්තර් විශ්වවිද්‍යාල මානව හිමිකම් විවාද තරඟාවලිය වැනි ක්‍රියාකාරකම් තුළින් සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන ප්‍රවර්ධනය කිරීමෙහිලා එහි නායකත්වය පෙන්නුම් කර තිබේ. "සුරක්ෂා" සහ "ඒකාලෝක" වැනි ව්‍යාපෘති, සමාජය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ ඇති කැපවීම මැනවින් ඉස්මතු කරයි. මීට අමතරව, ජාත්‍යන්තර යුක්තිය සඳහා වන ලෝක දිනය, එක්සත් ජාතීන්ගේ සාම සාධක භටයින්ගේ ජාත්‍යන්තර දිනය සහ ලෝක මාධ්‍ය නිදහස් දිනය වැනි අවස්ථාවලදී පළ කරනු ලබන බ්ලොග් ලිපි, මානව හිමිකම් පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම සඳහා දායක වේ. තවද, "වත්මන් තත්ත්වය තුළ පවතින සමාජ ගැටළු සහ අභියෝග" පිළිබඳව පැවැත්වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, දැවෙන සමාජ ගැටළු නිරාකරණය කිරීමෙහිලා විශ්වවිද්‍යාලය ඉටු කරන කාර්යභාරය තවදුරටත් අවධාරණය කරයි.

**සිදුකරන ලද පර්යේෂණ ගණන: 07**


ADMINISTRATION BUILDING

# මූල්‍ය ප්‍රකාශන 2024

## 12.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

වගුව 47: මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2024 (ශ්‍රීලං. රු.) | 2023 (යළි ප්‍රකාශිත) (ශ්‍රීලං. රු.) | 2023 (විගණිත) (ශ්‍රීලං. රු) |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද ආදායම** | | | | |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද ආදායම - ජංගම** | | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 5 | 5,342,998,483 | 4,781,740,843 | 4,781,740,843 |
| ශිෂ්‍යයින් සඳහා ශිෂ්‍යත්ව සහ ප්‍රදාන - මහපොළ | | 327,768,750 | 273,360,500 | 273,360,500 |
| ශිෂ්‍යයින් සඳහා ශිෂ්‍යත්ව සහ ප්‍රදාන - ශිෂ්‍යාධාර | | 105,332,000 | 166,264,000 | 166,264,000 |
| STHRD ව්‍යාපෘති ප්‍රදාන | | 90,675,145 | 33,229,570 | 33,229,570 |
| AHEAD ව්‍යාපෘති ප්‍රදාන | | 941,905 | 753,899 | 753,899 |
| බාහිර පර්යේෂණ ආධාර | | 86,421,162 | 108,103,203 | 108,103,203 |
| උපපාදන අරමුදල්වලින් ලද පරිත්‍යාග | | - | - | 5,829,896 |
| **විනිමය නොවන ගනුදෙනු වලින් මුළු ආදායම - ජංගම** | | **5,954,137,445** | **5,363,452,014** | **5,369,281,910** |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද ආදායම - ප්‍රාග්ධන** | | | | |
| භාණ්ඩාගාර අරමුදල්වලින් ප්‍රාග්ධන ආයෝජනය | | 273,922,949 | 206,471,419 | 206,471,419 |
| අක්මා රෝග සඳහා වන උතුරු කොළඹ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සඳහා ප්‍රාග්ධන ආයෝජනය | | 3,581,407 | 90,753,747 | 60,918,242 |
| අතිරේක බඳවාගැනීම් සඳහා AHEAD ව්‍යාපෘතියෙන් සිදුකරන ලද ප්‍රාග්ධන ආයෝජනය | | - | 82,429,776 | 82,429,776 |
| තොරතුරු තාක්ෂණ යටිතලපහසුකම් සංවර්ධන අරමුදල වෙතින් සිදුකරන ලද ප්‍රාග්ධන ආයෝජනය | | 1,701,600 | 5,174,520.43 | 5,174,520.43 |
| ප්‍රාග්ධන ප්‍රදාන - AHEAD ව්‍යාපෘතිය | | 745,967 | 136,080,281 | 136,080,281 |
| ප්‍රාග්ධන ප්‍රදාන - STHRD ව්‍යාපෘතිය | | 414,481,149 | 2,120,440,538 | 2,120,440,538 |
| පරිත්‍යාග | | 960,813,476 | 1,163,442 | 1,163,442 |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද මුළු ආදායම - ප්‍රාග්ධන** | | **1,655,246,548** | **2,642,513,724** | **2,612,678,219** |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද මුළු ආදායම** | | **7,609,383,993** | **8,005,965,738** | **7,981,960,129** |
| විනිමය ගනුදෙනුවලින් ලද ආදායම | | | | |
| ආයෝජන පොලිය | | 508,041,053 | 761,153,339 | 761,153,339 |
| දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයෙන් ලද ආදායම | | 324,481,289 | 286,832,794 | 286,832,794 |
| ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් / විශේෂ සේවාවලින් ලද ආදායම | | 585,148,281 | 493,574,608 | 493,574,608 |
| අභ්‍යන්තර ආදායම | 6 | 741,920,187 | 821,057,275 | 821,057,275 |
| **විනිමය ගනුදෙනුවලින් මුළු ආදායම** | | **2,159,590,810** | **2,362,618,016** | **2,362,618,016** |
| **මුළු ආදායම** | | **9,768,974,802** | **10,368,583,754** | **10,344,578,145** |

වගුව 47: (සම්බන්ධයි).

| දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2024 (ශ්‍රීලං. රු.) | 2023 (යළි ප්‍රකාශිත) (ශ්‍රීලං. රු.) | 2023 (විගණිත) (ශ්‍රීලං. රු) |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | | | |
| **පුනරාවර්තන ආදායම** | | | | |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද ආදායම - ජංගම** | | 5,954,137,445 | 5,363,452,014 | 5,369,281,910 |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද ආදායම** | | 2,159,590,810 | 2,362,618,016 | 2,362,618,016 |
| **මුළු ආදායම** | | **8,113,728,255** | **7,726,070,030** | **7,731,899,926** |
| **වියදම් - ජංගම (ප්‍රාග්ධන නොවන)** | | | | |
| පුද්ගල පඩිනඩි | 7 | 4,855,266,267 | 4,260,421,693 | 4,260,421,693 |
| ගමන් වියදම් | 8 | 432,919 | 2,395,888 | 2,395,888 |
| සැපයුම් | 9 | 171,734,464 | 204,101,403 | 204,101,403 |
| නඩත්තු වියදම් | 10 | 141,294,225 | 72,520,733 | 72,520,733 |
| කොන්ත්‍රාත් සේවා | 11 | 858,460,480 | 754,992,714 | 754,992,714 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 12 | 137,680,187 | 215,401,054 | 215,401,054 |
| සංවර්ධන අරමුදලින් දරනලද වියදම් | 13 | 346,770,694 | 312,746,755 | 312,746,755 |
| ව්‍යාපෘති වියදම් | 14 | 91,617,050 | 33,983,468 | 33,983,468 |
| දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපනය මධ්‍යස්ථානය සඳහා වියදම් | 15 | 136,864,152 | 195,289,620 | 195,289,620 |
| ගාස්තු අයකරන පාඨමාලා / විශේෂ සේවා සඳහා වියදම් | | 354,210,484 | 243,127,634 | 243,127,634 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | | 302,204,506 | 327,026,673 | 327,026,673 |
| වියදම් - ශිෂ්‍යාධාර | | 105,332,000 | 166,264,000 | 166,264,000 |
| වියදම් - මහපොළ | | 327,768,750 | 273,360,500 | 273,360,500 |
| බාහිර පර්යේෂණ ආධාර | | 86,421,162 | 108,103,203 | 108,103,203 |
| විදේශ විනිමය පරිවර්තනය කිරීමේදී ලද පාඩුව | | 7,712,250 | 3,580,159 | 3,580,159 |
| **මුළු වියදම්** | | **7,923,769,589** | **7,173,315,498** | **7,173,315,498** |
| **කාල සීමාව තුළ ජංගම අතිරික්තය/(හිඟය)** | | **189,958,665** | **552,754,532** | **558,584,428** |
| **විනිමය නොවන ආදායම - ප්‍රාග්ධන ප්‍රදාන** | | **1,655,246,548** | **2,642,513,724** | **2,612,678,219** |
| **වියදම් - ජංගම (ප්‍රාග්ධන)** | | | | |
| ප්‍රාග්ධන ප්‍රදානවලින් දරන ලද පුනරාවර්තන වියදම් | 16 | 55,229,704 | 19,740,843 | 19,740,843 |
| ක්ෂය වීම් | | 1,061,882,593 | 819,714,031 | 827,960,564 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂ කිරීම | | 10,931,919 | 9,574,101 | 1,327,568 |
| **මුළු වියදම් - ජංගම/ (ප්‍රාග්ධන)** | | **1,128,044,216** | **849,028,975** | **849,028,975** |
| **ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීමෙන් පසු කාලසීමාව තුළ අතිරික්තය/(හිඟය)** | | **527,202,331** | **1,793,484,749** | **1,763,649,244** |
| **කාල පරිච්ඡේදය තුළ අතිරික්තය/(හිඟය)** | | **717,160,997** | **2,346,239,282** | **2,322,233,673** |

# 12.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

වගුව 48: මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2024 (ශ්‍රීලං. රු.) | 2023 (යළි ප්‍රකාශිත) (ශ්‍රීලං. රු.) | 2023 (විගණිත) (ශ්‍රීලං. රු) |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල පිරියත සහ උපකරණ | 17 | 20,655,714,688 | 15,513,311,203 | 15,526,169,769 |
| පුස්තකාල පොත් සහ උපාධි කබා | | | | 6,547,941 |
| කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතු | 18 | 668,955,602 | 5,146,670,869 | 5,146,670,869 |
| අස්පෘෂ්‍ය වත්කම් | 19 | 36,833,283 | 19,406,505 | - |
| මූල්‍ය වත්කම් | 20 | 4,774,640,397 | 3,764,140,209 | 3,764,140,210 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **26,136,143,971** | **24,443,528,786** | **24,443,528,788** |
| **ජංගම වත්කම්** | | | | |
| ගබඩා භාණ්ඩ | 21 | 45,668,309 | 52,125,107 | 52,125,107 |
| විවිධ ණය ගැතියන් සහ ලැබිය යුතු | 22 | 267,989,337 | 382,597,397 | 382,597,396 |
| කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් | 23 | 1,349,064 | 826,680 | 826,680 |
| අත්තිකාරම් සහ පෙරගෙවුම් | 24 | 37,634,837 | 44,078,242 | 44,078,242 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 25 | 515,735,342 | 922,727,669 | 922,727,669 |
| **මුළු ජංගම වත්කම්** | | **868,376,889** | **1,402,355,095** | **1,402,355,095** |
| **මුළු වත්කම්** | | **27,004,520,861** | **25,845,883,882** | **25,845,883,883** |
| | | | | |
| **හිමිකම් සහ වගකීම්** | | | | |
| **හිමිකම්** | | | | |
| සමුච්චිත අරමුදල- අතිරික්තය/(හිගය)-ප්‍රාග්ධන | 26 | 10,140,949,835 | 9,613,747,503 | 9,583,912,000 |
| වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | 27 | 62,884,873 | 88,648,322 | 118,483,827 |
| අමාත්‍යමණ්ඩල අනුමැතිය ලත් ගොඩනැගිලි ව්‍යාපෘතිය | 28 | 2,264,066 | 1,665,966 | 1,665,966 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 8,298,179,471 | 8,298,179,471 | 8,298,179,471 |
| රඳවාගත් ඉපැයීම් | | 2,645,226,085 | 2,904,199,772 | 2,904,199,771 |
| **උප එකතුව** | | **21,149,504,331** | **20,906,441,035** | **20,906,441,035** |
| අත්තිකාරම් වශයෙන් ලද ආදායම | 29 | **1,206,806,861** | **1,129,108,545** | **1,129,108,545** |
| **සංචිත සහ සීමිත අරමුදල්** | | | | |
| අභ්‍යන්තර සීමිත අරමුදල් | 30 | 2,087,705,995 | 1,710,386,041 | 1,710,386,041 |
| උපපාදන අරමුදල් | 31 | 45,900,802 | 38,151,004 | 38,151,004 |
| පර්යේෂණ ආධාර | 32 | 191,951,593 | 123,827,638 | 123,827,638 |
| උප එකතුව | | **2,325,558,389** | **1,872,364,683** | **1,872,364,683** |
| ජංගම නොවන වගකීම් | | | | |
| විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | 33 | **1,818,772,941** | **1,507,316,311** | **1,507,316,311** |
| **ජංගම වගකීම්** | | | | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 34 | 110,987,826 | 135,666,147 | 107,003,047 |
| මෙහෙයුම් වියදම් සහ අනෙකුත් ගෙවියයුතු | 35 | 392,890,513 | 294,987,163 | 323,650,262 |
| **උප එකතුව** | | **503,878,338** | **430,653,309** | **430,653,309** |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **27,004,520,861** | **25,845,883,883** | **25,845,883,883** |

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කළ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස්කර ඉදිරිපත් කර ඇත.





යූ.අයි.එම්.අයි.ඩී. තෙන්නකෝන්
ලේඛකාධිකාරී

කේ.කේ.කේ.ධර්මතිලක
මූල්‍යාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පාලක සභාව විසින් වගකීම දරනු ලබයි. පාලක සභාව වෙනුවෙන් සහ සඳහා අත්සන් කරනු ලැබුවේ



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය  නිලන්ති ද සිල්වා
උපකුලපති





ජ්‍යෙෂ්ඨ මහාචාර්ය  එස්.ආර්.ඩී.කාලිංගමුදලි
පාලක සභා සාමාජික

මහාචාර්ය ඩබ්.එම්.සී.බී. වන්නිනායක
පාලක සභා සාමාජික

කැලණිය විශ්වවිද්‍යාලය
2025.07.01

# 12.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

වගුව 49: මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | 2024 (ශ්‍රී ලංකා රු.) | 2023 (ශ්‍රී ලංකා රු.) |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහ** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්තය/ (හිගය) | 189,958,665 | 552,754,532 |
| **ගැලපුම්** | | |
| දේපල පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභය | | (227,185) |
| චලනය නොවන, සෙමින් චලනය වන සහ යල් පැන ගිය තොග සඳහා ප්‍රතිපාදන | 2,924,420 | 348,060 |
| ආයෝජනවලින් ලද පොලී | (508,041,053) | (761,153,339) |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 302,204,506 | 327,026,673 |
| රජයේ ප්‍රදානය - පුනරුත්ථාපන සහ නඩත්තු | (55,228,483) | (19,740,843) |
| විශ්වවිද්‍යාල අරමුදල්/මූල්‍ය නොවන ගැලපුම් සඳහා දායක වූ ආදායම | (1,346,913,717) | (1,047,116,662) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(1,415,095,661)** | **(948,108,764)** |
| ගබඩා භාණ්ඩ (වැඩිවීම)/අඩුවීම | 3,532,378 | 535,925 |
| විවිධ ණය ගැතියන් සහ ලැබිය යුතු (වැඩිවීම)/අඩුවීම | 47,667,804 | (421,422) |
| කාර්ය මණ්ඩල අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | (522,384) | 562,950 |
| අත්තිකාරම් සහ පෙර ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | 6,443,405 | 64,901,885 |
| මෙහෙයුම් වියදම්සහ අනෙකුත් ගෙවියයුතු මුදල් වැඩිවීම/(අඩුවීම) | 97,903,350 | 115,588,367 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු වැඩි වීම/ (අඩු වීම) | (24,678,321) | 6,272,833 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමෙන් පසු මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ ජනිත මුදල් ප්‍රවාහය** | **(1,284,749,430)** | **(760,668,226)** |
| පාරිතෝෂිත ගෙවීම් | (139,286,177) | (75,033,026) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(1,424,035,607)** | **(835,701,252)** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහ** | | |
| දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | (174,661,660) | (510,570,691) |
| දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ආදායම | - | 916,500 |
| ආයෝජනවලින් ලද පොලී | 574,981,310 | 771,624,917 |
| ප්‍රදානය කරන ලද ණය මුදල් | 13,219,109 | (6,094,592) |
| කෙරීගෙනයන ප්‍රාග්ධන කටයුතු | (197,203,620) | (171,344,383) |
| ආයෝජන | (1,023,719,297) | (206,761,379) |
| සීමිත අරමුදල් සහ ප්‍රදාන | 1,051,895,686 | 10,250,212 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | **244,511,528** | **(111,979,417)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහ** | | |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන | 303,071,000 | 413,647,687 |
| බාහිර අරමුදල් භාවිතා කිරීම | 469,460,752 | 773,092,422 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | **772,531,752** | **1,186,740,109** |
| මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/ (අඩු වීම) | (406,992,327) | 239,059,440 |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | 922,727,669 | 683,668,229 |
| **වසර අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ** | **515,735,342** | **922,727,668** |

# 12.4. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

වගුව 50: හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | සමුච්චිත අතිරික්තය/(හිඟය) ජංගම | කැබිනට් අනුමැතිය ලද ගොඩනැගිලි ව්‍යාපෘති | ප්‍රත්‍යාගණන අතිරික්තය | රඳවාගත් ඉපැයුම් | සංචිත සහ සීමිත අරමුදල් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **2022 ජනවාරි 01 දිනට ශේෂය** | **101,342,610** | **7,820,262,755** | **1,227,570** | **8,298,179,471** | **2,731,495,331** | **2,699,706,341** | **21,652,214,078** |
| පෙර වර්ෂයේ ගැළපුම් | - | - | - | - | (6,745,572) | - | **(6,745,572)** |
| වර්ෂය තුළ අතිරික්තය/ (හිගය) | - | - | - | - | 2,346,239,282 | - | **2,346,239,282** |
| මාරු කිරීම් / ශුද්ධ සංචලන | 17,141,217 | - | 438,396 | - | (102,500,000) | (93,297,929) | **(178,218,316)** |
| MBBS ප්‍රදාන වෙත අරමුදල් මාරු කිරීම | - | - | - | - | (63,954,994) | 63,954,994 | **-** |
| ගාස්තු අයකිරීමේ පාඨමාලාවලින් අරමුදල් මාරු කිරීම | - | - | - | - | (318,998,674) | 318,998,674 | **-** |
| පුස්තකාල අරමුදල් වෙත අරමුදල් මාරු කිරීම | - | - | - | - | (6,281,251) | 6,281,251 | **-** |
| උපපාදන අරමුදල් වෙත අරමුදල් මාරු කිරීම | - | - | - | - | - | - | **-** |
| PV-DBO හි තත්‍ය (ලාභ)/අලාභය | - | - | - | - | 118,430,400 | - | **118,430,400** |
| ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11- අනුව වර්ගීකරණය- සමුච්චිත අරමුදල්-ප්‍රාග්ධන | - | 1,793,484,749 | - | - | (1,793,484,749) | - | **-** |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **118,483,827** | **9,613,747,504** | **1,665,966** | **8,298,179,471** | **2,904,199,772** | **2,995,643,331** | **23,931,919,872** |
| | | | | | | | |
| **2024 ජනවාරි 01 දිනට ශේෂය** | **118,483,827** | **9,583,912,000** | **1,665,966** | **8,298,179,471** | **2,904,199,770** | **3,001,473,227** | **23,907,914,263** |
| පූර්ව වර්ෂ ගැලපීම් | (29,835,504) | 29,835,504 | - | - | 76,962,552 | - | **76,962,552** |
| **2024 ජනවාරි 01 දිනට යළි ප්‍රකාශිත ශේෂය** | **88,648,323** | **9,613,747,504** | **1,665,966** | **8,298,179,471** | **2,981,162,322** | **3,001,473,227** | **23,984,876,813** |
| වර්ෂය තුළ අතිරික්තය/ (හිගය) | - | - | - | - | 717,160,997 | - | **717,160,997** |
| මාරු කිරීම් / ශුද්ධ සංචලනයන් | (25,763,450) | - | 598,101 | - | (60,246,438) | 213,781,861 | **128,370,074** |
| MBBS ප්‍රදාන වෙත අරමුදල් මාරු කිරීම | - | - | - | - | (78,869,363) | 78,869,363 | **-** |
| ගාස්තු අයකිරීමේ පාඨමාලාවලින් අරමුදල් මාරු කිරීම | - | - | - | - | (230,937,796) | 230,937,796 | **-** |
| පුස්තකාල අරමුදල් වෙත අරමුදල් මාරු කිරීම | - | - | - | - | (7,303,003) | 7,303,003 | **-** |
| උපපාදන අරමුදල් වෙත අරමුදල් මාරු කිරීම | - | - | - | - | - | - | **-** |
| PV-DBO හි තත්‍ය (ලාභ)/අලාභය | - | - | - | - | (148,538,302) | - | **(148,538,302.00)** |
| ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11- අනුව වර්ගීකරණය- සමුච්චිත අරමුදල්-ප්‍රාග්ධන | - | 527,202,331 | - | - | (527,202,331) | - | **-** |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **62,884,873** | **10,140,949,835** | **2,264,067** | **8,298,179,471** | **2,645,226,085** | **3,532,365,250** | **24,681,869,582** |

# 12.5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් සහ වෙනත් පැහැදිලි කිරීමේ සටහන්වලින් සමන්විත 2024 වර්ෂයේ සටහන්

## 12.5.1. ආයතනික තොරතුරු

**අ. වාර්තාකරණ අස්ථිත්වය**

කැලණිය, දළුගම පිහිටි කැලණිය විශ්වවිද්‍යාලය, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ ඊට පසුකාලීනව සිදුකරන ලද සංශෝධන යටතේ පිහිටුවන ලද පූර්ණවශයෙන් රජය සතු උසස් අධ්‍යාපන ආයතනයකි. මෙම විශ්වවිද්‍යාලය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

**ආ. විශ්වවිද්‍යාලයේ මෙහෙයුම්වල ස්වභාවය සහ ප්‍රධාන ක්‍රියාකාරකම්**

මෙම විශ්වවිද්‍යාලය වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය, මානව ශාස්ත්‍ර පීඨය, සමාජ විද්‍යා පීඨය, විද්‍යා පීඨය, වෛද්‍ය පීඨය, පරිගණක හා තාක්ෂණ පීඨය සහ උපාධි අධ්‍යයන පීඨය යනුවෙන් වන පීඨ හතකින් සමන්විත වේ.

“තිරසාර සංවර්ධනය උදෙසා දැනුම බිහි කිරීමේ සහ ව්‍යාප්ත කිරීමේ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම” විශ්වවිද්‍යාලයේ දැක්ම වන අතර “නිර්මාණශීලීත්වය සහ නවෝත්පාදනය තුළින් ජාතික සංවර්ධනයට දායක වන බුද්ධිමත් පුරවැසියන් බිහිකිරීම” විශ්වවිද්‍යාලයේ මෙහෙවර වේ.

විශ්ව විද්‍යාලයේ මූලික ක්‍රියාකාරකම් අතරට ඉගැන්වීම, ඉගෙනීම සහ පර්යේෂණ ඇතුළත් වේ. එහි උපායමාර්ගික අරමුණු වන්නේ:

- උසස් ගුණාත්මක හා නම්‍යශීලී ශික්ෂණ හා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම.
- විශ්වවිද්‍යාලයේ උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස උසස් ගුණාත්මක පීඨ සහ කාර්ය මණ්ඩලයක් ගොඩනැගීම.
- ගෝලීය ප්‍රමිතියෙන් යුතු බහුවිෂයික පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීම.
- ආර්ථික හා සමාජීය සබඳතාහි නිරතවීමේ පරාසය පුළුල් කරමින් විශ්වවිද්‍යාලයේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම.
- කාර්යක්ෂම හා ඵලදායී පරිපාලනය සහ මූල්‍ය කළමනාකරණය තුළින් විශිෂ්ට පාලන ක්‍රමයක් ගොඩනැගීම.

**ඇ. මූල්‍ය ප්‍රකාශන සඳහා බලය දුන් දිනය**

2025 පෙබරවාරි 28 වැනි දින පැවති පාලක සභා රැස්වීමේදී විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන ලදී.

**ඈ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඒවා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම විශ්වවිද්‍යාල කළමනාකාරීත්වයේ වගකීම වේ. වංචා හෝ දෝෂ හේතුවෙන් සිදුවිය හැකි සැලකිය යුතු සාවද්‍ය ප්‍රකාශන වැළැක්වීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාත්මක වන බවට කළමනාකාරීත්වය සහතික කරයි. මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් සංරචක වලින් සමන්විත වේ.

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- මූල්‍ය කාර්ය සාදනය පිළිබඳ ප්‍රකාශනය
- ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- අයවැය සහ තත්වය අගයන් සැසඳීමේ ප්‍රකාශනය
- වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරීමේ සටහන්වලින් සමන්විත සටහන්.

**ඉ. වාර්තාකරණ කාල පරිච්චේදය**

විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාල පරිච්ඡේදය 2024 ජනවාරි 01වැනි දින සිට 2024 දෙසැම්බර් 31 වැනි දින දක්වා වූ මාස දොළහක කාලයක් ආවරණය කරයි.

## 12.5.2. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

**අ. අනුකූලතා ප්‍රකාශය**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එහි මූල්‍ය චක්‍රලේඛ අංක 2/2018 මගින් සම්මත කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං. රා.ගි.ප්‍ර.) I, II සහ III වෙළුම් අනුව සකස් කර ඇත. අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර මූල්‍ය වර්ෂයේ භාවිතා කළ ප්‍රතිපත්තිවලට අනුකූල වේ. කෙසේ වෙතත්, රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් නිශ්චිත උපදෙස් ලබා දී නොමැති ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වන කල්හි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං. ගි.ප්‍ර.) භාවිතා කර ඇත.

**ආ. මිණුම්කරණ පදනම**

සාධාරණ වටිනාකමට මනිනු ලබන දේපල, පිරියත සහ උපකරණ සහ ආයුගණක තක්සේරු ක්‍රමය මත පදනම්ව මනිනු ලබන විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් හැර මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමක් මත සකස් කර ඇත. මෙම මිණුම්කරණවලට අදාළ විශේෂිත ප්‍රතිපත්ති ඉදිරි වර්ෂයේ දී පැහැදිලි කරනු ලැබේ.

**ඇ. අඛණ්ඩ පැවැත්ම**

විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මක් සහිතවේ යැයි යන උපකල්පන මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. අපේක්ෂිත අනාගත කාලයක් සඳහා විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පවතින බවට පාලක සභාව තක්සේරු කර ඇත. තවද, විශ්වවිද්‍යාලයට අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති විය හැකි තරමේ අවිනිශ්චිතතාවයන් පවතින්නේ යැයි පාලක සභාවේ අදහස් නොකරයි. විශ්වවිද්‍යාලයේ මෙහෙයුම්ඈවර කිරීමට හෝ නතර කිරීමට සැලසුමක් නොමැත.

**ඈ. ගිණුම්කරණයේ උපචිත පදනම**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය හැර මෙම මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම අනුගමනය කරමින් පිළියෙල කර ඇත.

**ඉ. කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල්**

විශ්වවිද්‍යාලය විසින් භාවිතා කරනු ලබන සහ ගනුදෙනු ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

**ඊ. වැදගත්භාවය සහ සමූහනය**

සමාන අයිතමවල සෑම වැදගත් පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වයක් ඇති අයිතම වැදගත් වන්නේ නම් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇති අතර එසේ නොවන්නේ නම් එක්කොට දක්වා ඇත.

**උ. සංසන්ධනාත්මක තොරතුරු**

ප්‍රමාණාත්මක, ආඛ්‍යානාත්මක, සහ විස්තරාත්මක දත්ත ඇතුළුව සංසන්දනාත්මක මූල්‍ය තොරතුරු අදාළ අවස්ථාවලදී අනාවරණය කෙරේ. අවශ්‍ය විටදී, සැසඳීම සඳහා පෙර වසරේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය ගළපා ඇත.

**ඌ. හිලව් කිරීම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලින් නියම කරනු ලැබ හෝ අවසර දී ඇත්නම් මිස වත්කම් සහ වගකීම් හෝ ආදායම් සහ වියදම් එකිනෙක හිලව් කර නොමැත.

**එ. විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු**

විදේශ මුදල් ඒකකවලින් සිදුකරන ගනුදෙනු, ගනුදෙනුව සිදු වූ දිනට පැවති විනිමය අනුපාතය භාවිතා කරමින්, ක්‍රියාකාරී මුදල් ඒකකය (ශ්‍රී.ලං.රු.) වෙතට පරිවර්තනය කරනු ලැබේ. ගනුදෙනු පියවීම හේතුවෙන් හෝ වර්ෂ අවසානයේදී මුදල්මය අයිතම නැවත මැනීම හේතුවෙන් පැන නගින යම් විදේශ විනිමය ලාභයක් හෝ අලාභයක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

## 12.5.3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

**අ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කිරීම**

2024 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී විශ්වවිද්‍යාලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර ඇත.

**ආ. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්**

වාර්තාකරණ කාලපරිච්ඡේදය තුළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සැලකිය යුතු තරමේ වෙනස්කම් සිදු නොවූ අතර පහත සඳහන් අවස්ථාවන්හිදී හැර පෙර වසරවල අනුගමනය කරන ලද ප්‍රතිපත්ති තවදුරටත් භාවිතා කර ඇත.

වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ, ඇතැම් දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේ වාර ගණනෙහි වෙනසක් සිදු කරන ලදී. මීට පෙර, මෙම වත්කම් සෑම වසර පහකට වරක් ප්‍රත්‍යාගණනය කරන ලදී. කෙසේ වෙතත්, එම ප්‍රත්‍යාගණනය වාර ගණන මේ වන විට සෑම වසර හතකට වරක් දක්වා දීර්ඝ කර ඇත.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, සාධාරණ අගය විශ්වාසනීයව මැනිය හැකි පහත සඳහන් දේපළ, පිරියත සහ උපකරණ වර්ග (ඉඩම්,ගොඩනැගිලි, උපාධි කබා, සහ මෝටර් රථ) ප්‍රත්‍යාගණනය කළ අගයන්ගෙන් වාර්තා කර ඇත. මෙම අගයන්, ප්‍රත්‍යාගණනය කරන දිනයේදී පවතින සාධාරණ අගයෙන්, පසුව එළඹෙන ඕනෑම උපචිත ක්ෂයවීමක් සහ පසුව එළඹෙන උපචිත හානිකරණ අලාභ අඩු කළ පසු අගය වේ. මෙම වෙනස විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමනාකරණ භාවිතාවන්ට අනුකූල වන අතර අගය කිරීමේ අවශ්‍යතා සමග අනුකූලතාවයද සහතික කරයි.

**ඇ. වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන**

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් මූල්‍ය වර්ෂය අවසානයේ දී ආදායම, වියදම්, වත්කම්, වගකීම්, සහ අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම අවශ්‍ය වේ. මෙම ඇස්තමේන්තු වරින් වර සමාලෝචනය කර අවශ්‍ය පරිදි ගලපනු ලැබේ.

**ඈ. වත්කම් සහ එම වත්කම් තක්සේරු කිරීමේ පදනම**

**i. දේපල, පිරියත සහ උපකරණ**

විශ්වවිද්‍යාලය, සිය ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් නිසි ලෙස හඳුනාගැනීම, මැනීම සහ වාර්තාකරණය සහතික කරමින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය 07 (ශ්‍රීලංරාඅගිප්‍ර 07) - දේපළ, පිරියත සහ උපකරණවලට

අනුකූලව එහි දේපළ, පිරියත සහ උපකරණ (PPE) ගිණුම්ගත කරනු ලබයි. දේපළ, පිරියත සහ උපකරණවලට ඉඩම්, ගොඩනැගිලි සහ වැඩිදියුණු කිරීම්, සහ යටිතල පහසුකම් ඇතුළත් වේ. ජල සහ විදුලි සැපයුම් යටිතල පහසුකම් සහ ජලාපවහන සහ අපද්‍රව්‍ය පද්ධති වැනි අත්‍යවශ්‍ය පහසුකම් ද යටිතල පහසුකම් යටතේ ආවරණය වේ. පරිගණක උපකරණ/උපාංග ප්‍රවර්ගයට, අධ්‍යයන සහ පරිපාලන කාර්යයන් සඳහා අත්‍යවශ්‍ය වන තොරතුරු තාක්ෂණයට අදාළ වත්කම් ඇතුළත් වේ. විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ ඇතුළුව, ගෘහ භාණ්ඩ, සවිකෘත, යන්ත්‍ර සූත්‍ර, සහ උපකරණ, අධ්‍යාපනයට සහ පර්යේෂණ සඳහා සහාය වීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මෝටර් රථ ප්‍රවර්ගය ප්‍රවාහන අවශ්‍යතා සපුරාලන අතර, උපාධි කබා, පුස්තකාල පොත් සහ වාර සඟරා වැනි පුස්තකාල සහ අධ්‍යාපනික ද්‍රව්‍ය ශාස්ත්‍රීය දැනුම ව්‍යාප්තිය සඳහා දායක වේ. මාර්ගගත වාර සඟරා සහ ශාස්ත්‍රීය මෘදුකාංග ඇතුළුව, අස්පෘශ්‍ය වත්කම්, ඩිජිටල් ඉගෙනුමට සහ පර්යේෂණවලට අදාළව ඒවායේ දායකත්වය සඳහා හඳුනා ගැනේ. අවසාන වශයෙන්, ක්‍රීඩා උපකරණ සහ වෙනත් වත්කම් ආවරණය වන විවිධ වත්කම්, විවිධ මෙහෙයුම් සහ ශාස්ත්‍රීය ක්‍රියාකාරකම් සඳහා සහාය වේ. මෙම වර්ගීකරණ රාමුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූල වන අතර, වත්කම් කළමනාකරණයේදී විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කරයි.

### ii. මූල්‍ය නොවන වත්කම් සඳහා හඳුනාගැනීම, මිනුම්කිරීම, සහ වාර්තාකරණ සීමා

දේපළ, පිරියත සහ උපකරණ (PPE), ඒවායේ අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්ව විද්‍යාලය වෙත ගලා ඒමට බොහෝ දුරට ඉඩ ඇති විට සහ වත්කමේ පිරිවැය විශ්වසනීයව මැනිය හැකි විට හඳුනාගනු ලැබේ. මූලික හඳුනාගැනීම පිරිවැය මත සිදු කෙරෙන අතර, එයට මිලදී ගැනීමේ පිරිවැය සහ වත්කම එහි අපේක්ෂිත භාවිතයට ගෙන ඒම සඳහා දරන ලද සෘජුවම ආරෝපණය කළ හැකි ඕනෑම පිරිවැයක් ඇතුළත් වේ. මූලික හඳුනාගැනීමෙන් පසුව, දේපළ, පිරියත සහ උපකරණ, සමුච්චිත ක්ෂයවීම් සහ හානිකරණ පාඩු අඩු කර පිරිවැයට මනිනු ලැබේ.

වත්කම් කළමනාකරණයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා, රු. 15,000 ක වාර්තාකරණ සීමාවක් හඳුන්වා දී ඇත. මෙම සීමාවට වඩා අඩු වටිනාකමක් ඇති වත්කම්, දේපළ, පිරියත සහ උපකරණ ලෙස වර්ගීකරණය නොකෙරේ. කෙසේ වෙතත්, පුස්තකාල පොත්, වාර සඟරා, සහ ගෘහ භාණ්ඩ වටිනාකම නොසලකා සටහන් කරනු ලැබේ.

### iii. පසුකාලීන පිරිවැය

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක අංගයක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එකී කොටසේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන්නේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් අයිතමයේ ධාරණ අගයට හඳුනාගනු ලැබේ. විශ්වවිද්‍යාලයේ හඳුනා ගැනීම ඉවත්කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව ප්‍රතිස්ථාපිත කොටසෙහි ධාරණ අගය හඳුනා ගැනීම ඉවත්කෙරේ.

දේපල, පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම සඳහා අදාළ වන පිරිවැය දැරූ පරිදි මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනගනු ලැබේ.

### iv. හඳුනා ගැනීම ඉවත්කිරීම

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක ධාරණ අගය එම අයිතමය බැහැර කිරීමේදී හෝ එය භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හෝ හඳුනා ගැනීමෙන් ඉවත් කෙරේ. හඳුනා ගැනීම ඉවත් කිරීම හේතුවෙන් ඇතිවන කිසියම් ලාභයක් සහ අලාභයක් ශුද්ධ අපහරණ ආදායම සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනා ගැනේ. කෙසේවෙතත් හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම මත ඇතිවන ලාභ ආදායම් ලෙස වර්ගගීකරණය නොකරයි.

### V. ක්ෂයවීම්

සින්නක්කර ඉඩම් හැර අනෙකුත් දේපල, පිරියත සහ උපකරණ අයිතමවල එක් එක් අංගය මත සරළ මාර්ග පදනමක් අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ක්ෂයවීම් හඳුනා ගනු ලැබේ. කිසියම් වත්කමක් භාවිතයට සඳහා තබා ඇති අවස්ථාවේ සිට එහි ක්ෂය වීම ආරම්භ වන අතර වත්කම විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කළ දිනය සහ වත්කම හඳුනා ගැනීම ඉවත් කරන දිනය යන දින අතරින් කලින් එළැඹි දිනයේදී ක්ෂය වීම් නතර වේ.

ප්‍රවර්තන සහ සංසන්දනාත්මක කාල පරිච්ඡේද සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ:

වගුව 51: වත්කමක ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය

| වත්කම් කාණ්ඩය | ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය |
|---|---|
| ගොඩනැගිලි සහ වැඩිදියුණු කිරීම් | වසර 20 යි |
| පරිගණක උපකරණ සහ උපාංග | වසර 05 යි |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම්, යන්ත්‍රෝපකරණ සහ උපකරණ | |
| - ගෘහ භාණ්ඩ | වසර 10 යි |
| - සවිකිරීම්, යන්ත්‍රෝපකරණ සහ උපකරණ | වසර 05 යි |
| යටිතල පහසුකම් | වසර 10 යි |
| මෝටර් රථ | වසර 05 යි |
| උපාධි කබා, පුස්තකාල සහ අධ්‍යාපනික ද්‍රව්‍ය | වසර 05 යි |
| විවිධ වත්කම් | |
| - අනෙකුත් වත්කම් | වසර 05 යි |
| - ක්‍රීඩා උපකරණ | වසර 04 යි |

වත්කමක ධාරණ අගය එහි ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදලට වඩා වැඩි නම් වත්කමෙහි ධාරණ වහාම එහි අයකරගත හැකි මුදලට ලියා හරින බැවින්, එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසානයේ වත්කම්වල අවශේෂ අගයන් සහ ප්‍රයෝජනවත් ආයු කාලය, යෝග්‍යවන්නේනම්, සමාලෝචනය කර ගළපනු ලැබේ.

අපහරණය නිසා සිදුවන ලාබ සහ පාඩු තීරණය කරනු ලබන්නේ එමගින් ඇතිවන මුදල ධාරණ අගය සමඟ සංසන්දනය කිරීමෙන් වන අතර ලාභය/ (අලාභය) විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

### vi. උරුම වත්කම්

සමාජ විද්‍යා පීඨයේ පුරාවිද්‍යා අධ්‍යයනාංශය මගින් සිදු කරන ලද පුරාවිද්‍යා කැනීම්වලදී හමුවූ ඓතිහාසික කෞතුක භාණ්ඩ වැනි උරුම වත්කම් කිහිපයක් කැලණිය විශ්වවිද්‍යාලය සතුව පවතී. ප්‍රධාන පුස්තකාලයේ ඇති පැරණි කාසි සහ පොත් එකතුවක් සහ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයනාංශය විසින් පවත්වාගෙන යනු ලබන පෞරාණික පුස්කොළපොත් එකතුවක් ද විශ්වවිද්‍යාලය සතුය. පුරාවිද්‍යාත්මක වටිනාකම තහවුරු කළ නොහැකි බැවින් මෙම වත්කම් තක්සේරු නොකෙරේ.

### vii. පිරිවැය ආකෘතිය

ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් පන්ති හැර දේපල පිරියත සහ උපකරණ එහි පිරිවැය අඩුකරන ලද සමුච්චිත ක්ෂයවීම් අනුව ගණනය කෙරේ. ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර එය පිරිවැය/ප්‍රත්‍යාගණ අගයට අනුව ගණනය කරනු ලැබේ.

### viii. ප්‍රත්‍යාගණන ආකෘතිය

මූලික හඳුනාගැනීම්වලින් අනතුරුව සාධාරණ වටිනාකම විශ්වසනීයව මැනිය පහත දක්වා ඇති දේපල, පිරියත සහ උපකරණ (ඉඩම්, ගොඩනැගිලි, උපාධි ලෝගු සහ මෝටර් රථ) පන්ති ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකමට දක්වා ඇති අතර, එය ප්‍රත්‍යාගණන දිනයට ඇති සාධාරණ වටිනාකමින් කිසියම් පසුකාලීන සමුච්චිත ක්ෂයවීම් සහ පසුකාලීන සමුච්චිත හාණිකරණ පාඩු අඩුකර ගණනය කරනු ලැබේ. මෙම වත්කම් පන්ති සෑම වසර පහකටම වරක් ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල කිසියම් හානිකරණ ස්වභාවයක් පෙන්නුම් කෙරේදැයි යන්න තීරණය කිරීම සඳහා සෑම වාර්තා කරන දිනයේදීම එකී දේපල, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් සමාලෝචනය කරනු ලබන අතර එවැනි හානිකරණ ස්වභාවයක් පිළිබඳ කිසියම් ඇඟවීමක් තිබේ නම් එම වත්කම්වල ආපසු අයකරගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමේ ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවන්නේ නම් හානිකරණ පාඩුව හඳුනා ගැනේ. හානිකරණ පාඩුව මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

වත්කම් ප්‍රත්‍යාගණනය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වගුව 52: වත්කම් ප්‍රත්‍යාගණනය

| වත්කම් | ප්‍රත්‍යාගණිත දිනය | ප්‍රත්‍යාගණනය කරන ලද ආයතනය | වත්කමේ ධාරණ අගය | වත්කමේ ප්‍රත්‍යාගණිත අගය | ප්‍රත්‍යාගණන අතිරික්තය |
|---|---|---|---|---|---|
| ඉඩම් | 31.12.2018 | තක්සේරු දෙපා. | 1,155,750,767 | 4,204,580,000 | 3,048,829,232 |
| ඉඩම් | 01.01.2019 | - එම - | - | 700,210,000 | 700,210,000 |
| ගොඩනැගිලි | 31.12.2018 | - එම- | 2,845,249,161 | 5,375,839,000 | 2,530,589,838 |
| ගොඩනැගිලි | 01.01.2019 | - එම- | - | 118,599,000 | 118,599,000 |
| උපාධි කබා | 31.12.2018 | - එම- | 884,446 | 12,020,320 | 11,135,874 |
| මෝටර් රථ | 01.01.2018 | - එම- | 27,838,603 | 114,940,000 | 87,101,397 |
| ඉඩම් | 31.12.2020 | - එම- | 58,514,788 | 547,160,000 | 488,645,213 |
| ගොඩනැගිලි | 31.12.2020 | - එම - | 39,826,218 | 62,850,000 | 23,023,783 |
| **එකතුව** | | | | | **7,008,134,337** |
| **2018.01.01 දිනට ප්‍රත්‍යාගණන අතිරික්ත ශේෂය** | | | | | **1,121,260,134** |
| **2024.12.31 දිනට ප්‍රත්‍යාගණන අතිරික්ත ශේෂය** | | | | | **8,129,394,471** |

### ix. ආයෝජන

ආයෝජනය යන්නෙන් භාණ්ඩාගාර බිල්පත්වල, ස්ථාවර තැන්පතුවල සහ ඉතිරිකිරීමේ ගිණුම්වල සිදුකරන ලද ආයෝජන නිරූපනය වේ. මෙම ආයෝජන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 - මූල්‍ය උපකරණවලට අනුකූලව ගිණුම්ගත කර ඇත. ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ගිණුම්වල ආයෝජනය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09ට අනුව ක්‍රමක්ෂිත පිරිවැයට වර්ගීකරණය කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09ට අනුව ඒවා මූලිකව සාධාරණ වටිනාකමින් මිනිනු ලබන අතර පසුව ඵලදායී පොලී අනුපාතයක් භාවිතා කරමින් සාධාරණ වටිනාකම අඩුකරන ලද ක්‍රමක්ෂිත පිරිවැයට මිනිනු ලැබේ.

### x. කාර්ය මණ්ඩල ණය

කාර්ය මණ්ඩල ණය යන්නට ආපදා ණය, පරිගණක ණය, විශේෂ ආපදා ණය, වාහන ණය, කාර්ය මණ්ඩල ණය සහ උපකුලපති අරමුදල් ණය ඇතුළත් වේ. කාර්ය මණ්ඩල ණය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09ට අනුව ක්‍රමක්ෂිත පිරිවැයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09හි නියම කර ඇති පරිදි කිසියම් කාර්ය මණ්ඩල ණයක හානිකරණ පාඩුවක් අපේක්ෂිත පිරිවැය ක්‍රමය මත හඳුනා ගනී.

### xi. කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

වාර්තා කරන දිනට නිමා නොකළ දේපළ, පිරියත සහ උපකරණ මත දරන ලද ප්‍රාග්ධන වියදම් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස දක්වනු ලබන අතර කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ සඳහා දරන ලද පිරිවැය දේපල, පිරියත සහ උපකරණ භාවිතය සඳහා තබා ඇති විට ඒවා වෙත මාරු කරනු ලැබේ.

### xii. අස්පෘශ්‍ය වත්කම්

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ සම්භාවිතාව ඇති විට සහ වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි විට මාර්ගගත සඟරා අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ඇත. අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරන පාඩු අඩුකරන ලද පිරිවැයට දක්වනු ලැබේ. මෙම වියදම් වසර 5 ක කාලයක් තුළ ක්‍රමක්ෂ කරනු ලැබේ.

### xiii. ජංගම වත්කම්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ වර්ගීකරණය කර ඇති ජංගම වත්කම් යනු විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ උපලබ්ධි වන හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කරන සහ වාර්තා කළ දිනට පසුව මාස දොළහක් ඇතුළත උපලබ්ධිවේයැයි අපේක්ෂා කරන අයිතම හෝ මුදල් හෝ මුදල් සමාන දෑ වේ.

**xiv. ගබඩා භාණ්ඩ**

ගබඩා භාණ්ඩ පිරිවැයට දක්වනු ලබන අතර පළමු ගැනුම් පළමු නිකුතු පදනම මත තීරණය වේ. ගබඩා භාණ්ඩ ප්‍රධාන වශයෙන් ලිපිද්‍රව්‍ය සහ අමතර කොටස්වලින් සමන්විත වේ. ගබඩා භාණ්ඩ පරිභෝජනය සඳහා මිස ප්‍රති අලෙවිය සඳහා නොවේ.

**xv. මුදල් සහ මුදල් සමාන දෑ**

මුදල් සහ මුදල් සමාන දෑ යනු අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ දන්නා මුදල් ප්‍රමාණයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි, වටිනාකමෙහි සැලකිය යුතු වෙනස් වීමේ අවදානමකට භාජනය නොවන කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ලෙස අර්ථ දැක්වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් සහ මුදල් සමාන දෑ යන්නට අතැති මුදල් සහ බැංකුවල තැන්පතු ඇතුළත් වේ. අත්පත් කරගත් දින සිට මාස හයක් හෝ ඊට අඩු කෙටිකාලීන කල්පිරීමක් සහිත ආයෝජන ද මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය මත සකස් කරනු ලැබේ.

**ඉ. ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම**

**i. පුනරාවර්තන ප්‍රදාන**

පුනරාවර්තන ප්‍රදාන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ මුදල් පදනම මත හඳුනා ගනී. දේපළ, පිරියත සහ උපකරණ පුනරුත්ථාපනය සඳහා දරනු ලබන පිරිවැය සහ ඉදිකිරීම් සහ නව වැඩ සඳහා වන ප්‍රාග්ධන ප්‍රදාන අවශ්‍ය අවස්ථාවලදී කෙරීගෙන යන වැඩ ලෙස හෝ ප්‍රාග්ධන වත්කම් ලෙස හඳුනාගනු ලැබේ.

**ii. ප්‍රාග්ධන ප්‍රදාන**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 11 - විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම අනුව ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත.

**ඊ. බාහිර ප්‍රදාන වලින් ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය**

උත්පාදිත අරමුදල්වලින් සහ විවිධ ව්‍යාපෘති අරමුදල්වලින් මිල දී ගත් දේපළ, පිරියත සහ උපකරණවල වටිනාකම "බාහිර ප්‍රදානවලින් ප්‍රාග්ධන වියදම් සඳහා දායක වීම" ලෙස පෙන්වා ඇත.

**උ. අභ්‍යන්තරව සීමා කළ අරමුදල්**

විශේෂිත අරමුණු සඳහා වෙන්කළ අරමුදල් අභ්‍යන්තරව සීමා කරන ලද අරමුදල්වලට ඇතුළත් වේ. සංවර්ධන අරමුදල් මගින් වසර අවසානයේ ශුද්ධ වියදම් නොකළ ශේෂයන් සහිත විශ්වවිද්‍යාලයේ,පීඨවල සහ අධ්‍යයනාංශ අරමුදල්වල සමුච්චිත තත්ත්වය නිරූපනය කෙරේ.

**ඌ. උපපාදන අරමුදල්**

උපපාදන අරමුදල්වලට විශ්වවිද්‍යාලයට ලැබෙන සීමිත පරිත්‍යාග සහ පරිත්‍යාගශීලීන් විසින් ස්ථාපිත කරන ලද විවිධ අරමුණුවලට අනුකූලව භාවිතා කරනු ලබන උපපාදන අරමුදල්වලින් උත්පාදිත ආයෝජන ප්‍රතිලාභ ඇතුළත් වේ.

**එ. බදු**

**i. ආදායම් බදු**

පවතින බදු රෙගුලාසිවලට අනුව විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය කටයුතුවලින් ලැබෙන ආදායම මත ආදායම් බදුගෙවීමට විශ්වවිද්‍යාලය බැඳී නොමැත.

### ii. එකතු කළ අගය මත බදු

පවතින බදු රෙගුලාසිවලට අනුව එකතු කළ අගය මත බදු ගෙවීමේ අවශ්‍යතාවයෙන් විශ්වවිද්‍යාලය නිදහස් කර ඇත.

### iii. පූර්ව පුද්ගලික ආදායම් බද්ද (APIT)

විශ්වවිද්‍යාල වියදම්වල කොටසක් නොවන, ආදායම් බදු ගෙවීම සඳහා බැඳීමක් ඇති සේවකයින්ගේ මාසික වැටුපෙන් අඩු කරන ලද පූර්ව පුද්ගලික ආදායම් බද්ද විශ්වවිද්‍යාලය විසින් දැනට ප්‍රේෂණය කරයි. එබැවින් පූර්ව පුද්ගලික ආදායම් බදු ගෙවීම විශ්වවිද්‍යාලයේ ගිණුම්වල ගිණුම්ගත කරනු නොලැබේ.

### iv. සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL)

2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතට අනුව, විශ්වවිද්‍යාලය මගින් උපයනු ලබන මාසික ආදායම මත 2.5%ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් වර්තමානයේ විශ්වවිද්‍යාලය විසින් ගෙවනු ලැබේ.

### v. රඳවා ගැනීමේ බද්ද (WHT)

2023 ජනවාරි 02 දින සිට බලාත්මක වන පරිදි සංශෝධිත ආදායම් බදු පනතේ 84A සහ 85 වගන්තිවලට අනුව, ඇතැම් ගෙවීම් සඳහා අදාළ වන වත්මන් රඳවා ගැනීමේ බදු අනුපාත අඩු කරනු ලැබේ.

## ඒ. සේවක ප්‍රතිලාභ

### i. අර්ථ දැක්වීම්

**<u>කෙටි කාලීන සේවක ප්‍රතිලාභ</u>**

කෙටිකාලීන සේවක ප්‍රතිලාභ අදාළ සේවාව සපයන විටදී වියදම් වශයෙන් හඳුනාගනු ලැබේ. සේවකයා විසින් සපයන ලද අතීත සේවාවේ ප්‍රතිඵලයක් ලෙස මෙම මුදල ගෙවීමට විශ්වවිද්‍යාලයට වර්තමාන නෛතික හෝ වාස්තවික බැඳීමක් තිබේ නම් සහ වගකීම විශ්වාසදායක ලෙස තක්සේරු කළ හැකි නම් ගෙවීමට බලාපොරොත්තු වන මුදල සඳහා වන බැරකම හඳුනා ගැනේ.

**<u>නිශ්චිත දායක සැලැස්ම</u>**

අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසිවලට අනුකූලව සේවකයෝ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (UPF), සේවක භාර අරමුදල (ETF), විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා හිමිකම් ලබති. කැලණිය විශ්වවිද්‍යාලය සිය සේවකයින්ගේ මූලික වැටුප් සහ ජීවන වියදම් දීමනා, අධ්‍යයන දීමනා සහ මාසික වන්දි දීමනා මත විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට, සේවක භාරකාර අරමුදලට සහ විශ්‍රාම වැටුප් අරමුදලට ස්ථාවර දායක මුදල් ගෙවන අතර මෙම දායකත්වයන් ඉක්මවා මුදල් ගෙවීම සඳහා නීතිමය හෝ වාස්තවික බැඳීමක් විශ්වවිද්‍යාලයට නොමැත. මෙම බැඳීම සේවක ප්‍රතිලාභ පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19හි අර්ථ දක්වා ඇති දායකත්ව සැලැස්මේ විෂය පථයට අයත් වේ. නිශ්චිත දායක සැලැස්මට දායක වීමේ වගකීම අදාළ සේවාව සපයනු ලබන විට ලාභ හෝ අලාභවල හඳුනා ගැනේ.

**<u>නිශ්චිත ප්‍රතිලාභ බැඳීම</u>**

1983 අංක 12 දරන පාරිතෝෂික පනත යටතේ, සුදුසුකම් ලත් සේවකයින් සඳහා නිශ්චිත ප්‍රතිලාභ වගකීමක් විශ්වවිද්‍යාලය වෙත පැවරේ. මෙම පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය 19 - සේවක ප්‍රතිලාභ යන විෂය පථයට අයත් වේ.
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම මිනුම්කිරීම නිශ්චිත ප්‍රතිලාභ වගකීම, වාර්තාකරණ දිනය වන විට එහි වර්තමාන අගයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වනු ලැබේ. මෙම ගණනය කිරීම, සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු විසින් ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් වාර්ෂිකව සිදු කරනු ලැබේ. ආයුගණක ලාභ සහ අලාභයන්ගෙන් සමන්විත නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් නැවත මැනීම, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වහා හඳුනා ගැනේ. වර්ෂය තුළ සේවකයින් විසින් සපයනු ලබන සේවාවන් හේතුවෙන් පැන නගින වගකීමේ වැඩිවීම (වත්මන් සේවා පිරිවැය),

විශ්වවිද්‍යාලය විසින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ගිණුම්ගත කරනු ලබයි.

වට්ටම් අනුපාතිකය, දිගුකාලීන පොලී අනුපාතිකයේ ආසන්න අගයක් මත පදනම්ව ගණනය කර ඇත. එය 2022 වර්ෂයේදී වසරකට 11% ක් වූ අතර, 2021 වර්ෂයේදී වසරකට 11.5% ක් විය. නිශ්චිත ප්‍රතිලාභ වගකීම සඳහා බාහිරව අරමුදල් සැපයීමක් සිදු නොකෙරේ.

ගිණුම්කරණ ඇස්තමේන්තුව ආයුගණක තක්සේරුව සඳහා වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාත පිළිබඳ උපකල්පන අවශ්‍ය වේ. මෙම වගකීම්වල සංකීර්ණත්වය සහ දිගුකාලීන ස්වභාවය හේතුවෙන්, නිශ්චිත ප්‍රතිලාභ වගකීම මෙම උපකල්පනවල වෙනස්වීම් වලට බෙහෙවින් සංවේදී වේ. සියලුම උපකල්පන එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කරනු ලැබේ.

### ii. විශ්‍රාම පාරිතෝෂිතයේ ආයුගණක තක්සේරුව

වෘත්තීය ආයුගණක සමාගමක් වන Actuarial & Management Consultants (Pvt) Ltd විසින් 2023 දෙසැම්බර් 31 දිනට ආයුගණක තක්සේරුවක් සිදු කරන ලදී. ආයුගණක තක්සේරුවේ සාරාංශගත වාර්තාව පහත පරිදි වේ:

ප්‍රධාන උපකල්පන:

වගුව 53: විශ්‍රාම පාරිතෝෂිකයේ ආයුගණක තක්සේරුව

| උපකල්පනය | 2024 | 2023 |
|---|---|---|
| **මූල්‍ය වට්ටම් අනුපාතය** | වාර්ෂික 11% | වාර්ෂික 13% |
| **වැටුප් වැඩිවීමේ අනුපාතය** | | |
| **අධ්‍යයන කාර්ය මණ්ඩලය** | වාර්ෂික 10.00% | වාර්ෂික 12.00% |
| **අනධ්‍යයන කාර්ය මණ්ඩලය** | වාර්ෂික 8.00% | වාර්ෂික 10.00% |
| **ජනවිකාසමය** | | |
| **මාර්තයතා වගුව** | 1967/70 මාර්තයතා වගුව, ලන්ඩනයේ Institute of Actuaries ආයතනය විසින් නිකුත් කරන ලදී. | |
| **විශ්‍රාම වයස** | | |
| **අධ්‍යයන කාර්ය මණ්ඩලය** | අවුරුදු 65 යි. | අවුරුදු 65 යි. |
| **අනධ්‍යයන කාර්ය මණ්ඩලය** | අවුරුදු 60 යි. | අවුරුදු 60 යි. |
| **කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය** | | |
| **අධ්‍යයන කාර්ය මණ්ඩලය** | වයස අවුරුදු 54 දක්වා වාර්ෂිකව1.00 % ඉන්පසු ශූන්‍යවේ | |
| **අනධ්‍යයන කාර්ය මණ්ඩලය** | වයස අවුරුදු 54 දක්වා වාර්ෂිකව 0.50 % ඉන්පසු ශූන්‍යවේ | |
| **ආබාධිතතා අනුපාතය (අධ්‍යයන සහ අනධ්‍යයන)** | මාර්තයතා වගුවේ10% | |

### නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගයට අදාළව සංවේදීතා විශ්ලේෂණය (ශ්‍රී ලංකා රුපියල්)

වට්ටම් අනුපාතයේ සහ වැටුප් වර්ධන අනුපාතයේ සිදුවන වෙනස්වීම් නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගයට ඇති කරන සැලකිය යුතු මට්ටමේ බලපෑම සංවේදීතා විශ්ලේෂණය මඟින් පෙන්නුම් කෙරේ.

| අවස්ථාව | ප්‍රමාණය (ශ්‍රී.ලං.රු.) |
|---|---|
| වට්ටම් අනුපාතිකයේ සියයට එකක වැඩිවීමක් (+1%) | 1,684,136,053 |
| වට්ටම් අනුපාතිකයේ සියයට එකක අඩුවීමක් (-1%) | 1,974,401,893 |
| වැටුප් වර්ධක අනුපාතයේ සියයට එකක වැඩිවීමක් (+1%) | 1,974,258,663 |
| වැටුප් වර්ධක අනුපාතයේ සියයට එකක අඩුවීමක් (-1%) | 1,682,061,294 |

**ඔ. බැරකම් සහ ප්‍රතිපාදන**

**ජංගම බැරකම්**

ජංගම බැරකම් ඒවායේ පොත් වටිනාකමට දක්වනු ලබයි.

**ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලයට පවතින වර්තමාන බැඳීමක් නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය කරන විට සහ බැඳීම් ප්‍රමාණය පිළිබඳ විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි විට ප්‍රතිපාදන හඳුනා ගනී. ප්‍රතිපාදන උපචිත වියදම් යටතේ දක්වනු ලැබේ. විශ්වවිද්‍යාලය ඇස්තමේන්තුවකට පැමිණෙන්නේ බොහෝදුරට සිදුවීමට ඉඩ ඇති ප්‍රතිඵලය පිළිබඳ ඇගයීමක පදනම මතය. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා ප්‍රතිපාදන සියල්ල ගිණුම්ගත කර ඇත.

**ඕ. අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම්**

අසම්භාව්‍ය බැරකමක් යනු වැඩසටහනේ පාලනයෙන් බැහැර අනපේක්ෂිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදුවීම හෝ සිදු නොවීමෙන් මතුවන බැඳීමක් හෝ බැඳීම් නිරවුල් කිරීම සඳහා සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි බවට නිශ්චිත නොවීම හේතුවෙන් හඳුනා නොගන්නා වර්තමාන බැඳීමක් වේ.

එමෙන්ම විශ්වසනීය ලෙස මැනිය නොහැකි වගකීමක් පවතින අතිශය දුර්ලභ අවස්ථාවන්හිදී ද අසම්භාව්‍ය බැරකමක් පැන නැගිය හැකිය. අවිනිශ්චිත තත්ත්වය බැරකමක් ලෙස හඳුනා නොගන්නා නමුත් මූල්‍ය ප්‍රකාශනවල එහි පැවැත්ම හෙළිදරව් කරයි.

අසම්භාව්‍ය වත්කමක් යනු විශ්වවිද්‍යාල පාලනයෙන් බැහැර අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදුවීමෙන් හෝ සිදු නොවීම මගින් එහි පැවැත්ම තහවුරු වන අතීත සිදුවීම්වලින් පැන නගින වත්කමකි. ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ සම්භාවිතාව ඇතත්, එය නියත වශයෙන්ම සහතික නොවන අවස්ථාවලදී විශ්වවිද්‍යාලය අහඹු වත්කම් හඳුනා නොගනී, නමුත් එහි පැවැත්ම හෙළි කරයි.

**ක. ආදායම් හඳුනා ගැනීම**

**i. හුවමාරු ගනුදෙනු**

පර්යේෂණ ප්‍රදාන, විවිධ ව්‍යාපෘති සහ අනෙකුත් ප්‍රදානවල ආදායම, අධ්‍යයන පැවරුම් ඇතුළු ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සහ අනෙකුත් සියලුම ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

**ii. හුවමාරු නොවන ගනුදෙනු-ප්‍රාග්ධන**

හුවමාරු නොවන ගනුදෙනු-ප්‍රාග්ධනවලින් ලැබෙන ආදායම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11ට අනුව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව, හුවමාරු නොවන ගනුදෙනු-ප්‍රාග්ධන ප්‍රදානවලින් ලැබෙන ආදායම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ආදායම ලෙස හඳුනාගෙන සමුච්චිත අරමුදල් අතිරික්ත ප්‍රාග්ධන ගිණුම වෙත මාරු කරනු ලැබේ. එය සමුච්චිත මුදලක් ලෙස මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සංචිත ගිණුමක් ලෙස දැක්වේ.

**iii. මූල්‍ය ආදායම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත නොමැති වීම හේතුවෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09ට අනුව ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් පොලී ආදායම උපචිත පදනමක් මත හඳුනා ගැනේ.

**iv. වියදම් හඳුනාගැනීම**

විශ්වවිද්‍යාලයේ සියලුම ක්‍රියාකාරකම් සිදු කිරීමේදී දරන වියදම් උපචිත පදනම මත හඳුනා ගෙන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කෙරේ.

**v. මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 හි මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇති අතර එමගින් මෙහෙයුම් ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම් සහ ආයෝජන ක්‍රියාකාරකම්වල දළ මුදල් ලැබීම් සහ දළ මුදල් ගෙවීම් හඳුනාගෙන ඇත. මුදල් සහ මුදල් සමානදෑ දන්නා මුදල් ප්‍රමාණයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි වටිනාකමේ වෙනස්වීම් පිළිබඳ සැලකිය යුතු අවදානමකට භාජනය නොවන කෙටි කාලීන, ඉහළ ද්‍රවශීල ආයෝජනවලින් සමන්විත වේ.

# 12.5.4. පැහැදිලි කිරීමේ සටහන්

## අ. උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන මෙහෙයුම් කඩිනම් කිරීමේ (AHEAD) ව්‍යාපෘතිය

උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන කඩිනම් කිරීමේ (AHEAD) මෙහෙයුම, 2018 සිට 2023 දක්වා දිවයිනේම උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අනුග්‍රහය දැක්වීම ඉලක්ක කරගත් ලෝක බැංකු අරමුදල් සම්පාදිත ව්‍යාපෘතියකි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සහ එහි විෂය පථය යටතේ පවතින විශ්වවිද්‍යාල, SLIATE, ATIs සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද උපාධි වැඩසටහන් පිරිනමන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල උසස් අධ්‍යාපන ක්‍රියාකාරකම් සඳහා සහාය ලබා දී ඇත.

**AHEAD ව්‍යාපෘතියේ ප්‍රධාන උපායමාර්ගික ක්ෂේත්‍ර**

මෙම ව්‍යාපෘතිය උපායමාර්ගික ප්‍රතිඵල ක්ෂේත්‍ර තුනක් කෙරෙහි අවධානය යොමු කර ඇත:

i. සිසුන් බඳවා ගැනීම් ඉහළ නැංවීම: ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වය දක්වන විෂය ධාරාවන් සඳහා ප්‍රමුඛත්වය දීම.

ii. උසස් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම: ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම (ELTA), ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම (ELSE), වෘත්තීය සංවර්ධනය සහ තත්ත්ව සහතිකකරණය.

iii. පර්යේෂණ, සංවර්ධනය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම: පර්යේෂණ, සංවර්ධනය, නවෝත්පාදන සහ වාණිජකරණය (RDIC) කෙරෙහි අවධානය යොමු කරන සංස්කෘතියක් ඇතිකිරීම සඳහා දිරිමත් කිරීම.

**කැලණිය විශ්වවිද්‍යාලයේ කාර්යභාරය**

කැලණිය විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය (OTS) අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙහෙයුම් හා අධීක්ෂණ සහාය කණ්ඩායමේ (OMST) අධීක්ෂණය යටතේ ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල මූල්‍ය, ප්‍රසම්පාදන, පරිපාලන සහ සම්බන්ධීකරණ කටයුතු නිසි ලෙස කළමනාකරණය කරයි.

**කැලණිය විශ්වවිද්‍යාලය ලද ජයග්‍රහණ**

කැලණිය විශ්වවිද්‍යාලය පහත සඳහන් ක්ෂේත්‍ර හරහා බෙදා හරින ලද රුපියල් මිලියන 929.7 ක ප්‍රදාන 20 ක් ලබා ගැනීමට සමත් විය.

<u>ප්‍රතිඵල ක්ෂේත්‍රය 1: ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීම ඉහළ නැංවීම (රුපියල් මිලියන 142)</u>

වෛද්‍ය අධ්‍යාපන, කාර්මික කළමනාකරණ, රසායන විද්‍යා, ගණිතය, භෞතික විද්‍යා, සංඛ්‍යාලේඛන සහ පරිගණක විද්‍යා යන අධ්‍යයනාංශ සඳහා ප්‍රදාන හයක් පිරිනමන ලදී.

<u>ප්‍රතිඵල ක්ෂේත්‍රය 2 (i): උසස් අධ්‍යාපන ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම (රුපියල් මිලියන 673)</u>

- වාණිජ හා කළමනාකරණ අධ්‍යයන, මානව ශාස්ත්‍ර සහ විද්‍යා පීඨවල පීඨ මට්ටමේ වැඩසටහන්.

- ගණකාධිකරණ, වාණිජ හා මූල්‍ය කළමනාකරණ, කාර්මික කළමනාකරණ සහ ශාක සහ අණුක ජීව විද්‍යාව යන අධ්‍යයනාංශ සඳහා අධ්‍යයනාංශ මට්ටමේ ප්‍රදාන.
- කලා පාඨමාලා සඳහා වන තොරතුරු තාක්ෂණ විශේෂ වැඩසටහනට අදාළව 2022 දී උපකරණ ප්‍රදානයක් ලැබීම.

ප්‍රතිඵල ක්ෂේත්‍රය 2 (ii): PhD ශිෂ්‍යත්ව (රුපියල් මිලියන 176.5)

| ආචාර්ය චිත්‍රා ප්‍රනාන්දු ශිෂ්‍යත්ව අරමුදල- පොලී | 3,613,752 | 3,065,221 |
| පීර්ටර් සිල්වා ශිෂ්‍යත්ව අරමුදල- පොලී | 37,543 | 31,424 |
| පී.පී. ජයවර්ධන ශිෂ්‍යත්ව අරමුදල- පොලී | 98,825 | 82,453 |
| ලිනස් සිල්වා/ ඇග්නස් පේදුරු ශිෂ්‍යත්ව අරමුදල - පොලී | 144,238 | 113,523 |
| ඇග්නස් පේදුරු ශිෂ්‍යත්ව අරමුදල - පොලී | 109,154 | 70,864 |
| මේරි මිතුරු ශිෂ්‍යත්ව අරමුදල-පොලී | 224,885 | 220,965 |
| එස් ජයවර්ධන ශිෂ්‍යත්ව අරමුදල්- පොලී | 349,325 | 272,886 |
| රත්නකර ශිෂ්‍යත්ව අරමුදල- පොලී | 249,238 | 199,266 |
| මහාචාර්ය එච්.එච්. කොස්තා අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල-පොලී | 454,108 | 355,798 |
| මහාචාර්ය ෂෙල්ටන් ගුණරත්න අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල- පොලී | 2,266,710 | 1,901,598 |
| රාජමන්ත්‍රී ශිෂ්‍යත්ව අරමුදල්- පොලී | 335,069 | 267,614 |
| හවන්පොල ශ්‍රී රතනසාර ශිෂ්‍යත්ව අරමුදල - පොලී | 349,567 | 302,029 |
| ශිෂ්‍ය භාර ශිෂ්‍යත්ව අරමුදල (HRM) - පොලී | 761,724 | 622,719 |
| මහාචාර්ය පී.රණසිංහ ශිෂ්‍යත්ව අරමුදල - පොලී | 338,674 | 244,218 |
| ඩබ්ලිව්.එස්.කරුණාතිලක ශිෂ්‍යත්ව අරමුදල - පොලී | 632,256 | 462,411 |
| කේ.එම්.පී.කුලසේකර ශිෂ්‍යත්ව -පොලී | 79,231 | 65,634 |
| ලක්ෂ්මි සහ ධර්මසේන ශිෂ්‍යත්ව - පොලී | 347,613 | 162,604 |
| මහාචාර්ය දිල්රුක්ෂි සඳකැන් හෙට්ටිආරච්චි ශිෂ්‍යත්ව - පොලී | 222,007 | 80,422 |
| සම්මානිත මහාචාර්ය මංගල ඉලංගසිංහ ශිෂ්‍යත්ව අරමුදල- පොලී | 96,345 | 64,595 |
| මහාචාර්ය සුදත් කාලිංගමුදලි ශිෂ්‍යත්ව අරමුදල- පොලී | 330,262 | 163,329 |
| ශාක සහ අණුක ජීව විද්‍යා ශිෂ්‍යත්ව- පොලී | 233,861 | 220,162 |
| ආචාර්ය පී.ටී. ද සිල්වා ශිෂ්‍යත්ව- පොලී | 443,779 | 170,406 |
| පූජ්‍ය ආචාර්ය වල්පොල පියනන්ද ශිෂ්‍යත්ව අරමුදල- පොලී | 134,500 | 35,000 |
| මහාචාර්ය එන්.කේ. දංගල්ල ශිෂ්‍යත්ව අරමුදල -පොලී | 16,813 | 4,375 |
| නන්දා පාලි අමරේ පිදුම ශිෂ්‍යත්ව අරමුදල - පොලී | 23,125 | - |
| පූජ්‍ය කුනේගොඩ පියතිස්ස ස්වර්ණ මුද්‍රිකාව ශිෂ්‍යත්ව අරමුදල - පොලී | 23,125 | - |
| **එකතුව** | **11,915,726** | **9,179,514** |

| | **දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂයට** | **උපලේඛන අංක.** | **2024 (ශ්‍රීලං.රු.)** | **2023 (ශ්‍රීලං.රු.** |
|---|---|---|---|---|
| **32** | **පර්යේෂණ ප්‍රදාන** | | | |
| | ජාතික විද්‍යා පදනම වෙතින් ලැබුණු ආධාර | **32.1** | 89,748 | 2,436,984 |
| | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයෙන් ලැබුණු ප්‍රදාන | **32.2** | 1,641,769 | 2,259,416 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් ලැබුණු ප්‍රදාන | **32.3** | 758,490 | 831,050 |
| | වෙනත් ආයතනවලින් ලද ප්‍රදාන | **32.4** | 178,076,254 | 108,435,745 |
| | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | **32.5** | 11,385,332 | 9,864,443 |
| | **එකතුව** | | **191,951,593** | **123,827,638** |

| **32.1** | **ජාතික විද්‍යා පදනමෙන් ලැබුණු ප්‍රදාන (ජා.වි.ප)** | **2024 (ශ්‍රීලං.රු.)** | **2023 (ශ්‍රීලං.රු.** |
|---|---|---|---|
| | වසර ආරම්භයේ ශේෂය | 2,436,984 | 4,664,735 |
| | **අඩුකළා:** වර්ෂය තුළ ගෙවීම් - පුනරාවර්තන | (2,347,236) | (2,227,751) |
| | **වසර අවසානයේ ශේෂය** | **89,748** | **2,436,984** |

වගුව 55: (සම්බන්ධයි).

| 32.2 | **විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයෙන් ලැබුණු ප්‍රදාන** | **2024 (ශ්‍රීලං.රු.)** | **2023 (ශ්‍රීලං.රු.** |
|---|---|---|---|
| | වසර ආරම්භයේ ශේෂය | 2,259,416 | 1,263,557 |
| | **එකතුකළා:** වර්ෂය තුළ ලැබුණු ප්‍රදාන | 50,000 | 2,010,000 |
| | **අඩුකළා:** වර්ෂය තුළ ගෙවීම් - පුනරාවර්තන | (667,648) | (1,014,142) |
| | **වසර අවසානයේ ශේෂය** | **1,641,769** | **2,259,416** |

| 32.3 | **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබුණු ප්‍රදාන (විප්‍රකො)** | **2024 (ශ්‍රීලං.රු.)** | **2023 (ශ්‍රීලං.රු.** |
|---|---|---|---|
| | වසර ආරම්භයේ ශේෂය | 831,050 | 1,633,850 |
| | **එකතුකළා:** වර්ෂය තුළ ලැබුණු ප්‍රදාන | - | 700,000 |
| | **අඩුකළා:** වර්ෂය තුළ ගෙවීම් - පුනරාවර්තන | (72,560) | (1,502,800) |
| | **වසර අවසානයේ ශේෂය** | **758,490** | **831,050** |

| 32.4 | **වෙනත් ආයතනවලින් ලැබුණු ප්‍රදාන** | **2024 (ශ්‍රීලං.රු.)** | **2023 (ශ්‍රීලං.රු.** |
|---|---|---|---|
| | වසර ආරම්භයේ ශේෂය | 108,435,745 | 152,510,727 |
| | **එකතුකළා:** වර්ෂය තුළ ලැබුණු ප්‍රදාන | 163,980,723 | 58,215,109 |
| | **අඩුකළා:** වර්ෂය තුළ ගෙවීම් - පුනරාවර්තන | (77,310,490) | (98,273,651) |
| | **අඩුකළා:** වර්ෂය තුළ ගෙවීම් - ප්‍රාග්ධන | (17,029,724) | - |
| | ගැළපුම් | - | (4,016,440) |
| | **වසර අවසානයේ ශේෂය** | **178,076,254** | **108,435,745** |

| | **දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂයට** | **2024 (ශ්‍රීලං.රු.)** | **2023 (ශ්‍රීලං.රු.** |
|---|---|---|---|
| 32.5 | **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව** | | |
| | වසර ආරම්භයේ ශේෂය | 9,864,443 | 10,406,583 |
| | **එකතුකළා:** වර්ෂය තුළ ලැබුණු ප්‍රදාන | 7,544,117 | 4,542,720 |
| | **අඩුකළා:** වර්ෂය තුළ ගෙවීම් - පුනරාවර්තන | (6,023,229) | (5,084,860) |
| | **වසර අවසානයේ ශේෂය** | **11,385,332** | **9,864,443** |

| | **දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂයට** | **2024 (ශ්‍රීලං.රු.)** | **2023 (ශ්‍රීලං.රු.** |
|---|---|---|---|
| 33 | **විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන** | | |
| | ජනවාරි 1 වන දිනට PV/DBO සඳහා ප්‍රතිපාදන | 1,507,316,311 | 1,373,753,063 |
| | කාල සීමාව සඳහා පොලී පිරිවැය | 195,951,120 | 247,275,551 |
| | අතීත සේවා පිරිවැය | - | - |
| | කාල සීමාව සඳහා ජංගම සේවා පිරිවැය | 106,253,386 | 79,751,122 |
| | **අඩුකළා:** වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම් | (139,286,177) | (75,033,026) |
| | PV-DBO හි තත්‍ය (ලාභ)/අලාභය | 148,538,302 | (118,430,400) |
| | **කාලපරිච්ඡේදය අවසානයේ ශේෂය** | **1,818,772,941** | **1,507,316,311** |

| | **දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂයට** | **2024 (ශ්‍රීලං.රු.)** | **2023 (ශ්‍රීලං.රු.** |
|---|---|---|---|
| 34 | **ආපසු ගෙවිය යුතු තැන්පතු** | | |
| | ටෙන්ඩර් තැන්පතු | 117,500 | 1,013,500 |
| | ආරක්ෂක තැන්පතු | 47,971,589 | 55,678,401 |
| | පුස්තකාල තැන්පතු | 48,799,034 | 50,311,146 |
| | කාර්ය මණ්ඩල ඇප තැන්පතු | 61,784 | 59,066 |
| | විවිධ තැන්පතු | 14,037,918 | 28,604,033 |
| | **එකතුව** | **110,987,826** | **135,666,147** |

වගුව 55: (සම්බන්ධයි).

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂයට | 2024 (ශ්‍රීලං.රු.) | 2023 (ශ්‍රීලං.රු. |
|---|---|---|---|
| 35 | **මෙහෙයුම් වියදම් සහ සහ අනෙකුත් ගෙවිය යුතු** | | |
| | උපචිත විගණන ගාස්තු | 4,430,640 | 2,180,640 |
| | කොන්ත්‍රාත් සේවා සඳහා උපචිත වියදම් | 130,900,307 | 62,001,922 |
| | ගාස්තු අයකිරීමේ පාඨමාලා සඳහා උපචිත වියදම් | 8,706,320 | 16,662,066 |
| | උපචිත නඩත්තු වියදම් | 69,609,288 | 508,500 |
| | උපචිත අනෙකුත් පුනරාවර්තන වියදම් | 43,765,122 | 81,699,394 |
| | උපචිත අනෙකුත් සැපයුම් වියදම් | 1,775,610 | 4,034,397 |
| | උපචිත ගමන් වියදම් | 69,000 | 100,000 |
| | උපචිත ව්‍යවස්ථාපිත ගෙවීම් | 3,563,734 | 10,871,329 |
| | ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම සම්බන්ධයෙන් වන බැඳීම් | 14,482,712 | 10,382,617 |
| | උපචිත පුද්ගල පඩිනඩි | 53,530,517 | 26,262,802 |
| | උපචිත තොග සැපයුම් | 16,506,398 | 8,081,845 |
| | උපචිත ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය වියදම් | 3,929,329 | - |
| | වෙනත් | 41,621,536 | 72,201,650 |
| | **එකතුව** | **392,890,513** | **294,987,163** |

## 12.5.6. 2023 වර්ෂයේ යළි ප්‍රකාශිත මූල්‍ය ප්‍රකාශන සඳහා වූ අමතර සටහන්

I. 2023 වර්ෂයේදී අස්පෘශ්‍ය වත්කම්, 'දේපළ, පිරියත සහ උපකරණ' යටතේ වාර්තා කර ඇත. කෙසේ වෙතත්, 2024 වර්ෂයේදී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 09/2022 සහ 649 ට අනුකූලව ඒවා වෙනම සටහන් ලෙස ඉදිරිපත් කර ඇත.

II. කොළඹ උතුර අක්මා රෝග මධ්‍යස්ථාන (CNCLD) ගොඩනැගිල්ල සඳහා ලැබුණු රු. 33,416,911.64 ක මුදල 2024 වර්ෂයේදී සමුච්චිත අරමුදල-අතිරික්ත/(හිඟ)-ප්‍රාග්ධන සහ වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන' ගිණුම් වෙත මාරු කර ඇත. කෙසේ වෙතත්, මෙම මුදලින් රු. 29,882,504.56 ක් 2023 වර්ෂයට අදාළ වේ.

III. 2023 මූල්‍ය ප්‍රකාශනවල, පහත දැක්වෙන ලෙජර ශේෂයන් සටහන් අංක 35 යටතේ ඇතුළත් කරන ලදී. කෙසේ වෙතත්, 2023 වර්ෂයේදී සිදු වූ වර්ගීකරණ දෝෂයක් නිවැරදි කිරීම සඳහා, 2024 වර්ෂයේදී ඒවා සටහන් අංක 34 යටතේ ඉදිරිපත් කර ඇත.

වගුව 56: ලෙජර් ශේෂයන්

| විස්තරය | ශ්‍රී.ලං.රු. |
|---|---|
| කාර්ය මණ්ඩල ඇප තැන්පතු පොලිය (16103004) | 31,566.13 |
| කාර්ය මණ්ඩල ඇප තැන්පතුව (16103009) | 27,500.00 |
| මුද්දර ගාස්තු තැන්පතුව (16102005) | 64,175.00 |
| විවිධ තැන්පතු ගිණුම් (16102001) | 15,503,401.93 |
| විවිධ තැන්පතු ගිණුම් (309) එ/ජ (16102039) | 99,433.60 |
| ආපනශාලා තැන්පතු ගිණුම් (16102113) | 496,135.50 |
| විවිධ තැන්පතු - FGS (16102116) | 12,387,299.85 |
| කාර්ය මණ්ඩල ඇප තැන්පතු පොලිය (16103004) | 53,587.44 |
| **එකතුව** | 28,663,099.45 |

# 12.5.7. අයවැය සහ සත්‍ය ප්‍රමාණයන් සංසන්දනය කිරීමේ ප්‍රකාශය- 2024

වගුව 57: අයවැය සහ සත්‍ය ප්‍රමාණයන් සංසන්දනය කිරීමේ ප්‍රකාශය

ශ්‍රීලං. රු.

| **බාණ්ඩය / වැය විෂය** | **අයවැයගත - 2024** | **සත්‍ය - 2024** | **විචලයය** | **විචලයයහි ප්‍රතිශතය** |
|---|---|---|---|---|
| | **අ** | **ආ** | **ඇ** | **ඇ/අ *** |
| **ආදායම්** | | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 5,287,770,000 | 5,287,770,000 | - | |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | 325,000,000 | 303,071,000 | (21,929,000) | |
| අභ්‍යන්තර ආදායම | 1,180,001,000 | 1,717,595,536 | 537,594,536 | |
| සංවර්ධන අරමුදලින් මාරු කිරීම | 265,160,000 | 441,995,274 | 176,835,274 | |
| **මුළු ආදායම** | **7,057,931,000** | **7,750,431,810** | **692,500,810** | **10%** |
| | | | | |
| **වියදම්** | | | | |
| පුද්ගල පඩිනඩි | | | | |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 3,953,843,400 | 3,767,215,072 | 186,628,328 | |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 1,096,808,794 | 1,088,051,195 | 8,757,599 | |
| **එකතුව** | **5,050,652,194** | **4,855,266,267** | **195,385,927** | **3.87%** |
| | | | | |
| **ගමන් වියදම්** | | | | |
| දේශීය | 700,000 | 432,919 | 267,081 | |
| විදේශ | 2,000,000 | - | 2,000,000 | |
| **එකතුව** | **2,700,000** | **432,919** | **2,267,081** | **84%** |
| | | | | |
| **සැපයුම්** | | | | |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 42,000,000 | 55,656,607 | (13,656,607) | |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 41,000,000 | 30,556,926 | 10,443,074 | |
| නිල ඇඳුම් සහ මැහුම් ගාස්තු | 10,500,000 | 4,161,027 | 6,338,973 | |
| යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ | 3,200,000 | 2,805,872 | 394,128 | |
| රසායන ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ | 19,980,000 | 12,868,151 | 7,111,849 | |
| වෛද්‍ය සැපයුම් | 5,060,000 | 4,415,010 | 644,990 | |
| වෙනත් සැපයුම් | 21,476,000 | 71,641,638 | (50,165,638) | |
| **එකතුව** | **143,216,000** | **182,105,230** | **(38,889,230)** | **-27%** |
| | | | | |
| **නඩත්තු වියදම්** | | | | |
| වාහන | 33,000,000 | 24,167,503 | 8,832,497 | |
| පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 50,000,000 | 116,919,625 | (66,919,625) | |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 8,000,000 | 5,914,776 | 2,085,224 | |
| ගෘහභාණ්ඩ | 600,000 | 37,700 | 562,300 | |
| වෙනත් | 500,000 | 1,381,688 | (881,688) | |
| **එකතුව** | **92,100,000** | **148,421,292** | **(56,321,292)** | **-61%** |

වගුව 57: (සම්බන්ධයි).

| බාණ්ඩය / වැය විෂය | අයවැයගත - 2024 | තතය - 2024 | විචලනය | විචලනයහි ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | | | | ශ්‍රීලං. රු. |
| | අ | ආ | ඇ | ඇ/අ * |
| **කොන්ත්‍රාත් සේවා** | | | | |
| ප්‍රවාහන | 100,000 | 67,970 | 32,030 | |
| විදුලි සංදේශ | 67,000,000 | 98,346,326 | (31,346,326) | |
| තැපැල් ගාස්තු | 5,580,000 | 3,741,680 | 1,838,320 | |
| විදුලිය | 302,000,000 | 299,393,682 | 2,606,318 | |
| ආරක්ෂක සේවා | 120,000,000 | 140,359,396 | (20,359,396) | |
| ජලය | 65,000,000 | 64,778,904 | 221,096 | |
| පිරිසිදු කිරීමේ සේවා | 125,000,000 | 191,689,517 | (66,689,517) | |
| කුලී ගාස්තු | 26,000,000 | 24,527,866 | 1,472,134 | |
| පළාත්පාලන ආයතන සඳහා ගාස්තු සහ බදු | 32,500,000 | 19,783,158 | 12,716,842 | |
| මුද්‍රණය, ප්‍රචාරණය ආදිය. | 23,000,000 | 33,393,833 | (10,393,833) | |
| වෙනත් | 5,000,000 | 15,008,132 | (10,008,132) | |
| **එකතුව** | **771,180,000** | **891,090,464** | **(119,910,464)** | **-16%** |
| | | | | |
| **වෙනත් පුනරාවර්තන වියදම්** | | | | |
| විශේෂ සේවා - සභාව සහ කමිටු | 4,000,000 | 6,692,546 | (2,692,546) | |
| -එම- වෘත්තීය සහ වෙනත් ගාස්තු | 100,000 | 135,040 | (35,040) | |
| වැඩමුළු, සම්මන්ත්‍රණ | 26,000,000 | 32,076,714 | (6,076,714) | |
| ශාස්ත්‍රීය පර්යේෂණ සහ ප්‍රකාශන | 7,200,000 | 1,484,564 | 5,715,436 | |
| කාර්ය මණ්ඩල සංවර්ධනය (ගුරුවරුන්, පරිපාලකයින් සහ අනෙකුත් සේවකයින් සඳහා පුහුණුව) | 4,500,000 | 2,080,315 | 2,419,685 | |
| නිවාඩු අවසරපත්‍ර සහ වාර ප්‍රවේශපත් | 5,800,000 | 4,558,850 | 1,241,150 | |
| උපාධි ප්‍රදානෝත්සව වියදම් | 36,200,000 | 35,367,648 | 832,352 | |
| සංග්‍රහ වියදම් | 6,100,000 | 4,987,211 | 1,112,789 | |
| දායකත්ව මුදල් සහ සාමාජික ගාස්තු | 2,500,000 | 3,310,473 | (810,473) | |
| විභාග වියදම් | 75,200,000 | 102,455,551 | (27,255,551) | |
| වෙනත් | 459,903,000 | 31,267,611 | 428,635,389 | |
| **එකතුව** | **627,503,000** | **224,416,522** | **403,086,478** | **64%** |
| **මුළු පුනරාවර්තන වියදම්** | **6,687,351,194** | **6,301,732,693** | **385,618,501** | |
| | | | | |
| **ප්‍රාග්ධන වියදම්** | | | | |
| පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම් | 63,885,000 | 57,300,011 | 6,584,989 | |
| වත්කම් අත්පත් කර ගැනීම් | 76,710,000 | 74,848,412 | 1,861,588 | |
| ඉදිකිරීම් ව්‍යාපෘති | 182,500,000 | 200,000,000 | (17,500,000) | |
| මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය | 1,905,000 | 128,859 | 1,776,141 | |
| පර්යේෂණ දිරිමත් කිරීම | - | - | - | |
| **මුළු ප්‍රාග්ධන වියදම්** | **325,000,000** | **332,277,282** | **(7,277,282)** | **-2%** |
| | | | | |
| **මුළු වියදම්** | **7,012,351,194** | **6,634,009,976** | **378,341,218** | **(0)** |



# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/G/UOK/1/24/19

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 අගෝස්තු 06 දින

උපකුලපති
කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

සහතික කරන ලද ගිණුම සහ යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :-

01. ලේකම් - අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
02. ලේකම් - මුදල්,ආර්ථික සංවර්ධන,ප්‍රතිපත්ති සම්පාදන,සැලසුම් හා සංචාරක අමාත්‍යාංශය
03. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

DIA
FNA Pl.
11/8/2025
V-C

11 AUG 2025
Vice-Chancellor's Office
11 AUG 2025
University of Kelaniya

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/G/UOK/1/24/19 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 අගෝස්තු 06 දින

උපකුලපති
කැලණිය විශ්වවිද්‍යාලය

**කැලණිය විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

කැලණිය විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සහ විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.3 විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් විශ්වවිද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍යවේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/ විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | වසර 2 කට වැඩි කාලයක සිට පැවත එන එකතු වටිනාකම රු.12,504,525 ක් වූ ආරක්ෂක තැන්පතු, හා වසර 5 කට වැඩි කාලයක සිට පැවත එන රු.15,363,991 ක පුස්තකාල තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 4 (ii) ඡේදය | පර්යේෂණයක් ආරම්භ කළ දින සිට මාස 06 ක් තුළ එකී යෝජනාවට අදාළ ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය ඇතුළත් අන්තර් පර්යේෂණ වාර්තාවක් පර්යේෂණ කළමනාකරණය සඳහා වන කමිටුවට ඉදිරිපත් කළ යුතු වුවද ප්‍රවර්ථන වර්ෂයේ පර්යේෂණ දීමනා ලෙස රු.10,693,540 ක් ලබා ගත් අනධ්‍යයන විධායක නිලධාරීන් 29 දෙනෙකු විසින් අන්තර් පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපියේ 5 වන ඡේදය | බැඳුම්කර උල්ලංඝණය කිරීම මත ප්‍රවර්තන වර්ෂය තුළදී අයකර ගන්නා ලද රු.194,401,919 ක් ඇතුළු එකතුව රු.717,291,990ක මුදල භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.2 වෙනත් කරුණු**

(අ) පරිගණක හා තාක්ෂණ පීඨ ගොඩනැගිල්ල තුළ පුස්තකාලයක් සකස් කිරීම සඳහා වර්ග මීටර් 185.8ක ඉඩකඩක් 2017 වර්ෂයේදී වෙන්කර තිබුණද එහි යෝජිත පුස්තකාලය ස්ථාපනය කර නොතිබුණි. එහෙත් එම පුස්තකාලය වෙනුවෙන් 2019 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ රු.7,935,048 ක් වටිනා පොත් 709 ක් මිලදීගෙන තිබුණු අතර එම පොත් අදාළ විද්‍යාර්ථයින්ගේ පරිහරණයට යොදා නොගෙන විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේ වර්ෂ 5 කට ආසන්න කාලයක සිට පැවතුණි.

(ආ) උසස් අධ්‍යාපන් ව්‍යාප්තිය සහ සංවර්ධන මෙහෙයුම් කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය මඟින් විද්‍යා පීඨයට ලබාදුන් පරිගණක හා උපාංග පිළිබඳ විශ්වවිද්‍යාලය විසින් 2023 දෙසැම්බර් 31 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී රු.1,625,000 ක් වටිනා Laptop පරිගණක 05 ක් අස්ථානගතවී ඇති බව හඳුනාගෙන ඇතත් විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු අයගෙන් එහි අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළදී අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගැනීමෙන් තොරව විශ්වවිද්‍යාලය විසින් මිලදීගෙන තිබුණු වටිනාකම රු.4,591,538ක් වූ ලිපි ද්‍රව්‍ය හා නඩත්තු ද්‍රව්‍ය තොගයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ඌන උපයෝජිතව පැවතුණි.

(ඈ) 2020 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර මාස 18 ක් තුළ සම්පූර්ණ කිරීමට නියමිතව තිබූ මහල් 4 කින් යුත් පඤ්ඤාරාම නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2021 ජූනි 21 දිනැති අධ්‍යාපන අමාත්‍යංශයේ අධ්‍යක්ෂකගේ (යටිතල පහසුකම් සංවර්ධන) ලිපියේ උපදෙස් පරිදි දෙපාර්ශවයේ එකඟතාව මත ගිවිසුම අවලංගු කර ඉදිකිරීම් නතර කර තිබුණි. ඉදිකිරීම් සඳහා අවශ්‍ය මූලික අනුමැතීන්ගෙන් තොරව මෙම ඉදිකිරීම් ආරම්භ කර තිබීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු.65,457,463ක මුදල රජයට සිදුවූ මූල්‍ය පාඩුවක් වන අතර ඒ සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන එය අයකර ගැනීමට හෝ මෙම ඉදිකිරීම් වෙනත් ඉදිකිරීමක් සඳහා භාවිතා කළ හැකිද යන්න ඇගයීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඉ) වසර 1 සිට 5 අතර කාලයක සිට අය නොවී පවතින එකතු වටිනාකම රු.77,823,917ක් වූ සේවක ණය අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) ගිවිසුම් කඩකළ ආචාර්යවරු 40 දෙනෙකුගෙන් 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දිනට අයවිය යුතුව පැවති එකතුව රු.436,728,258ක් අයකර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

# විගණකාධිපති වාර්තාව ආශ්‍රිතව විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නිරීක්ෂණ

**කැලණිය විශ්වවිද්‍යාලය**
**களனிப் பல்கலைக்கழகம்**
**UNIVERSITY OF KELANIYA**

මගේ අංකය
எனது இல
My No.

ඔබේ අංකය
உமது இல
Your No.

මගේ අංකය :- UK/IA/04/HED/G/UOK/1/23/19
ඔබේ අංකය :- HED/G/UOK/1/23/19

2025 සැප්තැම්බර් 12 දින

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල

**කැලණිය විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

ඔබගේ ඉහත සමාංකය සහ 2025 අගෝස්තු 06 දින දරන 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම් පහත ඉදිරිපත් කෙරේ.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(අ) මුදල් රෙගුලාසි 571

රු.12,504,525 ක් වූ ආරක්ෂක තැන්පතු -

මේ වන විට අදාළ අංශ දැනුවත් කර ඇති අතර එම අංශ මගින් ලැබෙන පිළිතුරු අනුව මුදල් කමිටු හා පාලක සභා අනුමැතිය ලබා ගෙන ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ.

University of Kelaniya, Kandy Road, Dalugama, Kelaniya 11600, Sri Lanka.
Web: www.kln.ac.lk | Email: info@kln.ac.lk
Tel: +94 112 903903

රු.15,363,991 වූ පුස්තකාල තැන්පතු -

මෙම මුදල විශ්වවිද්‍යාලීය අදායමට ගැනීම සඳහා විශ්ලේෂණ කටයුතු සිදුවෙමින් පවතින අතර 2025 සැප්තැම්බර් 30 න් අවසන් කාර්තුමය ගිණුම් පිළියෙළ කිරීමේදී අදාළ ගැලපුම් සිදු කිරීමට නියමිතය.

(ආ) 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 04 (ii) වගන්තිය

2025 වර්ෂය සඳහා පරිපාලන නිලධාරීන් 27 ක් සඳහා පර්යේෂණ දීමනා නිර්දේශ කර ඇත. ඒවා අතරින් 25 ක් පරිපාලන නිලධාරීන් සඳහා වන පර්යේෂණ දීමනා කළමනාකරණ කමිටුව මගින් ද 02 ක් අදාළ පීඨ වල පර්යේෂණ දීමනා කළමනාකරණ කමිටු හරහාද නිර්දේශ කර ඇත.

එසේ නිර්දේශ කරන ලද පර්යේෂණ දීමනා 27 අතරින් 15 ක් 2025 වර්ෂයේ නව පර්යේෂණ යෝජනා ඉදිරිපත් කරන ලද ඒවා වන අතර ඒ අතරින් 11 ක් සඳහා පෙර වසරේ එනම් 2024 වසරේ අවසන් කරන ලද පර්යේෂණ ව්‍යාපෘතියට අදාළව අවසන් වාර්තා ඉදිරිපත් කර ඇත. ඉතිරි පර්යේෂණ ව්‍යාපෘති 04 සම්බන්ධයෙන් අදාළ පරිපාලන නිලධාරීන් වෙත 2024 වසරේ සිදු කරන ලද පර්යේෂණයේ අවසන් වාර්තාව ඉදිරිපත් කරන ලෙස සිහිකැඳවීම් සිදු කර ඇත. ඉතිරි නිර්දේශිත පර්යේෂණ දීමනා අතරින් 11 ක් නිර්දේශ කර ඇත්තේ සිදු කරගෙන යනු ලබන පර්යේෂණ වල ප්‍රගතිය සැලකිල්ලට ගනිමිනි. ඒ සඳහා ප්‍රගති වාර්තා ඉදිරිපත් කර ඇත. එක් පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා සම්පූර්ණ කරන ලද පර්යේෂණ ව්‍යාපෘතියක ට අදාලව පළ කරන ලද පර්යේෂණ පරිසංවාදයක් සලකා බලා නිර්දේශ කිරීම සිදු කර ඇත.

පරිපාලන නිලධාරීන් දෙදෙනෙකු 2024 වර්ෂය සඳහා පර්යේෂණ දීමනා ලබා තිබුණ ද 2025 වර්ෂය සඳහා දීමනා ඉල්ලීමක් සිදු කර නොමැත. ඔවුන් අතරින් එක් නිලධාරියෙකු 2024 වර්ෂය සඳහා අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇති අතර අනෙක් නිලධාරියා 2024 වර්ෂය ට අදාළව ප්‍රගති වාර්තාව ඉදිරිපත් කර ඇත.

පරිපාලන නිලධාරීන් සඳහා වන පර්යේෂණ දීමනා කළමනාකරණ කමිටුව එම දීමනා නිර්දේශ කරන ලද්දේ ඉහත කී ප්‍රගති වාර්තා, අවසන් පර්යේෂණ වාර්තා සහ යෝජනාවලි සලකා බලා ය. ඒ අනුව පර්යේෂණ දීමනා ලබන පරිපාලන නිලධාරීන් සංඛ්‍යාව 29 කි.

(ඇ) 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපියේ 5 වන ඡේදය

බැඳුම්කර කඩවීම මත අයකර ගන්නා මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම සඳහා මේ දක්වා ලිඛිතව ගෙවීම් අංශයට උපදෙස් ලැබී නොමැත.

2

**2.3 වෙනත් කරුණු**

(අ) පරිගණක හා තාක්ෂණ පීඨය මුල් වසර 05 තුල දී ම කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල පවත්වා ගෙන ගෙන ගිය අතර, 2017 වර්ෂයේ සිට පැලියගොඩ 4 කණුවේ පිහිටි ගොඩනැගිල්ලට ගෙන යන ලදි. කුලී පදනම් මත ලබාගත් මෙම ගොඩනැගිල්ල තුල සිසුනට අධ්‍යයන කටයුතු සඳහා පුස්තකාල පහසුකම් ලබා දීමට යම් ඉඩ ප්‍රමාණයක් වෙන් කර තිබුණ ද දේශන ශාලා සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වූ හෙයින්, එම සීමිත ඉඩ ප්‍රමාණය ද දේශන ශාලා සඳහා භාවිතා කරන ලදී. තවද, පුස්තකාල පොත් හබඩා කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් සහ සහකාර පුස්තකාලයාධිපතිවරයෙකු ද පීඨය සතු නොවීය. එබැවින් දළුගම පරිශ්‍රය තුල පිහිටි ප්‍රධාන පුස්තකාලයේ කොටසක් තාක්ෂණ පීඨ සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා වෙන් කර තිබූ අතර, උක්ත පොත් 709 මිලදී ගෙන ප්‍රධාන පුස්තකාලයේ එම කොටස තුල සිසුන්ගේ භාවිතය සඳහා ලබා දී තිබුණි.

එම පීඨය, බුළුගහ හන්දිය පරිශ්‍රය තුලට 2024 වර්ෂයේ ගෙන යන ලද අතර, මේ වන විට වර්තමාන තාක්ෂණ පීඨයේ "අධ්‍යයන ගොඩනැගිල්ලේ" 6 වන මහලේ පිහිටි පුස්තකාලයට අයත් ලීබඩු හා උපකරණ ප්‍රසම්පාදනය නිමකර සවි කිරීම් කටයුතු අවසන් අදියරේ පවතී. එම කාර්යය නිම වූ වහාම ප්‍රධාන පුස්තකාලයේ තබා ඇති පීඨයට අයත් සියලුම පොත්පත් නැවත පරිගණක හා තාක්ෂණ පීඨය තුල සිසුන්ගේ පරිහරණයට ලබා දිය හැකිය.

(ආ) Laptop පරිගණක 05 ක් අස්ථාන ගත වීම සම්බන්ධව 529 වන පාලක සභාව වෙත ඉදිරිපත් කරන ලද මූලික විමර්ශන වාර්තාව හා එහි පාලක සභා තීරණය අනුවः

i. වී.පී. ධර්මසූරිය මහත්මිය 2024.01.04 දින මෙම විශ්වවිද්‍යාල සේවයෙන් ඉල්ලා අස්වූ අතර ඇය විසින් ඇගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම සඳහා අදාල ලියකියවිලි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කර තිබූ අතර අදාල Laptop පරිගණක 5 වටිනාකම සහ එහි අධිභාරය වන රු. 2,041,645/- ක මුදල වී.පී. ධර්මසූරිය මහත්මියගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අඩුකර විශ්වවිද්‍යාලය වෙත පවරාගෙන ඇත.

ii. බී.ඒ.එස්.ඩී. ආරියදාස මයා 2023.12.11 දින මෙම විශ්වවිද්‍යාල සේවයෙන් ඉල්ලා අස්වූ අතර ඔහු විසින් ඔහුගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල හා විශ්‍රාම වැටුප නිදහස් කිරීම සඳහා අදාල කිසිදු ලේඛනයක් විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කර නොමැත. ඒ පිළිබඳ සිහි කැඳවීමක් කරමින් 2025.06.13 දින ආරියදාස මයා වෙත නැවත ලිපියක් මඟින් දන්වා ඇත.

(ඇ)

ඌන උපයෝජිත බවට සඳහන් කර ඇති රු.4,591,538.42 ක් වන තොගයන්ගෙන් කැලණිය හා රාගම පරිශ්‍රයන්හි පිහිටි ගබඩාවන්හි ඇති සෙමින් චලනය වන, පිළිවෙලින් රු.3,869,575.11 ක් හා රු.8,100.00 ක් වන තොගයන් විශ්වවිද්‍යාලයේ විවිධ අංශයන්හි අවශ්‍යතාවයන්ට නිකුත් කිරීමට සිදු වේ. එම තොගයන් නිරන්තරයෙන් භාවිත නොවුවද, ඉල්ලුම් කරන ලද අංශයන්ගේ ඉල්ලීම මත මිලදී ගැනීමට කටයුතු කර ඇත.

රු.713,863.31 ක් වන ඉතිරි තොගයන් 2024 වසර තුලදී චලනය නොවන සහ හානි වූ හා යල්පැන ගිය තොගයන් කාණ්ඩයට අයත් බවට 2024.12.16 දිනට පැවති තොග සමීක්ෂණයේදී හඳුනා ගැනීමට ලක් වී ඇත. එම තොගයන් ගබඩා පරිශ්‍රයන්ගෙන් ඉවත් කිරීමට අවශ්‍ය කරන අනුමතින් ලද පසු, ඉවත් කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

(ඈ)

2020 අගෝස්තු 10 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණ මහල් 4 කින් යුතු හෙට්ටියාවත්ත පඤ්ඤාරාම නේවාසිකාරගාරය විද්‍යාලංකාර පිරිවෙනේ අකමැත්ත සහ කැබිනට් තීරණයක් මත නතර කිරීමට සිදුවුණි. අදාළ කොන්ත්‍රාත්තුව නතර කිරීම නිසා කොන්ත්‍රාත්කරුට රු. 4,029,430 ක අමතර ගාස්තුවක් ගෙවීමට සිදුවුණි.

උක්ත කරුණ පිළිබඳව 2023 දී අධ්‍යාපන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවට (Memo No 23/0296/607/26 කැබිනට් තීරණ 2023/03/08 අදාළව) අනුව කැබිනට් අමාත්‍යවරුන් විසින් මුදල් අමාත්‍යංශ ලේකම්ට දන්වා තිබුයේ විශ්වවිද්‍යාලය සමඟ සාකච්ඡා කර අනුමත කර ගන්නා ලද සවිස්තරාත්මක වාර්තාවක් ලබා දෙන ලෙසය.

විශ්වවිද්‍යාලය විසින් පත්කළ කමිටුවක් විසින් ව්‍යාපෘතියේ අරමුණ, මුදල් පසුබිම, සමාජීය බලපෑම. ඵලදායිතාව හා විශ්වවිද්‍යාලය මගින් මුදල් ආයෝජනය යන කරුණු ඇතුලත් සවිස්තරාත්මක වාර්තාවක් සකස් කර ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

2023/03/08 දින කැබිනට් තීරණය අනුව විශ්වවිද්‍යාලයෙන් පත් කල කමිටුව සැකසූ සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත 2024/04/19 ඉදිරිපත් කරන ලදී.

ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව සම්පූර්ණ වාර්තාව විශ්ලේෂණය කර වැඩබිම නිරීක්ෂණ වාර්තාවකින් පසු, රුපියල් මිලියන 245 ක මුදලකට කැලණිය විශ්වවිද්‍යාලයේ විදේශීය භික්ෂූන් සඳහා තනි කට්ටුවේ ගොඩනැගිල්ලක් විශ්වවිද්‍යාලය මගින් උපයාගත් අරමුදල් වලින් ඉදිකිරීමට 2024/07/30 (Letter No/HRD/HE/PP/UOK/24) දින නිර්දේශ කරන ලදි.

4

පහත පරිදි කැබිනට් යෝජනාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශ ලේකම්තුමාට 16/08/2024 දින යවන ලදි.

- සවිස්තරාත්මක වාර්තාවේ කරුණු සැලකිල්ලට ගෙන විදේශීය ස්වාමීන් වහන්සේලාට ලැගුම් ගැනීමට අවශ්‍ය මෙම නේවාසිකාගාරය විශ්වවිද්‍යාලය විසින් උපයාගත් අරමුදල් වලින් රුපියල් මිලියන 245 ක මුදලකට වර්ග මීටර් 560 කින් යුත් තනි මහල් ගොඩනැගිල්ලක් ලෙස ඉදිකිරීමට,

- එය මැනීම් කර ගෙවීමේ පදනම (Measure& Pay) යටතේ මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්) සමාගම (Central Engineering Services (Pvt) Ltd) මගින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශය යටතේ පිහිටුවා ඇති ස්ථාවර තාක්ෂණික කමිටුව මගින් අනුමත කරන ලද මිල ගණන් අනුව ගෙවීම් කිරීමට,

ඉදිරි ඉදිකිරීම් සඳහා භාවිත කිරීමට මෙම ගොඩනැගිල්ලේ අත්තිවාරම ශක්තිමත් බවින් යුක්ත බවට ව්‍යුහමය වරලත් ඉංජිනේරුවකුගේ නිර්දේශය සමග ලබාගත් තාක්ෂණික කමිටු වාර්තාවක් අමාත්‍යාංශ විගණන හා කළමණාකරන කමිටුව වෙත ලබාදී ඇත.

(ඉ) ඇති වර්ෂ 1 - 5 අතර කාලයක සිට අය නොවී පවතින සේවක ණය ශේෂය වන රු.77,823,917 ක වටිනාකම නිවරදි නොවන අතර අය නොවී පවතින ණය ශේෂ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| ණය වර්ගය | | ශේෂය (රු.) |
|---|---|---|
| ආපදා ණය | - | 4,085,287.98 |
| සේවක ණය | - | 9,360.00 |
| විශේෂ ආපදාණය | - | 40,833.00 |
| වාහණ ණය | - | 174,462.00 |
| පරිගනක ණය | - | 70,500.00 |
| එකතුව | - | 4,380,442.98 |

2024.12.31 දින වනවිට තවදුරටත් අය නොවී පවතින ණය වටිනාකම ඉහත පරිදි වන අතර එසේ අය නොවීමට හේතු වශයෙන් අරථසාධක අරමුදල් නිදහස් කර නොගැනීම, නොදන්වා විදේශ ගත වීම, සේවය අතහැර යාම හා සේවය අත්හිටුවා තිබීම, යන කරුනු සඳහන් කල හැකි අතර මෙම ගැටලු විසඳෙන අවස්ථාවේදී ඉහත ණය ශේෂ අයකර ගැනීමේ හැකියාව පවතී.

5

(ඊ)

2024.12.31 දිනට ගිවිසුම් කඩකළ ආචාර්යවරු ගණන 42 කි. ඔවුන්ගෙන් අයවිය යුතු මුදල රු.487,289,551.13 කි. 2024 වර්ෂය තුළ බැදුම්කර ගෙවා අවසන් කල සංඛ්‍යාව 07 කි.

2024 වර්ෂය තුළ විශ්වවිද්‍යාලය විසින් අයකරගෙන ඇති මුදල රු.189,733,429.09 කි. බැදුම්කර ගෙවීම් පැහැර හැර ඇති කාර්යමණ්ඩලයට එරෙහිව නීතිමය පියවර ගෙන ඇති අතර වාරික ගෙවීම් ප්‍රමාදවීම් මග හැරවා ගැනීමට නිරන්තර සිහි කැදවීම් ලිපි යොමු කරනු ලැබේ. එමෙන් ම බැදුම්කර අයකර ගැනීම් විධිමත් කිරීම සඳහා ඒ වෙනුවෙන් නිලධාරියෙකු පැවරුම් පදනම මත බඳවා ගැනීමට කටයුතු සිදු කරගෙන යනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා
උපකුලපති

පිටපත් :- 01 ලේකම් :- අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
02 ලේකම් :- මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් හා සංචාරක අමාත්‍යාංශය
03 සභාපති :- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

6

15

# විගණන කමිටු වාර්තාව 2024





**විගණන කමිටු වාර්තාව - 2024**

**විගණන කමිටුවේ සංයුතිය**

පාලක සභාවට වගකිව යුතු උප කමිටුවක් ලෙස ස්ථාපනය කර ඇති විශ්වවිද්‍යාලයේ විගණන කමිටුව විධායක නොවන සභා සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ. 2024 වසරේ දී පහත සඳහන් සාමාජිකයින් විගණන කමිටු කාර්යයන්හි නියුක්ත වූහ.

| සාමාජික | 2024 වසරේ දී කමිටුවට සහභාගී වීම (සහභාගී වීම/සහභාගී වීමට නියමිත) |
|---|---|
| 1. එල්.ජී. සුසන්ත සිල්වා මහතා (සභාපති) | 4/4 |
| 2. මේරි ටී. ඩික්මන් මිය | 1/3 |
| 3. සම්මානිත මහාචාර්ය එන්. ආර්. අර්තනායක | 4/4 |
| 4. සුභාෂිනී මුණසිංහ මිය | 0/1 |

ඉහත සඳහන් සාමාජිකයින්ට අමතරව ජාතික විගණන කාර්යාලයේ සාමාජිකයින්ටද නිරීක්ෂකයින් ලෙස සහභාගී වීම සඳහා ආරාධනා කරන ලදී.

**රැස්වීම්**

පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී./31 අනුව වසරකට සිව් වතාවක් කමිටුව රැස් විය යුතුය. සලකා බලන ලද වර්ෂය තුළ කමිටුව හය වතාවක් රැස් වූ අතර මෙම රැස්වීම්වල දී අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සාකච්ඡාවට ගන්නා ලදී. දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා කමිටු වාර්තා විශ්වවිද්‍යාලයේ පාලක සභාවට ලබා දෙන ලදී.

**මූලික වගකීම්**

විගණන කමිටුවේ ප්‍රධාන පරමාර්ථය වන්නේ විශ්වවිද්‍යාලයේ මූල්‍ය සහ ඒ ආශ්‍රිත කළමනාකරණ කටයුතු ඵලදායී ලෙස කරගෙන යාම සඳහා පාලක සභාවට සහාය වීමයි.

මූලික වගකීම් වනුයේ,

1. මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තාකරණය සහ විගණන ක්‍රියාවලියේ අඛණ්ඩතාවය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
2. විශ්වවිද්‍යාලයේ මූල්‍ය සහ ඒ ආශ්‍රිත කටයුතු වලට අදාළ ඕනෑම කාරණයක් පරීක්ෂා කිරීම.
3. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැසුම් සහ වැඩසටහන් අනුමත කිරීම.
4. අභ්‍යන්තර විගණන සැලැස්ම හා වැඩසටහන අධීක්ෂණය කිරීම.

5. බාහිර සහ අභ්‍යන්තර විගණන වාර්තා විමර්ශනය කිරීම සහ නිර්දේශයන් සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදුකිරීම.
6. අභ්‍යන්තර පාලන පද්ධති වල ඵලදායී ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීම, අනුකූලතාවය පරීක්ෂා කිරීම හා අධීක්ෂණය කිරීම.
7. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් නීතිරීති රෙගුලාසි සහ චක්‍රලේඛයන්ට අනුකූලව කටයුතු කරන්නේද යන්න සොයා බැලීම.
8. පිරිවැය ඵලදායීත්වය ඇතිකිරීම සහ අනවශ්‍ය වැය කපාහැරීම සඳහා නිශ්චිත කාල පරිච්ඡේදයකට වරක් ආයතනයේ ක්‍රියාකාරීත්වය ඇගයීම.

**වසර තුළ ක්‍රියාකාරකම්**

විමර්ශනයට ලක් කරන ලද වසර තුළ කමිටුව පහත සඳහන් ක්‍රියාකාරකම් වල නිරත විය.

**1. අභ්‍යන්තර විගණන සැලසුම් සහ වැඩ සටහන් අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම.**

2024 වසර සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන වැඩසටහන, කමිටුව අනුමත කර වසර මුළුල්ලේම එහි තත්ත්වය අධීක්ෂණය කළේය. කමිටුව අභ්‍යන්තර විගණනයේ ඵලදායිතාවය, විමසුම් වල ක්‍රියාකාරීත්වය සහ අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරීත්වය සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම සිදු කර ඇත. මීට අමතරව කමිටුව විසින් අභ්‍යන්තර විගණන ක්‍රියාවලියෙහි විගණන අවදානම් තක්සේරු කිරීම් සමාලෝචනය කිරීමද සිදුකරන ලදි.

**2. නීති සහ රෙගුලාසි සමඟ අනුකූලතාවය.**

බාහිර සහ අභ්‍යන්තර විගණකවරු විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීම සමාලෝචනය කරන ලදි. විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, පාරිතෝෂිත ගෙවීම, විශ්‍රාම අරමුදල් නිදහස් කිරීම සහ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම යනාදි ව්‍යවස්ථානුකූල ගෙවීම් නිරවුල් කිරීම පිළිබඳව තවදුරටත් කමිටුව විසින් පසුවිපරම් කරන ලදී. මීට අමතරව කමිටුව විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් විශ්වවිද්‍යාලය වෙත ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේ කාර්යයද ඉටුකරන ලදි.

**3. ශිෂ්‍යත්ව කඩකිරීම සම්බන්ධයෙන් අඛණ්ඩ සමාලෝචනය සහ අධීක්ෂණය.**

බැඳුම්කර කඩකරන ලද කාර්යමණ්ඩල සාමාජිකයින්ගෙන් ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව කමිටුව විසින් සමාලෝචනය සහ අධීක්ෂණය කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය තුළ බැඳුම්කර කඩකරනු ලැබූ පුද්ගලයින්ගෙන් රුපියල් මිලියන 189.7 කට ආසන්න මුදලක් විශ්වවිද්‍යාලයට අයකර ගැනීමට හැකියාව ලැබුණි. 2024 වර්ෂය ආරම්භයේ බැඳුම්කර කඩවූවන් 36 දෙනෙකු සිටින ලදි. 7 දෙනෙකුගෙන් මුළු බැඳුම්කර වටිනාකම වර්ෂය තුළ අයකර ගැනීමට හැකියාව ලැබුණි. 22 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල් වාරික වශයෙන් නිසි පරිදි

ගෙවමින් සිටින අතර ගෙවීම් පැහැරහැර ඇති 02 දෙනෙකුට එරෙහිව නීතිමය පියවර ගෙන ඇත. වාරික මුදල් ගෙවීම ප්‍රමාද වූ පුද්ගලයන් 18 දෙනෙකුට නිසි පරිදි මුදල් ගෙවන ලෙස සිහිකැඳවීම් යැවීමට කටයුතු කර ඇත.

**4. අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම හා ශක්තිමත් කිරීම.**

ස්ථාවර වත්කම් පාලනය, කොන්ත්‍රාත් කටයුතු සඳහා වියදම් ක්‍රමවත් කිරීම, පුස්තකාල පොත් බැහැර දීම, වාර්ෂික ගබඩා තොග සමීක්ෂණ/ස්ථාවර වත්කම් සමීක්ෂණ, බැඳුම්කර මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම, හඳුනා නොගත් සහ අයකර ගත නොහැකි ණය ශේෂයන් විසඳීම හා පෞද්ගලික ආරක්ෂක අංශයේ කටයුතු පරීක්ෂා කිරීම යන අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශයන් ලබා දෙන ලදී. තවද විගණකාධිපති විසින් 2024 වර්ෂය තුළ නිකුත් කරන ලද විගණන වාර්තා හා විගණන විමසුම් වලින් පෙන්වා දෙන ලද දුර්වලතාවයන් නිවැරදි කිරීමට ගනු ලැබූ පියවරයන් පිළිබඳව අඛණ්ඩව සමාලෝචනය කරන ලදී.

**5. විගණන කමිටු රැස්වීම්.**

2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර තුළ විගණන කමිටුව සිවු වතාවක් රැස් විය. සාමාජිකයින් විගණන කමිටු සඳහා ක්‍රියාකාරී ලෙස දායක විය. ආරාධිත නිරීක්ෂකයකු ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක් සෑම විගණන කමිටු රැස්වීමකටම සහභාගී වූ අතර, 2024/01, 2024/04 විගණන කමිටු සඳහා මහා භාණ්ඩාගාරයේ නියෝජිතයකු ද ආරාධිත නිරීක්ෂකයකු ලෙස සහභාගී විය. විශ්වවිද්‍යාලයේ අනෙකුත් කාර්යමණ්ඩල සාමාජිකයින්ට අවශ්‍ය වූ විට පැමිණීම සඳහා ආරාධනා කරන ලදී. නියෝජ්‍ය අභ්‍යන්තර විගණක විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

**6. ගබඩා තොග පරීක්ෂාව**

2024 වර්ෂය තුළ කාර්තුමය ගිණුම් පරීක්ෂාවට අනුකූලව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පවත්වාගෙන යන ප්‍රධාන ගබඩාවන් සහ, රාගම වෛද්‍ය පීඨ පරිශ්‍රයේ පිහිටි ගබඩාවෙහි 2024 ඔක්තෝබර් 14 දිනට පැවති තොග ශේෂ සහ 2024 දෙසැම්බර් 16 දිනට පැවති තොග ශේෂ සත්‍යාපනය කිරීමට කටයුතු කරන ලදී. ඒ ඒ තොග සමීක්ෂණයට අදාළව තොග සමීක්ෂණ වාර්තාවන් ද නිකුත් කරන ලදී.

**7. කාර්තුමය ගිණුම් පරීක්ෂාව**

පාලක සභා තීරණයක් අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් 2022 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලයේ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීම සඳහා කටයුතු කරන ලදී. ඒ අනුව 2024 වර්ෂයේ ප්‍රථම හා තෙවන කාර්තු සඳහා පිළියෙළ කළ මූල්‍ය ප්‍රකාශන සහ, 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කරන ලද අතර එම පරීක්ෂා කිරීම්වලට අදාළව පිළියෙළ කරන ලද වාර්තා විගණන කමිටුවට හා පාලක සභාව වෙත ඉදිරිපත් කරන ලදී. තවද කැලණිය විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව විගණකාධිපති වාර්තාව මඟින් 2024.12.31

දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව සත්‍ය හා සාධාරණ මතයක් ලබාදී ඇත.

**නිගමනය**

2024 වසර තුළ කමිටුව විසින් සළකා බලන ලද කරුණු සම්බන්ධයෙන් ලබාදෙන ලද නිර්දේශ මත පසුවිපරම් කටයුතු සිදුකිරීමේ සාර්ථකත්වය පිළිබඳව කමිටුව සෑහීමකට පත්විය.

සභාපති,<br>
විගණන කමිටුව,<br>
කැලණිය විශ්වවිද්‍යාලය